320 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 320 - இல. 09
Volume 320 - No. 09

2025 අගෝස්තු 06 වන බදාදා
2025 ஓகஸ்ட் 06, புதன்கிழமை
Wednesday, 06th August, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
ජාතික විගණන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය [තීරුව 1450]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1451]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1453]

**ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න** [තීරු 1456-1471]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1471-1497]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ලිසිං ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම [තීරුව 1498]
අංක 2185/74 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අවලංගු කිරීම [තීරුව 1500]

**2025.07.09 දින ගරු ඩී.වී. චානක මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය:**
ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 1502]

**ගරු හර්ෂණ රාජකරුණා මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම** [තීරුව 1507]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්**
ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) - ගරු කේ. කාදර් මස්තාන් මහතා - පළමුවන වර කියවන ලදී [තීරුව 1513]

**ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 1515 - 1630]

**දුම්කොළ බදු පනත:**
නියමය [තීරුව 1630]

**තේ (අපනයන බදු සහ පාලන) පනත:**
නියෝග [තීරුව 1631]

**කල් තැබීමේ ප්‍රශ්න** [තීරු 1632 - 1642 ]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
தேசிய கணக்காய்வு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு [ப: 1450]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1451]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1453]

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்** [ப: 1456-1471]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1471-1497]

**தனி அறிவித்தல் மூல வினா:**
குத்தகை நிறுவனங்களின் கொள்கைகளை மீளாய்வு செய்தல் [ப: 1498]
2185/74ஆம் இலக்க அதிவிசேட வர்த்தமானி அறிவித்தலை மீளப் பெறல் [ப: 1500]

**2025.07.09ஆம் திகதி மாண்புமிகு டி.வீ. சானகவினால் கேட்கப்பட்ட வினா:**
மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று [ப: 1502]

**மாண்புமிகு ஹர்ஷண ராஜகருணாவினது சொந்த விளக்கம்** [ப: 1507]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
இலங்கை வசதிகள் முகாமைத்துவ நிறுவகம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு கே. காதர் மஸ்தான்] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1513]

**இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 1515 - 1630]

**புகையிலை வரிச் சட்டம்:**
கட்டளை [ப: 1630]

**தேயிலை (வரி மற்றும் ஏற்றுமதிக்கான கட்டுப்பாடு) சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 1631]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 1632 - 1642]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
National Audit (Amendment) Bill: Determination of the Supreme Court [Col. 1450]

AUDITOR-GENERAL'S REPORT [Col. 1451]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1453]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 1456-1471]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1471-1497]

QUESTION BY PRIVATE NOTICE:
Reviewal of Policies in Leasing Sector [Col. 1498]
Revocation of Gazette Extraordinary No. 2185/74 [Col. 1500]

QUESTION POSED BY HON. D.V. CHANAKA ON 09.07.2025:
Statement by Hon. Prime Minister [Col. 1502]

PERSONAL EXPLANATION BY HON. HARSHANA RAJAKARUNA [Col. 1507]

PRIVATE MEMBERS' BILLS:
Institute of Facilities Management Sri Lanka (Incorporation) - [The Hon. K. Kader Masthan] - Read the First time [Col. 1513]

SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 1515 - 1630]

TOBACCO TAX ACT:
Order [Col. 1630]

TEA (TAX AND CONTROL OF EXPORT) ACT:
Regulations [Col. 1631]

ADJOURNMENT QUESTIONS [Cols. 1632 -1642]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 අගෝස්තු 06වන බදාදා***

*2025 ஓகஸ்ட் 06, புதன்கிழமை*

*Wednesday, 06th August, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ජාතික විගණන (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### தேசிய கணக்காய்வு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
### NATIONAL AUDIT (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to announce to Parliament that I have received the Decision of the Supreme Court in respect of the Bill titled "National Audit (Amendment)", which had been challenged in the Supreme Court in terms of Article 121 (1) of the Constitution.

The Supreme Court has communicated that the petitioners of SC/SD/21/2025 had withdrawn the application as they were satisfied with the Amendments to be moved at the Committee Stage of the Bill.

I order that the Decision of the Supreme Court be printed in the Official Report of today's Proceedings of the House.

*ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :*
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**"NATIONAL AUDIT (AMENDMENT) BILL"**

1. Transparency International Sri Lanka (Guarantee) Limited,
2. Pulasthi Hewamanna,
Both No. 366, Nawala Road,
Nawala.
Petitioners

**SC/SD/21/2025**

Vs.

Hon. Attorney General,
Attorney General's Department,
Colombo 12.
Respondent

Before: Hon. Justice Mahinda Samayawardhena
Hon. Justice Arjuna Obeyesekere
Hon. Justice Sobhitha Rajakaruna

Counsel: Viran Corea, P.C. with Thilini Vidanagamage and Nishika Fonseka for the Petitioners.

Nirmalan Wigneswaran, D.S.G. with Hashini Opatha, S.S.C. Rajika Aluwihare, S.C. and Senal Seneviratne, S.C. for the Respondent.

Date: 31.07.2025

A Bill titled "National Audit (Amendment) Bill" was published in the Gazette issued on 23rd June 2025, for the purpose of amending the National Audit Act, No. 19 of 2018, and was subsequently placed on the Order Paper of Parliament on 8th July 2025. This was done in accordance with Article 78(1) of the Constitution.

The petitioners invoked the jurisdiction of this Court under Article 121(1) of the Constitution on 22nd July 2025, challenging the constitutionality of several clauses of the said Bill.

The Attorney General was noticed by this Court in terms of Article 134(1) of the Constitution.

The hearing commenced at 10.00 a.m. on 29th July 2025. During the course of the hearing, the Learned Deputy Solicitor General, appearing for the Hon. Attorney General, informed Court that, in response to the concerns raised by the Learned President's Counsel for the petitioners, the amendments to be moved at the Committee Stage of the Bill would be tendered to Court in writing by way of a motion, with a copy served on the Learned President's Counsel.

This undertaking was fulfilled by the Learned Deputy Solicitor General by motion dated 31st July 2025. A copy of the said motion together with its annexure is attached herewith.

In view of the said undertaking learned President's Counsel for the petitioners withdrew the application.

This is communicated in terms of Article 121(3) of the Constitution.

Mahinda Samayawardhena, J.
Judge of the Supreme Court

Arjuna Obeyesekere, J.
Judge of the Supreme Court

Sobhitha Rajakaruna, J.
Judge of the Supreme Court

## II

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
## MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 අගෝස්තු 06 බදාදා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ I කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020, 2021, 2022 හා 2023 වර්ෂ සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්ය සාධන වාර්තා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විශාල වැඩ කොටසක් සිද්ධ කරන්න පුළුවන් තැනක් කියායි මම හිතාගෙන හිටියේ. හැබැයි, බුද්ධිමය දේපළ සම්බන්ධව ගන්න තිබෙන තීන්දු සහ ඒ ආයතනයෙන් ගත යුතු වැඩ කොටස අපි හරියාකාරව අරගෙන නැහැ කියන එක පැහැදිලිව පෙනෙනවා. ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තියක් හැටියට බුද්ධිමය දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියාත් මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කොළඹ 05, කැප්පෙටිපොළ මාවත, සමුළු නිවාස, අංක 12/සී දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.ආර්.ඩී. එස්. රාජකරුණා සහ වෙනත් නව දෙනෙකුගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දෙහිවල, ශ්‍රී සරණංකර පාර, සරණංකර ටෙරස්, අංක 04 දරන ස්ථානයෙහි පදිංචි කේ. ගාමිණී පුණ්‍යසිරි ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)

ගරු කථානායකතුමනි, තුම්මෝදර, ලබුගම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යන ස්ථානයෙහි සේවයේ නියුතු අයි.ඩී.ඩී.එල්. සමරනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු කථානායකතුමනි, මාතර, වැවහමන්දුව, අංක 18 දරන ස්ථානයෙහි පදිංචි ටී. සුරවීර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු කථානායකතුමනි, පිටිගල, ගාල්ලෙ ගෙදර වත්ත, බොරළුහේන පන්සල පාර යන ලිපිනයෙහි පදිංචි එම්. විමලසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කළුතර දකුණ, මහ හීනටියංගල, කන්දෙවත්ත, සුවසේවා මාවත, අංක 153/4 දරන ස්ථානයෙහි පදිංචි බී.එච්.ඩී.එච්. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කළුතර, නාගොඩ, බෝධියවත්ත, අංක 62/19 බී, 4 වැනි පටුමග දරන ස්ථානයෙහි පදිංචි ආර්.එස්. විමලසිරි ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) හොරණ, මුණගම, තක්ෂිලා උයන, අංක 156 දරන ස්ථානයෙහි පදිංචි ආර්.එච්.එම්. රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
ගරු කථානායකතුමනි, කෑගල්ල, නිල්වක්ක, "ඉන්ද්‍රජිත්", අංක ඊ 7 දරන ස්ථානයෙහි පදිංචි බී.ඒ. කරුණාතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු කථානායකතුමනි, නාරම්මල, බෙම්මුල්ලෙගෙදර, මීවැව, බෝමළු වත්ත යන ලිපිනයෙහි පදිංචි ඩී.බී. මානෙල් සෝමරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චානක මාදුගොඩ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ගරු කථානායකතුමනි, කෑගල්ල, මහ රෝහල, වෛද්‍ය ලේඛන සහකාර යන ස්ථානයෙහි සේවයේ නියුතු කේ.එම්.යූ.එස්. ජාලිය බණ්ඩාර මහතාගෙන් සහ වෙනත් දෙදෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

දිළිඳුකම පිටුදැකීම සඳහා නිදහසින් පසුව පත් වූ විවිධ ආණ්ඩු විවිධ නාමකරණ යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ ද, එවැනි වැඩසටහන් සඳහා ජනතා බදු මුදලින් කරන වියදම වැඩි වන අතරම ප්‍රතිලාභ ලබන ප්‍රමාණය ද ඉහළ ගොස් ඇත. එවැනි පසුබිමක දිළිඳු බව තුරන් කිරීම සඳහා බහුවිධ ප්‍රවේශ ඇතුළත් ඒකාබද්ධ වැඩසටහනක් වශයෙන් වත්මන් ආණ්ඩුව "ප්‍රජා ශක්ති" වැඩසටහන හඳුන්වා දී තිබේ.

1. "ප්‍රජා ශක්ති" වැඩසටහනෙහි මූලික අරමුණු මොනවාද?

2. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගනු ලබන ව්‍යුහය කුමක්ද?

3. මේ දක්වා පැවැති දිළිඳුබව තුරන් කිරීම සඳහා වූ වැඩසටහන් අසාර්ථක වීමට හේතු කවරේද?

4. මෙම වැඩසටහන මුලින් ක්‍රියාත්මක වූ වැඩසටහන්වලට වඩා වෙනස් වන ආකාරය සහ මුලින් ක්‍රියාත්මක වූ වැඩසටහන්වල පැවැති අඩුපාඩු පාලනය කිරීම සඳහා යොදා ඇති ක්‍රම මොනවාද?

5. මෙම වැඩසටහන යටතේ 2030 වන විට සහ ඉන් ඔබ්බට ඉලක්ක මොනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයෙන් අසනු ලබන ප්‍රජා ශක්ති වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් අපි කැබිනට් අනුකමිටුවක් පත් කර තිබෙනවා. ඒ අනුව එම වැඩ පිළිවෙළ සකස් කරගෙන යනවා. එම වැඩ පිළිවෙළ සකස් කර අවසන් වුණාට පසුව ගරු අගමැතිතුමිය මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා මත සිදු කරන අත්අඩංගුවට ගැනීම් මේ දිනවල මාධ්‍ය මඟින් වාර්තා වන අතර, බහුතර පිරිසක් එය අගය කරන අතරතුර ඇතැම් පිරිස් එහි ඍණාත්මක තත්ත්වයක් පෙන්වීමට උත්සාහ කරමින් සිටී.

1. 2024 වසර තුළ අල්ලස් හෝ දූෂණ චෝදනා මත කොපමණ ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබේද?

2. මෙම වසරේ මෙතෙක් අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?

3. මැත කාලීනව විවිධ තනතුරු හොබවන සහ හෙබ වූ නිලධාරින් මෙන්ම දේශපාලන නායකයන්ට විරුද්ධව පනතේ ප්‍රතිපාදන අනුව කටයුතු කරන ප්‍රවණතාවක් පවතින අතර, ඒ සම්බන්ධයෙන් රජයට එල්ල වන විවේචන සම්බන්ධයෙන් ලබා දිය හැකි පිළිතුර කුමක්ද?

4. අල්ලස් හෝ දූෂණය පිළිබඳව නිවාරණ කටයුතු කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමුවී තිබේද?

5. තිබේ නම් ඒ සඳහා ඇති සැලසුම් සහ ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු අසිත නිරෝෂණ එගොඩවිතාන මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. අල්ලස් චෝදනා මත 2024 වර්ෂයේදී පුද්ගලයන් 86දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

2. 2025 වර්ෂයේදී (2025.06.30 දිනට) අල්ලස් චෝදනා මත 34 දෙනෙක් ද, දූෂණ චෝදනා මත 29දෙනෙක් ද අත්අඩංගුවට ගෙන ඇත. එම විස්තර පහත පරිදිය.

| | | 2024 (අල්ලස් චෝදනා මත) | 2025.06.30 දිනට | | |
|---|---|---|---|---|---|
| | | | අල්ලස් චෝදනා මත | දූෂණ චෝදනා මත | එකතුව |
| 1 | දේශපාලනඥ/ හිටපු දේශපාලනඥ | - | - | 7 | 7 |
| 2 | රාජ්‍ය නිලධාරි/ හිටපු රාජ්‍ය නිලධාරි | 58 | 28 | 14 | 42 |
| 3 | සිවිල් පුද්ගලයින් | 28 | 6 | 3 | 9 |
| 4 | දේශපාලනඥයන්ගේ ඥාතීන් | - | - | 5 | 5 |
| | එකතුව | 86 | 34 | 29 | 63 |

3. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත හඳුන්වාදීමත් සමඟ එම දූෂණ විරෝධී පනත මඟින් ඇති කරනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පෙර පැවැති පනත්වලට වඩා විශාල බලතල රාශියක් හිමි විය.

ඒ අනුව, පෙර පැවැති අල්ලස් හෝ දූෂණ වැරැදිවලට අමතරව තවත් වැරැදි රාශියක් හඳුන්වා දුන් අතර, ඊට අමතරව දණ්ඩ නීති සංග්‍රහයේ හා පොදු දේපළ පනත යටතේ වන වැරැදි සම්බන්ධයෙන් ද, මුදල් විශුද්ධිකරණය පනත යටතේ වන වැරැදි සම්බන්ධයෙන්ද විමර්ශනය හා නඩු පැවරීමේ බලය දූෂණ විරෝධී පනත මඟින් ලැබුණි.

ඒ අනුව, 2023.09.15 දිනෙන් පසු දූෂණ විරෝධී පනත බලාත්මක වීමෙන් පසු විශේෂයෙන්ම අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ වන සහ දූෂණ විරෝධී පනතේ 111 වගන්තිය යටතේ වන "දූෂණ" නමැති වරද සම්බන්ධයෙන් වන විමර්ශන කඩිනම් කරනු ලැබූ අතර, දීර්ඝ කාලයක් විමර්ශන තත්ත්වය යටතේ පැවැති ගොනු කඩිනමින් අවසන් කිරීම සඳහා වන ක්‍රමයක් ද සකස් කරන ලදී.

ඒ හේතු කොට ගෙන විශේෂයෙන්ම මහා පරිමාණ දූෂණවලට අදාළ ගොනු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු වූ අතර, එම විමර්ශන ඉතා ඉක්මනින් අවසන් කිරීමේ ක්‍රමයක් ද සකස් කරන ලදී.

ඒ හේතු කොටගෙන දේශපාලනඥයන් හා රජයේ ඉහළ නිලධාරින්ට එරෙහිව චෝදනා එල්ල වූ මහා පරිමාණ දූෂණ වැරැදි සම්බන්ධයෙන් වන සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට දූෂණ විරෝධී පනතේ 47වන වගන්තිය අනුව ලැබී ඇති බලතල ප්‍රකාරව ක්‍රියාත්මක වූ අතර, එය විශේෂයෙන්ම "දූෂණ" නමැති වරද පිළිබඳ විමර්ශනය කිරීමට ඉතා අවශ්‍ය විය.

තවද, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව ඇති කරනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්පූර්ණයෙන්ම ස්වාධීන ආයතනයක් වන අතර, එය රජයේ කිසිදු සම්බන්ධයක් ඇති හෝ රජයට බලපෑම් කළ හැකි ආයතනයක් නොවේ.

ඒ අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පවත්වනු ලබන විමර්ශනවලට, අත්අඩංගුවට ගැනීම්වලට හෝ නඩු පැවරීම් සම්බන්ධයෙන් රජය කිසිදු මැදිහත්වීමක් නොකරයි.

4. කොමිෂන් සභාවේ අවධානය අල්ලස් හෝ දූෂණ චෝදනා සම්බන්ධයෙන් වැරැදි විමර්ශනය, නඩු පැවරීම්වලට අමතරව නිවාරණය කෙරෙහිද යොමු වී ඇත. ඒ සඳහා දූෂණ විරෝධී පනත මඟින් කොමිෂන් සභාවට බලය ලැබී ඇත.

5. **i. දූෂණ විරෝධී වැඩසටහන්**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව විවිධ කණ්ඩායම් අරභයා නිවාරණ වැඩසටහන් පවත්වන අතර, එහිදී රාජ්‍ය නිලධාරින්, ළමයින්, තරුණයන්, මහජනතාව ආදි වශයෙන් විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි වැඩසටහන් පවත්වනු ලැබේ.

ii. **දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025-2029**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ශ්‍රී ලංකාව සඳහා දූෂණ විරෝධී ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීමට ලැබී ඇති බලතල ප්‍රකාරව 2025-2029 වර්ෂ සඳහා වන දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

විවිධ පාර්ශ්වයන්ගෙන් ලබාගත් අදහස් හා යෝජනා ඒක රාශි කරමින් මෙම සැලැස්ම සකස් කර ඇති අතර, 2025.01.10 වන දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමේ සැසියක්ද පවත්වා අදහස් ලබාගෙන ඇත. මෙම සැලැස්ම සඳහා 2025.03.24 වන දින කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ද ලැබී ඇත. එම සැලැස්ම මඟින් උප අරමුණු කිහිපයක් ඔස්සේ ප්‍රධාන උපාය මාර්ග හතරක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන සැලසුම් ක්‍රියාමාර්ග සහිතව දක්වා ඇත. ඒවා අතර,

1. දූෂණ නිවාරණය;
2. අධ්‍යාපනය සහ ප්‍රජා සහභාගිත්වය ඉහළ නැංවීම;

[ගරු හරිනි අමරසූරිය]

3. අල්ලස හා දූෂණයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන ශක්තිමත් කිරීම; සහ

4. දූෂණයට එරෙහි නීතිය සහ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම

යන කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ සම්බන්ධයෙන් ඉදිරි අවුරුදු 05 ඇතුළත සිදු කළ යුතු ක්‍රියාමාර්ග ගණනාවක් විවිධ ක්ෂේත්‍ර අරමුණු කරගෙන සඳහන් කර ඇත. එහිදී රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, මහජන නියෝජිතයන්, දරුවන්, තරුණයන්, සිවිල් සමාජය, මාධ්‍ය, අධිකරණ ක්ෂේත්‍රය ආදි වශයෙන් සියලු අංශ ආවරණය වන පරිදි මෙම සැලසුම් සකස් කර ඇත. මෙම සැලැස්ම මඟින් දක්වා ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට දැනටමත් ආරම්භ කර ඇත.

තවද, මෙම සැලැස්ම ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් වන ජාතික මෙහෙයුම් කමිටුවක්ද මේ වනවිට පත් කර ඇත. එමෙන්ම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අදාළ වන ආයතන ඒ පිළිබඳ දැනුවත් කිරීම 2025.07.30 දින කමිටු රැස්වීමක් පවත්වා සිදු කර ඇත.

iii. අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීම.

තවද, රාජ්‍ය අංශය තුළ සුපිළිපන්නභාවය ඉස්මතු කිරීම සඳහා දැනටමත් අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීමට කටයුතු කර ඇති අතර, එසේ පිහිටුවන ලද අභ්‍යන්තර කටයුතු ඒකකවල නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් සංවිධානය කර මේ දිනවල ඒ පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත.

iv. 2025 වර්ෂයේ පළාත් පාලන මැතිවරණයෙන් පළාත් පාලන ආයතනවලට තේරී පත් වූ මහජන නියෝජිතයන්ගේ සුපිළිපන්බව - integrity - ඉහළ නැංවීම සහ දූෂණ විරෝධය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක්ද සංවිධානය කර ඇත.

v. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්ම 2025-2026 හරහාද වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරමින් යයි.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අතුරු ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා. පළමුවෙනි ප්‍රශ්නය මෙයයි.

වත්මන් ආණ්ඩුව බලයට පත් වෙන්න කලින් ආණ්ඩුව නියෝජනය කළ, වර්තමානයේ විපක්ෂයේ වාඩි වෙලා ඉන්න බොහෝ දේශපාලන නායකයන් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ, "ඔයගොල්ලන් ඩබල් කැබ් පිරෙන්න ෆයිල් ගෙනාවා. කෝ දැන් ඔයගොල්ලන් ගෙනාව ඒ ෆයිල්, කෝ විමර්ශන, කෝ අත්අඩංගුවට ගැනීම්, කෝ පරීක්ෂණ?" කියලා විශාල ඝෝෂාවක් නඟලා අහන්න පටන් අරගෙන තිබුණා. නමුත් ඔබතුමිය නායකත්වය දෙන වත්මන් ආණ්ඩුව - ඔබතුමිය කලින් පැහැදිලි කළා වාගේ - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන භෞතික හා මානව සම්පත් ක්‍රමානුකූලව ලබා දීලා ඒ ආයතන ශක්තිමත් කරලා ස්වාධීන පරීක්ෂණ කරගෙන යෑම සඳහා ඉඩකඩ ලබා දුන්නා. මහජන මුදල් බිලියන ගණන් හොරකම් කරපු දේශපාලන නායකයන් සහ නිලධාරින් අත්අඩංගුවට ගැනීම් සහ පරීක්ෂණ පැවැත්වීම් වර්තමානයේ දැන් වේගයෙන් සිද්ධ වෙනවා. ආණ්ඩුවට හිනා වුණු, "කෝ විමර්ශන, කෝ පරීක්ෂණ, කෝ අත්අඩංගුවට ගැනීම්?" කියලා අහපු ඒ අය දැන් ඒ හිනාව පැත්තකින් තියලා කෙඳිරි ගාන්න පටන් අරගෙන තිබෙනවා, දේශපාලන පළි ගැනීම් කරනවා කියලා. මේ සම්බන්ධයෙන් ඔබතුමිය දක්වන අදහස කුමක්ද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මගේ උත්තරය තුළත් සඳහන් වූ විධියට අපි මේ ක්‍රියාවලියට බලපෑමක් කරන්නේ නැහැ. නීතිය ක්‍රියාත්මක කරන එකයි සිද්ධ වෙන්නේ. නීතියට ක්‍රියාත්මක වෙන්නයි ඉඩ දීලා තිබෙන්නේ. කෙඳිරි ගාන එක අපට නවත්වන්න බැහැ. කෙඳිරි ගැවත් නැතත් නීතිය ක්‍රියාත්මක වෙනවා.

ඊයේ ගරු ජනාධිපතිතුමා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සම්මේලනයක් ආමන්ත්‍රණය කරමින් ප්‍රකාශ කළේත් කාගෙන්වත් පළිගන්න හෝ නිලධාරින්ට එරෙහිව ක්‍රියාත්මක වෙන්න අපට කිසිම අරමුණක් නැහැ කියන එකයි. විශේෂයෙන්ම එතුමා ඒ නිලධාරින්ට කිව්වේ, තමන්ගේ නම පාවිච්චි කරනකොට, තමන්ගේ signature එක යොදනකොට ඒකට මූල්‍යමය වටිනාකමක් දීලා ගනුදෙනු කරමින් ඒක යොදපු අවස්ථාවලදී ඒකට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙනවා කියන එකයි. අපෙන් ජනතාව බලාපොරොත්තු වුණේත්, ජනතාව අපට ජනවරම ලබා දුන්නේත් හොරු අල්ලන්න. දූෂණය, වංචාව නතර කරන්න කියන ඒ විශාල සංවාදය හරහා තමයි අපේ ආණ්ඩුව බලයට එන්නේ. ඒ නිසා අපි ඒක ක්‍රියාත්මක කරමින් යනවා. නීතියට හසු වෙන අය ඒ වැරදි නොකර හිටියා නම් කෙඳිරිගාන්න ඕනෑත් නැහැ.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මහජන ධනය හොරකම් කරපු දේශපාලන නියෝජිතයන් විශාල සංඛ්‍යාවක් අත්අඩංගුවට ගැනීම් සිද්ධ වෙනවා. ව්‍යාජ බෙහෙත් ගෙන්වලා දරුවන් සහ මිනිසුන් මරපු අය ඉන්නවා. දැන් අධිකරණ ක්‍රියාවලිය තුළ ඔවුන්ට කටයුතු කරමින් ඉන්නවා. ඇස් අන්ධ කරපු, ඇස් අන්ධ කිරීම සඳහා බාල බෙහෙත් ගෙන්වපු සෞඛ්‍ය ඇමතිවරු ඉන්නවා. ඒ වාගේම, ඩොලර් මිලියන 6.9ක පොහොර ගෙන්වනවා කියලා පොහොර ඇටයක්වත් අපේ රටට ගෙන්වන්නේ නැතුව පාඩු කරපු ඇමතිවරු ඉන්නවා. ඒ වාගේම තමයි, මහ ගෙදර ඉන්න ආච්චිටත් පාඩුවේ ඉන්න නොදී තමන් අනීතිකව රැස් කරපු ධනය ඒ වයසක මිනිස්සු නමටත් ලියලා අද ඔවුන් ද අසරණ තැනකට ඇදලා දාපු ජනාධිපති පුත්තු අත්අඩංගුවට ගැනීම් අපි දකිනවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනවා. දේශපාලන ක්ෂේත්‍රය තුළ ඉන්න මේ දේශපාලඥයන්ට මෙවැනි මානසික තත්ත්වයක් ඇති වෙන එක අපේ රටට හිතකර තත්ත්වයක් නොවෙයි. ගරු අගමැතිතුමියනි, ඔබතුමිය කලින් මතු කළා, පොදුවේ රටේ වංචාව, දූෂණය කියන එක නතර කිරීම සඳහා යෝජනා කරලා තිබෙන වැඩ පිළිවෙළ. මගේ ගැටලුව මෙයයි. දේශපාලන ක්ෂේත්‍රයේ හිටපු නායකයන් තමයි මේ අතිමහත් වංචා, දූෂණ සඳහා

නායකත්වය දීලා තිබෙන්නේ, මැදිහත් වෙලා තිබෙන්නේ. දේශපාලන ක්ෂේත්‍රය තුළින් මේ දූෂිත මානසිකත්වය ඇති වෙන තත්ත්වය වෙනස් කිරීම සඳහා ඔබතුමිය ගනු ලබන කඩිනම් ක්‍රියාමාර්ග තිබෙනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මම හිතන විධියට ජනතාව ඒ තීන්දුව අරගෙන ඉවරයි. ඒ සංස්කෘතිය දැන් ජනතාව විසින්ම අවසන් කර තිබෙනවා. මම හිතන විධියට ඒ දේශපාලනඥයන්ටත් සිද්ධ වෙනවා, වෙනස් වෙන්න. මොකද, නීතිය ක්‍රියාත්මක වන විධියට ඔවුන්ට ඒකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ තිබුණු සංස්කෘතිය දැන් වෙනස් වෙලා තිබෙනවා. ඒක වෙනස් කළේ, ජනතාව. ඒ වෙනස් කරපු අලුත් දේශපාලන සංස්කෘතිය තුළ තමයි අද අපි ක්‍රියාත්මක වෙන්නේත්, ජනතාව ක්‍රියාත්මක වෙන්නේත්. ඒ පැරණි සංස්කෘතිය නියෝජනය කරන දේශපාලන සම්ප්‍රදායයන් දැන් දුර්වල වෙමින්, නැතිවෙමින් යනවා. ඒකේ අවසාන සලකුණු කිහිපයක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ, ඇහෙන්න තිබෙන්නේ. Dinosaursලා extinct වුණු විධියටම ඒවාත් එහෙම ම අභාවයට යනවා. ඒක තමයි natural order of things. When things become extinct, they disappear; when things become rejected by the people, they will naturally go into extinction. And, that is what we are seeing right now.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අගමැතිතුමියට යොමු කරන මීළඟ ප්‍රශ්නය, ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

වංචාව හා දූෂණය පිළිබඳව මෙන්ම ඒ තුළින් මහජන මුදල් අපතේ යෑම හා අවභාවිත වීම පිළිබඳව සමාජයේ විශාල කතිකාවක් ඇති විය. ඒ අතර සීනි බදු වංචාව, සුදු ලූනු වංචාව, පොල්තෙල් ආනයනයේදී සිදු වූ වංචාව මෙන්ම, මහ බැංකු බැඳුම්කර වංචාව ද කැපී පෙනේ. එබැවින්, එම සිද්ධි සම්බන්ධ පහත සඳහන් ප්‍රශ්නවලට ගරු අගමැතිතුමියගෙන් පිළිතුරු අපේක්ෂා කරමි.

01. මහ බැංකු වංචාව, සුදු ලූනු වංචාව, සීනි බදු වංචාව හා පොල්තෙල් ආනයනයේදී සිදු වූ වංචාවල ප්‍රමාණයෙන් අහිමි වූ මුදල කොපමණ ද?

02. එම සිදුවීම් සම්බන්ධ චෝදනා එල්ල වූ පුද්ගලයන්ගේ හා ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද?

03. එම සිදුවීම් සම්බන්ධව මේ වන විට පැවැත්වෙන පරීක්ෂණවල ප්‍රගතිය කවරේද?

04. එම සිදුවීම් සම්බන්ධව මෙතෙක් ප්‍රශ්න කොට ඇති හා අත්අඩංගුවට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද?

05. ඉදිරියේදී අත්අඩංගුවට ගැනීමට හා ප්‍රශ්න කිරීමට නියමිත පුද්ගලයන් කවරේද?

06. මෙම වංචා අනාවරණ කර ගැනීමට සහ වග කිවයුතු පුද්ගලයන්ට එරෙහිව නීතිය උපරිම වශයෙන් ක්‍රියාත්මක කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

07. අදාළ වංචා මඟින් රටට අහිමි වූ මුදල් එම වග කිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සීනි බදු සම්බන්ධයෙන්, 2020.10.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි තවත් භාණ්ඩ 03ක්, එනම් පරිප්පු, ටින් මාළු, බොම්බයි ලූනු සඳහා පැවැති විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු එවකට පැවැති ජීවන වියදම් ගැටලුවට සහනයක් ලබා දීමේ අරමුණින් එවකට ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියෙන් 2020.10.13 දිනැතිව අංක 2197/12 දරන ගැසට් නිවේදනය ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව සීනි ආනයනය සඳහා එවකට පැවැති කිලෝග්‍රෑමයකට රුපියල් 50ක් වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ශත 25ක් දක්වා අඩු කිරීමට ඉහත ගැසට් නිවේදනය මඟින් කටයුතු කර ඇත. එම ගැසට් නිවේදනය 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ විධිවිධානවලට අනුකූලව 2021 ජනවාරි මස 16 දින පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇත.

02. අමාත්‍යාංශය විසින් ලබා දුන් තොරතුරු අනුව පුද්ගල හා ආයතනවල නම්, ලිපිනයන් ඉදිරිපත් කර නොමැති අතර, එවකට පැවැති රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් සීනිවලට අදාළව බදු අඩු කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයෙන් වාර්තාවක් කැඳවා ඇති අතර, එකී වාර්තාව පදනම් කර ගෙන සීනි බදු අඩු කිරීම පිළිබඳව රජයේ විගණකාධිපති මඟින් විශේෂ විගණන වාර්තාවක් කැඳවා ඇත.

03. ඉහත සඳහන් කළ විගණන වාර්තාවේ අඩංගු කරුණු සම්බන්ධයෙන් 2022 ජූනි මස 21වන දින පාර්ලිමේන්තුවේදී පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණයක් කිරීමට මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට නියෝග කර ඇත.

ඒ අනුව, මේ පිළිබඳ විමර්ශනයක් කිරීම සඳහා 2022 ජූලි මස 12වන දින මුදල් අමාත්‍යාංශය පොලිස්පතිවරයා මඟින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. ඒ පිළිබඳ පරීක්ෂා කර බලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2025 ජනවාරි 02 දිනැතිව නැවතත් මේ පිළිබඳ ව්‍යවහාරික විගණනයක් කිරීමට විගණකාධිපති මඟින් කටයුතු කර දෙන ලෙසද ඉල්ලා ඇත. එම ලිපිය ඇමුණුම 01 ලෙස දක්වා ඇත. මුදල් අමාත්‍යාංශය විසින් ඒ බව විගණකාධිපති වෙත 2025 ජනවාරි 21 දිනැතිව යොමු කර ඇත.

එයට පිළිතුරු ලෙස 2025 මාර්තු 07 දින විගණකාධිපති විසින් මේ පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි තවදුරටත් පුළුල් පරීක්ෂණයක් සිදු කිරීමට නම්, මෙම කරුණට අදාළ පාර්ශ්වකරුවන්ගේ තොරතුරු හා සාක්ෂි ලබා ගැනීමට හැකියාවක් නොමැති බව දැනුම් දී ඇත. එම ලිපිය ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු හරිනි අමරසූරිය]

ඒ බව 2025 මැයි 15 වන දින මුදල් අමාත්‍යාංශය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.

04. ඉහත 03 පිළිතුර අදාළ වේ.

05. ඉහත 03 පිළිතුර අදාළ වේ.

06. ඉහත 03 පිළිතුර අදාළ වේ.

07. ඉහත 03 පිළිතුර අදාළ වේ.

- සීනි බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ ඉහත කරුණුවලට අමතරව, 01වන ප්‍රශ්නයෙන් නඟා ඇති මහ බැංකු වංචාව, සුදු ලූනු වංචාව සහ පොල්තෙල් ආනයනයේදී සිදු වූ වංචාව සම්බන්ධ තොරතුරු අදාළ ආයතනවලින් කැඳවා ඇති අතර, ඊට පිළිතුරු ලබා දීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඉල්ලා ඇති බැවින්, ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන්න පුළුවන්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පිළිතුරු ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, ගරු අගමැතිතුමියනි. ඇත්තටම ඒවා තමයි කලින් මන්ත්‍රීතුමා අහපු අපේ ෆයිල්, ඩබල් කැබ් එක පිටුපස තිබුණු ෆයිල්. සීනි බදු වංචාව පිළිබඳ සිද්ධිය 2025දී කළ ඒ කටයුත්තෙන් ඉවරයි. නැවත සාක්ෂි හොයලා තමයි ඒ සිද්ධිය සම්බන්ධව කටයුතු කරන්න පුළුවන් වන්නේ කියන කාරණයයි කියන්නේ. ඔබතුමියලාගේ ආණ්ඩුව පත් වෙලා කිසිම විමර්ශනයක්, කිසිම අත්අඩංගුවට ගැනීමක්, කිසිම නීතිමය පියවරක් නොගත්තා කියන එක තමයි ඒකෙන් පැහැදිලි වන්නේ. දින වකවානු ගත්තොත්, 2021, 2022, 2023 වාගේ කාල වකවානුවල තමයි ඒ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරලා තිබෙන්නේ. දැන් 2024, 2025දී ඔබතුමියලාගේ ආණ්ඩුව බලයට පත් වුණාම කිසිම පැමිණිල්ලක්, නඩුවක්, විමර්ශනයක් මේ සම්බන්ධව සිදු වෙලා නැහැ. සිදු වූ විමර්ශනයේදීත් සාක්ෂි හොයන්න කියන කාරණය තමයි කියන්නේ.

මගේ ප්‍රශ්නය මෙයයි, ගරු අගමැතිතුමියනි. මහ බැංකු බැඳුම්කර වංචාව, සුදු ලූනු වංචාව, සීනි බදු වංචාව, පොල්තෙල් ආනයන වංචාව කියන්නේ ඔබතුමියලා ආණ්ඩු ගන්න ඒ දවස්වල වේදිකාවල බොහෝ සේ කථා කරපු ප්‍රශ්න. ගරු අගමැතිතුමියනි. ඒ වංචා පිළිබඳව මම කෙටියෙන් මතක් කරන්නම්. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳව දන්නවා, ඒක අදාළ පුද්ගලයන්ට දෙන්න ඕනෑ නිසා දුන්නා කියලා. ගරු අගමැතිතුමියනි, සුදු ලූනු වංචාවේදී සිදු වෙලා තිබෙන්නේ මෙයයි. සතොසේ තිබුණු සුදු ලූනු ටික අඩු මිලට පිටස්තර ව්‍යාපාරිකයෙකුට නිකුත් කළා. ඒ ව්‍යාපාරිකයා ඒවා පිරිසිදු කරලා වෙළෙඳ පොළට වැඩි මිලට විකිණුවා. සතොස ගත්තේත් වැඩි මිලට. ඒ නිසා සතොසට අලාභයක් සිදු වුණා කියන කාරණය තමයි ඔබතුමියලා එදා මතු කළේ. පොල්තෙල් වංචාවත් එහෙමයි; Aflatoxin අඩංගු පොල්තෙල් වෙළෙඳ පොළට ගියා කියලා කිව්වා.

ඒ හා සමානවම මෑත කාලයේ වෙච්ච සිදුවීම් මම උදාහරණ හැටියට ගන්නම්. මහ බැංකු බැඳුම්කර වංචාවට සමාන වංචාවක් තමයි, මෙගාවොට් 50 සුළං විදුලි බලාගාර ටෙන්ඩරය, ගරු අගමැතිතුමියනි. ටෙන්ඩර් මණ්ඩලය සහ ඇගැයීම් මණ්ඩලය මේ ටෙන්ඩරය reject කරනවා, රක්ෂණය නැති නිසා. මම මේ කියන්නේ හොරකමක් පිළිබඳව. ඒක හොරකමක්ද, නැද්ද කියන කාරණය තමයි මම ඔබතුමියගෙන් අහන්නේ. නමුත්, ජනාධිපතිතුමාගේ කැබිනට් අනුමැතියකින් මේක ලබා දෙනවා. එහෙම ලබා දෙන්නේත් එවකට හිටපු රාජපක්ෂවරුන්ගේ සහ රනිල් වික්‍රමසිංහගේ කළු සල්ලි සුදු කළාය කියපු ව්‍යාපාරිකයෙකුට. ඒක හොරකමක් ද කියන එක තමයි පළමුවෙනි කාරණය.

ගරු අගමැතිතුමියනි, ඒ කාරණයටම අදාළ තවත් දෙයක් තිබෙනවා. අපට, රටට පෙනෙන විධියට සුදු ලූනු වංචාව හා සමාන තවත් වංචාවක් තිබෙනවා. එදා සුදු ලූනු අඩු මිලට දීලා, වැඩි මිලට නැවත මිලදී ගත්තා. ඔබේ ආණ්ඩුව ලුණු ආනයනය කළා. තීරු බදු ඇතුළු සියලු බදු මුදල් ගෙවලාත් ලුණු කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 130ක් විතර තමයි වෙන්නේ. හැබැයි, මේ ලුණු ආනයනය කරන්න දුන්නේ වෙනත් ආයතනයකට. වෙනත් ආයතනයකට දීලා මේවා පැකට් කරලා වෙළෙඳ පොළට විකිණුවා. වෙළෙඳ පොළේ රුපියල් 100ට ගන්න තිබුණු ලුණු කිලෝවක් රුපියල් 350 දක්වා වැඩි වුණා. ඒ කාලයේ සිද්ධ වුණු සුදු ලූනු වංචාව හා සමානව තමයි මේකත් අපට පෙනෙන්නේ, හැඟෙන්නේ. ඒ කියන්නේ ආණ්ඩුව ලුණු ගෙනාවා, ඒවා වෙනත් ව්‍යාපාරිකයෙකුට දුන්නා, ඒගොල්ලන් ඒ ලුණු පැකට් කරලා වැඩි මිලකට වෙළෙඳ පොළට විකුණුවා. ඒ අතර තිබෙන ගනුදෙනුව මොකක්ද, ඒ මුදල කාටද ගියේ, කොහොමද ගියේ කියලා තමයි ඉතිහාසයේ තර්ක කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්නකෝ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ප්‍රශ්නය අහන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් විනාඩි 3ක් ගත්තා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
හොරකම ගැන නේ අහන්නේ. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ගැන නොවෙයි මේ අහන්නේ. මේ අහන්නේ වෙනත් කෙනෙක් ගැන. බැඳුම්කර වංචාව ගැන අහන්නේ. ඒ නිසා ගරු අගමැතිතුමියනි, - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුන් මතක තබා ගන්න, අතුරු ප්‍රශ්නයකට විනාඩි-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමාට මුලසුනේ ඉඳගෙන කරන්න තිබෙන්නේ ආණ්ඩුවේ හොරකම් සහ බැඳුම්කර වංචාව වහන එක නොවෙයි, ගරු කථානායකතුමනි. මුලසුන තිබෙන්නේ සාධාරණයක් කරන්න, මේ ප්‍රශ්නවලට. ඒ නිසා මට ප්‍රශ්නය අහන්න අවසරය දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න. විනාඩි 3ක් කාලය කන්නේ නැතිව.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු අගමැතිතුමියනි, සුදු ලූනු වංචාව සමඟ මේ ලුණු වංචාවත් බැඳෙනවා. ඊළඟ කාරණාව මේකයි. ඔබතුමිය කිව්වා, සීනි ආනයනයේදී කිලෝග්‍රෑමයකට පැවති බද්ද ශත 25කට අඩු කිරීමට කටයුතු කර තිබෙනවා කියලා. හැබැයි, ඔබේ ආණ්ඩුව බහලුම් තුන්සිය ගණනක් නිදහස් කළා, නිරීක්ෂණය නොකර. ඒවා ඇතුළේ මොනවාද තිබුණේ කියන කාරණාව පිළිබඳව අද වන විට වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. පසුගිය කාලයේ කරපු වංචා අල්ලා ගන්න කටයුතු කරනවා වාගේම, උදාහරණ සහිතව මා පෙන්වා දුන් වංචා සම්බන්ධයෙනුත් ජාතික ජන බලවේගයේ - NPP එකේ - නායිකාව වන ඔබතුමියගෙන් අපි අහන්නේ මේවාට දඬුවම් දෙන්න පුළුවන් කශේරුකාවකින් යුතුව කටයුතු කරනවාද කියලායි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට මම පිළිතුරු දෙන්නම්. අර hints එක්ක නම් මම engage වෙන්න යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, දූෂණය ගැන කථා කරනකොට, දූෂණ සංස්කෘතියක් තුළ නීතිය උල්ලංඝනය කරමින් හොර වැඩ කරන විධියකුත් තිබෙනවා. නීත්‍යානුකූලව, ඉතාම unethical විධියට, ආචාර ධර්ම පිළිපදින්නේ නැතුව කරන වැඩ කොටසකුත් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒක ගජ මිතුරු සැලකීම කියායි අපි බොහෝ වෙලාවට හඳුන්වන්නේ. විමර්ශනවලින් නිශ්චිත වැරදිකරුවන් කොතැනද, මොන නීතියද උල්ලංඝනය වුණේ කියන එක සොයනවාට වඩා එතැන තිබෙනවා, දූෂණ සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්නයක්. සමහර වෙලාවට නීති වෙනස් කරන්නේ ඒ නීතිය තුළින් loopholes හොයලා දෙනවා, තමන්ගේ ගජ මිතුරන්ට වාසිය ලබා දෙන්න. ඒ වාගේ අවස්ථා පසුගිය කාලය තුළ අපි ඕනෑ තරම් දැක්කා.

ගරු කථානායකතුමනි, මේවාට නීතිය විතරක් ක්‍රියාත්මක කරන එක නොවෙයි කළ යුත්තේ. ඒ සංස්කෘතිය, තමන්ගේ ගජ මිතුරන්ට අවශ්‍ය වෙන ආකාරයට නීති, ප්‍රතිපත්ති හදන එකේ ඉඳන්ම ඒ විධියට බලය තුළින් එක් කණ්ඩායමකට ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් වන විධියේ පාලන ක්‍රමයක් ඇති කිරීම කියන ඒ සියල්ලම වෙනස් විය යුතුයි. ඒක තමයි අපි වෙනස් කරමින් ඉන්නේ. ගරු මන්ත්‍රීතුමා මතු කරපු සමහර කාරණා සම්බන්ධයෙන් විමර්ශන පවත්වාගෙන යනවා. තොරතුරු හොයනවා. මේවා සංකීර්ණයි. මේ මූල්‍ය වංචා පිළිබඳව තොරතුරු සොයන එකත්, වැරදිකරුවන් හරියට නම් කරන එකත් සංකීර්ණ වැඩක්. ඒ විමර්ශන කරගෙන යනවා. නමුත් ඊට වඩා වැදගත් වෙන දේ තමයි ගරු කථානායකතුමනි, නීත්‍යානුකූල විධියට හැබැයි, ආචාර ධාර්මික නොවන විධියට, unethical විධියට දේවල් කරන එක. Conflict of interest කියන ඒවා හෙළිදරව් නොකර ක්‍රියාත්මක වන විධිය අපි නතර කරලා තිබෙන්නේ. අන්න එතැන තමයි අපි දකින විධියට ප්‍රධානම වෙනස සිද්ධ වෙලා තිබෙන්නේ. නීතිය ක්‍රියාත්මක වෙනවා. අවශ්‍ය පරීක්ෂණත් කරගෙන යනවා. එතැන නීති විරෝධී විධියට යම් දෙයක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒවාට විරුද්ධව ක්‍රියාත්මක වෙන්න අනිවාර්යයෙන්ම කොමිෂන් සභාවට බලය තිබෙනවා. ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමියනි, ඔබතුමිය කියන කාරණය ඇත්ත. ඔබ ආණ්ඩුව තුළ ආචාර්යවරු, මහාචාර්යවරු බොහෝ දෙනෙකු ඉන්නවා. මේ සංකීර්ණ ප්‍රශ්න විසඳන්න තමයි ජනතාව ඔබතුමියලාට ඡන්දය දුන්නේ. නමුත්, තවම මේ සංකීර්ණ ප්‍රශ්න හඳුනාගෙන නැහැ කියන කාරණය පිළිබඳව ඇත්තටම අපි කනගාටු වෙනවා. ඒ වාගේම ගරු අගමැතිතුමියනි, ඔබතුමිය සංස්කෘතීන් ගැන කථා කළා. හොඳයි. හොඳ තේමාවක් ඔබතුමිය කිව්වා. ඒ කියන්නේ, හොරුන්ට ආවේණික වෙච්ච සංස්කෘතීන් හරහා හොරු ඔවුන්ට බලය හදා ගත්තා කියන එක.

ගරු අගමැතිතුමියනි, ඔබතුමියගේ ආණ්ඩුවත් යම් සංස්කෘතියක් හදාගෙන තිබෙනවා. දැන් හොරු අල්ලනවා, හොරුන්ට තරාතිරම නොබලා දඬුවම් දෙනවා කියන කාරණය කියනවා. එතකොට එළියේ ඉන්න මිනිස්සු හිතනවා, හොරු අල්ලනවා කියලා. හැබැයි, ඒ සැණින්ම මා කලින් සඳහන් කරපු හොරකම් ටික වැහෙනවා නේද? හොරු අල්ලන නිසා, හොරු කුදලන නිසා දැන් අපට එළියේ ලොකු credit එකක් තිබෙනවා කියලා අපේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා. හැබැයි, හොරු අල්ලන සංස්කෘතිය පෙන්වලා නැවත ඔබේ ආණ්ඩුවේ සමහර,- ඔබතුමිය නොවෙයි. ඔබතුමිය ඒක කවදාවත් කරන්නේ නැති බව මම දන්නවා. මොකද, ඔබතුමිය නිසා තමයි මට නැවත පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වුණේ. එහෙම නැත්නම් මගේ ප්‍රජා අයිතිය අහෝසි වෙනවා. හැබැයි, ඔබතුමියගේ ඔය ගෞරවනීයභාවය පාවිච්චි කරලා ඔය ඉදිරි පෙළේ සිටින කීපදෙනෙක්,- සුදු ලූනු වංචාව සිද්ධ වෙච්ච හා සමානව ලුණු වංචාව සිද්ධ කරයි කියන එකට ඔබතුමිය මට පැහැදිලි උත්තරයක් දුන්නේ නැහැ. හැබැයි, මම ඔප්පු කරලා පෙන්නුවා, ගරු අගමැතිතුමියනි, පසුගිය කාරණා ගැන කියපු ඒවාත් එක්කම මේකත් එක හා සමානයි කියන එක. ඔබතුමියගේ ඔය කියන සද්භාවය සහ ඒ පෙනී හිටීම පාවිච්චි කරලා හොරු අල්ලන මුවාවෙන් නැවත හොරකම් කිරීමට ඔබේ ආණ්ඩුවේ සංස්කෘතියක් තිබෙනවා නේද? මොකද, සුදු ලූනු වංචාව වාගේ ලුණු වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. සීනි බදු වංචාව වාගේ බහලුම් වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම ටෙන්ඩර් මණ්ඩලය අවසර නොදුන් එක, reject කරපු එක කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් ගජ මිතුරන්ට දීලා තිබෙනවා. ඔබතුමිය මේ සංස්කෘතිය හඳුනාගෙන තිබෙනවාද? දැන් සමහරුන්ට අධිකරණවලින් පවා එන්න කියලා තිබෙනවා, පසුගිය කාලයේ කරපු දේවල්වලට. අගමැතිතුමිය හැටියට, මේ ආණ්ඩුවේ නියමුවා හැටියට ඒවාට ගන්න පුළුවන් තීන්දු තරාතිරම් නොබලා ඔබතුමිය ගන්නවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

අනිවාර්යයෙන්ම ඒ තීන්දු ගන්නවා, ගරු කථානායකතුමනි. එවැනි නීති විරෝධී වැඩ කරලා තිබෙනවා නම් සියලුම හොරු අල්ලනවා. ඒ ගැන කිසිම දෙගිඩියාවක් තියා ගන්න ඕනෑ නැහැ. ඒ වාගේම ගරු කථානායකතුමනි, අපි මේ හොරු අල්ලන වැඩේ කරන්නේ මොකක් හරි cover එකක් ලබා ගන්න කියන චෝදනාව නම් මම තරයේ ප්‍රතික්ෂේප කරනවා. එහෙම මොකක් හරි නාඩගමක්, performance එකක් නොවෙයි මෙතැන සිද්ධ වෙන්නේ. ඇත්තටම මේක මේ රට තුළ දූෂණ විරෝධී

[ගරු හරිනි අමරසූරිය]

සංස්කෘතියක් ස්ථාපිත කරන්න ගන්න අවංක උත්සාහයක්. ඒ උත්සාහය තුළත් වැරැදි වැඩ වෙනවා නම් අනිවාර්යයෙන්ම ඒවා පිළිබඳවත් විමර්ශනය කරලා ඒ හොරුත් අල්ලනවා. කවුරුවත් ඒක ගැන කිසිම සැකයක් තියා ගන්න ඕනෑ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ අදාළ පිරිස අල්ලලා තියා ගත්තා නම් හරි නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நான் கௌரவ பிரதம அமைச்சர் அவர்களிடம் பின்வரும் வினாக்களைக் கேட்கின்றேன்.

1. இலங்கையில் சுனாமியால் பாதிக்கப்பட்டவர்களுக்கு வழங்குவதற்காக நிர்மாணிக்கப்பட்ட வீட்டுத்திட்டங்களில் 1,500 மில்லியன் ரூபாய் சவூதி அரேபிய நிதி உதவியுடன், அக்கரைப்பற்று பிரதேச செயலாளர் பிரிவில் சுனாமியால் பாதிக்கப்பட்ட குடும்பங்களுக்கு வழங்குவதற்காக அமைக்கப்பட்ட 500 வீடுகள் மாத்திரம் இன விகிதாசாரத்தின் அடிப்படையில் வழங்கப்பட வேண்டுமென உயர் நீதிமன்றத்தில் தொடரப்பட்ட வழக்கின் அடிப்படையில் கடந்த 20 வருடங்களாக பகிர்ந்தளிக்கப்படாமல் பெருங்காடாக மாறியிருப்பதை அறிவீர்களா?
2. அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுவால் மேற்கொள்ளப்பட்ட மாவட்ட இன விகிதாசார அடிப்படையில் இவ்வீடுகள் பகிர்ந்தளிக்கப்பட வேண்டுமென்ற தீர்மானம் பற்றி சட்டமா அதிபர் மூலமாக உயர் நீதிமன்றத்துக்கு அறியத்தரப்பட்டுள்ளமைக்கு அமைய உயர் நீதிமன்றத்தால் ஏதேனும் தீர்மானங்கள் அல்லது அறிவுறுத்தல்கள் தரப்பட்டுள்ளனவா?
3. பெருங்காடாகி பாழடைந்த நிலையில் காணப்படுகின்ற இவ்வீட்டுத்திட்டத்தை முழுமையாக மீளமைப்பதற்கும் அவற்றுக்கு மேலதிகமாக மேலும் 500 புதிய வீடுகளை வழங்குவதற்குமான உறுதிமொழிகள் அந்நிறுவனத்தால் வழங்கப்பட்டுள்ளமை பற்றி அறிவீர்களா?
4. அக்கரைப்பற்று பிரதேச செயலாளர் பிரிவில் சுனாமி அனர்த்தத்தால் பாதிக்கப்பட்ட 308 குடும்பங்கள் இனங்காணப்பட்டுள்ளமையும், இக்குடும்பங்களுக்கு அவ்வீடுகள் வழங்கப்பட வேண்டுமென சிபாரிசு செய்யப்பட்டுள்ளதையும் அறிவீர்களா?
5. இரு நாடுகளுக்கும் இடையிலான நட்புறவை மேலும் வலுப்படுத்தக்கூடிய வகையில், இந்த விடயம் தொடர்பாக ஆராய்ந்து, பொருத்தமான நடவடிக்கைகளை மேற்கொள்வதற்கு பாராளுமன்றக் குழு ஒன்றை நியமிப்பது பொருத்தமானதென இச்சபைக்கு முன்மொழிவாரா?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. 2004.12.26 දින මෙරටට බලපෑ සුනාමි ව්‍යසනයෙන් නිවාස අහිමි වූ අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාව වෙත බෙදා දීම සඳහා සවුදි අරාබි රාජධානියේ සල්මන් රජුගේ මානුෂීය ආධාර සහ සහන මධ්‍යස්ථානයේ මූල්‍යමය අනුග්‍රහයෙන් අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස 500කින් යුත් නොරොච්චෝල සුනාමි ව්‍යාපෘතිය 2005 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර, 2011 වර්ෂයේදී වැඩ අවසන් කර ශ්‍රී ලංකා රජය වෙත භාර දී ඇත.

   එහෙත්, පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමියන් ඇතුළු පිරිසක් විසින් අම්පාර දීඝවාපිය රජමහා විහාරස්ථානය ආසන්නව මුස්ලිම් ජනතාව පදිංචි කරවීම සිංහල, බෞද්ධ ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩවන බව ප්‍රකාශ කරමින්, 2008.03.31 දින එවකට අම්පාර දිසාපතිවරයා ඇතුළු 12දෙනෙකුට විරුද්ධව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර ඇත. ඒ අනුව ප්‍රතිලාභීන් අතර නිවාස බෙදා දීම අත්හිටුවීමට සිදු විය.

   එම මූලික අයිතිවාසිකම් පෙත්සම සලකා බැලූ ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2009.06.01 දින තීරණය කර ඇත්තේ රජයේ ඉඩම්, මහජනතාව වෙනුවෙන් විධායකය විසින් දරනු ලබන බවත්, එය අන්සතු කළ හැක්කේ නීතියෙන් අවසර දී ඇති පරිදි පමණක් බවත්ය. තවද, ප්‍රතිලාභීන් ලෙස වෙන් කර ඇති කිසිවකු නීත්‍යනුකූල ක්‍රියාවලියකින් තෝරා ගෙන නොමැති බව ශ්‍රේෂ්ඨාධිකරණය නිරීක්ෂණය කර තිබුණි. එමෙන්ම, මෙම නිවාස බෙදා දීම රජයේ ඉඩම්වල භාරකාරිත්වය දරන විධායකය විසින් නියම කර ඇති ඉඩම් බෙදා හැරීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් ජාතික ජන අනුපාතයකට අනුව සිදු කළ යුතු බවත් එහි සඳහන් කර තිබේ. මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව හේතුවෙන් මෙතෙක් එම නිවාස 500 බෙදා දීමට නොහැකි වී ඇත.

2. 2016.01.11 දින අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වන ලද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තීරණය ලබා දී ඇත්තේ, මෙම නිවාස අම්පාර දිස්ත්‍රික්කයේ ජීවත් වන ප්‍රජාවන්ගේ වාර්ගික අනුපාතයට අනුව බෙදා දීම සුදුසු බවය. ඒ අනුව, 2012 වර්ෂයේ පවත්වන ලද ජන හා නිවාස සංගණනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද තොරතුරුවලට අනුව, මෙම දිස්ත්‍රික්කයේ ජනඅනුපාතයට අනුව පහත සඳහන් ආකාරයට මෙම නිවාස 500 බෙදා දීමට ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමැතිය ලැබේ නම් එය සිදු කිරීමට හැකියාව පවතී.

| | ජන වර්ගය | දිස්ත්‍රික් ජන අනුපාතය | නිවාස 500න් නිවාස |
|---|---|---|---|
| 1 | සිංහල | 38.9% | 195 |
| 2 | මුස්ලිම් | 43.4% | 217 |
| 3 | දෙමළ | 17.4% | 87 |
| 4 | වෙනත් | 0.3% | 1 |

මේ පිළිබඳ මීට පෙර නීතිපතිතුමා වෙතින් උපදෙස් විමසන ලදුව ඒ සෑම අවස්ථාවකදීම ලබා දී ඇති උපදේශය වූයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව කටයුතු කරන ලෙසය.

නමුත්, මෙම නොරොච්චෝල නිවාස ව්‍යාපෘතිය සම්බන්ධව නීතිපතිතුමාගේ අංක E/457/2023 හා 2023.12.07 වන දින කැඳවීම් ලිපියට අනුව 2023.12.13 දින පෙ.ව. 9.30ට නීතිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේදී පවත්වන ලද සාකච්ඡාවේදී නීතිපතිතුමා මේ පිළිබඳව දීර්ඝව සලකා බලා ඉහත 2012 ජන හා නිවාස සංගණනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද තොරතුරුවලට අදාළව මෙම දිස්ත්‍රික්කයේ ජන අනුපාතයට අනුව නිවාස බෙදා දීමේ හැකියාව සම්බන්ධව යළි සලකා බැලීමට තීරණය කරන ලදී.

එබැවින්, 2009.06.01 දින ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නඩු තීන්දුවට පටහැනි නොවන පරිදි ඉහත සඳහන් 2012 වර්ෂයේදී පවත්වන ලද ජන හා නිවාස සංගණනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද තොරතුරුවලට අදාළව ඉහත සඳහන් ආකාරයට මෙම දිස්ත්‍රික්කයේ ජන අනුපාතයට අනුව මෙම නිවාස 500 බෙදා දීම සුදුසු බවට නිර්දේශ කර ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට යළි සලකා බැලීම සඳහා ගරු නීතිපතිතුමා වෙත යොමු කර ඇති අතර, මේ සම්බන්ධයෙන් 2025 ජුනි 23 වන දින ගරු විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා, නීතිපති දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ අම්පාර දිස්ත්‍රික් ලේකම් ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් සමඟ රැස්වීමක් පැවැත්විය. ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අපහාසයක් සිදු නොවන ආකාරයෙන් ඉදිරි කටයුතු සැලසුම් කළ යුතු බවත්, මෙම නිවාසවල වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබා දීමට කටයුතු කරන මෙන් අදාළ නිලධාරින් දැනුවත් කරන ලදී. මෙම ගැටලුව නිරාකරණය කර ගන්නා තෙක් දිගින් දිගටම සාකච්ඡා සිදු කෙරෙනු ඇත.

ඒ අනුව, ගරු ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් වසර 20ක කාලයක් ගත වී ඇතත්, මෙතෙක් එම නිවාස බෙදා දීමට නොහැකි වී ඇති අතර, දැනට එම නිවාස භාවිතයට නුසුදුසු තත්ත්වයේ පවතී.

3. මෙම නිවාස අලුත්වැඩියා කිරීම සම්බන්ධව අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයා දැනුවත් කර නොමැති බව දන්වා ඇත.

4. අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම්ගේ අංක AP/PLN/ NRHSC/2/18 හා 2024.04.29 දිනැතිව අම්පාර දිස්ත්‍රික් ලේකම් මඟින් ජනාධිපති ලේකම් අමතන ලද ලිපිය මඟින් සුනාමියෙන් හානියට පත් ප්‍රතිලාභීන්ගේ සංගමය හා සිවිල් සමාජ සංවිධානවලින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම්වලට අනුව අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුනාමියෙන් විපතට පත් වූ පවුල් 308 දෙනා අතර එම නිවාස බෙදා දීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් කර ඇති නමුත්, දිස්ත්‍රික් ලේකම්වරයාට නිවාස ලබා දීමට සුදුසු පුද්ගලයින් හඳුනා ගැනීමට දැනුම් දෙන ලදී. කෙසේ වෙතත්, එය ක්‍රියාත්මක කිරීමට අපහසුතාවක් ඇති බව හඳුනා ගෙන ඇත. ඒ පිළිබඳව නිශ්චිතව තහවුරු කර නොමැත.

5. අධිකරණයට අපහාස කිරීමකින් තොරව නිවාස බෙදා හැරීමට ක්‍රම සහ විධි සොයා ගැනීම සඳහා පාර්ලිමේන්තු කමිටුවක් පත් කළ හැක. අමාත්‍යාංශය විසින් මෙම නිවාස බෙදා දීම සම්බන්ධ වත්මන් තත්ත්වය පිළිබඳව සෞදි අරාබියේ තානාපති කාර්යාලය විවිධ අවස්ථාවලදී දැනුවත් කර ඇත.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, சுதந்திரத்துக்குப் பிறகு பல தடவை பாதிக்கப்பட்ட மக்களுக்கு காணிகள், வீடுகள் வழங்கப்பட்டு இருக்கின்றன. அரசியலமைப்பின் உத்தரவாதச் சட்டவிதிகளுக்கு ஏற்ப சமத்துவ சட்ட ஏற்பாடுகளின் பிரகாரம் எல்லா அரச வளங்களும் சமமாகப் பகிர்ந்தளிக்கப்பட வேண்டும் என்ற அடிப்படையிலேயே இந்த விடயம் தொடர்பில் நீதிமன்றம் தீர்ப்பளித்துள்ளது. ஆனால், கடந்த காலங்களில் இதுபோன்று எங்கேயும் நடக்கவில்லை. நாங்கள் இங்கு சமயத் தலைவர்களை குறை கூறவில்லை. ஒரு கட்சியால் இனவாத அடிப்படையிலேயே இந்த வழக்கு தாக்கல் செய்யப்பட்டு இருக்கிறது. சவூதி அரேபிய அரசாங்கமானது, இலங்கை அரசாங்கத்துக்கு இந்த வீட்டுத் திட்டத்தை சுனாமியால் பாதிக்கப்பட்ட மக்களுக்குத்தான் கொடுக்குமாறு சொல்லியிருக்கிறது. சுனாமியால் பாதிக்கப்பட்ட மக்களுக்குக் கொடுப்பதற்கு வழங்கப்பட்ட இந்த வீட்டுத்திட்டம் தொடர்பில் வழக்குத் தாக்கல் செய்யப்பட்டபோது, சட்டமா அதிபர் திணைக்களம் என்ன விளக்கங்களைக் கூறியதோ தெரியாது! நீதிமன்றம் இவ்விடயம் தொடர்பில் தீர்ப்பொன்றை வழங்கியிருப்பதால், சுனாமியால் பாதிக்கப்பட்ட 308 குடும்பங்களுக்கும் வீடுகளைக் கொடுத்துவிட்டு, மிகுதி வீடுகளை மாவட்ட இன விகிதாசார அடிப்படையில் வழங்குவதுதான் பொருத்தமானதாக இருக்கும். ஏனெனில், இந்த வீட்டுத்திட்டம் சுனாமியால் பாதிக்கப்பட்டவர்களுக்கென வழங்கப்பட்டது.

இந்த வழக்கு இனவாத அடிப்படையிலேயே தாக்கல் செய்யப்பட்டு இருக்கிறது. கடந்த காலங்களில் இனவாதத்துடன் செயற்பட்டவர்களுக்கு மாற்றமாக, நீங்கள் system change என்ற அடிப்படையில் ஆட்சிக்கு வந்திருக்கிறீர்கள். இனவாதத்தால் பாதிக்கப்பட்டு இருக்கின்ற இந்த மக்களுக்கு உரிய தீர்வை நீங்கள் வழங்குவீர்களென நான் நம்புகின்றேன். சட்டமா அதிபரினதும் உங்களுடையதும் முயற்சிகளின் அடிப்படையில், சுனாமியால் பாதிக்கப்பட்ட 308 குடும்பங்களுக்கும் வீடுகளைப் பெற்றுக் கொடுப்பதற்குப் பொருத்தமானதொரு நடவடிக்கையை மேற்கொள்ள வேண்டும். நீங்கள் சொன்னதுபோன்று பாராளுமன்றக் குழுவை நியமித்து அல்லது சட்டமா அதிபர் ஊடாக மீண்டும் எடுக்கப்பட்டு இருக்கும் நடவடிக்கைகளைச் சாதகமாக்கி சுனாமியால் பாதிக்கப்பட்ட 308 குடும்பங்களுக்கும் வீடுகளைக் கொடுத்துவிட்டு, மிகுதியை மாவட்ட இன விகிதாசார அடிப்படையில் வழங்குவதுதான் பொருத்தமானதாக இருக்கும். இது சம்பந்தமாக உங்களுடைய நிலைப்பாடு என்ன? என்பதை அறிய விரும்புகின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක් තිබෙනවා. එම නඩු තීන්දුවෙන් කියා තිබෙන්නේ ජාතික ජන අනුපාතය අනුව එම නිවාස බෙදන්න කියලායි. ඒ අනුව ක්‍රියාත්මක වීමේදී තමයි යෝජනාවක් ඇවිත් තිබෙන්නේ දිස්ත්‍රික් ජන අනුපාතය අනුව බෙදා දෙන්න කියලා. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් ලබා දී තිබෙන නිසා ඒකට අපහාස වෙන විධියේ තීරණයක් අපට ගන්න බැහැ කියන එක තමයි අපට නීතිපති දෙපාර්තමේන්තුවෙන් දන්වා තිබෙන්නේ. මේ නිවාස 500 පිළිබඳ තත්ත්වය ඒකයි. ඒ නිසාම තමයි අපි යෝජනා කරන්නේ අපි පාර්ලිමේන්තුවේ කමිටුවක් තුළත් මේ ගැන සාකච්ඡා කරමු කියලා. අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා දිගින් දිගටම මේ සාකච්ඡාව තුළ ඉන්නවා. මේ පිළිබඳව සුදුසු විසඳුමක් ගැනීමට අපි යෝජනා කරමු. මේ නිවාස 500 කොහොමද බෙදා දෙන්නේ කියන කාරණය සම්බන්ධව සහ අර 308දෙනෙකුගේ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒකටත් අපි වෙනම මැදිහත් වෙලා සාධාරණයක් ඉෂ්ට කරන්න කටයුතු කරනවා. මම හිතන විධියට එසේ මැදිහත්වීමට අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ නිවාස 500 පිළිබඳ කටයුත්තේදී අර ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අනුකූලව තමයි ගරු කථානායකතුමනි, අපට මැදිහත් වෙන්න පුළුවන් වන්නේ.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, இனவாதத்தை எதிர்த்து சமத்துவக் கொள்கையுடன் ஆட்சிபீடம் ஏறிய இந்த அரசாங்கம், குறித்த விடயத்தில் பாதிக்கப்பட்ட 308 குடும்பங்களுக்குரிய வீடுகளைப் பெற்றுக்கொடுப்பதற்கு ஏதோவொரு வகையில் ஏற்பாடுகளைச் செய்ய வேண்டும். நீங்கள் சொன்னதுபோல, நாங்களும் உயர் நீதிமன்றத்தின் தீர்ப்பை ஏற்றுக்கொள்கின்றோம்; நீதித்துறையின் சுயாதீனத் தன்மையைப் பாதுகாக்கின்றோம். எனக்குத் தெரிந்த வகையில், இந்த நாடு சுதந்திரம் பெற்றதன் பின்னர், சரித்திரத்தில் இவ்வாறு நடந்ததில்லை. இவ்வாறு ஒரு தீர்ப்பைப் பெறுவதற்கு நீதிமன்றத்தில் lawyers சட்ட நுணுக்கங்களை முன்வைத்து இருக்கிறார்கள். உங்களுக்கே தெரியும், இது ஓர் இனவாதக் குழுவால் திட்டமிட்டு செய்யப்பட்டது என்று. எனவே, பாதிக்கப்பட்ட மக்களுக்கு நியாயத்தைப் பெற்றுக் கொடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ නිසා තමයි අපි මේ පාර්ලිමේන්තුවේ කමිටුවක් යෝජනා කරලා තිබෙන්නේ, මේ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේත් අදහස් අරගෙන විසඳුමක් ලබා ගන්න. ඒ වාගේම, අපි දිගින් දිගටම මේ ප්‍රශ්නය හොඳින් විසඳන්න උත්සාහ ගන්නවා. ගරු මන්ත්‍රීතුමා මෙතැනදී මතු කරපු අදහස් එක්ක, ඒ කමිටුව ඉතා ඉක්මනින් ස්ථාපිත කරලා, ඒ වැඩ කටයුතු ඉදිරියට ගෙනියනවා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### 2015-2019 කාලය තුළ දේශපාලනඥයින් සහ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව ගොනු කරන ලද නඩු: විස්තර
### 2015 - 2019 வரை அரசியல்வாதிகள் மற்றும் அரச அலுவலர்களுக்கு எதிராகத் தாக்கல் செய்யப்பட்ட வழக்குகள்: விபரம்
### CASES FILED AGAINST, POLITICIANS AND PUBLIC OFFICIALS DURING 2015-2019: DETAILS

633/2025

1. **ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයේදී සිදු වී ඇති වංචා, දූෂණ සහ ඝාතන සම්බන්ධයෙන් දේශපාලකයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව වර්ෂ 2020 සිට 2024 දක්වා කාලය තුළ නීතිපති දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් මේ වන විට නඩු කටයුතු අවසන් වී ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් නඩු අතරින් නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම නඩු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015 முதல் 2019 வரையான காலப்பகுதியில் இடம்பெற்றுள்ள ஊழல், மோசடிகள் மற்றும் படுகொலைகள் தொடர்பில் அரசியல்வாதிகள் மற்றும் அரச அலுவலர்களுக்கு எதிராக சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்தால் 2020-2024 காலப்பகுதியில் தாக்கல் செய்யப்பட்ட வழக்குகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவற்றில், இன்றளவில் நிறைவடைந்துள்ள வழக்கு விசாரணைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) அவ்வழக்குகள் யாவை என்பதையும்;

(iv) மேலே (i)இல் குறிப்பிடப்பட்டுள்ள வழக்குகளில், சட்டத்துறை தலைமையதிபதியால் மீளப்பெறப்பட்ட வழக்குகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(v) அவ்வழக்குகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) the number of cases that have been filed by the Attorney-General's Department against politicians and public officials during the period from 2020 to 2024 in relation to fraud, corruption and homicides committed during the period from 2015 to 2019;

(ii) the number of cases that have been concluded with proceedings by now from among the cases referred to above;

(iii) those cases;

(iv) out of the cases referred to in (i) above, the number of cases that have been withdrawn by the Attorney-General; and

(v) those cases?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) දත්ත නොමැති බැවින් (i) සිට (v) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලබා දිය නොහැකියි.

(ආ) මේ යටතේ එතුමා අහන්නේ වංචා, දූෂණ සහ සාතන යන වර්ගීකරණය යටතේ දේශපාලකයන්ට සහ රාජ්‍ය නිලධාරින්ට පවරපු නඩු ගැනයි. නමුත්, නීතිපති දෙපාර්තමේන්තුව ගොනු තබා ගැනීමේදී පුද්ගලයින්ගේ සමාජ තත්ත්වය, වෘත්තිය හෝ තරාතිරම ඇතුළත් කර ලේඛන පවත්වා ගෙන යන්නේ නැහැ. ඒවා තිබෙන්නේ coded ලෙසයි. එනම්, ප්‍රදේශ අනුව, වර්ගය අනුව වෙන්න පුළුවන්. සමහර විට 'ළමා අපචාර' ආදි නම් යොදා ගන්නවා වෙන්න පුළුවන්. ඒ නිසා මේ ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙන ප්‍රශ්නයට උත්තර දෙන්න, ඒ ආකාරයට දත්ත ගබඩා කරලාත් නැහැ. මොකද, ඒක කරන එක වැරැදි නිසා එසේ කරලා නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නවලට උත්තර දිය නොහැකියි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවා, ගරු කථානායකතුමනි. නීතිපති දෙපාර්තමේන්තුව 2015-2019, 2020-2024 වශයෙන් රාජ්‍ය නිලධාරින්, දේශපාලනඥයන් යනුවෙන් දත්ත වෙන් කරලා නැති වුණත් ඒ කාලය තුළදී පැවරු නඩු ප්‍රමාණය කොයි තරම්ද කියන්න පුළුවන් නේද, ගරු ඇමතිතුමනි?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
එහෙම කියන්න පුළුවන්. කාරණය මේකයි. එය සාමාන්‍යයෙන් නඩු 15,000ක්, 20,000ක් විතර තිබෙන තැනක් නේ. ඒ නිසා ප්‍රශ්නය ඒ විධියට frame කරලා නැවත අහන්න. ඒ කියන්නේ, මේ කාලය තුළ අපරාධ නඩු කීයක් පවරා තිබෙනවාද වාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න පුළුවන්. ඒවා කියන්න බැරිකමක් නැහැ. හැබැයි, ප්‍රශ්නය ඒ විධියට frame කරන්න වෙනවා. එතකොටයි මට ඒකට තොරතුරු අරගෙන එන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, ඒ විධියට අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි,-

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, මට දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අර ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැහැ කියලා කිව්වාම දෙවැනි අතුරු ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
එතුමා උත්තර දෙන්නේ නැති වුණාට මට අහන්න අයිතිය තිබෙනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අහන්න දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඔබතුමා කොහොමද තීන්දු කරන්නේ මම අතුරු ප්‍රශ්නයක් අහනවාද, නැද්ද කියන එක?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැහැ කිව්වාම ඒකෙන් තේරුම් යන්නේ,-

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
එතුමා උත්තර දෙන්නේ නැති එක නේ එතුමාගේ උත්තරේ. නමුත්, මට ප්‍රශ්නයක් අහන්න පුළුවන් නේ. ඕනෑ නම් එතුමාට ඒකටත් උත්තර දෙන්නේ නැතිව ඉන්න පුළුවන්. ඒකට ප්‍රශ්නයක් නැහැ. මට අතුරු ප්‍රශ්නය අහන්න දෙන්නකෝ.

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා දැන් කිව්වා, නැවත ප්‍රශ්නයක් අහන්න කියලා. නැවත ප්‍රශ්නය අහන එක නොවෙයි, ඔබතුමා අද උත්තර දෙන්න ලැහැස්ති වෙලා ආ ආපු ප්‍රශ්නයට අදාළව රාජ්‍ය නිලධාරින්, දේශපාලනඥයන් කියලා වර්ග කරන්නේ නැතිව නීතිපති දෙපාර්තමේන්තුව ඔබතුමාට සමස්ත නඩු ප්‍රමාණයවත් දුන්නේ නැද්ද, උත්තරයක් හැටියට?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
නැහැ. මොකද, ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නවලට තමයි මම උත්තර කැඳෙව්වේ. මේ තිබෙන්නේ වර්ගීකරණය කරලා විශේෂිත ලෙස අහපු ප්‍රශ්නයක්. මේ කාලය තුළ ඒවා කොච්චරද කියලා මගෙන් අහලා එච්චා නම්, මට ඒකට උත්තර දෙන්න පුළුවන්. මම ඒ තොරතුරු කැඳෙව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අවශ්‍ය නම් නැවත ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. මම ඒ ආකාරයට උත්තර දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද දින ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන නිසා පහත කරුණු ඉදිරිපත් කරන්නයි මා මෙම අවස්ථාව යොදා ගන්නේ.

2025 ජූලි මස 11, 15 සහ 17 යන දිනයන්හිදී රැස්වූ යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවිධ පාර්ශ්ව ගණනාවකගේ අදහස් විමසීමෙන් අනතුරුව එකී වාර්තාව 2025 ජූලි මස 22වැනි දින මේ සභාවට ඉදිරිපත් කරන ලදී. එහිදී කරුණු කිහිපයක් සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ එකඟතාව ලබා ගන්නා ලෙස අප විසින් විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දෙන ලදී. එහිදී, සීමාසහිත එල්.ටී.එල්. හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම - LTL Holdings (Pvt.) Limited - සතු කොටස් අවශේෂ සමාගමක් වෙත පැවරීමට කාරක සභාව විසින් එකඟ වුවද, ඒ සඳහා නීතිපති අනුමැතිය නොලැබුණු බැවින් එම වගන්තියට සංශෝධන රහිතව ඉදිරිපත් කරනු ලැබූ වගන්ති සඳහා කාරක සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලද පාරිභෝගික ආරක්ෂාවට අදාළ කරුණු පිළිබඳවද නීතිපතිවරයාගේ මත විමසීමෙන් අනතුරුව අදාළ සංශෝධන සිදු කරනු ලැබූ බව බලශක්ති අමාත්‍යාංශය විසින් දැනුම් දෙන ලද අතර, ඒ සඳහාද කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

සමාගම් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබූ වගන්ති එක් වගන්තියකට සම්පිණ්ඩනය කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලැබූ වගන්තිය සම්බන්ධයෙන්ද කාරක සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන ලද සම්ප්‍රේෂණ වත්කම්වල හිමිකාරිත්වය සඳහා කාල නිර්ණයක් අවශ්‍ය බවට වූ යෝජනාව ඇතුළත් කොට නොමැතිව මුල් පනතේ පැවැති ආකාරයෙන්ම එම වගන්තිය පවතින බව දැනුම් දුන් බැවින් ඒ සඳහාද අනුමැතිය ලබා දෙන ලදී.

නීතිපතිවරයාගේ මත විමසුම අනුව අදාළ සංශෝධන සිදු කිරීමට කාරක සභාව විසින් දෙනු ලැබූ තීරණය අනුව ක්‍රියාත්මක වෙමින් අදාළ සංශෝධන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ බවත්, ඉහත දින තුනේදීම පැවැති රැස්වීම්වලදී සාකච්ඡා කළ කරුණුවලට අමතර කිසිදු කරුණක් මෙම කැබිනට් පත්‍රිකාවේ ඇතුළත් කොට නොමැති බවත් 2025 අගෝස්තු 05වන දින පැවැති කාරක සභා රැස්වීමේදී තහවුරු කරන ලදී.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

## ශ්‍රී ලංකා රේගුව: පරීක්ෂාවකින් තොරව බහලුම් නිදහස් කිරීම
## இலங்கைச் சுங்கம்: சோதனையின்றி கொள்கலன்களை விடுவித்தல்
## SRI LANKA CUSTOMS: RELEASE OF CONTAINERS WITHOUT INSPECTION

639/2025

**2. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ආනයනික බහලුම් නිදහස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ඇති වූ විශාල තදබදයට පිළියම් නිර්දේශ කිරීම පිණිස පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් පිහිටුවීමට ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කරන ලද බව දන්නේද;

(ii) එම කමිටුවට ඇතුළත්වූ නිලධාරින්ගේ නම්, ඔවුන්ගේ තනතුරු නාම සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත කමිටුවේ නිර්දේශ මත පරීක්ෂාවකින් තොරව නිදහස් කරන ලද බහලුම් සංඛ්‍යාව කොපමණද;

(iv) පරීක්ෂාවකින් තොරව බහලුම් නිදහස් කිරීමේදී ශ්‍රී ලංකා රේගුව විසින් සලකා බලන නිර්ණායක කවරේද;

(v) ශ්‍රී ලංකා රේගුව විසින් පරීක්ෂාවෙන් තොරව බහලුම් නිදහස් කිරීම විශාල අවදානමක් බව පිළිගන්නේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i ) இறக்குமதி செய்யப்பட்ட கொள்கலன்களை விடுவிப்பதில் ஏற்பட்ட தாமதத்தின் காரணமாக ஏற்பட்ட பெரும் நெரிசலுக்குத் தீர்வாக, அனுபவம் வாய்ந்த சிரேஷ்ட அலுவலர்களைக் கொண்ட ஒரு விசாரணைக் குழுவை அமைக்க இலங்கைச் சுங்கம் நடவடிக்கை எடுத்துள்ளதை அறிவாரா என்பதையும்;

( ii ) அந்தக் குழுவில் உள்ளடக்கப்பட்ட அலுவலர்களின் பெயர்கள், அவர்களின் பதவிப் பெயர்கள் மற்றும் முகவரிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி குழுவின் பரிந்துரைகளின் அடிப்படையில் சோதனையிடாமல் விடுவிக்கப்பட்ட கொள்கலன்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) இலங்கைச் சுங்கமானது சோதனையின்றி கொள்கலன்களை விடுவிக்கும்போது கவனத்திற்கொள்ளும் அளவுகோல்கள் யாவை என்பதையும்;

(v) இலங்கைச் சுங்கமானது சோதனையின்றி கொள்கலன்களை விடுவிப்பது பாரியதோர் ஆபத்து என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(vi) அவ்வாறெனில், அது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policies:

(a) Will he inform this House-

(i) whether he is aware that the Sri Lanka Customs has taken steps to establish a Committee of Inquiry consisting of experienced senior officers to recommend remedies to the port congestion caused by the delay in the release of imported containers;

(ii) the names, designations and addresses of the officers who were included in the Committee concerned, separately;

(iii) the number of containers that have been released without inspection, on the recommendations of the above Committee;

(iv) the criteria taken into consideration by the Sri Lanka Customs in releasing containers without inspection;

(v) whether he accepts that the release of containers without inspection by the Sri Lanka Customs poses a serious risk; and

(vi) if so, the measures that will be taken in that regard?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ආනයනික බහලුම් නිදහස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ඇති වූ තදබදයට පිළියම් නිර්දේශ කිරීම සඳහා නොව, පරිගණක පද්ධතිය මඟින් ස්වයංක්‍රියව භෞතික පරීක්ෂාව සඳහා තේරුණු, එහෙත් භෞතික පරීක්ෂාවෙන් බැහැරව වෙනත් නිර්ණායක මත නිදහස් කිරීමට හැකි, අවදානම අවම වූ බහලුම් තෝරා ඒවා නිදහස් කිරීම සලකා බැලීම සඳහා කමිටුවක්, - Steering Committee- පත් කිරීමට ශ්‍රී ලංකා රේගුව 2024.07.23වන දින කටයුතු කළ බව දනිමි.

(ii) මූලිකවම අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා) එස්.පී. අරුක්ගොඩ මහතාගේ අධීක්ෂණය යටතේ එල්.කේ.එච්.ඩී.කේ. ආරේවත්ත මහතා (ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ), ජී.එම්.බී. ගජනායක මහතා (ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ) සහ එස්.ඒ.ටී.බී. සූරවීර මහතා (රේගු අධ්‍යක්ෂ) යන නිලධාරීන් මෙම කමිටුවට පත් කළ අතර, ජී.එම්.බී. ගජනායක මහතා විශ්‍රාම යෑම මත එම්.කේ.එස්.පී. ජයවර්ධන මහතා (ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂ) පසුව පත් කර ඇත.

(iii) 2024.07.23වන දින පත් කරන ලද කමිටුව, බහලුම් තදබදය කළමනාකරණය කරගත නොහැකි අවස්ථාවලදී අවශ්‍යතාව පරිදි විටින් විට රැස් වූ අතර, 2025.01.18 දින දක්වා කාලය තුළ එවැනි අවස්ථා 14කදී රැස් වී ඔවුනට ලබා දුන් නිර්ණායකවලට අනුකූලව අවදානම අවම බවට තෝරා ගත් ආනයන බහලුම් 2,527ක් නිදහස් කිරීමට කමිටුව තීරණය කර තිබෙනවා.

(iv) කමිටුව විසින් ඔවුන්ගේ විෂය පරිචය හා පළපුරුද්ද පදනම් කරගෙන ආනයන සටහන්කරය හා අදාළ ආනයන ලියවිලි පරීක්ෂා කර පහත කරුණු පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු බහලුම් භෞතික පරීක්ෂාවකින් තොරව නිදහස් කරනවා. ඒ අනුව,

1. දිගු කාමරයේ - long room එකේ - ආනයන සටහන්කර සම්මත කිරීමේ ක්‍රියාවලිය අවසාන කර තිබීම
2. මිල පිරික්සුම් අංශය වෙත යොමු වී ඇති ආනයනවල ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අවසන් කර තිබීම
3. රේගුවේ නීති බලාත්මක කරන අංශ විසින් වැඩිදුර පරීක්ෂාව සඳහා තෝරා ගෙන නොමැති වීම
4. අදාළ බහලුම්වල නීති විරෝධී ද්‍රව්‍ය ඇති බවට බුද්ධි තොරතුරු ලැබී නොතිබීම
5. ගෙවිය යුතු සියලු බදු මුදල් ගෙවා තිබීම

කියන කාරණා සලකා බලනවා.

ඒ කාරණාවලටත් අමතරව නිදහස් කිරීමට බහලුම් තෝරා ගැනීම සඳහා පහත නිර්ණායක කෙරෙහි ද අවධානය යොමු කර තිබෙනවා.

I. ආනයන ලියවිලිවල අදාළ භාණ්ඩ, සාම්පල හෝ පිරිවිතර පරීක්ෂාවකින් තොරව නිශ්චිතව හඳුනා ගැනීමට අවශ්‍ය විස්තර සපයා තිබීම

II. ආනයනකරුවන් කිහිප දෙනෙකුට අයත් භාණ්ඩ එකට -එකම කන්ටේනරයේ- අසුරා නොතිබීම

III. ආනයන සටහන්කරයේ භාණ්ඩ වර්ග 7 ඉක්මවා නොතිබීම

IV. බහලුම් පරිලෝකන පද්ධතිය හරහා ස්කෑන් කිරීම

V. කමිටුවට සුදුසු යැයි හැඟෙන වෙනත් කරුණු ද සලකා බැලීම

(v) ශ්‍රී ලංකා රේගුව විසින් භෞතික පරීක්ෂා කිරීමකින් තොරව බහලුම් නිදහස් නොකරන අතර, පරීක්ෂා කිරීම සඳහා විවිධ ක්‍රමවේද අනුගමනය කරනු ලබනවා. එහිදී අවදානම තක්සේරු කිරීමෙන් අනතුරුව එය අවම වන ආකාරයට අදාළ නිදහස් කිරීම් සිදු කරනු ලබනවා.

(vi) අදාළ නොවේ.

(ආ) පනතේ ඇති ප්‍රතිපාදනයන්ට අමතරව, 2025.01.18 දින නිදහස් කරන ලද බහලුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව

[ගරු අනිල් ජයන්ත මහතා]

විසින් පශ්චාත් නිෂ්කාසන විගණනයක් දැනටමත් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරමින් තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෑතකදී සිද්ධ වෙච්ච භයානකම ජාවාරම හැටියට තමයි මෙය සලකන්නේ. මේ සම්බන්ධව සමාජයේ කතිකාව වී තිබෙන්නේ එයයි. මේකට අදාළ විෂය භාර අමාත්‍යතුමා හැටියට ගරු ජනාධිපතිතුමා කමිටුවක් පත් කරලා කමිටු වාර්තාවකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කමිටු වාර්තාවේ විශේෂයෙන්ම සඳහන් කරලා තිබෙනවා, රතු කන්ටේනර් සම්බන්ධයෙන්. ඒවා අභ්‍යන්තරයේ තිබිච්ච දේවල් සම්බන්ධව විශාල ගැටලුවක් තිබෙනවා, ඒක නිවැරදි කරලා නැහැ කියලා මේකේ සඳහන් වෙලා තිබෙනවා සම්පූර්ණයෙන්ම. අපේ අර්චුනා මන්ත්‍රීතුමා කිව්වා, එල්ටීටීඊ සංවිධානයේ ආයුධ ආවා කියලා මේ කන්ටේනර්වල. දැන් මේක බරපතළ ප්‍රශ්නයක්. ආණ්ඩුවටත් බරපතළ ප්‍රශ්නයක්. එතුමා එහෙම කථාවක් කිව්වා නේ. එහෙම ඒවා මේවා ඇතුළේ ඇවිල්ලා තිබෙනවා කියලා එතුමාට දැනගන්න ලැබුණු කථාවක් කිව්වා නේ. මේ ප්‍රශ්නය ආවාට ගියාට අතහැරලා මෙහෙම උත්තර දීලා විතරක් ඉන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, එළියට ගිය භාණ්ඩ සම්බන්ධ යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම් වගකීම භාරගන්නවා කියලා. ඒ වාගේම, වෘත්තීය සමිතිත් කිව්වා මේක වැරදියි කියලා. මේ කමිටු වාර්තාවේත් කියනවා, මේ ක්‍රමය වැරදියි කියලා. මේ රතු කන්ටේනර් සම්බන්ධව ගත්ත තීන්දුව මොකක්ද? විශේෂයෙන්ම විමර්ශනයකට අමතරව අභ්‍යන්තරව ගන්න පුළුවන් තීන්දු තීරණ. ගරු ඇමතිතුමනි, මට ඔබතුමා කියන්න අද වෙනකොට විශේෂයෙන්ම මේ කමිටු වාර්තාව සම්බන්ධව අරගෙන තිබෙන තීන්දුව මොකක්ද කියලා. එක පැත්තකින් මේක ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අවශ්‍ය නැහැ. මොකද, මේක අමාත්‍යතුමා ඉල්ලපු වාර්තාවක් නිසා. හැබැයි අද පැන නැඟිලා තිබෙන මේ ප්‍රශ්නය අනුව හරි නම් ආණ්ඩුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි, මේ වාර්තාව. ඉදිරිපත් කරලා මේක සාකච්ඡාවට ගන්න ඕනෑ. හැබැයි, මේක විපක්ෂයෙන් තමයි ඉදිරිපත් කළේ. දැන් ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. ආණ්ඩුව ඒ වාර්තාව ඉදිරිපත් කළේත් නැහැ, ඒ ගැන හරි පිළිතුරක් දීලාත් නැහැ. ඒ නිසා මේ රතු කන්ටේනර් අස්සේ තිබිච්ච භාණ්ඩ පිළිබඳ ලැයිස්තුවක් අපට ලබාදෙන්න ඔබතුමා සූදානම්ද, මේ කන්ටේනර් ගෙනාපු ආයතන ටික සහ මේ කන්ටේනර්වල අඩංගු භාණ්ඩ වර්ග මොනවාද කියන කරුණු මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සභාගත කරන්න පුළුවන්ද කියන එක මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහනවා, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ පළමු අතුරු ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

මේ බහලුම් නිදහස් කිරීමේ ක්‍රමය අනුව කමිටුව රැස් වූ වාර ගණන මගේ පිළිතුරේත් සඳහන් කළ පරිදි කලින් අවස්ථා 13යි. මේ අවස්ථාවත් එක්ක අවස්ථා 14යි. ඒ තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වාගේම, මේ දීලා තිබෙන වාර්තාව අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව සඳහන් කළා. ඒ විධියට තදබදයක් එනකොට බහලුම් නිදහස් කිරීමේ ක්‍රමය සඳහා අවදානම් කළමනාකරණය කිරීමේ කමිටුවක් තමයි රේගුව පත් කරලා තිබෙන්නේ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේ සමාජ මාධ්‍ය හා එළියේ කථාවක් නිර්මාණය වුණා, විවිධ විවිධ දේවල් මේවායේ අඩංගුයි කියලා. ඒ නිසාවෙන්ම වෙනම ම කමිටුවක් පත් කළා, මේ පිළිබඳ පරීක්ෂා කරන්න. ඒ වාර්තාව තමයි භාණ්ඩාගාර ලේකම්තුමාට බාර දීලා තිබෙන්නේ. ඒ වාර්තාව අපි ඉදිරියේදී ඉදිරිපත් කරනවා. ඒ සියලු කන්ටේනර්වල නම් ගම් සහ විස්තර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව දැනටමත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද මේ පිළිබඳ විමර්ශනයක් සිදු කර තිබෙනවා. අභ්‍යන්තර විගණනයක් ද සිදු වෙමින් පවතිනවා. ඒ තොරතුරුත් අපි ඉදිරියේදී ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙම සිද්ධියෙන් පසුවත් මේ වාගේ කිසිම පරීක්ෂාවකින් තොරව ලුණු කන්ටේනර් 6ක් වරායෙන් එළියට ආවා කියලා වාර්තා වුණා. එතකොට දැන් ප්‍රශ්න කිහිපයක් ඇති වෙනවා. එක පැත්තකින් අන්තරායකර භාණ්ඩ, විනාශකාරී භාණ්ඩ උපයෝගි කර ගනිමින්, ආයුධ අරගෙන විශේෂයෙන්ම අද පාතාලය රජ කරනවා. මේ සියල්ලටම බලපාන කාරණයක් වෙනුවෙන් තමයි මේ සියලුදෙනාම එළියේ කථා කරන්නේ. මේ සම්බන්ධව අවශ්‍ය තීන්දු තීරණ ගන්නවා වාගේම, විශේෂයෙන්ම රජයට අය විය යුතු බදු මුදල් සම්බන්ධවත් මේක ඇතුළේ විශාල ගැටලුවක් තිබෙනවා. එතකොට මේ ලුණු කන්ටේනර් ටික එළියට ආවේ කොහොමද? ඒක සිද්ධ වුණේ කොයි ආකාරයෙන් ද? යම් වරදක් වෙලා කියලා, යම් ප්‍රශ්නයක් වෙලා කියලා ඒක සමස්ත රට තුළම කථා වුණාට පස්සේ, ඒ ගැන කමිටුවක් දාලා ඔබතුමන්ලා ඒකෙන් වාර්තාවක් ගත්තාට පස්සේත් නැවත වතාවක් ලුණු කන්ටේනර් 6ක් එළියට එනවා නම්, එතැන තිබෙන සම්බන්ධතාව සහ එතැන තිබෙන ජාවාරම මොකක්ද? මෙන්න මේ පිළිබඳව ඔබතුමා ලබාදෙන පිළිතුර මොකක්ද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, මේ අසා තිබෙන මුල් ප්‍රශ්නයෙන් ලුණු කන්ටේනර් සම්බන්ධයෙන් විමසීමක් කරලා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ලුණු කන්ටේනර් සම්බන්ධ ප්‍රශ්නය නිශ්චිතව ඉදිරිපත් කරනවා නම්, මට පුළුවන් එයටත් පිළිතුරක් ඉදිරිපත් කරන්න. ලුණු විතරක් නොවෙයි, විවිධ වූ භාණ්ඩ සම්බන්ධ කන්ටේනර් නිදහස් කිරීමේදී යම් යම් ගැටලු පැන නඟිනවා නම්, ඒකට අදාළ බලඅධිකාරිය තමයි රේගු දෙපාර්තමේන්තුව. ඔවුන් ඒ කටයුතු සිද්ධ කරනවා. ගරු මන්ත්‍රීතුමාට ලුණු කන්ටේනර් සම්බන්ධයෙන් දැනගැනීමට අවශ්‍ය නම් ප්‍රශ්නයක් විධියට නිශ්චිතව ඒක ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත්, මේ ප්‍රශ්නයේදී එම ලුණු කන්ටේනර් ප්‍රශ්නය අදාළ වෙන්නේ නැහැ.

## 2025.02.10 දින දිවයින පුරා විදුලිය විසන්ධි වීම: හේතු

2025.02.10ஆம் திகதி இடம்பெற்ற நாடு தழுவிய மின் துண்டிப்பு: காரணங்கள்

ISLANDWIDE POWER CUT ON 10.02.2025: REASONS

653/2025

**3. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025.02.10 වැනි දින සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි විදුලිය විසන්ධි කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය තීරණය කරන ලද බව දන්නේද;

(ii) එවැනි තීරණයක් ගැනීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(iii) විදුලිය විසන්ධි නොකර අඛණ්ඩ විදුලි සැපයුමක් ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) இலங்கை மின்சார சபை 2025.02.10ஆம் திகதி நாடு தழுவிய மின் துண்டிப்புக்கான தீர்மானத்தை மேற்கொண்டிருந்ததை அறிவாரா என்பதையும்;

(ii) அத்தகைய தீர்மானமொன்றை மேற்கொள்வதற்குச் செல்வாக்குச் செலுத்திய காரணிகள் யாவை என்பதையும்;

(iii) மின் துண்டிப்பை மேற்கொள்ளாது, தொடர்ச்சியாக மின்சாரத்தை வழங்குவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether he is aware that the Ceylon Electricity Board had decided to impose an islandwide power cut in Sri Lanka on 10.02.2025;

(ii) the reasons for such a decision; and

(iii) the measures that will be taken to provide continuous power supply without interruption?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. 2025 පෙබරවාරි 10 වන දින මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව දිවයින පුරා විදුලි ඉල්ලුම කළමනාකරණය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කරන ලදී. විදුලි ඉල්ලුම කළමනාකරණ සටහන පහතින් දක්වා ඇත. පැය 15.30ත්, පැය 22.00ත් අතර කාලය තුළ පාරිභෝගිකයෙකුට උපරිම පැය එකහමාරක කාලයක් සඳහා විදුලි ඉල්ලුම කළමනාකරණ වාර සේවා සැපයුම් පදනමක් මත - rotational basis - සිදු කරන ලදී.

| Electricity Supply disconnection Time (විදුලි සැපයුම විසන්ධි කරන වේලාව) | Electricity Supply Restoration Time (විදුලි සැපයුම යථා තත්ත්වයට පත් වන වේලාව) | Duration (කාල සීමාව) | Group (කාණ්ඩය) |
|---|---|---|---|
| Between 03:30 p.m & 04:00 p.m ප.ව. 3.30ත්, ප.ව. 4.00 අතර | Between 05:00 p.m & 05:30 p.m ප.ව. 5.00ත්, ප.ව. 5.30 අතර | 1hr 30 min | A,B,C,D |
| Between 05:00 p.m & 05:30 p.m ප.ව. 5.00ත්, ප.ව. 5.30 අතර | Between 06:30 p.m & 07:00 p.m ප.ව. 6.30ත්, ප.ව. 7.00 අතර | 1hr 30 min | E,F,G,H,U,V |
| Between 06:30 p.m & 07:00 p.m ප.ව. 6.30ත්, ප.ව. 7.00 අතර | Between 08:00 p.m & 08:30 p.m ප.ව. 8.00ත්, ප.ව. 8.30 අතර | 1hr 30 min | I,J,K.L,P,Q |
| Between 08:00 p.m & 08:30 p.m ප.ව. 8.00ත්, ප.ව. 8.30 අතර | Between 09:30 p.m & 10:00 p.m ප.ව. 9.30ත්, ප.ව. 10.00 අතර | 1hr 30 min | R,S,T,W |

(ii) එසේ ඉල්ලුම් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවක් ඇති වූයේ 2025.02.09 දින සිදු වූ සමස්ත විදුලි පද්ධති බිඳ වැටීම අතරතුර ලක්විජය බලාගාරයේ සිදුවූ ප්‍රාචීර - diaphragms - හානිය නිසා එහි ජනන ඒකක තුනම විදුලි පද්ධතියට ලබා ගත නොහැකි වීම හේතුවෙන්, උත්පාදන ධාරිතාවෙහි හිඟයක් ඇති වූ බැවිනි.

කෙසේ වෙතත්, 810 MW එළදායී බලාගාර ධාරිතාවක් සහිත ලක්විජය බලාගාරයේ ඒකක තුනම ලබා ගත නොහැකි වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉල්ලීම මත මෙම කාලය තුළ තාවකාලිකව ලබා ගත හැකි වූ සොබාදනව් බලාගාරය ඇතුළු අනෙකුත් විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීමෙන් ඉල්ලුම් කළමනාකරණ අවශ්‍යතාව 250 MW දක්වා අඩුකර ගැනීමට හැකි විය.

(iii) ලක්විජය බලාගාරයේ ඒකකවල ප්‍රාචීරවල අක්‍රියතාව හේතුවෙන් දිගු වේලාවක් බලාගාර පද්ධතියට ලබාගත නොහැකි වීම මඟහරවා ගැනීම පිණිස එසේ සම්පූර්ණ පද්ධති බිඳ වැටීම අතරතුර ඇති විය හැකි ප්‍රාචීර අක්‍රියතාව සහ බොයිලේරු ජලාපවහනය අවම කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත.

ඊට අමතරව දහවල් කාලයේදී ඇති වන පද්ධති අසමතුලිතතාව හෝ සමතුලිතතා අවදානම

[ගරු කුමාර ජයකොඩි මහතා]

කළමනාකරණයට අදාළ සැපයුම් ගිවිසුමට අනුකූලව මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබ ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, මේ රටේ පැවැත්මට සහ ජන ජීවිතයට විදුලි බලය සහ බලශක්තිය ඉතාම වැදගත්. එසේ වුවත්, මේ වසරේ දිනෙක අපේ ජාතික විදුලි බල පද්ධතිය බිඳ වැටෙනවා. පැය 24කට ආසන්න කාලයක blackout එකක් වුණා. ගරු ඇමතිතුමනි, එහිදී ඔබතුමා මාධ්‍යයට ප්‍රකාශ කළා, රිළවෙක්, එහෙම නැත්නම් වඳුරෙක් හේතුවෙන් තමයි ඒ blackout එක වුණේ කියලා. ඊට පස්සේ ඔබතුමා පරීක්ෂණ කමිටුවක් පත් කළා. ඒ පරීක්ෂණ කමිටුවේදීත් ප්‍රකාශ වෙනවා, සංඛ්‍යාත පාලනය කරන වික්ටෝරියා ජනන යන්ත්‍රයේ කළමනාකරණ පද්ධතියේ සිදු වෙච්ච අක්‍රමිකතාවක් නිසා තමයි ඒ blackout එක වුණේ කියලා. එතකොට ඒ පරීක්ෂණ කමිටුවෙන් යම් නිර්දේශ ලබා දීලා ඇති. අපි කැමැතියි දැන ගන්න, ඒ නිර්දේශ මොනවාද, ඒ නිර්දේශ ඔබතුමා ක්‍රියාත්මක කරලා තිබෙනවාද, එහෙම නැත්නම් ඔබතුමා අර කියපු ආකාරයට ඇත්තටම රිළවෙක් හෝ වඳුරෙක් නිසා ඒ blackout එක වුණාද කියලා. තවමත් ඔබතුමන්ලා විශ්වාස කරන්නේ ඒකද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ඇත්තටම මූලිකම හේතුව තමයි, සීමාකාරී අවස්ථාවේ තිබුණු විදුලි පද්ධතිය මූලිකව අසමතුලිත වීම නිසා එහි සංඛ්‍යාතය - වික්ටෝරියා බලාගාරය කියන්නේ සංඛ්‍යාතය control කරන බලාගාරයක් - හර්ට්ස් 50ට වඩා ගොඩක් අඩු වුණාම හෝ වැඩි වුණාම ඒවා system එකෙන් off වන එක. එහෙම වෙන්න තමයි ඒක හදලා තිබෙන්නේ. මොකද, සංඛ්‍යාතය හර්ට්ස් 50ට කිට්ටු නැත්නම් බල්බ් එකක්වත් පත්තු වෙන්නේ නැහැ. පද්ධතියේ ආරක්ෂාව සඳහා තමයි ඒවා තිබෙන්නේ. Inverter එකක් ගත්තත් ඒකේ range එකක් තිබෙනවා. ඒ කියන්නේ මේ පද්ධතිය පහළට වැටිලා frequency එක දිගටම drop වීම තමයි blackout එකට හේතුව. ඒක තමයි මූලික හේතුව. මූලික හේතුව ඒක වුණාට, ඒකට අදාළව වාර්තාවේ තිබෙන ගොඩක් දේවල්, ඒ කියන්නේ ක්ෂණිකව කරන්න පුළුවන් දේවල් අපි ක්‍රියාත්මක කරගෙන යනවා. මෙහිදී එක කාරණයක් තමයි, මේවා ලක්විජය බලාගාරය පටන් ගත්ත දවසේ ඉඳලා කරන්න තිබුණු දේවල් වුණත්, ඒවා කර නොතිබීම. ඒ කියන්නේ, එක් වරම diaphragms තුනම off වන මට්ටමක් තමයි එදා ඉඳලාම තිබුණේ. අපි ඒ සඳහා අවශ්‍ය precautions අනුව, ඒක soft විධියට නවත්වාගන්න කටයුතු කළොත්, අඩුම ගණනේ අපට ඒක පැය 24ක් ඇතුළත නැවත ආරම්භ කරන්න පුළුවන්. නැත්නම් මේ සඳහා දවස් 4ක් ගතවෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම යොදාගෙන යනවා. ඒ සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන විධියට කළ යුතු දේවල් තිබෙනවා.

ඒ වාගේම පද්ධති කළමනාකරණය ගත්තොත්, විශේෂයෙන්ම හිරු එළිය වැඩි දවස්වල පාලනයකින් තොරව ලැබෙන ධාරිතාවක් තිබෙනවා. ඒ කියන්නේ අපට දකින්න බැහැ, ඒක කොච්චර එනවාද කියලා. ඒක System Control Centre එකට පෙනෙන්නේ නැහැ. ඒ, මේක හැදිලා තිබෙන හැටි. අපි දැන් ඒවා නිවැරදි කරගෙන යනවා. ඒ වාගේම ඉදිරියේදී අවශ්‍ය developments කරන්නත් කටයුතු කරගෙන යනවා. කලින් කිව්වා වාගේම, දීර්ඝ කාලීන ඒවාත් තිබෙනවා, කෙටි කාලීන ඒවාත් තිබෙනවා. ඒ විධියට තමයි අපි කටයුතු කරන්නේ. මොකද, මේ තත්ත්වය ගත්තොත්, මීටත් වැඩිය අමාරු අවස්ථා ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, පෙබරවාරි 9වැනිදාට පසුවත් එහෙම වෙලා තිබෙනවා. හැබැයි, අපේ precautions සහ අපේ ඉංජිනේරුවන්, කාර්මික ශිල්පීන් ඇතුළු වෘත්තිකයන් ගොඩක් උනන්දුවෙන් වැඩ කිරීමත්, ඒ සඳහා අවශ්‍ය සහයෝගය වාගේම guidance ලබා දීමත් නිසා දැන් එම තත්ත්වය යම් මට්ටමකට පාලනය කරගෙන යනවා. මේක ස්ථිරව කරන්න battery storage, එහෙම නැත්නම්, pump storage වගේ දේවල්වලටත් අපට දවල් කාලයේ යෙදෙන්න වෙනවා. ඒවාට අවශ්‍ය මූලික කටයුතු අපි පටන් අරගෙන තිබෙනවා. මේ වන විට අපි මෙගාවොට් 160ක battery storage එකක් ගන්න ටෙන්ඩර් කැඳවලා තිබෙනවා. ඒ වාගේ මූලික දේවල් අපි ආරම්භ කරලා තිබෙනවා. කෙසේ වෙතත්, කළ යුතු තවත් දේවල් තිබෙනවා. ඒවා එක්වරම කරන්න බැහැ. මොකද, මහා භාණ්ඩාගාරයේ මුදල් ආලා නොවෙයි CEB එක පවත්වාගෙන යන්නේ. CEB එක පවත්වාගෙන යන්නේ, මිනිස්සු බිල් ගෙවන සල්ලිවලින්. ඒ නිසා ඒ development සඳහාත් අපි ණය ගන්න ඕනෑ. ඒ වගේ දේවල්වලට ණය ගන්න ගියාම, ණය දෙන ආයතනවලින් ඒ ණය මුදල okay කළත්, ඒක ක්‍රියාත්මක වෙන්න සාමාන්‍යයෙන් අවුරුදු එකහමාරක් විතර ගතවෙනවා. ඒ වාගේ කාලයක් අවශ්‍ය වෙනවා. ඇත්තටම අපි ඉදිරි වසර කිහිපය තුළ මේක කලින් විධියට නොවෙන්න කටයුතු කරනවා. මොකද, ලෝකයේ රටවල් ඕනෑ තරම් මේ සම්බන්ධයෙන් solutions අරන් තිබෙනවා. අපේ රටත් අපි එතැනට අරගෙන යනවා. අපි ඒක වගකීමෙන් කියනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, "විදුලිබල පද්ධතියේ සිදුවන තාක්ෂණික හානි සහ ආයතන කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු අවම කර ගැනීමට මහජන උපයෝගිතා කොමිසම මගින් පියවර ගැනීම..." කියලා. ඒ, 25වැනි පොරොන්දුව. විදුලිබල ක්ෂේත්‍රය තුළ එදා වුණු ඒ සිදුවීම නිසා විදුලි පාරිභෝගිකයාට විශාල හානියක් වුණා. ඒ වාගේම ඉදිරියේදීත් එහෙම වෙන්න පුළුවන්. අනාගතයේ දීත් එවැනි ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙන්න පුළුවන්. එවැනි තත්ත්වයන්ට මුහුණ දෙන්න නම් පාරිභෝගික අයිතිය ශක්තිමත් කරන්න ඕනෑ. ඒ කියන්නේ, මහජන උපයෝගිතා කොමිෂන් සභාව ශක්තිමත් කරන්න ඕනෑ කියන එකයි. දැනට තිබෙන නීතියේ පාරිභෝගික අයිතිය ශක්තිමත් කරන්න අවශ්‍යයි. ඒක ඔබතුමාත් පිළිගන්නවා ඇති, ගරු ඇමතිතුමනි. නමුත් අද ඉදිරිපත් කරන මේ සංශෝධන පනත් කෙටුම්පතේ රජය විසින් ඉදිරිපත් කරපු මුල් කෙටුම්පතේවත්, අද දින ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනවලදීවත් පාරිභෝගික අයිතිය ශක්තිමත් කරන, පුරවැසියා ආරක්ෂා කරන, ජාතික පද්ධතිය ආරක්ෂා කරන, පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කරන ප්‍රතිපාදන කිසිවක් නැහැ. ඒ පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි ඉදිරිපත් කරපු යෝජනා පවා අද ඉදිරිපත් වෙලා නැහැ. ඒවා ඉවත් වෙලා තිබෙනවා. ඒකට නීතිමය හේතු තිබෙන්න පුළුවන්. ඒකට හේතු වුණේ මුල් කෙටුම්පතට ඉදිරිපත් නොකිරීම බව නීතිපතිවරයා කියනවා. ඇයි, පාරිභෝගික අයිතීන් පිළිබඳව මෙතරම්

සැහැල්ලුවෙන් සලකන්නේ? ජනාධිපතිතුමාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව පාරිභෝගිකයා ආරක්ෂා කරනවා, අලුතින් නීති රීති ගෙන එනවා කියලා තිබෙද්දී; පොරොන්දු වෙලා තිබෙද්දී, තාක්ෂණය ගැන දන්නා මේ රටේ සිටින ඉංජිනේරුවරුන් වාගේම සාමාන්‍ය මිනිස්සුත් දිගින් දිගටම මේ ප්‍රශ්නය මතු කරද්දී වැදගත්, බරපතළ සංශෝධනයක් කරන මේ අවස්ථාවේ දී විදුලි පාරිභෝගිකයාගේ අයිතිය සුරක්ෂා කරන අලුත් ප්‍රතිපාදන ඉදිරිපත් නොකළේ ඇයි? ඔබතුමන්ලා මහජන උපයෝගිතා කොමිෂන් සභාව දුර්වල කරනවාද? පුරවැසියාගේ පාරිභෝගික අයිතිය දුර්වල කරනවාද? එහෙම නැත්නම් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය මොකක්ද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඇත්තටම අතීතය දන්නා හැමෝම ඒක දන්නවා. පාර්ලිමේන්තුවට යෝජනා ගෙනැල්ලා මහජන උපයෝගිතා කොමිසමේ සභාපති එළවපු ආණ්ඩුවල හිටපු අය තමයි අපෙන් ප්‍රශ්න අහන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොනවාද මේ කියන්නේ?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ප්‍රශ්නයට උත්තරය දෙන්න ඉඩ දෙන්නකෝ. *[බාධා කිරීම්]* ඔබතුමා අතුරු ප්‍රශ්නයක් ඇහුවා. *[බාධා කිරීම්]* අපි කිසිම විධියකට පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් නැති කරලා නැහැ. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමනි, ඔච්චර රිදෙනවාද? අපට උත්තර දෙන්න ඉඩ දෙන්න. අපට ඇත්ත කථා කරන්න පුළුවන්. බොරු කථා කරන්නයි අපි කැමති නැත්තේ. *[බාධා කිරීම්]* ඒ ආයතන නැති කරපු ආණ්ඩුවල මන්ත්‍රීවරුන් මේ සභාවේ මේ විධියට කෑ ගහලා වැඩක් නැහැ. *[බාධා කිරීම්]* අපි අනිවාර්යයෙන්ම පාරිභෝගිකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනවා. ඒ ගැන බය වෙන්න එපා. ඔබතුමන්ලා වාගේ නොවෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔබතුමන්ලා කලබල වෙන්න එපා. උත්තරය දෙන්න හැදුවා විතරයි නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔය කියන කතන්දරය 2024 අංක දරන පනතෙත් නැහැ. අපි ඉදිරිපත් කළ පනත් කෙටුම්පතේ විතරක් නොවෙයි, 2024 අංක දරන original පනතෙත් නැහැ. ඒ ආණ්ඩුව අපේ නොවෙයි. හරි නේද? ඔබතුමන්ලා කියපු එක හරි. අපි පනත සංශෝධනය කරන්න කෙටුම්පත ඉදිරිපත් කළා. ඔබතුමන්ලාගේ යෝජනා අරගෙන ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි ඒවා ඉදිරිපත් කළා. ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා අද ඒක මෙතැන ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළා. ඒ කටයුතු අපි කරලා නැතුව නොවෙයි. හැබැයි, උසාවියෙන් ඒවා reject කළා.

ඒ වාගේම මහජන උපයෝගිතා කොමිසම විදුලි බලයට විතරක් අදාළ එකක් වෙන්න බැහැ. ඊට වඩා පුළුල් විධියට අපි මේ ගැන හිතන්න ඕනෑ. මහජන උපයෝගිතා කොමිසමට හැම ක්ෂේත්‍රයක්ම - ජලය, විදුලිය, තෙල් - ඇතුළත් වෙන්න ඕනෑ. මෙතැනදී අපි විදුලි බලය හෝ විදුලි බිල ගැන විතරක් පටු විධියට දකින්නේ නැහැ.

මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ අපේ ඊළඟ පියවර තමයි, Energy Transition Act එකක් පාර්ලිමේන්තුවට ගෙන ඒම. ඒකෙදි ඔය ඔක්කොම energy පුළුල් විධියට අරගෙන, මේ ගැන කථා කරලා, මහ හැරුණු හෝ අඩුපාඩු වෙච්ච දේවල් පිළිබඳ ඔබතුමන්ලාගේත් යෝජනා අරගෙන අපි ඉදිරියට ක්‍රියාත්මක කරනවා. ඒ ගැන කිසිම සැකයක් තියා ගන්න එපා. මොකද, අපට අවශ්‍ය අපේ බලශක්ති ක්ෂේත්‍රය සාර්ථක විධියට සහ රටට ආරක්ෂාව සපයන විධියට ක්‍රියාත්මක කිරීම. ඒ නිසා අපි යෝජනා අත්හැරලා නැහැ. ඔබතුමා ඒක දන්නවා. අපි ඒකට ධනාත්මක - positive - විධියට තමයි ප්‍රතිචාර දක්වන්නේ. අනිවාර්යයෙන්ම ඒක මේ අවුරුද්ද ඇතුළත හෝ ලබන අවුරුද්ද මුල වනකොට අපි ගෙනෙනවා.

## මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන රෝහල්: පරිපූරක වෛද්‍ය සේවා සහ සුළු සේවක පුරප්පාඩු

මத்திய மாகாண சபையால் நிருவகிக்கப்படும் வைத்தியசாலைகள்: நிறைவுகாண் மருத்துவச் சேவைகள் மற்றும் சிற்றூழியர் வெற்றிடங்கள்

HOSPITALS GOVERNED BY CENTRAL PROVINCIAL COUNCIL: VACANCIES IN PARAMEDICAL SERVICES AND MINOR STAFF

704/2025

**4. ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල්වල නම් කවරේද;

(iii) එම එක් එක් රෝහලේ පවතින වෛද්‍ය, හෙද, පරිපූරක වෛද්‍ය සේවා සහ සුළු සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම රෝහල්වල භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i ) மத்திய மாகாண சபையின்கீழ் நிருவகிக்கப்படும் வைத்தியசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அத்தகைய வைத்தியசாலைகளின் பெயர்கள் யாவை என்பதையும்;

( iii ) அத்தகைய ஒவ்வொரு வைத்தியசாலையிலும் காணப்படுகின்ற வைத்தியர், தாதியர்,

[ගරු චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය ]

நிறைவுகாண் மருத்துவச் சேவைகள் மற்றும் சிற்றூழியர் வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

( iv ) மேற்படி வைத்தியசாலைகளில் பௌதிக மற்றும் மனித வள அபிவிருத்தி கருதி மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of hospitals governed under the Central Provincial Council;

(ii) names of the hospitals concerned;

(iii) number of vacancies existing for doctors and nurses in the paramedical services and on the minor staff in each of the hospitals referred to above, separately; and

(iv) measures that will be taken to develop physical and human resources of the above-mentioned hospitals?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

| | මහනුවර | මාතලේ | නුවරඑළිය | එකතුව |
|---|---|---|---|---|
| දිස්ත්‍රික් මූලික රෝහල් - A | 0 | 1 | 1 | 2 |
| දිස්ත්‍රික් මූලික රෝහල් - B | 1 | 0 | 1 | 2 |
| ප්‍රාදේශීය රෝහල් - A | 16 | 7 | 2 | 25 |
| ප්‍රාදේශීය රෝහල් - B | 21 | 6 | 9 | 36 |
| ප්‍රාදේශීය රෝහල් - C | 10 | 6 | 13 | 29 |
| පුනරුත්ථාපන රෝහල - දිගන | 1 | 0 | 0 | 1 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක | 28 | 14 | 22 | 64 |
| රෝහල් එකතුව | 77 | 34 | 48 | 159 |

(ii) ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

මහනුවර දිස්ත්‍රික්කයේ රෝහල් 77ක්, මාතලේ දිස්ත්‍රික්කයේ රෝහල් 31ක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ 48ක් තිබෙනවා.

ඇමුණුම 01

Kandy District

| Ditrict Base Hospitals Type B | Divisional Hospital A | Divisional Hospitals Type B | Divisional Hospitals Type C | PMCU |
|---|---|---|---|---|
| DBH Teldeniya | DH Akurana | DH Ambagahapelessa | DH Batumulla | PMCU Alawathugoda |
| | DH Ankumbura | DH Bambaradeniya | DH Dunhinna | PMCU Balana |
| | DH Deltota | DH Bokkawala | DH Kahawatte | PMCU Dedunnupitiya |
| | DH Dolosbage | DH Galaha | DH Muruthalawa | PMCU Dodanwala |
| | DH Galagedara | DH Galpihilla | DH Narampanawa | PMCU Elamaldeniya |
| | DH Hasalaka | DH Gelioya | DH Pattiya Pallegama | PMCU Galhinna |
| | DH Kadugannawa | DH Hatharaliyadda | DH Udagama Atabage | PMCU Girihagama |
| | DH Katugastota | DH Jambugahapitiya | DH Ulapane | PMCU Godahena |
| | DH Madolkele | DH Kolongoda | DH Wattapola | PMCU Gohagoda |
| | DH Mampitiya | DH Kotaligoda | DH West Hall | PMCU Kotikambe |
| | DH Marassana | DH Kuruduwatta | 10 | PMCU Kurugoda |
| | DH Menikhinna | DH Medawala | | PMCU Madawala |
| | DH Pusssallawa | DH Medamahanuwara | | PMCU Mahakanda |
| | DH Thiththapajjala | DH Minipe | | PMCU Mailapitiya |
| | DH Udadumbara | DH Morahena | | PMCU Makuldeniya |
| | DH Wattegama | DH Pamunuwa | | PMCU Mapakanda |
| | 16 | DH Panvilatanna | | PMCU Mawatura |
| | | DH Sangarajapura | | PMCU Meemure |
| | | DH Thalathuoya | | PMCU Megodakalugamuwa |
| | | DH Uduwela | | PMCU Poojapitiya |
| | | DH Yakgahapitiya | | PMCU Rajawella Digana |
| | | 21 | | PMCU Rambuke-ela |
| | | | | PMCU Rambuke-wela |
| | | | | PMCU Sandasiri Dunuvila |
| | | | | PMCU Suduhumpola |
| | | | | PMCU Udatalawinna |
| | | | | PMCU Welamboda |
| | | | | PMCU Yahalatanna |
| | | | | 28 |

Matale District

| Ditrict Base Hospitals Type A | Divisional Hospital A | Divisional Hospitals Type B | Divisional Hospitals Type C | PMCU |
|---|---|---|---|---|
| DBH Dambulla | DH Nalanda | DH Yatawatta | DH Dewahuwa | PMCU Aluvihare |
| | DH Madipola | DH Lenadora | DH Muwandeniya | PMCU Dullewa |
| | DH Galewela | DH Sigiriya | DH Gammaduwa | PMCU Opalgala |
| | DH Hettipola | DH Laliambe | DH Ovilakanda | PMCU Ukuwela |
| | DH Ratthota | DH Handungamuwa | DH Ilukkumbura | PMCU Gurubabila |
| | DH Laggalapallegama | DH Hatthtaamuna | DH Maraka | PMCU Paldeniya |
| | DH Kongahawela | 6 | 6 | PMCU Wawala |
| | 7 | | | PMCU Kandenuwara |
| | | | | PMCU Pallepola |
| | | | | PMCU Whaakotte |
| | | | | PMCU Kalundawa |
| | | | | PMCU Alkaduwa |
| | | | | PMCU Madawalaulpatha |
| | | | | PMCU Aluthwewa |
| | | | | 14 |

Nuwaraeliya District

| Ditrict Base Hospitals Type A | Ditrict Base Hospitals Type B | Divisional Hospital A | Ditrict Divisional Hospitals Type B | Ditrict Divisional Hospitals Type C | PMCU |
|---|---|---|---|---|---|
| DBH Dickoya | DBH Rikillagaskada | DH Maskeliya | DH Bogawanthalawa | DH Agarapathana | PMCU Ambewela |
| | | DH Walapane | DH Ginigathhena | DH Dayagama | Hangarapiiya |
| | | 2 | DH Kotagala | DH Gonaganthanna | Hapugasthalawa |
| | | | DH Kothmale | DH Gonapitiya | Hatton |
| | | | DH Lindula | DH Hanguranketha | Kalaganwattha |
| | | | DH Maldeniya | DH Highforest | Kandapola |
| | | | DH Mathurata | DH Laxsapana | Keerthibandarapura |
| | | | DH Udapussallawa | DH Madulla | Katambulawa |
| | | | DH Watawala | DH Mandaramnuwara | Kurupanawela |
| | | | 9 | DH Mooloya | Manakola |
| | | | | DH Nildandaheenna | Maswela |
| | | | | DH North Medakumbura | Munwaththa |
| | | | | DH Theripeha | Nanuoya |
| | | | | 13 | Nawathispane |
| | | | | | Norton Bridge |
| | | | | | Protoft |
| | | | | | Pundaluoya |
| | | | | | Ragala |
| | | | | | Rupaha |
| | | | | | Upcot |
| | | | | | Wijebahukanda |
| | | | | | Pallebowala |
| | | | | | 22 |

(iii) ඇමුණුම 02 මඟින් දක්වා ඇත. එය දීර්ඝ ඇමුණුමක්. ඇමුණුම 02 **සභාගත*** කරමි.

(iv) 1. රෝහල් සඳහා පවතින අවශ්‍යතා ප්‍රමුඛතාගත කරමින් විවිධ ව්‍යාපෘති යටතේ ලැබෙන ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් භෞතික සම්පත් අත්පත් කර ගැනීමට කටයුතු සිදු කරමින් තිබෙනවා.

2. මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය බඳවා ගැනීම් කිරීමටත්, ඒ වාගේම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, ආයතනික මට්ටමින්, පළාත් සභා සහ ජාතික මට්ටමින් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමටත් තිබෙනවා.

(ආ) පැන නොනඟී.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මධ්‍යම පළාත් සභාව යටතේ මෙන්ම මුළු දිස්ත්‍රික්කයේම පළාත් සභා යටතේ තිබෙන රෝහල්වල යටිතල පහසුකම් ඉතා අඩු මට්ටමක තමයි තිබෙන්නේ. මම නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ මහකන්ද ප්‍රාථමික රෝහල සහ කලුගමුව ප්‍රාථමික රෝහල යන රෝහල් දෙක ගත්තොත්, සාමාන්‍යයෙන් දවසකට රෝගීන් 300ක, 400ක ප්‍රමාණයක් මේ රෝහල්වලට එනවා. අඩුම තරමේ රෝගීන් විස්සකටවත් වාඩි වෙන්න පුටු ඒ රෝහල්වල නැහැ. ගරු කථානායකතුමනි, අපි කලුගමුව ප්‍රාථමික රෝහල ගත්තොත්, මාතෘ සායනය, ළමා සායනය වාගේම බෝවන රෝගීන් සියලුදෙනා ඉන්නේත් එක ශාලාවක. ඒ වාගේම ගොඩක් රෝහල්වල ඉන්නේ එක වෛද්‍යවරයෙක් විතරයි. ඒ වෛද්‍යවරයාට ලෙඩක් හැදුණොත්, එහෙම නැත්නම්, ඔහුට රාජකාරියට එන්න බැරි වුණොත් ඒ දවසට ඒ රෝහලේ රෝගීන් බලන්න කවුරුත් නැහැ. උදාහරණයක් ගත්තොත්, හතරලියද්දේ හඳබෝවන ප්‍රාථමික රෝහලේ ගිය අවුරුද්දේ මාස 6ක් විතර වෛද්‍යවරයකු හිටියේ නැහැ. පළාත් සභා යටතේ තිබෙන එවැනි රෝහල්වල යටිතල පහසුකම් දියුණු කරන්නත්, ඒ වාගේම වෛද්‍යවරුන්ගේ හිඟය තුරන් කිරීම සඳහාත් ආණ්ඩුව ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

විශේෂයෙන්ම භෞතික සම්පත් පැත්තෙන් ගත්තාම, අපි වැඩ පිළිවෙළ දෙකක් හදලා තිබෙනවා. එකක් තමයි, දිස්ත්‍රික් රෝහල් සහ ඉන් පහළ තිබෙන ග්‍රාමීය රෝහල් සහ ප්‍රාදේශීය වශයෙන් තිබෙන රෝහල්, ඒ කියන්නේ ගම් මට්ටමේ තිබෙන අනෙකුත් සියලුම රෝහල් cover වෙන විධියට භෞතික සම්පත් ඉහළ නැංවීමේ විශේෂ වැඩසටහනක් අපි ලෝක බැංකුවේ ආධාර යටතේ ක්‍රියාත්මක කරනවා. ඔබතුමිය කියන රෝහලුත් ඒකට ඇතුළත් කරලා තිබෙන්නේ. තව මාස දෙක තුනකින් ඒ සම්බන්ධයෙන් අපි ක්‍රියාත්මක වෙනවා.

ඊට පස්සේ අපි මූලික රෝහල් - base hospitals - ගත්තොත්, ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුව යටතේ වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒක යටතේ ඒවාට අවශ්‍ය සියලු සම්පත් ලබා දීමට අපි ක්‍රියා කරනවා. ඒ වාගේම අපි රෝහල් සම්බන්ධව යම් විශ්ලේෂණයක් කළා. ඒ අනුව ඒවායේ තිබෙන සම්පත්, ඒ තුළින් ලබා දෙන සේවා සහ ඒවාට එන රෝගීන් සංඛ්‍යාව අනුව එක් එක් රෝහල්වල සුවිශේෂතා තිබෙනවා. ඒ සුවිශේෂතා හඳුනා ගනිමින්, එම එක් එක් රෝහල් වැඩිදියුණු කරන්නේ කොහොමද කියන එකත් අපි දැන් වටහාගෙන තිබෙනවා. ඒ අනුව, එක් එක් රෝහල් පද්ධතියේ සුවිශේෂිතා සලකා ඒවා වැඩිදියුණු කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි හදලා තිබෙනවා. බොහෝදුරට ඒ වැඩ පිළිවෙළ තව මාස කීපයකින් අපට මධ්‍යම පළාතේත් ආරම්භ කරන්න පුළුවන්. ඒ වාගේම මීට පෙරත් ලෝක බැංකුවේ ආධාර යටතේ ග්‍රාමීය රෝහල් වැඩිදියුණු කිරීම් කළා. නමුත් අපි පිළිගන්නවා, සමහර රෝහල්වල ඒ කටයුතු ඉතිරිවෙලා තිබෙන බව. අපි ඒ කටයුතුත් ඉදිරියේදී කරගෙන යනවා.

ඊළඟට බඳවා ගැනීම් ගත්තොත්, ලබන සඳුදා වනකොට පශ්චාත් සීමාවාසික වෛද්‍යවරුන් applications දාලා ඉවර වෙනවා. ඒ නිසා අපට තව සතියක්, දෙකක් ඇතුළත ඒ අය බඳවා ගන්න පුළුවන්. හුඟක් වෙලාවට ඒ අය ඒ ග්‍රාමීය රෝහල්වල සේවයේ යෙදවීමට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අනෙකුත් කාර්ය මණ්ඩලවල බඳවා ගැනීමේ කටයුතුත් තිබෙනවා. හැබැයි, අවාසනාවකට වාගේ X-ray Techniciansලා වාගේ අය බඳවා ගැනීමේ ප්‍රශ්නයක් අපට තිබෙනවා, අධිකරණයෙන් දුන් වාරණ නියෝගයක් තිබෙන නිසා.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අසනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මට අවස්ථාව ලබා දුන්නාට චමින්ද්‍රානී කිරිඇල්ල මැතිනියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දයාසිරි ජයසේකර මහතා ]

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කුලියාපිටිය රෝහල පිළිබඳ ප්‍රශ්නය ඉතාම විශාල ප්‍රශ්නයක්. ඔබතුමාත් දන්නවා, ඒකේ professorial unit එකක් හදන්න අවශ්‍ය කටයුතු ටික ලැහැස්ති කරලා අවුරුදු ගණනාවක් තිස්සේ ඒ කටයුත්ත දැන් එහාට මෙහාට අදින බව. මෙහි එක් අංශයක් කුරුණෑගල ශික්ෂණ රෝහලට අරගෙන යන්න හදනවා. මේ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාත් දන්නවා, 2024 වසරේ, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ hospital එකක් ගැනමයි කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hospitals තමයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔබතුමාත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අධ්‍යක්ෂවරයෙක් විධියට හිටපු නිසා මම මේක කියන්නේ. *[බාධා කිරීමක්]* මේක වැදගත් කාරණයක්. එතුමා මේ ගැන දන්න හින්දා මම අහන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මම මෙතැන කථානායකවරයා, වෛද්‍යවරයෙක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට අහන්න පුළුවන් වන්නේ, ඒ ප්‍රධාන ප්‍රශ්නයට අදාළ කාරණා විතරයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඉතින්, මේ hospitals ගැන තමයි අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hospitals ගැන නොවෙයි. කුලියාපිටිය ගැන අහන්නේ මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, ඉතින්. මධ්‍යම පළාතේ, - *[බාධා කිරීමක්]* මෙතුමා කැමැතියි නේ, උත්තර දෙන්න. එතුමා කැමැතියි, උත්තර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, එතුමා ඇමතිතුමා නොවෙයි. ඇමතිතුමා වුණත් උත්තර දෙන්න බැහැ කථානායකවරයාගේ, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම කරන්න එපා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට අහන්න පුළුවන් මධ්‍යම පළාතේ, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේක පාර්ලිමේන්තුව. එතුමාගෙන් මේක අහන්න ඉඩ දෙන්න. *[බාධා කිරීමක්]* අපි එතුමාගෙන් අහමු. කැමැතිද, නැද්ද කියලා එතුමාගෙන් අහන්නකෝ. *[බාධා කිරීමක්]* ජනතාවගේ ප්‍රශ්නයක් අහන්න දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කැමැති වුණත්, කැමැති නැති වුණත් මට තිබෙන discretion එක අනුව බලතල තිබෙනවා, ඒ ගැන කටයුතු කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කැමැතිද? *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
අද හවසට මේ සම්බන්ධව අපි දීර්ඝ උත්තරයක් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි නේ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ සම්බන්ධව ප්‍රශ්නයක් යොමු වෙලා තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඔව්, අද හවසට උත්තර දෙන්න ප්‍රශ්නයක් යොමු වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම PHI මහත්තයාගෙන් අහගන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තේරුම් ගන්න. විනයගරුකව හැසිරෙන්න. ඔය විධියට PHI මහත්තයාගෙන්, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම PHI මහත්තයාගෙන් අහගන්නම් කියලා නේ කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, PHI මහත්තයා කියලා මේ සභා ගර්භයේ එහෙම කථා කරන්න අවශ්‍යතාවක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
PHI මහත්තයාගෙන් අහගන්නම් කියලා කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, තේරුණා. කට තිබුණු පළියට කථා කරන්න එපා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
PHI මහත්තයාගෙන් අහගන්නම් කියලා නේ කිව්වේ. මොකක්ද, තිබෙන ප්‍රශ්නය?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ඕක කලින්ම අහගන්න තිබුණා නේ.

## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව: කාර්යභාරය
ஏற்றுமதி விவசாயத் திணைக்களம்: பணிப்பொறுப்பு
DEPARTMENT OF EXPORT AGRICULTURE: ROLE

996/2025

**5. ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂි භෝග නිෂ්පාදනය කරනු ලබන ගොවීන් ශ්‍රී ලංකාවේ සිටින බව දන්නේද;
(ii) ඔවුන්ට සිය කෘෂි නිෂ්පාදන අපනයනය කිරීම සඳහා ලබා දී ඇති පහසුකම් කවරේද;
(iii) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කවරේද;
(iv) බාධාවකින් සහ අපහසුතාවකින් තොරව සිය කෘෂි නිෂ්පාදන අපනයනය කිරීම සඳහා එම දෙපාර්තමේන්තුව විසින් තරුණ ව්‍යවසායකයන් වෙනුවෙන් ලබා දී ඇති පහසුකම් සහ ප්‍රවේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் ஏற்றுமதியை இலக்காகக்கொண்டு விவசாயப் பயிர்களை உற்பத்தி செய்கின்ற விவசாயிகள் உள்ளனர் என்பதை அறிவாரா;
(ii) அவர்களுக்கு தமது விவசாய உற்பத்திகளை ஏற்றுமதி செய்வதற்கு வழங்கப்பட்டுள்ள வசதிகள் யாவை;
(iii) ஏற்றுமதி விவசாயத் திணைக்களத்தின் பணிப்பொறுப்பு யாது;
(iv) இத்திணைக்களம் இளம் தொழில்முயற்சியாளர்களுக்குத் தடைகள் மற்றும் அசௌகரியங்கள் இன்றி தமது விவசாய உற்பத்திகளை ஏற்றுமதி செய்வதற்குப் பெற்றுக்கொடுத்துள்ள வசதிகள் மற்றும் அணுகுமுறைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation :

(a) Will he inform this House -
(i) whether he is aware that there are farmers in Sri Lanka who produce agricultural crops targeting exportation of them;
(ii) the facilities that they have been provided with to export their agricultural products;
(iii) the role of the Department of Export Agriculture; and
(iv) the facilities and accesses that have been provided by the said Department for the young entrepreneurs to export their agricultural products without impediment or inconvenience?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

ගොවීන් ඇතුළු පාර්ශ්වකරුවන් ලක්ෂ 7කට ආසන්න පිරිසක් මේ වන විට අපනයන කෘෂි භෝග වගාවන්හි සහ ඒ ආශ්‍රිත කර්මාන්තවල නියැළී සිටී.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

(ii) කෘෂි නිෂ්පාදන අපනයනයට සුදුසු ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම සඳහා අවශ්‍ය කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳව හා අස්වනුවල ගුණාත්මය ඉහළ නැංවීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස්, මඟ පෙන්වීම සහ ආයෝජන ආධාර ලබා දීම ඇතුළුව ව්‍යවසායකයින්ව අපනයන වෙළෙඳ පොළ හා සම්බන්ධ කරවීමට අදාළ උපදෙස් හා පුහුණු ක්‍රමවේද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරයි.

(iii) වැඩි විදේශ විනිමයක් ඉපැයීමත්, අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රයේ නිරත සියලු පාර්ශ්ව කරුවන්ගේ තිරසර ආර්ථික හා සමාජයීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින්, පරිසරය සුරැකෙන අයුරින් අපනයන කෘෂි භෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට කටයුතු කිරීම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වේ.

එහිදී අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් ගම්මිරිස්, කරාබු, සාදික්කා, කරදමුංගු, කෝපි, කොකෝවා, වැනිලා, පුවක්, පැඟිරි, සේර, ගොරකා, කහ සහ ඉඟුරු ආදී කුළුබඩු භෝග, පානීය භෝග සහ උත්තේජකාරක භෝග වගා කිරීම සහ එම භෝගවලට අදාළව අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන කාර්යභාරය වශයෙන් සිදු කෙරේ.

(iv) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය තුළ මෙම කටයුතු සඳහා "ව්‍යාපාර උපදේශන ඒකකයක්" ස්ථාපනය කර, මේ සඳහා අවශ්‍ය මඟ පෙන්වීමට හා සහාය ලබා දීමට සෘජුවම දායක වේ.

ඊට සමගාමීව දිස්ත්‍රික්/පළාත් මට්ටමෙන් ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීමත්, කෘෂි භෝග අපනයනයට සම්බන්ධ වන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනඟමින් ව්‍යවසායකයින්ට වඩාත් පහසුවෙන් මේ සඳහා සම්බන්ධවීමට පහසුකම් සැලසීමත් කරනු ලැබේ. එමෙන්ම විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය වැනි තරුණ ව්‍යවසායකයින්ට වඩාත් සමීප මාර්ග ඔස්සේ මේ පිළිබඳව දැනුම හා තොරතුරු ලබා දෙමින් අපනයනය ඔවුන් අතර ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ නිලධාරින්ගේ වාර්තාවල කුමක් සඳහන් වුවත්, යථාර්ථය නම් අපනයන ඉලක්ක කෘෂි භෝග නිෂ්පාදනය කළත්, එම නිෂ්පාදන අපනයනය කිරීමේදී විවිධාකාරයේ දුෂ්කරතාවන්ට, ගැටලුවලට මුහුණ දෙන්න සිදුවෙන එකයි. මේ අපනයනකරුවන් ඉතා අඩු මුදලකට ගොවියාගෙන් මේ නිෂ්පාදන මිලදී ගෙන ඉතා ඉහළ මිලකට අපනයනය කරලා ඉහළ ලාභයක් ගන්නවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මා විශේෂයෙන්ම මේ ප්‍රශ්නය අහන්න හිතුවේ, මේ නිසායි. අපි විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත් කාලයේ, එහි අවසාන භාගයේ වාගේ මා දන්නා ඒ විද්‍යාර්ථීන්ට අවශ්‍ය වුණා, මේ අපනයන ඉලක්ක කෘෂි කර්මාන්තයට යොමු වෙන්න. ඔවුන් ඒ සම්බන්ධව උපදෙස් ලබා ගන්න කෘෂිකර්ම අමාත්‍යාංශයට, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ගියා. මේ සම්බන්ධයෙන් එතැනදී ඒ අයට ලැබුණේ මොකක්ද? ඒ අය ගිහිල්ලා, මේ අපනයන භෝග සම්බන්ධයෙන් විස්තර කථා කරලා එළියට ආවේ ඒ අපනයන සම්බන්ධයෙන් වූ කෘෂි කර්මාන්තයේ යෙදෙන්න නොවෙයි, වෙනත් රැකියාවකට යොමු වෙන්නයි. මොකද, ඒ සඳහා අවශ්‍ය කරන පෙලඹවීම සහ අවශ්‍ය පහසුකම් ටික ඔවුන්ට ලබා දීලා නැහැ. තරුණ පරම්පරාව ගත්තත්, අතිවිශාල පිරිසක් කැමැතියි, කෘෂි කර්මාන්තයේ යෙදිලා ආදායම් ලබන්නට. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්නේ, මේ කටයුත්ත වඩා කාර්යක්ෂම කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින්, මේ දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද කියලායි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, මෙම විෂය පථය ගත්තොත්, මේක අපේ රටට ඩොලර් ගෙන ඒමට අදාළව උපයෝගි කර ගන්න පුළුවන් ව්‍යාපෘතියක්. අපනයන භෝග ගත්තොත්, කුරුඳුත් ඇතුළත්ව ප්‍රධාන වශයෙන් භෝග 14ක් තිබෙනවා.

කුරුඳුවලට දැන් වෙනම දෙපාර්තමේන්තුවක් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම පසුගිය කාලයේ කෘෂි අපනයන භෝග සම්බන්ධයෙන් යම් ගැටලු ප්‍රමාණයක් නිර්මාණය වුණා. ඒවාට අපිත් ඒ වෙලාවේ මැදිහත් වුණා; අරගළ කළා. පසුගිය කාලයේ ප්‍රතිඅපනයනය කියන ක්‍රියාවලියට මුවා වෙලා විවිධ අකටයුතුකම් සිදු වුණා. ඉන්දුනීසියාව, වියට්නාමය වාගේ රටවලින් ගොඩක් වෙලාවට ගම්මිරිස් වාගේ භෝග ගෙනැල්ලා, කලවම් කරලා, "Made in Sri Lanka" කියන ලේබලය යටතේ පසුගිය කාලවල අපනයනය කළා. ඒ විතරක් නොවෙයි. මීට අදාළව ඇමතිවරු ගණනාවක් එක්ක මගේ මූලිකත්වයෙන්ම අපි ගොවිජන සම්මේලනය විධියට සාකච්ඡා කරලා තිබෙනවා. ඒ සාකච්ඡාවලදීත් අපට අනාවරණය වුණු විධියට එම ඇමතිවරුන්ම සමහර තැන්වල කියලා තිබෙනවා, ඉන්දුනීසියාව වාගේ රටවලින් ආනයනය කරන ගම්මිරිස් ලංකාව තුළට ගෙනෙන්නේත් නැතුව නැවේදීම "Made in Sri Lanka" කියන ලේබලය යටතේ වෙනත් රටවලට ප්‍රතිඅපනයනය කර තිබෙන බව. අපේ කුළුබඩුවලට ලෝකයේ හොඳ ඉල්ලුමක් තිබෙනවා. ඒ වෙනුවෙන් හොඳ පහසුකමක් ලබා දීලා තිබෙනවා. නමුත්, පසුගිය කාලයේ අකටයුතුකම් ගොඩක් සිදු වුණා. ඒ අකටයුතුකම් වැළැක්වීම සඳහා මේ වනකොට අපි කටයුතු කරමින් ඉන්නවා. එපමණක් නොවෙයි. මෙම දෙපාර්තමේන්තුව යටතේ මෙම වගා ප්‍රවර්ධනය කිරීම සඳහා මීට පෙර වෙන් කළ මුදලට වඩා විශාල මුදල් ප්‍රමාණයක් -තුන් ගුණයක්- මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. එම මුදල් පරිහරණය කරමින් මෙම වගා ප්‍රචලිත කිරීමටත්, එම භෝග වගා කරන ජනතාවගේ වෙළෙඳ පොළ ප්‍රශ්නය නිරාකරණය කිරීමටත් අපි මේ වනකොට මැදිහත් වෙමින් ඉන්නවා.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම මේ අසන අතුරු ප්‍රශ්නයට අදාළව යම් පිළිතුරකුත් ලැබුණා. නමුත්, මම නැවතත් අහන්නේ මෙයයි. නියෝජ්‍ය අමාත්‍යතුමා විධියට ඔබතුමා දන්නවා, පසුගිය කාලයේ කෘෂි භෝග අපනයනයේදී විවිධ ආකාරයෙන් දූෂණ සිදු වුණු බව. මම හිතන විධියට, ඒ සම්බන්ධයෙන් විශාල හඬක් නැඟුවේ ඔබතුමායි. ඔබතුමා ඒ ගොවි සංවිධාන හරහා ගොවීන් එකතු කරගෙන ඒ සම්බන්ධයෙන් විශාල හඬක් නැඟුවා. එම දූෂණ වැළැක්වීම සඳහා වර්තමානයේදී අවශ්‍ය වූ පියවර ඔබතුමා අරගෙන තිබෙනවාද, ඔවුන්ට යම් සහතිකයක් දෙන්න පුළුවන්ද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇහුවේ ඇත්තටම වැදගත් ප්‍රශ්නයක්. ඔබතුමා ඇසූ ප්‍රශ්නය සම්බන්ධයෙන් මට පෞද්ගලිකව හොඳට අත්දැකීම් තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය රාජගිරියේ ප්‍රශ්නකාරී ගොඩනැඟිල්ලක තිබුණු කාලයේ පැවැති සාකච්ඡාවකින් අනතුරුව හිටපු කෘෂිකර්ම ඇමතිවරයා මා එක්කම ප්‍රකාශ කළා, විශේෂයෙන්ම ඉන්දුනීසියාවේ ගම්මිරිස් ලංකාවේ වරායට ගෙනෙන්නේත් නැතුව නැවේදීම ඒවා ලංකාවේ විධියට "Made in Sri Lanka" කියන ලේබලය යටතේ හුවමාරු වනවාය කියලා. අපි ඒ සම්බන්ධව දයා ගමගේ හිටපු ඇමතිවරයා එක්කත් සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම තවත් හිටපු ඇමතිවරු එක්කත් සාකච්ඡා කරලා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් අරගළ කරලාත් තිබෙනවා. මිද්දෙනිය නගරය ඇතුළු හැම තැනකම අපි උද්ඝෝෂණ වාගේම අරගළ කරලා තිබෙනවා, ගොවි ජනතාවට සිදු වුණු අකටයුතුකම් සම්බන්ධයෙන්. එම අකටයුතුකම් වෙන්න බලපෑ කාරණාව තමයි, පිට රටවල තිබෙන කසළ භෝග ගෙනැල්ලා කලවම් කරලා ප්‍රතිඅපනයනය කිරීම. විශේෂයෙන්ම කරුංකා, ගම්මිරිස්, කුරුඳු වාගේ විශේෂ භෝග ගත්තාම සමහර අවස්ථාවල ඒවායේ මිල තුට්ටු දෙකට බහිනවා. එම නිසා ගොවීන්ට ඒවා විකුණන්න බැරි වනවා. ඒ තත්ත්වය උදා වෙන්න හේතුව තමයි, විශේෂයෙන්ම පිට රටවල තිබෙන කසළ භෝග ගෙනැල්ලා කලවම් කරලා ප්‍රතිඅපනයනය කිරීම. කසළ තේ අපේ රටේ තේ විධියට ප්‍රතිඅපනයනය කරනවා වාගේම මේ ක්‍රියාවලියත් පසුගිය කාලයේ ගජරාමෙට සිද්ධ වුණා. ඒ තත්ත්වය තුළ තමයි අපේ රටේ අපට තිබුණු වෙළෙඳ පොළ තුළ ප්‍රශ්න මතු වුණේ. අපේ රටේ සන්නාමය, කීර්ති නාමය පලුදු වුණා.

ගරු කථානායකතුමනි, අපේ කෘෂි අපනයන භෝග ඉන්දියාව වාගේ රටවල් ගන්න කෝටාවක් තිබෙනවා. එම කෝටාව වෙනත් රටවල කසළ භෝගවලින් සම්පූර්ණ වනකොට අපට වෙළෙඳ පොළ පිළිබඳ ප්‍රශ්නයක් ආවා. එම ප්‍රශ්නයත් එක්ක අපේ ගොවි ජනතාවගේ කෘෂි භෝගවලට ඉල්ලුමක් නැතුව ගියා. මිල පහත වැටුණා. එම තත්ත්වය පිළිබඳව අපට ඉතාම හොඳ අත්දැකීම් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් අපි කිරලා මැනලා අධ්‍යයනය කරලා තිබෙනවා. එම තත්ත්වය තුළ අද එම දෙපාර්තමේන්තුව අපේ අමාත්‍යාංශය යටතටම ගෙන තිබෙනවා. ඒ අත්දැකීම්, ඒ සම්බන්ධකම් සහ ඒ අවබෝධය තුළ මේ තිබෙන තත්ත්වය වෙනස් කිරීම සඳහා අපි මේ වනකොට කටයුතු කරමින් ඉන්නවා. ඒක අනිවාර්යයෙන්ම වෙනස් කරනවා. අපේ රටේ මේ අපනයන භෝග ඉතාම හොඳ, දියුණු තැනකට අපි අනිවාර්යයෙන්ම ගේනවා. රටට ඩොලර් විශාල පංගුවක් ගෙනෙන විධියට මෙම කර්මාන්තය අනිවාර්යයෙන්ම අපි දියුණු කරනවා. ඒ වාගේම තමයි, මේ තුළින් සිද්ධ වුණු වංචා, දූෂණ හා අකටයුතුකම්වලට වැට බඳිමින් මේ වනකොට ඒවාට අදාළව අපි ක්‍රමානුකූලව මැදිහත් වෙමින් ඉන්නවාය කියන කාරණයත් මේ වෙලාවේදී මම මතක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ලීසිං ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම
### குத்தகை நிறுவனங்களின் கொள்கைகளை மீளாய்வு செய்தல்
### REVIEWAL OF POLICIES IN LEASING SECTOR

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා මේ කාරණය ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය සඳහා යොමු කරන්න කැමතියි.

I rise today to draw the attention of this august House to the urgent need for reform in the leasing industry which has grown into a highly protected and lopsided sector, operating with minimal accountability and disproportionately favouring financial institutions over struggling citizens.

It is deeply concerning that leasing companies - particularly Finance Companies under Central Bank licensing and supervision – are resorting to increasingly forceful and punitive measures to recover leased assets, including vehicles and machinery, even in cases where 60 -70 per cent of the dues have already been settled. These actions often disregard context, compassion and fairness and are carried out without transparency or proper checks and balances.

Moreover, current regulations permit seizure of mortgaged assets merely upon a 90 to 150-day delay in payment without adequate consideration of whether the default was willful or due to unavoidable economic hardship –such as job loss, illness or macroeconomic instability.

ගරු කථානායකතුමනි, මතක තබා ගන්නට අවශ්‍යයි, රට බංකොලොත් වුණාම සියයට 10ට තිබුණු එක සියයට 30 දක්වා ගියාම ඒකත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවාය කියන එක. ඒකෙන් ඇතිවෙලා තිබෙන ප්‍රතිවිපාකයක් තමයි, මේ.

This state of affairs erodes public trust in the financial system, exacerbates poverty and undermines the role of the Central Bank as a responsible regulator. It is imperative that the Central Bank introduces a more humane, tiered and compassionate framework for asset recovery, which distinguishes between defaulters acting in bad faith and those affected by genuine difficulty.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ගත්තොත්, සමහර වෙලාවට නුවර ඒගොල්ලන් ගෙයින් ඇදලා එළියට දමන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. කාර් එක එළියේ යන ගමන් අරගෙන යන අවස්ථා තිබෙනවා. ඉතින්, මම මේ මනුෂ්‍යභාවයෙන් තමයි මේ කාරණය අහන්නේ.

[ගරු රවි කරුණානායක මහතා]

Accordingly, I seek urgent responses and policy clarity on the following key questions:

1. What specific regulatory protections are currently in place under the Central Bank's direction for borrowers who face involuntary default in the leasing sector?

    - Can the Central Bank provide data on how many asset seizures occur annually, and how many involve individuals facing economic hardship rather than willful non-payment?

2. Why does the Central Bank permit the seizure of mortgaged assets such as vehicles after just 90 to 120 days of non-payment, without mandating any assessment of the lessee's financial hardship, intent or willingness to negotiate?

3. Can the Central Bank introduce or recommend guidelines to financial institutions to differentiate between willful defaulters and genuine hardship cases and mandate negotiated settlements or restructuring options before seizure proceedings are initiated?

4. Has the Central Bank considered introducing a mandatory "Grace period mechanism" or a mediation board to be consulted prior to the seizure of leased property – especially for micro and small enterprise operators who rely on such assets for income generation?

5. What are the legal remedies currently available to lessees who allege unfair repossession of their leased assets? Has the Central Bank ever intervened in cases where financial institutions were found to have acted with undue haste or without exploring restructuring options?

6. Will the Central Bank commit to a policy review of the leasing sector, particularly to examine the impact of harsh seizure practices on small business owners, self-employed individuals and low-income earners so that a more equitable and humane framework could be instituted?

7. Can the Central Bank provide a breakdown of leasing contracts by institution and indicate whether large finance companies dominate the market due to regulatory asymmetry or monopolistic practices and if so, what steps will be taken to ensure a level playing field for the consumer?

Thank you, Sir.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම කල් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.

## II

## අංක 2185/74 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අවලංගු කිරීම

2185/74ஆம் இலக்க அதிவிசேட வர்த்தமானி அறிவித்தலை மீளப் பெறல்

REVOCATION OF GAZETTE EXTRAORDINARY NO. 2185/74

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர் கௌரவ அனுர கருணாதிலக்க அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

யாழ்ப்பாண மாவட்டத்திலுள்ள 17 உள்ளூராட்சி மன்றங்களில் பிரதேச சபைகளாகவுள்ள 13 உள்ளூராட்சி மன்றங்களினதும் நிருவாக ஆளுகைக்கு உட்பட்ட அனைத்துப் பகுதிகளும், நகர அபிவிருத்தி கட்டளைச் சட்டத்தின்கீழ் 2020.07.24ஆம் திகதிய 2185/74ஆம் இலக்க அதிவிசேட வர்த்தமானப் பத்திரிகைமூலம், நகர அபிவிருத்திப் பகுதிகளாக வெளிப்படுத்தப்பட்டுள்ளதை அமைச்சர் அறிவாரா?

01. இதன்மூலம் பிரதேச சபைகளின் அதிகாரங்களை மத்திய அரசின் கீழுள்ள நகர அபிவிருத்தி அதிகாரசபை கட்டுப்படுத்தும் நிலை ஏற்பட்டுள்ளதுடன், கட்டுமான அனுமதி, நில அளவைப் படம் உறுதிப்படுத்தல், காணி உப பிரிவிடல், வீதி எல்லைக்கோட்டுச் சான்றிதழ், ஆதன ஒருங்கிணைப்பு உள்ளிட்ட பிரதேச சபைகளால் மேற்கொள்ளப்படும் மக்கள் நலச் சேவைகளுக்கான கட்டணம், கள ஆய்வு மற்றும் ஆவணக் கட்டணங்கள் என்பவை உச்ச அளவில் நகர அபிவிருத்தி அதிகாரசபையால் நிர்ணயம் செய்யப்படுகின்றமை சாதாரண மக்கள்மீது பொருளாதாரச் சுமையை ஏற்படுத்துவதாக அமைந்துள்ளது என்பதை அமைச்சர் அறிவாரா?

02. தற்சார்புப் பொருளாதாரம் முன்னிலைப்படுத்தப்படும் கிராமங்களில், தமது வாழ்வாதாரம் கருதி மக்களால் மேற்கொள்ளப்படும் சிறிய மற்றும் நடுத்தர கைத்தொழில், குடிசைக் கைத்தொழில் என்பவை வியாபார ஆதனங்களாக மாற்றப்பட்டு அனுமதி வழங்கப்படுகின்றமையால் சாதாரண மக்கள் படும் அவலங்கள் எத்தகையவை என்பதை கௌரவ அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

03. மாநகர சபைகளுக்கும் நகர சபைகளுக்குமே நகர அபிவிருத்திக் கட்டளைச் சட்டம் பொருந்தத்தக்க சூழலில், மக்களின் இயல்பு வாழ்வையும் பிரதேச சபைகளின் இயங்குநிலையையும் தேசவழமையையும் பாதிக்கும் வகையில், யாழ்ப்பாண மாவட்டத்தின் அனைத்துப் பிரதேச சபைகளின் எல்லைகளும் நகர அபிவிருத்திப் பிரதேசங்களாக வெளிப்படுத்தப்பட்டமை ஏன் என்பதை கௌரவ அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

04. இத்தகைய வர்த்தமானி அறிவித்தலின் பின்னரே, தையிட்டி விகாரை உள்ளிட்ட சட்டவிரோதக் கட்டுமானங்களின் அதிகரிப்பும் ஏற்பட்டுள்ளது என்ற அடிப்படையில், பொதுமக்களின் நலன் கருதி மேற்கொள்ளப்படும் பிரதேச சபைகளின் தீர்மானங்களையும் மீறி, நகர அபிவிருத்தி அதிகாரசபையால் வழங்கப்படும் அனுமதிகளைத் தடுப்பதற்கான வழிவகைகள் எவை என்பதை கௌரவ அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

05. பிரதேச சபைகளின் அதிகாரங்களையும், இலகுபடுத்தப்பட்ட மக்கள் நலச் சேவைகளையும் கேள்விக்குட்படுத்தும் வகையிலான மேற்படி வர்த்தமான அறிவித்தலை மீளப் பெறுவதொன்றே சபைகளின் சுயாதீன இயங்குநிலையை உறுதிசெய்யும் என்ற அடிப்படையில், குறித்த வர்த்தமான அறிவித்தலை மீளப்பெற நடவடிக்கை எடுக்கப்படுமா என்பதை கௌரவ அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

06. ஆமெனில், குறித்த வர்த்தமானி அறிவித்தல் எப்போது மீளப்பெறப்படும் என்பதையும், இல்லையெனில் அதற்கான காரணம் என்ன என்பதையும் அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරයාගේ ප්‍රශ්නය සඳහා වන පිළිතුරෙහි තාක්ෂණික කරුණු ගණනාවක් ඇතුළත් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ගත යුතුව තිබෙනවා. ඒ නිසා ප්‍රමාණවත් කාලයකට පස්සේ මේ සඳහා පිළිතුරු ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, ගරු අග්‍රාමාත්‍යතුමිය. ගරු ඩී.වී.චානක මන්ත්‍රීතුමා විසින් 2025.07.09 වන දින ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## 2025.07.09 දින ගරු ඩී.වී.චානක මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය: ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රකාශය

## 2025.07.09ஆம் திகதி மாண்புமிகு டி.வீ. சானகவினால் கேட்கப்பட்ட வினா: மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

## QUESTION POSED BY HON. D.V. CHANAKA ON 09.07.2025: STATEMENT BY HON. PRIME MINISTER

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා විසින් 2025.07.09 දින අසනු ලැබූ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

(අ) 2005 වර්ෂයේ සිට 2025 මැයි මාසය දක්වා ශ්‍රී ලංකාවට ලැබුණු සෘජු ආයෝජන ප්‍රමාණය වාර්ෂිකව පහත සඳහන් වනවා.

| වර්ෂය | සෘජු විදේශ ආයෝජන (ඇ.ඩො.මි.) |
|---|---|
| 2005 | 287 |
| 2006 | 604 |
| 2007 | 734 |
| 2008 | 889 |
| 2009 | 601 |
| 2010 | 516 |
| 2011 | 1,066 |
| 2012 | 1,338 |
| 2013 | 1,391 |
| 2014 | 1,616 |
| 2015 | 970 |
| 2016 | 801 |
| 2017 | 1,710 |
| 2018 | 2,367 |
| 2019 | 1,189 |
| 2020 | 687 |
| 2021 | 780 |
| 2022 | 1,076 |
| 2023 | 737 |
| 2024 | 614 |
| 2025 මැයි දක්වා | 232 |
| එකතුව | 20,205 |

ගරු කථානායකතුමනි, එහි විස්තර ඇමුණුම 01හි සඳහන් වනවා.

(ආ) ආංශික විදේශ සෘජු ආයෝජන ප්‍රමාණ පිළිබඳ වෙන් වෙන් වශයෙන් තොරතුරු සියල්ලත් මම කියවන්නේ නැහැ. එම විස්තර ඇමුණුම 01හි සඳහන් වනවා. ඇමුණුම 01 පහත දැක්වේ.

[ගරු හරිනි අමරසූරිය]

ඇමුණුම 01

**BOARD OF INVESTMENTS OF SRI LANKA**
**Foreign Direct Investment (2005 onwards)**
*Sector Wise*
(Projects approved under Sec.16 & 17 of the BOI Law)

| Row Labels | FDI 2005 (US$ Mn) | FDI 2006 (US$ Mn) | FDI 2007 (US$ Mn) | FDI 2008 (US$ Mn) | FDI 2009 (US$ Mn) | FDI 2010 (US$ Mn) | FDI 2011 (US$ Mn) | FDI 2012 (US$ Mn) | FDI 2013 (US$ Mn) | FDI 2014 (US$ Mn) | FDI 2015 (US$ Mn) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Manufacturing | 136.99 | 236.21 | 174.11 | 190.02 | 164.17 | 159.61 | 323.05 | 307.98 | 359.77 | 333.90 | 256.99 |
| Food, Beverages & Tobacco | 29.38 | 34.38 | 25.93 | 14.24 | 10.68 | 17.54 | 41.83 | 75.98 | 49.70 | 44.69 | 42.67 |
| Textile, Wearing Apparel & Leather Prod. | 48.68 | 104.63 | 63.53 | 76.23 | 51.60 | 41.50 | 94.99 | 86.62 | 102.56 | 83.09 | 45.40 |
| Wood and Wood Products | 8.16 | 4.39 | 0.30 | 2.21 | 1.69 | 1.34 | 2.07 | 2.65 | 1.73 | 2.53 | 2.82 |
| Paper, Paper Products, Printing & Publishi | 1.05 | 0.94 | 0.10 | 0.86 | 20.80 | 8.71 | 3.92 | 4.05 | 2.10 | 36.27 | 2.22 |
| Chemical, Coal, Petroleum, Rubber | 23.28 | 45.45 | 52.83 | 37.58 | 14.99 | 43.50 | 66.23 | 58.96 | 114.38 | 91.92 | 75.41 |
| Non-Metallic Mineral Products | 0.56 | 6.31 | 4.83 | 12.77 | 11.18 | 10.63 | 17.79 | 17.97 | 44.97 | 29.71 | 13.66 |
| Fabricated Metal, Machinery & Transport | 12.30 | 12.60 | 9.30 | 14.01 | 14.99 | 14.88 | 68.24 | 38.82 | 16.98 | 6.97 | 46.07 |
| Other Manufactured Products | 13.60 | 27.49 | 17.29 | 32.12 | 38.24 | 21.51 | 27.99 | 22.94 | 27.33 | 38.72 | 28.73 |
| Agriculture | 0.47 | 0.67 | 0.43 | 2.65 | 3.69 | 6.45 | 17.97 | 6.90 | 8.47 | 5.72 | 3.87 |
| Agriculture | 0.47 | 0.67 | 0.43 | 2.65 | 3.69 | 6.45 | 17.97 | 6.90 | 8.47 | 5.72 | 3.87 |
| Infrastructure & Services | 149.74 | 366.81 | 559.83 | 696.26 | 433.39 | 350.24 | 725.04 | 964.28 | 1,023.17 | 1,188.79 | 708.81 |
| Infrastructure | 140.97 | 328.40 | 529.82 | 662.43 | 388.34 | 314.64 | 512.22 | 591.16 | 779.90 | 682.45 | 452.10 |
| Housing Property Development & Shop Of | 12.95 | 56.30 | 30.24 | 19.40 | 16.35 | 35.43 | 146.76 | 56.52 | 217.62 | 339.21 | 210.78 |
| Telephone & Telecommunication Network | 111.74 | 262.71 | 403.81 | 553.17 | 295.17 | 205.44 | 197.23 | 242.68 | 359.77 | 152.49 | 138.84 |
| Power Generation | 15.78 | 7.81 | 92.68 | 87.86 | 67.73 | 58.44 | 57.70 | 30.30 | 5.25 | 7.87 | 4.42 |
| Fuel, Gas, Petroleum & others | 0.50 | 1.11 | 1.38 | 0.05 | 1.83 | 15.06 | 109.03 | 66.25 | 39.69 | 4.65 | 46.84 |
| Port Container Terminals | | 0.48 | 1.72 | 1.94 | 7.25 | 0.28 | 1.50 | 195.42 | 157.58 | 178.24 | 51.22 |
| Services | 8.77 | 38.41 | 30.00 | 33.83 | 45.06 | 35.60 | 212.82 | 373.12 | 243.27 | 506.34 | 256.70 |
| Hotels & Restaurant | 2.91 | 5.21 | 3.75 | 3.01 | 7.40 | 11.81 | 161.21 | 117.31 | 67.93 | 68.35 | 183.23 |
| IT & BPO | 1.77 | 11.88 | 8.42 | 14.62 | 11.81 | 10.96 | 13.29 | 19.35 | 19.27 | 20.52 | 10.86 |
| Other Serivices | 4.08 | 21.32 | 17.83 | 16.20 | 25.85 | 12.83 | 38.32 | 236.46 | 156.07 | 417.47 | 62.62 |
| Non BOI Projects | | | | | | | | 59.00 | | 87.85 | |
| Grand Total | 287.20 | 603.69 | 734.36 | 888.94 | 601.25 | 516.30 | 1,066.06 | 1,338.16 | 1,391.41 | 1,616.26 | 969.66 |

| Row Labels | FDI 2016 (US$ Mn) | FDI 2017 (US$ Mn) | FDI 2018 (US$ Mn) | FDI 2019 (US$ Mn) | FDI 2020 (US$ Mn) | FDI 2021 (US$ Mn) | FDI 2022 (US$ Mn) | FDI 2023 (US$ Mn) | FDI 2024 (US$ Mn) | FDI 2025 Q1 (US$ Mn) | FDI (US$ Mn) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Manufacturing | 250.11 | 347.60 | 291.48 | 319.59 | 191.85 | 223.12 | 363.92 | 239.10 | 259.90 | 68.36 | 5,197.80 |
| Food, Beverages & Tobacco | 49.46 | 62.55 | 22.27 | 26.11 | 6.61 | 8.70 | 6.89 | 5.18 | 1.04 | 0.26 | 576.08 |
| Textile, Wearing Apparel & Leather Prod. | 24.43 | 78.19 | 90.60 | 104.85 | 78.13 | 101.55 | 104.12 | 84.71 | 45.97 | 28.70 | 1,540.11 |
| Wood and Wood Products | 3.09 | 2.30 | 4.91 | 7.25 | 9.00 | 9.53 | 3.86 | 2.59 | 2.23 | | 74.65 |
| Paper, Paper Products, Printing & Publishi | 3.06 | 7.92 | 8.96 | 1.31 | 1.17 | 1.10 | 2.00 | 2.74 | 8.65 | 0.04 | 117.98 |
| Chemical, Coal, Petroleum, Rubber | 99.55 | 105.01 | 97.32 | 108.37 | 61.20 | 68.39 | 207.76 | 98.91 | 165.65 | 31.21 | 1,667.90 |
| Non-Metallic Mineral Products | 26.84 | 28.15 | 20.99 | 7.50 | 2.63 | 4.60 | 1.51 | 7.68 | 14.41 | 3.88 | 288.55 |
| Fabricated Metal, Machinery & Transport | 11.92 | 8.95 | 7.84 | 9.51 | 3.37 | 6.53 | 5.99 | 10.16 | 6.46 | 1.92 | 327.80 |
| Other Manufactured Products | 31.76 | 54.52 | 38.60 | 54.71 | 29.73 | 22.73 | 31.79 | 27.15 | 15.48 | 2.34 | 604.75 |
| Agriculture | 1.89 | 1.41 | 0.46 | 1.34 | 0.76 | 0.50 | 0.17 | 0.14 | 0.06 | 0.01 | 64.02 |
| Agriculture | 1.89 | 1.41 | 0.46 | 1.34 | 0.76 | 0.50 | 0.17 | 0.14 | 0.063 | 0.012 | 64.02 |
| Infrastructure & Services | 549.01 | 1,361.29 | 2,074.92 | 867.93 | 494.39 | 556.62 | 711.54 | 498.09 | 353.83 | 134.75 | 14,768.71 |
| Infrastructure | 339.50 | 1,043.52 | 1,773.66 | 643.71 | 383.40 | 433.46 | 576.12 | 221.58 | 250.22 | 93.41 | 11,141.00 |
| Housing Property Development & Shop Of | 79.46 | 540.64 | 397.76 | 455.28 | 256.11 | 201.50 | 192.66 | 40.71 | 20.46 | 3.21 | 3,329.34 |
| Telephone & Telecommunication Network | 243.60 | 208.99 | 522.18 | 138.13 | 117.56 | 223.17 | 350.02 | 113.08 | 68.14 | 4.53 | 4,912.44 |
| Power Generation | 13.23 | 0.00 | 0.01 | 2.26 | 0.00 | 0.00 | 1.03 | 2.75 | 3.50 | 0.36 | 458.99 |
| Fuel, Gas, Petroleum & others | 1.58 | 1.05 | 3.74 | 0.85 | 1.54 | 1.36 | 0.55 | 34.70 | 70.69 | 1.16 | 403.60 |
| Port Container Terminals | 1.63 | 292.83 | 849.98 | 47.19 | 8.18 | 7.43 | 31.87 | 30.34 | 87.43 | 84.15 | 2,036.64 |
| Services | 209.51 | 317.77 | 301.26 | 224.22 | 110.99 | 123.16 | 135.43 | 276.51 | 103.60 | 41.34 | 3,627.71 |
| Hotels & Restaurant | 145.66 | 252.64 | 223.37 | 153.89 | 65.99 | 69.82 | 53.81 | 128.59 | 90.80 | 40.94 | 1,857.62 |
| IT & BPO | 22.50 | 25.01 | 58.74 | 39.99 | 26.40 | 43.93 | 6.74 | 12.41 | 2.65 | 0.14 | 381.24 |
| Other Serivices | 41.36 | 40.12 | 19.15 | 30.34 | 18.61 | 9.42 | 74.88 | 135.50 | 10.15 | 0.27 | 1,388.85 |
| Non BOI Projects | | | | | | | | | | | 146.85 |
| Grand Total | 801.00 | 1,710.29 | 2,366.86 | 1,188.87 | 686.99 | 780.24 | 1,075.63 | 737.329 | 613.7865 | 203.122 | 20,177.39 |

---

** මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.*
** இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.*
** This annex is also placed in the Library.*

(ඇ) 2011-2012 කාලයේදී සුප්‍රීම් ග්ලෝබල් හෝල්ඩින්ග්ස් ආයතනයට අනුබද්ධිත සුප්‍රීම් සැට් සමාගම විසින් දියත් කළ සන්නිවේදන චන්ද්‍රිකාව සඳහා ආයෝජනය කර ඇති මුදල පිළිබඳ අසා තිබෙන ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

සුප්‍රීම් සැට් සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී තිබෙන්නේ 2012 මැයි මස 23 වන දින වේ.

2013/14 කාලය තුළ මෙම ආයතනය රුපියල් මිලියන 12,104,936ක මුදලක් සන්නිවේදන චන්ද්‍රිකාව සඳහා යොදවා ඇත.

(ඈ) සමාගම විසින් ඉදිරිපත් කර ඇති ආයෝජන අයදුම්පතෙහි තොරතුරු අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය විසින් මුදල් ආයෝජනය කර නොමැත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17වන වගන්තිය යටතේ දේශීය වෙළෙඳ පොළ කේන්ද්‍ර කරගත් ව්‍යාපෘතියක් ලෙසයි ඒක ආයෝජනය කර තිබෙන්නේ. රුපියල් මිලියන 1,828ක ආයෝජනයක් සහිතව මහනුවර කාර්මික උද්‍යානයේ චන්ද්‍රිකා පද්ධතියක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා 2012.05.23 දින සුප්‍රීම් එස්ජ්ටී (පෞද්ගලික) සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති අතර, මෙම ව්‍යාපෘතිය මඟින් ග්‍රාහකයින් සඳහා විදුලි සංදේශ සහ විකාශන පහසුකම් සැපයීමට නියමිතය.

මෙම ව්‍යාපෘතිය 2015.08.27 දින සිට වාණිජ මෙහෙයුම් ආරම්භ කර ඇත. පවතින වාර්තාවලට අනුව, වර්ෂ 2019 වන විට සමාගමේ කොටස් ව්‍යුහය පහත පරිදි වේ.

සුප්‍රීම් එස්ජ්එල් ඉන්වෙස්ට්මන්ට්ස් (පෞද්ගලික) සමාගම - කොටස් 47,180,200 - 20%

සුප්‍රීම් ග්ලෝබල් හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගම - කොටස් 188,344,970 - 80%

(ඉ) ආයෝජන මණ්ඩලය සතු වාර්තා අනුව, ශ්‍රී ලංකාවට මූල්‍ය ප්‍රතිලාභ ලෙස සුප්‍රීම් සැට් සමාගම විසින් පහත සඳහන් ආදායම් ලබා ඇත.

| වර්ෂය | ආදායම (රුපියල් මිලියන) |
|---|---|
| 2015/2016 | 19,617 |
| 2016/2017 | 28,133 |
| 2017/2018 | 29,106 |
| 2018/2019 | 34,169 |
| 2019/2020 | 42,960 |
| 2020/2021 | 62,545 |
| 2021/2022 | 87,789 |
| 2023 - 1st Half | 39,590 |

ගරු කථානායකතුමනි, දීලා තිබෙන වාර්තා අනුවයි මේ පිළිතුර සකස් කර තිබෙන්නේ. ලැබී තිබෙන දත්ත සහ තොරතුරු අනුව පමණයි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු කථානායකතුමනි, මම පළමුවෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමියට ස්තුතිවන්ත වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ලංකාව තුළ ආයෝජකයන්ට එල්ල කර තිබුණු ලොකුම ප්‍රහාරයකට අද ඔබතුමිය උත්තර දුන්නා. මා හිතන විධියට, ඒ ගැන ලංකාවේ අය වැඩියෙන්ම දන්නේ "චිචීගේ රොකට් එක" කිව්වාමයි. "සුප්‍රීම් සැට්" කිව්වාට වඩා, "චිචීගේ රොකට් එක" කිව්වොත් තමයි දන්නේ. ඒ සඳහා ලංකාව ඩොලර් මිලියන 300ක් ආයෝජනය කළා, එය අතුරුදහන් වෙලා කියලා තමයි කිව්වේ. මම ඒ ප්‍රශ්නය අහපු දවසේත් බිමල් රත්නායක මහත්මයා ආණ්ඩු පක්ෂය පැත්තේ ඉඳිමින් කිව්වා, එය අතුරුදහන් වෙලා කියලා. හැබැයි, දැන් අග්‍රාමාත්‍යතුමියම කියනවා, එහෙම දෙයක් වෙලා නැහැ, ඒකට ලංකාවේ එක රුපියලක්වත් ආයෝජනය කරලා නැහැ කියලා. ඒ වාගේම, අනෙක් පැත්තෙන්, 2005 සිට 2025 මැයි දක්වා ඇමෙරිකානු ඩොලර් මිලියන 20,000ක සෘජු විදේශ ආයෝජන රටට ඇවිල්ලායි තිබෙන්නේ.

ගිය සතියට කලින් සතියේ පාර්ලිමේන්තුවේදී සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකුත් "සුප්‍රීම් සැට්" චන්ද්‍රිකාව සම්බන්ධයෙන් කථා කරමින්, ඊට පහර ගසමින් කියනවා මම දැක්කා, ඒක ලංකාවේ රජයෙන් එවකට ජනාධිපතිතුමාගේ පුතාලට විනෝද වෙන්න කරපු දෙයක් කියලා. හැබැයි, අද අග්‍රාමාත්‍යතුමිය කියනවා, ඒකෙන් විශාල ආයෝජනයක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා, ඊට පසුව හැම අවුරුද්දකම - වාර්ෂික - ආදායමක් ලැබී තිබෙනවා කියලා.

මම අග්‍රාමාත්‍යතුමියගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්න කැමැතියි, එවැනි ආයෝජන අධෛර්යවත් කරන්න මේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරලා එසේ ප්‍රහාර එල්ල කිරීම ඔබතුමිය අනුමත කරනවාද කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මට BoI එකෙන් ලැබී තිබෙන තොරතුරු අනුව තමයි මම පිළිතුර සැපයුවේ. ඒක ගැන නිගමනයකට එන්න, එය විශාලද, පොඩිද, කොහොමද කියන එකක් ගැන මගේ අදහසක් කියන්න නම් ගියේ නැහැ. BoI එකෙන් දැනට සපයා තිබෙන මේ තොරතුරු අනුව තමයි මම මේ පිළිතුර ලබා දුන්නේ.

මා හිතන විධියට, මේ ගැන සමාජයේ කථාබහට ලක් වුණේ වෙනත් හේතු නිසා. ගරු මන්ත්‍රීතුමනි, ඒක ගැන ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහනවා නම් ඒකට උත්තර දෙන්නත් මට පුළුවන්. ඒක වෙනම වැඩක්. ඔබතුමා අහපු ප්‍රශ්නයට උත්තරය BoI එකෙන් ලැබුණු තොරතුරු අනුවයි මම ඉදිරිපත් කළේ. ඒ ආයෝජනය ලොකුද, පොඩිද, හොඳද, නරකද කියන එක ගැන සමාජය තීරණය කරයි. අපි කවදාවත් ආණ්ඩුව හැටියට; රජය හැටියට ආයෝජකයන් අධෛර්යවත් කරන්න නම් කිසිසේත්ම මැදිහත් වෙන්නේ නැහැ. ඒ ආයෝජනවලින් මිනිස්සු ගන්නා ප්‍රයෝජන සහ ඒවා කොහොමද සිද්ධ වෙන්නේ කියන එක වෙනම කථාවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ලොකුද, පොඩිද කියන එකක් අදාළ නැහැ, "ආයෝජන" කියන්නේ ආයෝජන. ලංකාවට එන ඩොලර්වලින් තමයි අපට තෙල් මිලදී ගැනීමේ ඉඳලා හැම දේම කරන්න වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ, අපට ලැබෙන විදේශ ප්‍රේෂණ, ඒ වාගේම සෘජු විදේශ ආයෝජන වාගේම සංචාරක කර්මාන්තය තුළින් ලැබෙන ආදායම. ඒක නිසා ඒක ලොකුද, පොඩිද කියා බලලා වෙනස්කම් කරන්න එපා. ඒ වාගේම, මොන ආණ්ඩුවෙන් ගෙන ආ ඒවාද කියා බලලා වෙනස්කම් කරන්නත් එපා.

[ගරු ඩී.වී. චානක මහතා]

අනෙක් කාරණය මේකයි. ගරු අග්‍රාමාත්‍යතුමියනි, BoI එකෙන් ලබා දුන් ඒ උත්තරය ඔබතුමිය මේ සභාවට ඉදිරිපත් කළේ එය අධ්‍යයනය කරලායි කියා අපි විශ්වාස කරනවා. ඒ වාගේම, අතිගරු ජනාධිපතිතුමා යටතේයි මේ අමාත්‍යාංශය තිබෙන්නේ. ඒක නිසා එහි උත්තර ලබා දීමේදී අපි විශ්වාස කරනවා, ඒවා ඇත්ත උත්තර කියා සලකා සහ ඔබතුමිය එම උත්තර අධ්‍යයනය කර ලබා දෙනවා කියලා.

ඒ වාගේම මම දැනගන්න කැමැතියි, මේ අවුරුද්දේ ආපු සෘජු ආයෝජන මොනවාද, ආපු ලොකුම ආයෝජනය මොකක්ද, එහි වටිනාකම කීයද කියලා. මම හිතනවා, ඔබතුමිය ඒ ගැන දන්නවා ඇති කියලා. ඒ පිළිබඳව තොරතුරු මොනවා හෝ තිබෙනවා නම් ඔබතුමියට පවසන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව නිශ්චිත තොරතුරු ලබා දෙන්න නම්, එය වෙනම ප්‍රශ්නයක් හැටියට යොමු කරන්න කියා ගරු මන්ත්‍රීතුමාට කියන්න. එතකොට මම පිළිතුර ලබා දෙන්නම්.

ගරු කථානායකතුමනි, ආයෝජන ගත්තොත්, සංවර්ධන ඉලක්ක එක්ක ගළපා තමයි ආයෝජනයක් හොඳද, නරකද කියන එක අපි තීරණය කරන්නේ. එහෙම නැතුව, එහි ප්‍රමාණය අනුව විතරක්ම නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

## ගරු හර්ෂණ රාජකරුණා මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு ஹர்ஷண ராஜகருணாவினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. HARSHANA RAJAKARUNA

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

ඊයේ දිනයේදී ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා විසින් අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ලද වාචික ප්‍රශ්නයකට අනුව හිටපු ජනාධිපතිවරුන්ගේ, ඇමතිවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ දරුවන්ට, ඥාතීන්ට සහ හිතවතුන්ට 2005 වර්ෂයට පසුව ජනාධිපති අරමුදල මඟින් මුදල් ලබා දීම පිළිබඳව විමසන ලදී.

එහිදී මාගේ නමත් ප්‍රකාශ වූ අතර, එවකට මගේ පියා ආණ්ඩුව නියෝජනය නොකළ අතර, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට එම ප්‍රතිපාදනය ලබා ගත්තේ නියමිත සුදුසුකම්වලට අනුව විධිමත් ක්‍රමවේදයකට යටත්වය. මම ඒක විශේෂයෙන්ම කියන්න ඕනෑ. මෙහිදී ආණ්ඩු පක්ෂය විසින් ඉතාම සැලසුම්සහගත ලෙස මෙම ප්‍රශ්නය සකස් කර හිතා මතා මා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන් අපහසුතාවට පත් කිරීමට කටයුතු කළ බව පෙනී යයි.

ඉතා පැහැදිලිව මම මේ කාරණය කියන්න ඕනෑ. මගේ උපාධිය අවසන් කළාට පසුව රජයේ ශිෂ්‍යත්වයකට මම ඉල්ලුම් කළා. ඒ ශිෂ්‍යත්වය පශ්චාත් උපාධි සඳහා යොමු කරන ලද ශිෂ්‍යත්වයක්. රුපියල් ලක්ෂ 5ක ශිෂ්‍යත්වයක් මට ලැබුණේ, ඉල්ලුම් කරලා, සම්මුඛ පරීක්ෂණයකට ගිහිල්ලා, සුදුසුකම් ඇතිවයි. ඇමතිතුමාම ප්‍රකාශ කළා, ලක්ෂ 730කට වඩා වැඩි මුදලක් එසේ ශිෂ්‍යත්ව සඳහා ලබා දුන්නා කියලා. ලක්ෂ 5ක ශිෂ්‍යත්වයක් මම ලබා ගත්තා. මගේ නම විතරයි කිව්වේ. අනෙක් ලක්ෂ 700 ගණනට අදාළව ශිෂ්‍යත්ව ලබා ගත් කිසිවෙකුගේ නමක් සඳහන් කළේ නැහැ.

ඒ වාගේම මම කියන්න කැමැතියි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මට ලබා දුන් ලියවිල්ලේ පිටපත කියවන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, අපේ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා තමයි මහපොළ ශිෂ්‍යත්වයේ නිර්මාතෘ. එතුමාටත් මේ වාගේම ශිෂ්‍යත්වයක් ලබා දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලාගේ පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර මැතිතුමාත් රජයේ ශිෂ්‍යත්වයක් ලබලා තමයි එදා රුසියාවට ගියේ. එම නිසා ගරු කථානායකතුමනි, මේක දිගින් දිගටම, දිගින් දිගටම කරන මඩ ගැසීමක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඉතාම ගෞරවයෙන් මේ කියන්නේ. ඔබතුමා මට ලබා දුන්නු ලිපිය කියවන්න. අමතර ඒවා කියවන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒක තමයි මම මේ පැහැදිලි කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මෙතැන බලාගෙන ඉන්නවා දරුවෝ. මේ දරුවෝත් කවදා හරි රජයේ ශිෂ්‍යත්වයකට ගිහිල්ලා ඊට පස්සේ මේ පාර්ලිමේන්තුවට ආවොත්, ඒකටත් චෝදනාවක් කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාව නතර කරන්න සිදු වෙනවා. ඔබතුමා මට ලබා දීපු ලියවිල්ල කියවන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ නිසා කරුණාකර මේ පිළිබඳව අවධානය යොමු කර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මගේ යුතුකම් හා වගකීම් නිසි පරිදි, බාධාවකින් තොරව ඉටු කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

ඊට අමතරව, මේ ආකාරයෙන් මාගේ දේශපාලන චරිතයට හානි වන අයුරින්, හිතාමතා, සැලසුම් සහගතව කටයුතු කරන අවස්ථා දිගින් දිගටම නිරීක්ෂණය වන බැවින් කරුණාකර මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ද මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එක එක්කෙනා තමන්ගේ මුහුණේ දැලි ගා ගත්තාට අපට කරන්න දෙයක් නැහැ. ඒකට රෝහණ විජේවීර සහෝදරයා ඇදාගෙන කථා කරපු එක ගැන මට වචනයක් කියන්න අවසර දෙන්න ඕනෑ. රෝහණ විජේවීර සහෝදරයාට ලැබුණු ශිෂ්‍යත්වය ලංකාවේ ජනතාවගේ මුදලින් ලැබුණු දෙයක් නොවෙයි. සෝවියට් කොමියුනිස්ට් පක්ෂයෙන් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට ලැබුණු ශිෂ්‍යත්ව ප්‍රමාණයකින් එකක් තමයි ඔහුට ලැබුණේ. ඒ වාගේම, රෝහණ විජේවීර සහෝදරයා කියන්නේ, බොහෝ වරප්‍රසාද සහිත පවුලක කෙනෙක් නොවෙයි. එය තමන්ගේ අතේ හැන්ද තිබියදී බෙදා ගත්තු එකක් නොවෙයි. ඒ නිසා කරුණාකරලා තමන්ගේ උත්තර තමන් දී ගන්න. අපේ පක්ෂයේ නිර්මාතෘවරයා ඒවාට නිකම් ගාවාගන්න එපා කියන ඉල්ලීම කරනවා. ඒක පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධවයි. *[බාධා කිරීම්]*

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මට-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් පැහැදිලි කිරීම කළා නේ. එච්චරයි. කරුණාකර ඔබතුමා දැන් වාඩි වෙන්න. ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මට අවස්ථාවක් ලබා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉල්ලීමක් කළාට පස්සේ අවස්ථාව ලබා දුන්නා. *[බාධා කිරීම්]* ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධවයි.

දසවන පාර්ලිමේන්තුවේ පළමුවන සභා වාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ලෙස මා මෙතෙක් රාජකාරි කළ අතර, එහි වගකීම හැකි උපරිම ආකාරයෙන් ඉටු කළ බව මම විශ්වාස කරමි. වර්තමාන ආණ්ඩුව COPA එකේ සභාපති ධුරය විපක්ෂයට ලබා දීමට එකඟතාව පළ කර ඇති බැවින්, ඒ සඳහා ඉඩ සලසා දීමට මා එම සභාපති ධුරයෙන් අද දින ඉල්ලා අස්වන බව කාරුණිකව දැනුම් දෙමි. *[බාධා කිරීම්]* එම ධුරයේ කටයුතු කරගෙන යාමට සහය දුන් සැමටම ස්තුතිය පළ කරන අතර, කමිටු,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක වාද විවාද කරන කථාවක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. *[බාධා කිරීම්]* නැහැ, වාද විවාදයක් නැහැ. වහාම වාඩි වෙන්න; කරුණාකර වාඩි වෙන්න. *[බාධා කිරීම්]* ඔය කරන දේ වැරැදියි. *[බාධා කිරීම්]*

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මම අද දිනයේ එම ධුරයෙන් ඉල්ලා අස්වන බව කාරුණිකව දැනුම් දෙමි. එම ධුරයේ- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා,- *[බාධා කිරීම්]*

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, මට මිනිත්තුවක කාලයක් ලබා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා ඉඳගන්න. *[බාධා කිරීම්]*

ඔබතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. *[බාධා කිරීම්]* කරුණාකරලා විනයක් ඇතිව හැසිරෙන්නකෝ, ගරු මන්ත්‍රීතුමන්ලා. මොනවාද මේ පොඩි එවුන් කෑගහනවා වාගේ කෑගහන්නේ මෙතැන? කොච්චර අශෝභනද? කරුණාකර වාඩි වෙන්න. *[බාධා කිරීම්]* කරුණාකර වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, මට මිනිත්තුවක කාලයක් ලබා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට මම උදේ ආවාට පස්සේ අවස්ථාව ලබා දුන්නා, එතුමාට තිබෙන කාරණාව පැහැදිලි කරන්න. *[බාධා කිරීම්]* නැහැ, නැහැ. එතුමා කළේත් වැරැද්දක්. *[බාධා කිරීම්]* එතුමාගේ නිර්දෝෂීභාවය කියන්නේ නැතුව වෙන වෙන අයගේ නම් කියන්න එතුමාට අවශ්‍යතාවක් නැහැ. එතුමාට කොහේවත් වරප්‍රසාදයක් නැහැ, වෙන අයගේ නම් කියන්න. ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]* වාඩිවෙන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. වාඩි වෙන්න. *[බාධා කිරීම්]* මතක තියාගන්න, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට පෞද්ගලික කරුණු පැහැදිලි කිරීමක් සඳහා පමණයි අවස්ථාව ලබා දුන්නේ. එතුමා මොකක්ද කළේ? එතුමාට අදාළ කාරණාව විතරක් පැහැදිලි කරනවා වෙනුවට, එතුමා වෙන අයගේ නම් සඳහන් කරන්න පටන් ගත්තා. එතකොට ඒ අදාළ පාර්ශ්වකරුවන් නැඟී සිටින එක වරදක් නොවෙයි. *[බාධා කිරීම්]* කරුණාකරලා වාඩිවෙන්න, ගරු මන්ත්‍රීතුමන්ලා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයට උත්තර දෙන්න බැහැ ඇමතිතුමාට. ඒක වැරදියි. ඔබතුමා මයික් එක දුන්නා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා ඉඳගන්න. *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඔබතුමා පක්ෂග්‍රාහී වෙන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා ඔක්කොම වාඩිවෙන්න. කරුණාකරලා වාඩි වෙන්න. ඔක්කොම නැඟිටලා ඉන්නවා. කරුණාකරලා වාඩි වෙන්න. පළමුවෙන් වාඩි වෙන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. ඔබතුමන්ලා මම කියන දේ අහන්න ඕනෑ. කරුණාකරලා වාඩි වෙන්න. ඔහොම ඔක්කොම නැඟිටලා හරියන්නේ නැහැ. ඔබතුමන්ලාට ඕනෑ විධියට මේ සභාව මෙහෙයවන්නේ නැහැ. *[බාධා කිරීම්]* කරුණාකර වාඩිවෙන්න. ඔහොම හිටගෙන හිටියොත් ඔබතුමන්ලා කිසිම කෙනෙකුට මම අවස්ථාව ලබා දෙන්නේ නැහැ. මෙතැන කී දෙනෙක් හිටගෙන ඉන්නවාද? කී දෙනෙක් අත උස්සනවාද? එහෙම බැහැ.

ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රකාශය කරන්න. *[බාධා කිරීම්]*

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධවයි. *[බාධා කිරීම්]*

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දසවැනි සැසිවාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ලෙස මා මෙතෙක් රාජකාරි කළ අතර, එහි වගකීම හැකි උපරිම ආකාරයෙන් ඉටු කළ බව මා විශ්වාස කරමි. *[බාධා කිරීම්]* වර්තමාන ආණ්ඩුව COPA එකේ සභාපති ධුරය විපක්ෂයට ලබා දීමට එකඟතාව පළ කර ඇති බැවින්, ඒ සඳහා ඉඩ සලසා දීමට මා එම සභාපති ධුරයෙන් අද දින ඉල්ලා අස්වන බව කාරුණිකව දැනුම් දෙමි. එම ධුරයේ කටයුතු කරගෙන යෑමට සහාය දුන් සැමට ස්තුතිය පළ කරන අතර, කම්ටු සාමාජිකයෙකු ලෙස අද දින සිට උපරිමයෙන් කැපවෙමින් වැඩ කටයුතු කරන බවද දැනුම් දෙමි.

බොහොම ස්තුතියි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා මට ලබා දුන්න ලිපියේ ඔය කිසිම නමක් සඳහන් වෙලා තිබුණේ නැහැ. නමුත් එතුමා මොකද කළේ? එතුමාගේ අවස්ථාව අනිසි ලෙස පාවිච්චි කරලා මෙතැන ප්‍රකාශ නිකුත් කරන්න පටන් ගත්තා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන්නේ ඔබතුමා මට ලබා දුන්න ලිපිය. *[බාධා කිරීම්]* ඔබතුමා ලබා දුන්න ලිපියේ ඒ කිසිම නමක් තිබුණේ නැහැ. ඔබතුමාට මේක කියවන්න විතරයි තිබුණේ. ඔබතුමා මෙතැනදී තනිකර නරක විධියට හැසිරුණා. ඔබතුමා වෙනත් අයගේ නම් ප්‍රකාශ කළා. ඒක වැරදියි. ඒක වැරදියි. ඔබතුමා ගැන විතරයි ඔබතුමාට කියන්න පුළුවන්. පෞද්ගලික කරුණු පැහැදිලි කිරීමකට ඔබතුමාට අවස්ථාව ලබා දුන්නාම,- *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අවස්ථාව අරගෙන ඒ අවස්ථාව නරක විධියට පාවිච්චි කළා. නරක විධියට පාවිච්චි කළා. කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]* එහෙම බැහැ. *[බාධා කිරීම්]*

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේ යෝජනා. ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* කරුණාකර වාඩිවෙන්න.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை வசதிகள் முகாமைத்துவ நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### INSTITUTE OF FACILITIES MANAGEMENT SRI LANKA (INCORPORATION) BILL

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே! பின்வரும் பிரேரணையை நான் சமர்ப்பிக்கின்றேன்.

> "இலங்கை வசதிகள் முகாமைத்துவ நிறுவகத்தைக் கூட்டிணைப்பதற்கான சட்டமூலத்தைக் கொண்டுவர அனுமதி வழங்கப்படுமாக"

**ගරු අමිර්තනාදන් අඩෙයික්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Urban Development, Construction and Housing for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා මගේ point of Order එක බාධාවකින් තොරව ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා point of Order එක කියන්න. මම අහගෙන ඉන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විශේෂයෙන් රාජ්‍ය පාර්ශ්වයට කරුණු පැහැදිලි කරන්න අවස්ථාව ලබා දෙනකොට, ඒ සම අවස්ථාව විපක්ෂයටත් ලබා දෙන්නට ඕනෑ. *[බාධා කිරීම්]* මම අවසන් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකක් එතැන නැහැ. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අවසන් කළේ නැහැ. හර්ෂණ රාජකරුණා මැතිතුමාට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමනි, ඒ ගැන මගේ පැහැදිලි කිරීම,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හර්ෂණ රාජකරුණා මැතිතුමාට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමනි, මේකයි. රාජකරුණා මන්ත්‍රීතුමාට,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඔව්. ඔබතුමාට පිළිතුරු දෙන්න යන්නේ මම. රාජකරුණා මන්ත්‍රීතුමාට ඒ අවස්ථාව ලබා දුන්නා, ඉල්ලුවාට පස්සේ. ඒත් එතුමා ඒකට අදාළ දේවල් නොවෙයි කියන්නේ. ඒක සම්පූර්ණයෙන් වැරදියි, ගරු විපක්ෂ නායකතුමනි. රාජකරුණා මන්ත්‍රීතුමා උදේම ඇවිත් එතුමාගේ කාරණාව කිව්වාම මම ඉතාම සද්භාවයෙන් අවස්ථාව දුන්නා. එතුමා ඒ ලිපියේ වෙනත් කිසිම නමක් සඳහන් කරලා තිබුණේ නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඔබතුමා ඒ වෙලාවේ එතුමාගේ කථාව නතර කරන්න කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, එතුමාට පැහැදිලිවම කිව්වා මේ භාර දීලා තිබෙන ලියවිල්ලේ තිබෙන දේ විතරක් කියවන්න කියලා. එතුමා වැරදි විධියට හැසිරුණා. වැරදි විධියට හැසිරුණා. *[බාධා කිරීමක්]* නැහැ.

ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත

## இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்
## SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සහ 3 දරන යෝජනා - දුම්කොළ බදු පනත යටතේ නියමය සහ තේ (අපනයන බදු සහ පාලන) පනත යටතේ නියෝග ද අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා. *[බාධා කිරීම්]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වෙලා වාඩි වෙන්න. [බාධා කිරීම්] නැත්නම් මට ඔබතුමා මේ සභාවෙන් එළියට දාන්න සිද්ධ වෙනවා. [බාධා කිරීම්]

විවාදය ආරම්භ කිරීම, ගරු කුමාර ජයකොඩි අමාත්‍යතුමා. Hon. Minister, you may commence the Debate. You have 20 minutes. - *[Interruption.]*

[පූ.භා. 11.43]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය සහ දුම්කොළ බදු පනත යටතේ නියමය සහ තේ (අපනයන බදු සහ පාලන) පනත යටතේ නියෝග අද විවාදයට ගැනෙනවා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, අද බලශක්ති අමාත්‍යවරයා විධියට මටත්, ගරු ජනාධිපතිතුමා ඇතුළු අපගේ රජයටත් සුවිශේෂී දවසක් විධියටයි මා සලකන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ඔක්කෝම වාඩි වෙන්නකෝ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
අද අප සම්මත කර ගැනීමට බලාපොරොත්තු වෙන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් අප රටේ විදුලිබල ක්ෂේත්‍රයේ විශාල පිම්මක් ලබා ගැනීමට අපි අපේක්ෂා කරනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නියෝගයක් දුන්නාම වාඩි වෙන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මෙම සංශෝධනයේ වැදගත්කම මා විසින් පැහැදිලි කළ පසු අද දවසේ සුවිශේෂත්වය ඔබට පැහැදිලි වනු ඇත. අපි ළමා කාලයේදීත්, අපේ දරුවෝත් ජාතික වීරයන්ගේ නාමාවලියක් කටපාඩම් කරනවා. එම නාමාවලියේ ඉහළින්ම සිටිය යුතු පුද්ගලයකුගේ නමක් ඇතැම් විට අපේ දරුවෝ දන්නේවත් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order, Hon. Member? - *[Interruption.]*

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Speaker, I am a Member of the Committee on Ethics and Privileges. - *[Interruption.]* Sir, I am saying this with utmost responsibility. When a matter of Privilege is raised, if there are certain mistakes, for example, if an Hon. Member has not kept to his written submission, your pointing that out to him is a different matter. But, to allow another Hon. Member to make comments about a matter that has just been raised, even before you refer the matter to the Committee, is very dangerous, Sir. Some comments or some decisions that you yourself have made whilst in the Chair are being investigated by that Committee.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, he raised his - *[Interruption.]*

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Wait, Sir, let me finish this. I am saying this with responsibility. The Hon. Leader of the House stood up

and misled you; he misled you with regard to certain comments that were purportedly made by the Hon. (Dr.) Ramanathan Archchuna when, in fact, he had not made them. And, you prevented Hon. (Dr.) Archchuna's speeches from going live. What I am now trying to say, Sir, is that when a Privilege Matter is raised, you have to refer it to the Committee before you take a decision. You must not allow other Hon. Members to make it a debate.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අහගන්නකෝ. ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමනි, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා මට ලිපියක් ලබා දුන්නා. ඒක කියවන්න තමයි එතුමාට තිබුණේ. එතුමා ඒ ලියුමේ content එකට අදාළ නැති දේවල් කියවන්න පටන් ගත්තා. ඒ නිසා මම එතුමා නතර කළාම, ඒත් කියවාගෙන ගියා. *[බාධා කිරීමක්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

You should have stopped that. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Stop කරන්න කිව්වත් ඒක කියවාගෙන ගියා. කියපුවාම අහන්නේ නැහැ, ඒක හරි වැරදියි. ඒක එතුමාගේ discipline නැතිකම. *[බාධා කිරීමක්]* ගරු කුමාර ජයකොඩි අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 20ක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි, පෞද්ගලික කරුණු පැහැදිලි කිරීමක්. It is not a Privilege Matter. මේ කාරණාව තේරෙන්නේ නැහැ නේ ඔබතුමන්ලාට.

ගරු කුමාර ජයකොඩි අමාත්‍යතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

අපි ළමා කාලයේදීත්, අපේ දරුවෝත් ජාතික වීරයන්ගේ නාමාවලියක් කටපාඩම් කරනවා. එම නාමාවලියේ ඉහළින්ම සිටිය යුතු පුද්ගලයකුගේ නමක් ඇතැම් විට අපේ දරුවෝ දන්නේවත් නැහැ. ඒ තමයි අද සිට සියවසකටත් ඉහතදී ලංකාවේ පළමුවෙනි විදුලිබල ප්‍රතිසංස්කරණ මේ රටට හඳුන්වා දීමට තම ජීවිතය කැප කළ ඩී.ජේ. විමලසුරේන්ද්‍ර මහත්මයා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1918 වාගේ ඈත යුගයක විමලසුරේන්ද්‍ර මැතිතුමා ජල විදුලිය මේ රටට හඳුන්වා දුන්නේ ඒ සමඟ ලංකාවට විදුලි දුම්රියත් හඳුන්වා දෙන අදහසින්. නමුත් අධිරාජ්‍යවාදී පාලකයින් ඔහුගේ හඬට ඇහුම්කන් දුන්නේ නැහැ. ඔහුගේ සිහිනය සැබෑ කරගන්න ඔහුට අවුරුදු තිස් ගණනක් පොර බදන්න වුණා. මේ වාගේ, විවිධ කාලවල අපට විදුලිබල ක්ෂේත්‍රයේ "බස් මිස්" වෙලා තිබෙනවා. මේ වාරයේ අපි එහෙම "බස් මිස්" කරගන්නේ නැහැ.

අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රය වෙළෙඳපොළ ක්‍රමයකට ප්‍රතිසංස්කරණය විය යුතු බවට සාකච්ඡා ආරම්භ වුණේ එක්දහස්නවසියඅනූ ගණන්වල. නමුත් ඒ සෑම කතිකාවකදීම එවක සිටි පාලකයන්ගේ යටි අරමුණ වුණේ මේ රටේ ජනතාවගේ දේපළ කුණු කොල්ලයට විකුණා දැමීම සහ ජනතාවගේ බොටුව මිරිකා විදුලි ගාස්තුවෙන් තම හෙංචයියන්ගේ බඩ වඩා ගැනීමට ඉඩ හැරීමයි. ඒකෙන් තමන්ගේත් බඩ වඩා ගැනීමයි. මෙතුවක් කල් ඇති වුණු විදුලි අර්බුද සියල්ලම ඇති කරපු අර්බුද මිස ස්වාභාවිකව ඇති වූ ඒවා නොවෙයි. ගත යුතු තීරණ නිසි කාලයේදී නොගෙන කල් මරමින් ඉඳ අර්බුදය ඇති වූ පසු හදිසි මිලදී ගැනීම් ආදී ක්‍රමවලින් මේ දේවල් කර තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, would you please sit down and listen to the Hon. Minister?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කුඩා රටක් වන අපේ රට විදේශීය ආයෝජන ගෙන්වා ගැනීම වැදගත්. එසේ ආයෝජන ගෙන්වා ගත යුත්තේ අලුත් රැකියා උත්පාදනය කරන්න. අපනයන වැඩි කර රටට ඩොලර් ගේන්න. විදුලිය කියන්නේ ඒ වාගේ ආයෝජන රටට ආකර්ෂණය කර ගැනීමට රජයේ මැදිහත්වීමෙන් සපයා දියයුතු යටිතල පහසුකමක්. වගකිව යුතු රජයක් කළ යුත්තේ කලාපයේ අනෙක් රටවලට සාපේක්ෂව අඩුම මිල සහිත විදුලිය රට තුළ නිපදවා නිෂ්පාදන ආර්ථිකයකට අවශ්‍ය ආයෝජන රටට කැඳවා ගැනීමයි. නමුත් පසුගිය වසර 40 පුරාම සිදුවුණේ කුමක්ද? අපට මතකයි, 1996දී විදුලි අර්බුදයක් ඇති වුණා. රාත්‍රියට විදුලිය කපන්න සිද්ධ වුණා. ඇයි එහෙම වුණේ? විදුලිබල මණ්ඩලය ඒ වෙනකොටත් සකස් කර තිබූ සැලසුම් අනුව අඩු වියදම් බලාගාර නිසි කාලයේදී ඉදි නොකිරීම. ඒකට විසඳුම ලෙස කළේ මොකක්ද? ඉතා අධික මිලැති ගෑස් ටර්බයින් ගෙනැල්ලා ගහන්න ව්‍යාපාරිකයන්ට අවස්ථාව ලබා දීම. එහෙම අවස්ථාව දීලා ඒකට කිව්වා, අපි රටේ බලශක්ති ක්ෂේත්‍රයට ආයෝජන කැඳෙව්වා කියලා. මේ බලාගාරවල ඉන්ධන වියදම සම්පූර්ණයෙන්ම දරන්නේ විදුලි පාරිභෝගිකයන්. ඊට අමතරව අවුරුදු 15-20 ගිවිසුම් මඟින් අර බලාගාරයේ මූලික පිරිවැයයි, ඉතා ඉහළ Return on Equity - ROE - එකකුයි ලැබෙන විධියට මේවා සකස් කරගත්තා. විදුලි බලාගාරයක් ඉදි කරනවා කියන එක ඉතා අඩු අවදානම් සහිත ඉහළ ප්‍රතිලාභ ලැබෙන ආයෝජන මාධ්‍යයක් බවට පත් වුණා. අපේ රටේ ජනතාව වරදවා වටහා ගන්නා කාරණයක් තමයි ඩීසල් බලාගාර ක්‍රියාත්මක වුණොත් විතරයි ඩීසල් මාෆියාව සතුටු වෙන්නේ කියන එක. ඇත්තටම මේ බලාගාර ක්‍රියාත්මක වුණත් නැතත්, ඒ අයගේ ප්‍රතිලාභය ලැබෙනවා. අපේ රටේ අහිංසක ජනතාවගේ විදුලි අවශ්‍යතාව ඇපයට අරගෙන ආයෝජන නාමයෙන් එක්තරා ව්‍යාපාරික පන්තියකට ලාභ ගන්න සකස් කරපු ක්‍රමයක් තමයි අපට ඉතිරි වුණේ.

[ගරු කුමාර ජයකොඩි මහතා]

මට ආරංචියි, මේ වෙනකොට සමහර කර්මාන්තශාලා හිමියෝ තමන්ගේ මීළඟ ආයෝජනය විධියට කරන්න පෙලඹෙන්නේ නව මැෂින් දාලා, නව සේවකයෝ වැඩට ගන්න එක නෙවෙයි, තමන්ට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා විශාල solar panel එකක් ගහලා විදුලිය ඒකකයක් රුපියල් 37 ගාණේ විදුලිබල මණ්ඩලයට විකුණන එක තමයි දැන් ඒගොල්ලන්ගේ ආයෝජනය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආයෝජන ක්ෂේත්‍රයේ මොකක් හරි විකෘතියක් තිබෙනවා කියලා පැහැදිලියි නේද? පෞද්ගලික අංශයෙන් විදුලි බලාගාරවලට ආයෝජනය කරන එක වැරදියි කියනවා නොවෙයි. ඔවුන් ලවා නිසි කලට නිසි තාක්ෂණයෙන් යුතු බලාගාර අප ඉදි කරගත යුතුව තිබුණා. එහෙම වුණා නම් අපට ස්වාභාවික වායු බලාගාරයක් අවුරුදු 10කට පමණ කලින් හදාගන්න තිබුණා. ඒවාට පෞද්ගලික අංශයේ ආයෝජන ගෙන්වා ගන්නත් තිබුණා. විනිවිදභාවයෙන් යුතු, තරගකාරී වෙළෙඳපොළක් හරහා විදුලිය ජනනය, සම්ප්‍රේෂණය හා බෙදා හැරීම වෙනුවෙන් අප පෙනී සිටින්නේ මෙසේ අර්බුද ඇති කරමින් ජනතාව සූරාකෑමේ ක්‍රමය නැවැත්වීමටයි. නමුත්, ජාතික ආරක්ෂාව වෙනුවෙන් විදුලිය ඇතුළු බලශක්ති ක්ෂේත්‍රයේ රජයේ පංගුව ආරක්ෂා කර ගැනීම අපේ රජයේ ප්‍රතිපත්තියයි.

අපි මේ ගෙන ආ සංශෝධන මොනවාද? 2024 පනතේ කර්තෘවරුන් ඉතා ප්‍රසිද්ධියේ කියන දෙයක් තමයි, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය, මන්නාරම සුළං විදුලි බලාගාරය වාගේ බලාගාර විකුණා දැමීම පිණිසම ඔවුන් ලංකා විදුලිබල මණ්ඩලය ආයතන 12කට වෙන් කරන්න යෝජනා කළ බව. ඔවුන් ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන වචනය තමයි ආයෝජන කැඳවා ගැනීම කියන එක. අපේ රටේ ජනතාවගේ සම්පත් නොවිකුණා ආයෝජන ගෙන එන හැටි අපි මේ මාස 10කට ආසන්න කාලයේදී පෙන්වා දී තිබෙනවා. අපි මේ සංශෝධනයෙන් ජනතා දේපළ විකිණීමට වැට බැඳලා තිබෙනවා. ආයෝජන නාමයෙන් අධික මිල සහිත ගෑස් ටර්බයින් ඉදි කළා වාගේ, ආයෝජන නාමයෙන් දැනට ජනතාව විසින් ගෙවා අවසන් කොට සැබැවින්ම ජනතාවට අයිති ජනතා දේපළ අපි විකුණන්න දෙන්නේ නැහැ. අපේ ජනතාව මේ බලාගාර, සම්ප්‍රේෂණ පද්ධතිවලට විදුලි බිලෙන් බදු ගෙවලා විතරක් නොවෙයි, තමන්ගේ උපන් ගම්බිම් අත හැරලා, ඇතැම් විට හුස්ම ගන්නා වාතය පවා වෙනදා තරම් පිරිසිදු නැති තත්ත්වයකට එන එක ඉවසලා විතරක් නොවෙයි, ඒ කාලයේ හිටපු පාලකයන්ගේ මෝඩකම්වලට තෙල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල ලැගලා ජීවිතයෙනුත් වන්දි ගෙවලායි තිබෙන්නේ. එහෙම කැප කිරීමෙන් උපයා ගත් ජනතා දේපළ අපි ආයෝජන නාමයෙන් විකුණන්න ඉඩ දෙන්නේ නැහැ. විකුණන්න ඉඩ තියන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මේකයි. NEAC කියලා ආයතනයක් ගැන 2024 පනතේ සඳහන් වුණා. එය ඇමති විසින්ම පත් කරන, ඇමතිට විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පමණක් උපදෙස් දෙන සභාවක්. National Electricity Advisory Council කියන එම සභාවට පැවරී තිබෙන කාර්යය සමහරක් දැනටමත් ලංකා විදුලිබල මණ්ඩලයෙන් කෙරෙන දේවල්. ඉතිරි ඒවා ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ දේවල්. විදුලිබල ක්ෂේත්‍රයට විතරක් මේ වාගේ තවත් ආයතනයක් පිහිටුවීමෙන් අනවශ්‍ය සංකීර්ණත්වයක් ඇති වෙනවා. සමස්ත බලශක්ති ක්ෂේත්‍රයම ඒකාබද්ධ කළ පුළුල් ජාතික බලශක්ති සැලසුම් ආයතනයක් ඉදිරියේදී ස්ථාපිත කරන්න අප බලාපොරොත්තු වෙනවා. අපි විදුලිබල ක්ෂේත්‍රය පෝෂණය කරන්න බලාපොරොත්තු වෙන්නේ මේ සංශෝධනය මඟින් ඇති කරන ප්‍රධාන ආයතන 4 නවීන, ශක්තිමත් ආයතන බවට පත් කිරීමෙනුයි.

2024 පනතේ අඩංගු ප්‍රධාන කාරණයක් තමයි, තරගකාරී වෙළෙඳ පොළක් ඇති කර ගැනීම. නමුත් මේ කාරණය පනතේ සඳහන් වෙන්නේ ඉතා සැහැල්ලු විධියටයි. "විදුලිබල තොග වෙළෙඳ පොළක් පිහිටුවනු ලැබේ" කියලා බොහොම සැහැල්ලුවෙන් කියලා තිබෙනවා. අපි ඒ වෙළෙඳ පොළේ ප්‍රධාන කොටස් වෙන් වෙන්ව හඳුනාගෙන ඒවා පිහිටුවන පිළිවෙළ පවා සඳහන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ආනුෂංගික සේවා - ancillary services - පිළිබඳ වෙළෙඳ පොළ, ඒ වාගේම සිල්ලර වෙළෙඳ පොළ - retail market - වාගේ අංශවලට අපි ඉඩ හදලා තිබෙනවා. මේ වෙළෙඳ පොළවල් තව වසර කිහිපයකින් ක්‍රියාත්මක තත්ත්වයට ආවාට පසුව සූර්ය විදුලි බලයේ ඇත්ත මිල, බැටරි ගබඩාවල ඇත්ත මිල වගේම, පාරිභෝගිකයෙක් light එකක් switch off කළාම ඉතිරි වෙන ඇත්ත මිල අපිට බලාගන්න පුළුවන් වෙනවා. මා අර කලින් සඳහන් කළ කැපකිරීම් කරලා රටේ ජනතාවගෙන් සියයට 100කට ආසන්න ප්‍රමාණයකට මේ වෙනකොට විදුලි පහසුකම් තිබෙනවා. ඒ සැපයුමේ තත්ත්වය - quality එක - ඉදිරියට ගන්න දැන් අපි බලන්න ඕනෑ. ඒ සඳහා පැය 24ම විදුලිය තිබෙන්න ඕනෑ, වඳුරෝ පැන්නාම මුළු විදුලිබල පද්ධතියම කඩා නොවැටී තිබෙන්න ඕනෑ, ඒ වාගේම ගෘහස්ත සහ කර්මාන්ත අංශයන්ට දැරිය හැකි කලාපයේ අඩුම මිලට විදුලිය ලබා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ පනතේ දුර්දාන්ත කොටස් සංශෝධනය කරලා, ඊළඟට ක්‍රියාත්මක කරන අපේ වැඩ පිළිවෙළ මොකක්ද? ලංකා විදුලිබල මණ්ඩලයේ දැනට සේවකයන් 23,000කට ආසන්න ප්‍රමාණයක් සේවය කරනවා. මෙම සේවකයන්ගෙන් ඉංජිනේරුවන් ප්‍රමුඛ තාක්ෂණික නිලධාරින් ගැන මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ නිලධාරින් අතිදක්ෂ වෘත්තිකයන් පිරිසක්. ලෝකයේ දියුණු යැයි සම්මත ඕනෑම රටක විදුලිබල පද්ධතිය පවත්වාගෙන යමින් දියුණු කිරීමට මේ වෘත්තිකයන්ට හැකියාව තිබෙනවා. පසුගිය වසර කිහිපයේදී අපේ ඉංජිනේරුවන් සිය ගණනක් ලංකාවට සාපේක්ෂව ඉතා ඉහළ වැටුප් සහිත ඉහළම තාක්ෂණික රැකියාවලට පිටත්ව ගියා. මේ තාක්ෂණික වෘත්තිකයන් ඇතුළු සියලු වත්මන් විදුලි සේවකයන් අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ මීළඟ පරිච්ඡේදයට අපට අවශ්‍යයි; අත්‍යවශ්‍යයි කියන එක පළමුවෙන් කියන්න ඕනෑ. ඒ වාගේම ඒ අය නැතුව අපේ විදුලිබල පද්ධතියට අතීතයකුත් නැහැ, වර්තමානයකුත් නැහැ, අනාගතයකුත් නැහැ.

අපි ඔබ සමඟ උරෙන් උර ගැටෙමින් මේ ජාතික සම්පත රැක ගැනීමට සටන් කළ පිරිසක් කියන එක විෂය භාර අමාත්‍යවරයා විධියට මම සියලු විදුලි සේවකයන්ට මතක් කරදෙන්න කැමැතියි. අප රජය බලයට පත් වුණේ ඔබේ ආශිර්වාදයෙන්. මාස කිහිපයකින් ඔබට අලුත් ආකෘතියක විදුලිබල ක්ෂේත්‍රයක් අත්දකින්න ලැබුණත්, ඔබ මෙතෙක් කල් රැක ගැනීමට සටන් කළ සියලු හරයන්, වටිනාකම්, ඔබේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද ඔබටත් ඉදිරියෙන් සිට ආරක්ෂා කර දීමට අප වගවන බව මතක තබාගන්න. වෙනත් පාලකයන් මෙන් නොව ඔබට අපගේ භාවිතයන් ගැන විනිශ්චයකට එන්න පුළුවන්. අප ගැන විශ්වාසය තබා ඊළඟ පරිච්ඡේදයට අප සමඟ අත්වැල් බැඳගන්න. වෙනත් රටක රැකියාවකට යැමට හිතනවා නම්, රට වෙනුවෙන් ඒ ගැන දෙවරක්, තෙවරක් හිතන්න කියා මා ආරාධනා කරනවා. පැරණි පාලකයන් කිසිදු ඉදිරි දැක්මක් නැතිව ලංකා විදුලිබල මණ්ඩලයට අනවශ්‍ය ලෙස සේවකයන් බඳවා ගත්තා වන්නට පුළුවන්. ඒ අයගේ තීරණ මතම අපේ රටේ ජනතාව පැය 12ක් අඳුරේ ඉන්න තත්ත්වයකට පත් වුණාම, ඔබ ඔවුන්ට බරක් කියා කිව්වා. ඔබ සහ අප අතර අසමගිය ඇති කරන්නට දත කන පණ්ඩිතයන් කියන ආකාරයට 23,000කට ආසන්න වූ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක පිරිස බරක් විධියට අපි දකින්නේ නැහැ. අපි ඔබව

දකින්නේ මානව සම්පතක් විධියටයි. අප විසින් අති නවීන පද්ධති ක්‍රියාකරුවකුගෙන් සමන්විත ආයතනයක් බිහි කරගත යුතුයි, අති නවීන ජනන සමාගමක් බිහි කර ගත යුතුයි, අති නවීන සම්ප්‍රේෂණ පද්ධතියක් බිහි කර ගත යුතුයි, මහජනතාවට ළංව සේවය කරන අති නවීන බෙදා හැරීමේ පද්ධතියක් බිහි කර ගත යුතුමයි. මේ සියල්ල රුපියල්වලින් හෝ ඩොලර්වලින් විතරක් ගොඩනහන්න බැහැ. ඒ යෝධ කර්තව්‍යයට අනිවාර්යයෙන්ම වත්මන් විදුලි සේවකයන් අපට අවශ්‍යයි. ඒ නිසා මම නැවත මතක් කරන්නේ ඔබේ අයිතිවාසිකම්, වරප්‍රසාද අපි ආරක්ෂා කර දෙනවා පමණක් නොවෙයි, ඒවා තවත් ශක්තිමත් කරන්නට සාමූහික ගිවිසුම් - collective agreements - වාගේ ප්‍රගතිශීලී පියවරවලට යන්න අප දැනටත් කැපවෙලා ඒ වෙනුවෙන් ක්‍රියා කරමින් පවතින බවයි. ඔබ දැනටත් රටට කරන සේවය පිළිබඳව ඔබේ ඇති ස්වයං තෘප්තිය වැඩි වෙන, ජාතික පුනරුදයේ කොටස්කාරයෙක් බවට ඔබව පත් කර ගන්නා නායකත්වයක් අපි ඔබට ලබා දෙන බව මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ වෙලාවේ මේ පිළිබඳවත් සඳහන් කරන්න අවශ්‍යයි. මෙම සංශෝධනය අපට මීට මාස 6කට පමණ පෙර ගේන්න පුළුවන්කම තිබුණා. අප සිදු කළ යුතු සංශෝධන පිළිබඳව පැහැදිලි අවබෝධයක් මේ ආණ්ඩුව භාර ගන්නා විටම අපට තිබුණා. වසර එකහමාරකටත් වැඩි කාලයක් අපි මේ ගැන ගැඹුරු අධ්‍යයනයක් කර තිබුණා. නමුත් අපි ජනතාවට පොරොන්දු වුණා, මේ ගැන පුළුල් කතිකාවකින් පසු අපි මේ සංශෝධන කරනවා කියලා. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ දහස් ගණනක් වූ සේවකයන්, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, JICA ඇතුළු සංවර්ධන සහකරුවන් ඇතුළු ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ මාස 8කට ආසන්න කාලයක් මේ සම්බන්ධව අපි සංවාදයක නිරතව සිටියා. ඔවුන්ගේ සියලු අදහස් හා යෝජනා අපි සලකා බැලුවා විතරක් නොවෙයි, අපේ මූලික සංශෝධනවල වෙනස්කම් පවා කළා. හැබැයි, අපට ඔවුන්ගේ යෝජනාවලට එකඟ විය හැක්කේ රජයක් ලෙස ජනතාව සමඟ ඇති කර ගත් සම්මුතිය තුළ පමණයි.

අපි ජනතාවට පොරොන්දු වුණා, ජනතා දේපළ විකිණීමට උඩගෙඩි නොදෙන බවට. මේ කටයුත්තේදී අවසාන මොහොත දක්වාත් බලපෑම් කළ කණ්ඩායම් උත්සාහ කළේ රජය සතු සියයට සියයක් අයිතිය වෙනස් කරන්නයි. මේ මාස 8 පුරාවටම විරුද්ධ බලවේග පොදුවේ රජයටත්, පෞද්ගලිකව මටත්, අප විසින් පත් කළ නිලධාරින්ටත් මඩ, අවලාද ගසමින් මේ ජනතාවාදී සංශෝධන ආපසු හරවන්නට උත්සාහ කළා. අපි පත් කළ නිලධාරින් බොහෝදෙනෙක් රජයේ වැටුපක්වත් නොගෙන, රජයේ වාහනයක්වත් පාවිච්චි නොකර, ස්වේච්ඡාවෙන් මේ කාර්යයටත්, පොදුවේ රටේ බලශක්ති ක්ෂේත්‍රය ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගෙන යෑමටත් තම උපරිම සේවය ලබා දුන්නා. මුලින් ඒ කණ්ඩායම් උත්සාහ කළා, අපේ නිලධාරින්ට ළඟැඳියාවන් අතර ගැටුම් ඇති බව පෙන්වන්න. ඒ වාගේම ඒ අයට විදුලි බලාගාර අයිතියි කියලා පෙන්වන්න උත්සාහ කළා. ඒ විධියට බලාගාර අයිතියි කියලා මඩ ගහන අපේ අවංක නිලධාරින්ට එහෙම එක බලාගාරයක්වත් අයිති නැහැ. මේගොල්ලන් මේ මඩ ගහන්නේ කුලියට ගත් අන්තේවාසිකයෝ දාලා. එකම කුලී අන්තේවාසිකයෝ ටිකක් තමයි මේගොල්ලන් පාවිච්චි කරන්නේ. ඒගොල්ලන් කුලියට මාධ්‍ය සාකච්ඡා තියනවා. එකිනෙකට වෙනස් බැනර් ගහගෙන මාධ්‍ය සාකච්ඡා තියනවා, කුලියට picket කරනවා. බැරිම තැන මේ අය දැන් අපේ නිලධාරින්ට බොරු චෝදනා පටවලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා පැමිණිලි දානවා. එතැනට මාධ්‍යවේදීනුත් අරගෙන යනවා. ඒ අයට මේ සෙල්ලම තව වැඩි කාලයක් කරන්න ලැබෙන්නේ නැහැ කියන එකත් මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපගේ විරුද්ධවාදින්ගෙන් මා ඉල්ලා සිටින්නේ දැන්වත් ඔබේ මඩ, අවලාද නවත්වන්න කියලායි. ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයේ මීළඟ පරිච්ඡේදයට අද සිටවත් ධනාත්මකව හවුල් වෙන්න කියා මම ඔවුන් සියලුදෙනාට ආරාධනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Kabir Hashim. You have an allocation of 16 minutes.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
It is 18 minutes, Hon. Deputy Speaker.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. (Dr.) Archchuna?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I will read the relevant Standing Order. Please let me explain at least for 30 seconds. Do not switch off the mike. I will read the Standing Order. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) බලන්න. It states, I quote:

> "A member may in any proceedings question whether proper procedures have been or are being followed by making a point of order except at a time when a division is in progress.

So, anytime, an Hon. Member can raise a point of Order. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ඒක පැහැදිලියි නේද?

ඊයේ මගේ නම සඳහන් කරලා, මට "මාමා" කියලා මගේ මුහුණ පෙන්නලා කථා කරපු එක ඔබතුමාත් බලාගෙන හිටියා.

ඒකට උත්තර දෙන්න මම point of Order එකක් ඉල්ලුවාම, මූලාසනයේ සිටි කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය මට mike එක දුන්නේ නැහැ. එතකොට මට විනාඩි 7ක් කෑ ගහන්න වුණා. මමත් doctor කෙනෙක්; ඔබතුමාත් doctor කෙනෙක්. ඔබතුමා හැසිරෙන විධියට විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරුන් ඔබතුමාට ගරු කරනවා. ඒ නිසා කරුණාකරලා ඔය මූලාසනයේ වාඩිවෙන අනෙක් අයට කියන්න, මේ වාගේ දෙයක් තිබෙනවා කියලා. School යන ළමයින් පවා මේක කියවනවා.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

Hon. Kabir Hashim, you may start you speech now. You were previously allotted 18 minutes. But, due to all the rumpus that took place, the time of both sides has been reduced. So, now your time has been reduced to 16 minutes.

[12.02 p.m.]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

Okay, Hon. Deputy Speaker. I will get some extra time allotted.

Sir, ගරු අමාත්‍යවරයාට උත්තර දෙන්න කලින් මම යමක් කියන්න කැමැතියි. රෝහණ විජේවීර මහතාගේ නම කියනකොට බිමල් රත්නායක ඇමතිතුමා ඇවිස්සුණා. දැන් ඒකට ඇවිස්සෙන්න ඕනෑ නැහැ. මොකද, රෝහණ විජේවීරගේ ප්‍රතිපත්තිවල නොවෙයි දැන් ජේවීපී එක ඉන්නේ. රෝහණ විජේවීර නොවෙයි ඒගොල්ලන්ගේ නායකයා. දැන් ට්‍රම්ප් තමයි ඒගොල්ලන්ගේ නායකයා. *[බාධා කිරීම්]* ට්‍රම්ප්ගේ ප්‍රතිපත්ති, ට්‍රම්ප්ගේ කොන්දේසි තමයි ක්‍රියාත්මක කරන්නේ. *[බාධා කිරීම්]* ඉතින් මොකටද මේවා? *[බාධා කිරීම්]* අපි ට්‍රම්ප් ගැන කථා කළේ නැහැ නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ සමස්ත ආර්ථික දියුණුව සඳහා තරගකාරිත්වයට, සමාජ අභිවෘද්ධියට, බලශක්ති ක්ෂේත්‍රය ඉතා වැදගත් කියන එකේ තර්කයක් නැහැ. ඒක අපි කවුරුත් පිළිගන්නවා. ඒක රටට අවශ්‍යම ක්ෂේත්‍රයක්. මේ පුංචි වෙලාව තුළ කරුණු කිහිපයකින් මේ ගැන කථා කරන්න මම උත්සාහ කරන්නම්.

ඇතැම් දේශපාලනඥයන්, නිලධාරින්, ආණ්ඩුවල ඉන්න පිරිස් ආත්මාර්ථකාමීව වැඩ කරනවා. ඒ කියන්නේ, යම් අරමුණු මුල් කරගෙන පෞද්ගලික න්‍යාය පත්‍රවලට වැඩ කරන දේශපාලනඥයන් සහ නිලධාරින් පිරිසක් ඉන්නවා. ඒගොල්ලන් ජාතික ප්‍රතිපත්ති විකෘති කරන්න උත්සාහ දරනවා. ඒක දැනුත් වෙනවා. ඒ වෙලාවට ඒගොල්ලන් ඒවා විකෘති කරන්න පාවිච්චි කරන්නේ මොකක්ද? උද්‍යෝග පාඨ, ජනප්‍රිය සටන් පාඨ, ජනප්‍රියවාදය. ඒ අයට එවැනි වචන සෙට් එකක් තිබෙනවා, හැම වතාවකම පාවිච්චි කරන. ඒක ජේවීපී එක හොඳටම දන්නවා. ජාතික ආරක්ෂාව කියයි, ජනතා බලය කියයි, පෞද්ගලික ප්‍රාග්ධනය අනතුරුදායකයි කියයි, මුදලාලිකරණය කියයි, විදේශ ආක්‍රමණය කියයි. ඔය වාගේ කථාවලින් තමයි මේවා වසා ගන්නේ. ඇත්තවශයෙන්ම රාජ්‍ය නිලධාරිවාදය සහ මේ දේශපාලන අධිකාරිය, මේ බලධාරින් ටික එකතු වෙලා මේ උද්‍යෝග පාඨ, ජනප්‍රිය සටන් පාඨ භාවිත කරලා, දූෂිත බැම්මක් හදාගන්නවා, තමන්ගේ ඒකාධිකාරී බලය රැකගන්න. ඒ විකෘති තත්ත්වය තවදුරටත් රැකගන්න තමයි, මේ වාගේ සංශෝධන ගෙනෙන්නේ. සමහර සංශෝධන බදාම හැටියට ගෙනෙනවා, ඒ දූෂිත බැම්ම වසාගන්න. අපි විශ්වාස කරනවා, එම ඒකාධිකාරී මාෆියාව වසාගන්න අදත් ගෙනැල්ලා තිබෙන්නේ ඒ වාගේ සංශෝධනයක් කියලා. ඒ සංශෝධනයට එරෙහි වන්න විපක්ෂය ගන්න ස්ථාවරය මොකක්ද කියලා අපි කියන්න ඕනෑ. හැබැයි ඒක කියන්න ඉස්සර වෙලා බලශක්ති ක්ෂේත්‍රයේ පසුබිම ගැන මම කෙටියෙන් කථා කරන්න ඕනෑ.

විදුලිබල මණ්ඩලයේ ව්‍යූහය ස්ථාපිත කරන්නේ 1969දී ඩඩ්ලි සේනානායක ආණ්ඩුව යටතේ. එතකොට 2000 දශකය තුළ ගෝලීය වශයෙන් කලාපීය රටවල් හැම එකක්ම බලශක්ති පද්ධතිය මිටි ලිහිල් කිරීම - unbundling - කියන ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළට ගියා. හැබැයි ශ්‍රී ලංකාවත් ඒ කාල පරිච්ඡේදය තුළ, 2001දී රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබෙද්දී කරු ජයසූරිය මහතා විදුලිබල හා බලශක්ති ඇමතිවරයා හැටියට ඒ සම්බන්ධයෙන් ප්‍රගතිශීලී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. ඒක ලංකාවේ හොඳම පනත් කෙටුම්පත කියලා ඕනෑම විශේෂඥයෙක් කියනවා. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණේ union එක මොකද කළේ? ඇමතිතුමා කිව්වා නේ, බස් එක miss වුණාය කියලා. බස් එක miss වුණේ කොහේද කියලා දැනගන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ union එකයි, විදුලිබල මණ්ඩලයේ ඇතැම් වෘත්තීය සමිතියි එකතු වෙලා ඒ පනත් කෙටුම්පතට විරෝධය පාලා අන්තිමට ඒ ආණ්ඩුවත් ගෙදර යැව්වා. එතකොට ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් 2004-2024 දක්වා ආසියානු කලාපය තුළ අධිකම විදුලි ගාස්තුව තිබුණේ ලංකාවේ. එය රටට, භාණ්ඩාගාරයට ලොකු බරක් වුණා. 2004දී එක්සත් ජාතික පක්ෂය ඒ වෙනුවෙන් ගෙනා විදුලි ප්‍රතිසංස්කරණයට ජනතා විමුක්ති පෙරමුණ ඉඩ දුන්නේ නැති නිසා එහි ප්‍රතිඵලය වුණේ මොකක්ද? 2021දී විදුලිබල සුරක්ෂිතතාව බිඳ වැටුණා. 2021 වර්ෂය වෙනකොට අපට විදුලිය නැතුව කළුවරේ ඉන්න වුණා. මුළු රටම කළුවරට ගියා. 2023දී විදුලිබල මණ්ඩලයේ ණය රුපියල් කෝටි 12,600ක් භාණ්ඩාගාරයට භාර ගන්න සිදු වුණා. ඒක ගෙවන්න වුණේ, මේ රටේ පුරවැසියන්ට. එතකොට ඒකත් විදුලිබල මණ්ඩලයේ බංකොලොත්භාවයට එක හේතුවක් වෙන්න පුළුවන්. ඒ වෙනකොට ඒ වාගේ ප්‍රශ්නයක් තිබුණා විතරක් නොවෙයි, 2025 February මාසයේදී මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව ජනතා විමුක්ති පෙරමුණු කැබිනට් මණ්ඩලයෙන් රුපියල් කෝටි 18,200ක විදුලිබල මණ්ඩලයේ තවත් ණයක් සම්බන්ධව තීරණයක් ගත්තා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා ඇති. රුපියල් කෝටි 18,200ක් වන ඒ ණයත් ගෙවන්න කියලා මේ රටේ ජනතාවට - පාරිභෝගිකයන්ට - පැටෙව්වා. ඒක කොහොමද කරන්නේ? ජනාධිපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් 159දෙනාම අත ඔසවලා IMF එකේ "Third Review under the Extended Arrangement" කියන ඒ agreement එකට යටත් වෙලා අද හැම පාරිභෝගිකයෙකුම ගෙවන විදුලි බිලෙන් කොටසක් යනවා, ඒ ණය පියවන්න. එතකොට ඔබතුමන්ලා තමයි පාරිභෝගිකයන්ට ඒ බර පටවන්නේ. ඔබතුමන්ලා කිව්වා, "මේවා හොරා කාපු සල්ලි. අපි ඒ මුදල ගෙවන්නේ නැහැ. මේක ජනතාවට පටවන්නේ නැහැ" කියලා. හැබැයි, දැන් ජනතාව තමයි ඒකත් ගෙවන්නේ. ඔය වාගේ තැනක ඉඳගෙන තමයි මේ පනත් කෙටුම්පත හරහා සංශෝධනයක් ගෙනෙනවා කියන්නේ. ඒ වාගේම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අපි ගහන පෙට්‍රල්, ඩීසල් ලීටරයකට රුපියල් 50ක් එකතු කරනවා. ඒකත් ඇමතිවරයා හොරකම් කරන සල්ලි කියලා ඔබතුමන්ලා කිව්වා. හැබැයි, ඒක තවම කපනවා. ඒ අස්සේ තමයි මේ Amendment එකත් ගෙනෙන්නේ.

ඇමතිතුමා දන්නවාද දන්නේ නැහැ, ලංකා විදුලිබල මණ්ඩලය කියන්නේ, සිරස් අනුකලනය මත පදනම් වූ ඒකාධිකාරී ආයතනයක් කියන එක. ඉංග්‍රීසියෙන් කියනවා නම්, vertically-integrated monopoly. ඒකේ අවපාලනය උපරිම වශයෙන් තිබෙනවා. එතකොට ඒක ප්‍රශ්නයක්. ඒක හදන්න ඕනෑ. ඒ ක්‍රමය හරියට තිබුණා නම් අද විදුලිබල මණ්ඩලයට මෙච්චර පාඩුවක් වෙන්න බැහැ. හැබැයි, හිටපු ඇමති කංචන විජේසේකර මැතිතුමා 2024දී ගෙනාපු පනත් කෙටුම්පත අංග සම්පූර්ණ නැහැ. අපි විපක්ෂය හැටියට එදා ඒ පනත් කෙටුම්පතේ හැම දෙයකටම එකඟ වුණේ නැහැ. ඒකේ අඩුපාඩු රැසක් තිබුණා. නමුත් ඒ වෙලාවේදී අපි ඒකට සංශෝධන කිහිපයක් ඉදිරිපත් කළා. ඒගොල්ලන් ඒ සංශෝධන භාර ගත්තේ නැහැ. හැබැයි, ඒ

වෙලාවේ හැටියට ජනාධිපතිවරණයක් පෙනෙද්දී ජනප්‍රිය ස්ථාවරයේ ඉන්නේ නැතුව, ගැලරියට ගහන්නේ නැතුව එතුමා ඉතා නිර්භීතව ඒ ප්‍රතිව්‍යුහගත කිරීමේ පදනම ගෙනාපු එක අපි ඇත්තටම අගය කරනවා. ඒකේ අඩුපාඩු තිබෙන්න පුළුවන්. හැබැයි, දැන් මම ඔබතුමන්ලාට කෙටියෙන් කියන්නම්, ඔබතුමන්ලා මේ ගෙනෙන සංශෝධනවලට අපි විරුද්ධ වෙන්නේ ඇයි කියලා.

කංචන විජේසේකර හිටපු ඇමතිතුමා 2024දී සම්මත කරපු පනත අනුව සිරස් අනුකලනය මත පදනම් වූ ඒකාධිකාරි ව්‍යුහය unbundle කරන්න, නැත්නම් මිටියෙන් ලිහීමට උත්සාහ කළා. ඒ නිසා එතුමා විදුලි ජනනය සමාගම් හතරකට බෙදා ගත්තා. එමෙන්ම බෙදා හැරීම ඒ වාගේම සමාගම් හතරකට බෙදා ගත්තා. ජාතික විදුලි සම්ප්‍රේෂණ ජාලයක් - National Grid Operation එකක් - National System Operator කියන ඒ ඔක්කෝම ටික හදද්දී අපි ඒකට කැමති වුණු හේතුවක් තිබුණා. එක පැත්තකින්, ඒ පනතේ සියලු නියාමන තිබුණේ රජය යටතේ. ඒ කියන්නේ, රෙගුලාසි සහ නියාමනය කිරීම සම්පූර්ණයෙන් තිබුණේ ලංකා විදුලිබල මණ්ඩලයට හෝ අමාත්‍යවරයාට. ඒ නිසා ඒක පෞද්ගලීකරණයට නිකම් දුන්නා කියලා නැහැ. Control එක තිබුණා. ඕනෑ විධියට ආණ්ඩුවට ප්‍රතිපත්ති සකස් කරන්න තිබුණා.

දැන් ඔබතුමා ගෙනෙන සංශෝධන අනුව ඔබතුමා ආපසු අඩියක් පස්සට අරගෙන සියයට සියයක් ඒ ඒකාධිකාරි ව්‍යුහයම නැවත ක්‍රියාත්මක කරන්න තමයි බලන්නේ. සියයට සියයක්ම ජනනය යටතේ "ට්‍රාන්ස්කෝ" කියන කොම්පැනියට NTNSP කියන එකේ සියයට සියයක අයිතිය තියාගෙන ඒ වාගේම distribution සියයට සියයක් ලංකා විදුලිබල මණ්ඩලයේ ඒකාධිකාරිය ව්‍යුහය තුළ තියාගෙන ආපස්සට අඩියක් ගන්න එක තමයි මේ පුබුදු නිරෝෂන් සංශෝධනයෙන් ක්‍රියාත්මක වෙන්නේ කියලා අපට කියන්න පුළුවන්. ඒක ඔබතුමාගේ සංශෝධනයක් නොවෙයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා ඒ සඳහා ඉදිරිපත් වුණේත් නැහැ. මේ ගැන කිසිම දෙයක් කථා කළේත් නැහැ. මේකේ විශේෂඥයා මම හිතන විධියට ඉංජිනේරු මහත්මයෙක්. පාර්ලිමේන්තුවේ ජනතා බලය තිබෙද්දී දැන් එතුමා කියනවා, අවුරුදු දෙකක් ගිහිල්ලා මේක unbundle කරනවා කියලා. කංචන ඇමතිතුමා ගෙනාපු පනතේ ඒ unbundle කිරීමේ ව්‍යුහය තීරණය කළේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ජනතා නියෝජිතවරුන්. දැන් මේක තීරණය කරන්න යන්නේ නිලධාරින්. පාර්ලිමේන්තුවෙන් පිට ඉඳලා අවුරුදු දෙකකින් තීරණය කරන්න යනවා, මොන කොම්පැනියට ද මේක විකුණන්නේ, කාටද මේ සමාගම් අයිති වෙන්නේ, කොයි ව්‍යුහයෙන්ද හදන්නේ කියලා. ඒකේ දූෂිත ක්‍රියාවන් සිදු වෙන්න ඔබතුමන්ලා ඉඩ හදනවා. What I would like to say is that the final unbundling of an SOE created by an Act of Parliament after intense debate in the Supreme Court has now been left, due to these Amendments, to the arbitrary administrative actions by unelected officials. That is what your Amendment seeks to do.

කංචන හිටපු ඇමතිතුමා ගෙනාපු 2024 පනත යටතේ National Electricity Advisory Council එකක් පත් කරනවා කිව්වා. එතුමා කිව්වා, ඒක පත් කරන්නේ කැබිනට් අනුමැතියක් එක්ක, විශේෂඥ පිරිසකගේ උපදෙස් ගන්න කියලා. අපි ඒකට යෝජනා කළා, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත් කරන්න කියලා. එදා විපක්ෂයේ හිටපු ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන් තුන්දෙනාත් ඒකට එකඟ වුණා. හැබැයි, අද මේ පුබුදු නිරෝෂන් සංශෝධනයෙන් මොකක්ද කියන්නේ? ඇමතිවරයාට පුළුවන්, කමිටුවක් - *ad hoc* කමිටුවක් - පත් කරන්න. ඒක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමටත් යටත් වෙන්නේ නැහැ; ඒ නීති රීතිවලට යටත් වෙන්නේත් නැහැ. ඒක රාජ්‍ය නීතියට යටත් වෙන්නේ නැති කමිටුවක් බවට පත් වනවා. එතකොට ඒ වගවීම කවුද භාර ගන්නේ? ඒ නිසා අපට ඒකට එකඟ වෙන්න බැහැ.

ඒ වාගේම ඉතිහාසය තුළ විදුලිබල පනත්වල තිබුණේ least-cost dispatch mechanism එකක්. විදුලිය සපයනකොට පාරිභෝගිකයාට උපරිම සහනය දීලා අඩුම වියදමට විදුලිය සැපයිය යුතුයි. හැබැයි, ඔබතුමාගේ සංශෝධනය ගෙනෙනවා, "security constrained economic dispatch" කියන වචන, ඒ "least-cost dispatch" කියන වචන වෙනුවට. අපි කිව්වා, "economic dispatch" කියන එක Act එකේ define කරන්න කියලා. නමුත්, ඒක define කරලා නැහැ. ඒකට ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කියපු කාරණාව තමයි, "ඇමෙරිකාවේ තිබෙන වචන සෙට් එකක් අපි මේ දමා ගත්තේ" කියන එක. මම කිව්වේ, ඔබතුමන්ලාගේ දැන් නායකයා ට්‍රම්ප් කියලා. එතකොට ඇමෙරිකාවේ වචන සෙට් එකක් මේකට දාලා හරියන්නේ නැහැ. මොකද, economic dispatch කියන්නේ, externalities - බාහිර වියදම් - මේක ඇතුළට අරගෙන පාරිභෝගිකයන්ට මේකෙන් ගහන්න පුළුවන් කියන එකයි. ඒ නිසා මේක පැහැදිලි නැහැ. මේකට අපි තරයේම විරුද්ධයි. අපි මේකට එකඟ වෙන්නේ නැහැ. මොකද, මේකෙන් පාරිභෝගිකයන් පාවා දීමක් සිද්ධ වනවා.

ඊළඟට, මේ පනතට ගෙනෙන සංශෝධනය තුළ එක වැදගත් දෙයක් අපි දැක්කා. එදා කරු ජයසූරිය මැතිතුමා ගෙනාපු පනත මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවෙන් ක්‍රියාත්මක කළා. ඒ කියන්නේ, මහජන උපයෝගිතා කොමිෂන් සභාවට තමයි නියාමකයා හැටියට සම්පූර්ණ බලය තිබෙන්නේ මේ රටේ විදුලි ගාස්තු අය කිරීම පිළිබඳව තීරණ ගන්න. ඒ ස්වාධීනත්වය අපි ආරක්ෂා කරන්න ඕනෑ. එතකොට ගාස්තු සකස් කරන ප්‍රතිපත්තිය ආණ්ඩුවට තිබෙනවා. හැබැයි, tariff වර්ග 7ක් තිබෙනවා. ඒ 7ම set කරන්නේ ඇත්තටම PUCSL එකෙන්. හැබැයි, ඔබගේ සංශෝධනය අනුව ඔබ ඒකට ඇතුළත් කරනවා, මහජන උපයෝගිතා කොමිෂන් සභාව tariff එක, නැත්නම් විදුලි ගාස්තුව අඩු වැඩි කරන කොට මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් ගත යුතුයි කියලා. මොකක්ද ඒකෙන් වැටහෙන්නේ? ඒ, ඒකෙන් දේශපාලන බලපෑමක් සිදු කරනවා කියන එක. ජනතා විමුක්ති පෙරමුණ මෙහෙම හිතනවා කියන එක පුදුමයි. මොකද, නිර්දේශපාලනීකරණයක් කරන්නයි ඔබතුමන්ලාව මිනිස්සු පත් කළේ. හැබැයි, ඔබතුමන්ලාගේ මේ සංශෝධනයෙන් කරන එක ඇත්ත වශයෙන්ම පුදුම කාරණාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට LTL Holdings Limited එක වාගේම Sri Lanka Energies (Pvt.) Limited එක ගත්තාම, 2024දී ගෙනාපු පනතේ යෝජනාවක් තිබුණා, ඒ අයට විදුලිබල මණ්ඩලයට අයිති කොටස් ටික මහා භාණ්ඩාගාරයට යොමු කරන්න ඕනෑ කියලා. අපි ඒක යෝජනා කළා, ආංශික අධීක්ෂණ කාරක සභාවේදී. හැබැයි, ඒකට ඔබතුමන්ලා එකඟ වුණේ නැහැ. ඔබතුමන්ලා ඒකට විරුද්ධ වුණා. අපි කියන්නේ, ඒක එතැනට යන්න ඕනෑ කියායි. මොකද, ඒ ස්වාධීනත්වය එහෙම තිබුණා නම් තමයි, LTL Holdings Limited එක විදේශ ආයෝජන සහ වෙනත් ආයෝජන ගලාගෙන එන්නේ. එතකොට අපට මේක දියුණු කරන්න පුළුවන්. කෝටි ගණනක්, ඩොලර් බිලියන ගණනක් ඕනෑ generation, transmission සහ distribution දියුණු කරනවා නම්. නමුත්, රජයක් හැටියට අපට ඒ මුදල් නැහැ. ඒවා ගන්නේ නැතුව කරන්න බැහැ. ඉන්දියාව පවා එහෙම තමයි ඒගොල්ලන්ගේ පද්ධතිය දියුණු කර තිබෙන්නේ.

ඊළඟට, ආංශික අධීක්ෂණ කාරක සභාවේ ඔක්කොමලා එකඟ වුණා - JVP එකෙන් ආපු මන්ත්‍රීවරුනුත් එකඟ වුණා - ඒ LTL Holdings Limited එක transmission company එක, NTNSP එක, යටතේ තියන්නේ නැතුව residual company එකට,

[ගරු කබීර් හෂීම් මහතා]

නැත්නම් shared services company එකට යොමු කරන්න ඕනෑ කියලා. ඒකට එකඟ වුණාට පසුව සිදු වුණු පුදුම වැඩේ තමයි, නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත මහත්මිය ඒකට පටහැනිව කථා කරලා තිබීම. එතුමිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ට යවන ලිපියේ මෙසේ සඳහන් වෙනවා:

> "As such, the proposed CSA deviates from the merits and principles of the Bill and therefore is inconsistent with Article 78(3) of the Constitution."

But, I say that the Attorney-General's representative does not explain how or why moving LTL Holdings Limited from the NTNSP to a residual company conflicts with Article 78(3) of the Constitution. So, I would like to ask the Attorney-General himself to explain to this House how that Committee Stage Amendment on moving LTL Holdings Limited deviates from the merits and principles of this Bill because it is a critical matter. ඒ ලිපිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, you have two more minutes left from your allotted time.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Can I have two more additional minutes, Hon. Chief Opposition Whip? - *[Interruption.]* Sir, he agreed to give me two more minutes. So, altogether, its four minutes, Sir.

මේ සංශෝධන පනත් කෙටුම්පත ක්‍රියාත්මක වෙන්න කලින්ම දේශපාලනීකරණයේ ඒකාධිකාරි නිලධාරිවාදය තවත් ශක්තිමත් වෙනවා කියන එක තේරෙනවා. තව එකක් පෙනෙන්න තිබෙනවා. ඒ තමයි, අපි සියලුදෙනාම සටන් කරපු පුනර්ජනනීය බලශක්තිය අඩපණ කිරීමට සැලසුම් කරපු කුමන්ත්‍රණයක් මේ සංශෝධනත් එක්ක තිබෙන බව අපට පෙනී යනවා. මම දැක්කා, ඒක ඇමතිවරයාත් සනාථ කරනවා, හැම තැනම මේ solar panels දාන්නේ ඒක ලොකු බිස්නස් එකක් නිසා කියලා. මීට වඩා මොකක්ද, හොඳ? අද solar power තමයි මම හිතන විධියට coalවලින් පසුව අඩුම වියදමට ගන්න පුළුවන්. ආසියානු සංවර්ධන බැංකුවෙන් පසුගිය අවුරුදු හය, හත ඇතුළත ඩොලර් මිලියන ගණනක් අපේ රටට ණය දීලා තිබෙනවා, Grid එකට සූර්ය බලය වැඩියෙන් අවශෝෂණය කර ගැනීම සඳහා. ඒකේ Report එකක් ඉදිරිපත් කළා. ඒගොල්ලන් Renewable Energy Development Master Plan එකක් නිකුත් කරලා, 2030වන කොට සියයට 70ක renewable energyවලින් මේ රට දුවන්න පුළුවන් වන සැලැස්මක් දුන්නා. අපි ඩොලර් මිලියන ගණනක් ණයත් ගත්තා. එතකොට මහජන උපයෝගිතා කොමිෂන් සභාව අනුමත කරපු, ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉදිරිපත් කරපු මේ Least-cost Long-term Generation Expansion Plan එකේ කියනවා, solar battery storage එක අපි ගිය වසරේ procure කරලා තිබෙන්න ඕනෑ කියලා. හැබැයි, battery storage එක procure කළේ නැහැ. දැන් ඒ වෙනුවට solar power පැත්තකට දාලා තිබෙනවා. නමුත් පුදුම වැඩේ, විස්මයට පත් වෙන වැඩේ තමයි LNG ව්‍යාපෘතියක් ගේන්න මේ ආණ්ඩුව සැලසුම් කරන එක. මේ LNG ව්‍යාපෘතිය විශාල පාඩුවක් සිදු වෙන එකක්. මාධ්‍ය හරහා ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ කාලයේ, 2021දී China Harbour Engineering Company එක සහ Engro Corporation එකෙන් දාපු ටෙන්ඩරයක් වන LNG plant එකක් ගැනයි කථා කරන්නේ. හැබැයි, ප්‍රශ්න කිහිපයක් මතු වෙනවා. ඒ මූලික ටෙන්ඩරයේ තිබුණේ, China Harbour Engineering Company එකත් එක්ක Engro Corporation කියන ආයතනයයි. හැබැයි, Engro Corporation කියන සමාගම දැන් ඉවත් වෙලා තිබෙනවා. ඒක පිළිබඳව අමාත්‍යාංශ ලේකම්තුමාත් interview එකකදී සනාථ කරනවා. ප්‍රසම්පාදන කොමිසමේ රෙගුලාසි අනුව ගරු ඇමතිතුමා, ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. එක පාර්ශ්වකරුවෙක් අයින් වුණාම ඒ ටෙන්ඩරය අවලංගු වෙනවා. එතකොට ඒක නීතියට පටහැනියි. හැබැයි, ලේකම්තුමා interview එකක් දීලා වෙන මොකක් හරි එකක් කථා කරනවා. ඇත්තටම ඇදහිය නොහැකි කරුණු එතුමාගේ උත්තරයේ තිබෙනවා. පුදුම වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ අද LNG ඉල්ලුම අඩු වෙලා තිබෙනවා. 2018දී තිබුණු ඉල්ලුම අද නැහැ. අද ජාත්‍යන්තර වෙළඳපොළේ LNG මිලත් වැඩි වෙලා තිබෙනවා. එතකොට සහස්දනව් විදුලි බලාගාර ව්‍යාපෘතිය ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලයෙන් ජනවාරි මාසයේ 31වන දා අනුමත කළා. එතැන වැරදි දත්ත දීලා, ව්‍යාජ අංක ගණිතයක් පෙන්වලා ඔබතුමන්ලා ඩොලර් එක රුපියල් එකසිය ගණනක් වන විධියට හදලා එකේ LNG unit cost එක රුපියල් 20ක් කියලා පෙන්වලා තිබුණා. PUCSL එකෙන් ඔබතුමන්ලාගේ ලේකම්තුමාට යවපු ලිපිය මම **සභාගත*** කරනවා.

මේකේ කියනවා, වියදම රුපියල් 43ක් කියලා LNG පාවිච්චි කරනවා නම්. ඔබතුමන්ලා දන්නවා, renewable energyවලින් රුපියල් 18කට unit එකක් නිෂ්පාදනය කරන්න පුළුවන් අවස්ථාවක ඔබතුමන්ලා මේ LNG ව්‍යාපෘතියක් කරන්න යන බව. එතකොට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ China Harbour Engineering Company ව්‍යාපෘතිය, මේ LNG ව්‍යාපෘතිය ගත්තාම, China Harbour Engineering Company එක කිසිම දවසක LNG ව්‍යාපෘතියක් කරලාම නැහැ; ඒකේ අත්දැකීම් නැහැ. එතකොට ඒගොල්ලන් මූලික ටෙන්ඩර් එකෙන් deviate වෙලා තිබෙනවා. ඒ වෙලාවේම ඊට කලින් LTL Holdings Limited එක Excelerate Energy කියන ඇමෙරිකානු කොම්පැනියක් එක්ක මේකටම ටෙන්ඩර් කළා. ඒගොල්ලන්ගේ location එක වෙනස් කරනවා කියලා කියපු නිසා ඒක deviation එකක් කියලා ඒගොල්ලන්ව අයින් කළා. දැන් China Harbour Engineering Company Project එකත් කියනවා, අර location එක ඒගොල්ලන් වෙනස් කරනවා කියලා. එතකොට, ඒකත් deviation එකක්. එතකොට, ඇමෙරිකානු සමාගම අයින් කරලා මේ සමාගම දමන එක නීතියට පටහැනියි කියලා ආපසු මේකෙන් පෙන්වා දෙන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, you have one more minute.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Yes, I am finishing up, Sir.

ගරු ඇමතිතුමා, මේකෙන් මම පුදුම වෙන දේ තමයි ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ලේකම්තුමාගෙන් interview එකක් කරලා අහනවා, මේ LNG plant එක දැන් approved ද කියලා. ඒකට "ඔව්" කියනවා. එතකොට LNG unit cost එක කීයද කියලා අහනවා. ලේකම්තුමා කියනවා, "I have no idea of the unit cost" කියලා. කොහොමද මේක අනුමත කරන්නේ? *[බාධා කිරීම්]* අනේ, මම දන්නේ නැහැ. ඊළඟට අහනවා, මේ Engro ආයතනයත් එක්ක එකතු වෙලා තමයි මේක කරන්නේ - *[බාධා කිරීම්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
පුබුදුගෙන් අහන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඔව්, ඒක පුබුදුගෙන් අහන්න ඕනෑ.

Engro එක තවම ඉන්නවාද කියලා අහනවා. "නැහැ, Engro එක අයින් වුණා" කියනවා. එතකොට එක ආයතනයක් අයින් වුණා නම්, ඒක cancel වෙන්න ඕනෑ. එතකොට කවුද, China Harbour Engineering Company එක ඊළඟට, මේකට ඇතුළත් කරලා තිබෙන්නේ Engro එක වෙනුවෙන් කියලා ඇහුවාම, ඒකට "I do not know" කියලා කියනවා. එතකොට එයත් දන්නේ නැහැ. මේක අනුමත කෙරුවාට එයා දන්නේ නැහැ, කවුද එන අලුත් partner කියලා. මේක නීති විරෝධියි. එතකොට ලේකම්තුමාගෙන් අහනවා, "What is the estimated cost of operating LNG power plant in the first year including fuel?" කියලා. ඒකටත් "No idea yet" කියනවා. ඒක ගැනත් ලේකම්තුමාට no idea. හැබැයි, ටෙන්ඩර් එක දෙන්න යනවා ලු. මේක ඉතාම දූෂිත එකක් කියලා මේ රටේ මිනිස්සු සැක කරනවා, ගරු ඇමතිතුමා. ඔබතුමන්ලා මේ Amendments එක්ක මේ ඒකාධිකාරී බලය සහිත මේ මාෆියාවට නැවත බලයක් දීලා තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

අවසන් වශයෙන් මම කාරණයක් කියන්නම්. 1976දී ලංකාවේ නිවෙස්වලින් සියයට 10කට අඩු ප්‍රමාණයකට තමයි විදුලිය තිබුණේ. අපි නියෝජනය කරපු අපේ මව් පක්ෂය විසින් මහවැලිය ඇතුළු ජල ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් කරපු නිසා 2000 වසර වෙනකොට නිවෙස්වලින් සියයට 56ක විදුලිය තිබුණා. ඉන්පසුව අපි 2001 සිට 2004 දක්වා කාලය තුළ "දීපාලෝක" වැඩසටහන ක්‍රියාත්මක කරලා 2005 වසර වනකොට මේ රටේ නිවෙස්වලින් සියයට 70කට විදුලිය ලබා දුන්නා. 2011 වසර වනකොට එය සියයට 90 දක්වා වැඩි වුණා. 2016 වසර වනකොට -යහපාලන ආණ්ඩුව වනකොට- අපේ ආණ්ඩුව යටතේ අපි මේ රටේ විදුලිය අවශ්‍යතාව සියයට 100ක් සම්පූර්ණ කර දුන්නා. අපට ඒ ගැන කථා කරන්න, ආඩම්බර වෙන්න පුළුවන්. නමුත්, මේ සංශෝධන ගෙනෙන ඔබතුමන්ලා ඒ කාල වකවානුව තුළ මොකක්ද කළේ? 1970දී ට්‍රාන්ස්ෆෝමර්වලට ගැහුවා. ඔබතුමන්ලා 1988 - 1989දී මේ රටේ ට්‍රාන්ස්ෆෝමර් පුපුරවලා මේ රට අන්ධකාරයට -කළුවරට- ගෙනිච්චා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please wind up?

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
I am finishing up, Sir.

2001, 2002, 2003දී කරු ජයසූරිය මහත්තයා ගෙනාපු ප්‍රගතිශීලීම විදුලිබල පනත ඔබතුමන්ලාගේ වෘත්තීය සමිති හරහා කඩාකප්පල් කරලා නැවත විදුලිබල මණ්ඩලයට කෝටි 50,000ක පාඩුවක් ඇති කළා. ඒ වගකීමත් ඔබතුමන්ලා තමයි භාරගත යුත්තේ. ඒ නිසා ඉතිහාසය තුළින් දකින්න පුළුවන්, මේ සංශෝධනයෙන් මේ රටට ඊළඟට වෙන්නේ මොකක්ද කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ravindra Bandara. You have nine minutes.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order? Take only 30 seconds.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට තෙල් සංස්ථාවේ බස් එකක් 50දෙනෙක් පුරවාගෙන මහරගම තිබෙන උද්ඝෝෂණයට පහර දීම සඳහා අරගෙන යනවා. මම ඇමතිතුමාට ඒක මතක් කරනවා. ඒ බස් රථයේ අංකයත් ඔබතුමාට දෙන්නම්. *[බාධා කිරීම්]* ඒක තමයි අද ඔබතුමන්ලාට සිද්ධවෙලා තිබෙන්නේ. *[බාධා කිරීම්]* මේකට විරුද්ධව අවශ්‍ය කරන- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is not a point of Order.

Hon. Ravindra Bandara, your nine minutes start now.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බස් එකේ නොම්මරේ ඉල්ලුවා නේ.*[බාධා කිරීම්]*

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මම හිතන විධියට අද උදේ- *[බාධා කිරීමක්]* නියෝජ්‍ය කථානායකතුමනි, මගේ වෙලාව - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravindra Bandara, you go ahead. - [Interruption.] Hon. Dayasiri Jayasekara, please take your seat. He noted that down. - [Interruption.] Hon. Members, please bring the House to order.

[අ.භා. 12.24]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් කියන්න ඕනෑ, අපි දැක්කා අද උදෙත් ජනාධිපති අරමුදල කියලා කියන්නේ මොකක්ද කියලා- *[බාධා කිරීම්]* මම මේ වෙනුවෙන් විනාඩියක් ගන්නවා. අපි දැක්කා, අද හර්ෂණ රාජකරුණා ගැන කථා කළා. ඊයේ මමයි ඒ ප්‍රශ්නය නැඟුවේ. මේ රටේ අහිංසක, දුප්පත් ජනතාව වෙනුවෙන් වැය කරන්න තිබුණු මුදල් -ජනාධිපති අරමුදල- *[බාධා කිරීම්]* ඒගොල්ලන් ඉඳලා අවුරුදු හැත්තෑ ගණනක් තිස්සේ මේ රටත් ආපස්සට යවලා, මිනිස්සුන්ගේ සල්ලිවලින් තමන් අධ්‍යාපනය ලබන්න පිටරට යන්නත් කටයුතු කරලා ලජ්ජා නැතිව තව එක එක කථා කියනවා. ඔය ඉන්නේ අනෙක් හාදයා. ඒ හාදයාත් ජනාධිපති අරමුදලෙන් අරගෙන, ඒක දෙන්නම් දෙන්නම් කියලා හැමදාම බොරු කියලා, කියන එක ඉල්ලා අස් කරගෙන ලජ්ජා නැතිව කථා කරනවා. පළාත් සභා ඡන්දය තියන්න ලු. පළාත් සභා තියන්න නොවෙයි, ඔයා කියන කියන ඒවා ඉල්ලා අස් කරගන්නවා. මෙතැන බාධා කරන්නේ නැතිව කරුණාකරලා වාඩිවෙලා අහගෙන ඉන්න, ඉස්සෙල්ලා. *[බාධා කිරීම්]* අපි ඉතාම වැදගත් පනතක් ගැනයි කථා කරන්නේ. *[බාධා කිරීම්]* ලජ්ජයි තමයි වාඩි වෙන්න. සුදු ඇඳගෙන හිටියාට වැඩක් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please speak to the topic?

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මිනිස්සුන්ගේ සල්ලිවලින් හොරා කාලා ඒවා ගසා කාපු හාදයෝ- *[බාධා කිරීම්]* ඔබතුමා වාඩිවෙන්න. *[බාධා කිරීම්]* කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Hon. Member, would you please speak to the topic of the Debate today?

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ඔයා අද කියනවා, හෙට ඉල්ලා අස් කරගන්නවා. ඕක නේ ඔයාගේ වැඩේ. ලජ්ජා නැතිව අර සල්ලි ටික ඉස්සෙල්ලා ගෙවලා ඉන්නකෝ, ජනාධිපති අරමුදලෙන් ගත්ත. *[බාධා කිරීමක්]* මම ඔයාගේ නම කිව්වේ නැහැ. වාඩිවෙන්න. *[බාධා කිරීමක්]* ඊළඟට, මම කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, I will give you a minute after the Hon. Member finishes.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
කබීර් හෂීම්, ඔයා හිටියේ ලංකාවේද කියලා මම අහනවා. *[බාධා කිරීම්]* ඔයා මේ ලෝකයේද, ලංකාවේද හිටියේ. ඔයගොල්ලෝ LNG ගැන කථා කළා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, I will give you only 30 seconds.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ඔය LNG එක 2009 ඉඳන් හතර පාරක් විවෘත කළා. හතර පාරක් විවෘත කළා. *[බාධා කිරීම්]* LNG ගෙනැල්ලාවත් නැහැ. LNG ගෙනැල්ලාත් නැහැ. *[බාධා කිරීම්]* ඕක තමයි ඔයගොල්ලෝ කරපු දේ. ඊළඟට කථා කරනවා, සූර්ය බලය ගැන. *[බාධා කිරීම්]* අහගන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please, give the mike to the Hon. Dayasiri Jayasekara. Take only 30 seconds, Hon. Member.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, ඒ මුදල් ගෙවීම සම්බන්ධව මම කටයුතු කරන්නම්. ඊට කලින් 2004 ඉඳලා 2008 වෙනකල් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු ගත්ත මුදල් ටික හරියට කියලා ඉන්න. එක්කෙනෙක් රුපියල් ලක්ෂ 10යි, අනෙක් කෙනා රුපියල් ලක්ෂ 20යි. ඒක කියලා ඉන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, Hon. Member, that is it. Hon. Member from the Government side who is on his feet, would you please stick to the topic of today's Debate? - *[Interruption.]*

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ඔය මෝඩ කථා, ගොන් කථා අහන්න මේ රටේ ජනතාව සූදානම් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා මට අවශ්‍ය වෙලාව ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
( மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, would you please stick to the topic of the Debate?

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ඔය මාතෘකාවට ආවොත්- *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ඔබතුමා කොහොමද mike එක දෙන්නේ එහෙම? *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Would you please take your seat, Hon. Deputy Minister?

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

මම විශේෂයෙන් කියන්න ඕනෑ,- *[බාධා කිරීම්]* ඔය කබීර් හෂීම් මහත්මයා මේක හොඳට අහ ගන්න. වාඩි වෙලා, හොඳින් අහගෙන ඉන්න. ඔබතුමා LNG බලාගාරය ගැනත් කථා කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! Hon. Member, would you please stop mentioning names? We are wasting a lot of time by doing that. Do not mention names.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ඒකත් අර "ෆොක්ස්වාගන්" කර්මාන්තශාලාව වගේ තමයි; හතරගමනක් විවෘත කළා. හතරගමනක් විවෘත කළත් මොකක්ද කළේ? එක LNG ව්‍යාපෘතියක්වත් ලංකාවට ගෙනැල්ලා නැහැ. *[බාධා කිරීම්]* ඔබතුමා සූර්ය බල සංග්‍රාමය ගැන කථා කළා. සූර්ය බල සංග්‍රාමය ගැන කථා කළාට- *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු මන්ත්‍රීතුමා-

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ඔළුව හොඳ නැති අය ඉස්සෙල්ලා ඔළුව පරීක්ෂා කරවාගෙන එන්න. ඔළුව පරීක්ෂා කරවාගෙන ඇවිල්ලා මෙතැන හැසිරෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සූර්ය බල සංග්‍රාමයක් ගැන එතුමන්ලා කථා කරනවා. හැබැයි, ඒක ගෙනාවට, එදා කෝ smart grid එකක් ඇති කළාද? කෝ pumped storage එකක් ඇති කළාද? කෝ, battery system එකක් ඇති කළාද? එදා ඒ මොකවත් කළේ නැහැ. නමුත්, අද අපේ බලශක්ති ඇමතිතුමා ඒ ටික ලස්සනට කරගෙන යනකොට දැන් මෙතුමන්ලාට රිදිලා.

මතක තබා ගන්න, ඔබතුමන්ලා ගෙනාපු, ඒ ආයතනය කෑලි 12ට කඩන ක්‍රමය නොවෙයි, මේ තිබෙන්නේ. එහිදී විශේෂයෙන්ම NTNSP යටතේ සියයට 50ක් දෙනවා පෞද්ගලික අංශයට. මේකේ එහෙම නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමාට කියලා දෙන්නම් ආයෝජන එහෙම එන හැටි. පොඩ්ඩක් වාඩි වෙලා අහගෙන ඉන්න.

ඊළඟට, සූර්ය බල සංග්‍රාමය ගැන කිව්වා. ඒ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන් අනාථ කළා; ඇනුවා. ඔබතුමන්ලා සේවක අයිතිවාසිකම් ගැනත් කථා කරනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, කිසිම සේවකයෙකුගේ අයිතිවාසිකම් නැති වෙන්නේ නැති බව. ඒ අයගේ විශ්‍රාම වැටුපට, සේවක අර්ථසාධක අරමුදලට කිසි දෙයක් වෙන්නේ නැහැ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Kabir Hashim, please wait until the Hon. Member finishes his speech. I will give you time to raise your point of Order.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ඔබතුමා වාඩි වෙන්නකෝ. නම කිව්වේ නැහැ නේ. අහගෙන ඉන්න. රිදෙනවා තමයි. රිදුණාට කමක් නැහැ. මේ ටික අහගෙන ඉන්න. මේ ටික හොඳට අහගෙන ඉන්න.

ඊළඟට, ඔබතුමන්ලාගේ තිබුණා සෙල්ලමක්. ඒ තමයි, හදිසි විදුලිය මිල දී ගැනීම. හදිසි මිල දී ගැනීම් කියන ඒවාට ඉදිරියේදී ඉඩ හම්බ වෙන්නේ නැහැ. ඔබතුමන්ලා දැන් කියනවා, "හදිසි මිල දී ගැනීම් කර ගන්න තිබුණා. ඒවා නැති වෙනවා" කියලා. ඒ

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

වාගේම ඔබතුමන්ලාට අවශ්‍ය වෙලා තිබුණේ මේ ආයතනය පෞද්ගලීකරණය කරන්න සහ සේවකයන් එළියට දමන්න. ඒ ඔක්කෝම වෙන්නේ නැති වනකොට දැන් මේ වැඩ පිළිවෙළට බාධා කරනවා. ජල විදුලි බලාගාර සියල්ලේ අයිතිය සියයට සියයක් රජය සතුව තියාගෙන, ආයෝජන ගෙනෙන්නේ කොහොමද, පෞද්ගලික අංශයට ආයෝජන අවස්ථා දීලා, ලංකා විදුලිබල මණ්ඩලය ගොඩ ගන්නේ කොහොමද කියලා තමයි මෙම වැඩ පිළිවෙළේ සැලසුම් වෙලා තිබෙන්නේ. එදා එම ආයතනය කැලි කැලිවලට කඩලා, කිසිම සැලසුමක් නැතුව කටයුතු කරන්න ගියා. කංචන හොඳටම කළා කියලා දැන් කියනවා. පන්සල්වලට විදුලිය දෙන්න ඕනෑ. පන්සල්වල සූර්ය පැනල සවි කර තිබෙනවා. හැබැයි, අවශ්‍ය capacity එක මොකක්ද කියලා බලලා නැහැ. මාතර ප්‍රදේශයේ තමයි ඒවා වැඩියෙන්ම සවි කර තිබෙන්නේ. ඒවා ගැන බලලා නැහැ. ගරු ඇමතිතුමා බොහොම සැලසුම් සහගතව, ලස්සනට වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. කිසිම සේවකයෙකුගේ වරප්‍රසාද, අයිතිවාසිකම් නැති නොවන විධියට, කිසිම සේවකයෙකු එළියට නොදමන විධියට වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. එයාලාට ඕනෑ නම් පුළුවන් ස්වකැමැත්තෙන් අයින් වෙන්න. ඒකටත් අවශ්‍ය ප්‍රතිපාදන සකස් කරලායි තිබෙන්නේ. අන්න ඒ විධියට මේ වැඩ පිළිවෙළ ලස්සනට ක්‍රියාත්මක කරගෙන යනකොට එය කඩාකප්පල් කරන්න කථා කරනවා.

ඊළඟට එතුමා කියන්නේ මොකක්ද? "මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් ගන්නවා" ලු. උපදෙස් ගැනීමක් නොවෙයි. ඒ සම්බන්ධයෙන් දැනුවත් කර, මුදල් අමාත්‍යාංශයෙන් විමසා, ඒ තිබෙන coordination එක- *[බාධා කිරීමක්]* අනේ ගරු මන්ත්‍රීතුමා, අහගෙන ඉන්න. ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත කියන්නේ, ඉතාම හොඳ පනත් කෙටුම්පතක්. ලස්සනට මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනකොට ඔබතුමන්ලාට ඒ ගැන හිතාගන්න බැහැ; ඔබතුමන්ලාට ඒක දරා ගන්න බැහැ. අන්න ඒක තමයි තිබෙන ප්‍රශ්නය. හැබැයි, මෙතැන කලබල කරලා, කෑගහලා, මේ වැඩ පිළිවෙළ ආපස්සට ගන්න බැහැ. විශේෂයෙන් කියන්න තිබෙන්නේ ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වීමත් එක්ක සේවකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වෙනවා. ඒ වාගේම, මීට අදාළ කොටස් කිරීම් විද්‍යානුකූල පදනමක් මත තමයි සිදු වෙලා තිබෙන්නේ. දැන් බලන්න, මේක හදපු මනුස්සයාගේ නම පවා කියනවා. ඒ නම කියන්න ඕනෑ නැහැ. මම නැවත කියනවා. LNG බලාගාරය විවෘත කළා, හතර වතාවක්. කංචන, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇවිල්ලා විවෘත කළා. කෝ, ඒ LNG බලාගාරය? ඒක නැහැ. සූර්ය බල සංග්‍රාමය ගැන කිව්වා. ඒක අනාථ වෙලා. මේ රට ඉස්සරහට යන්න නම්, මේ රටට ආයෝජකයෝ එන්න නම් විනිවිදභාවයෙන් කටයුතු කරන්න ඕනෑ. පෞද්ගලික අංශයේ ආයෝජන ඇවිල්ලා, තරගකාරිත්වයක් ඇති වෙලා, විනිවිදභාවයෙන් කටයුතු කරන්න ඕනෑ. අර ඔබතුමන්ලා කළා වාගේ, හදිසි මිල දී ගැනීම් කියලා ඉන්ධන ගත්තා වාගේ කථා දැන් නැහැ නේ. දැන් ඒවා කෙරෙන්නේ නැහැ නේ.

දවල්ට සූර්යාලෝකය ලැබෙනවා. රෑට සූර්යාලෝකය නැහැ. ඒක තමයි battery system එක හඳුන්වා දෙන්නේ; අවශ්‍ය වෙලාවට battery system එකෙන් විදුලිය දෙන්නේ. ක්‍රියාත්මක වුණු අසාර්ථක ක්‍රමවේදය වැළැක්වූවාම ඔබතුමන්ලාට රිදෙනවා. මේ වැඩ පිළිවෙළ ලස්සනට කරගෙන යනකොට ආයෙත් ලොවෙත් වෙනස් කරන්න බැරි තත්ත්වයට එනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up. Would you please wind up?

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order? I will give you 30 seconds.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ Standing Orders අනුව පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරයෙකුගේ නම කියන්නේ නැහැ. මට "කබීර්" කියලා එළියේදී කිව්වාට කමක් නැහැ. හැබැයි, පාර්ලිමේන්තුවේදී කියන්න ඕනෑ, "ගරු මන්ත්‍රීතුමා" හෝ "කබීර් හෂීම් මන්ත්‍රීතුමා" කියලා. එතුමා මගේ නම කිය කියා කථා කළා. ඒක හරි නැහැ. මම කැමැති නැහැ, එතුමාටත් ඒ විධියට අපහාස කරන්න. එම නිසා එතුමාට Standing Ordersවලට අනුව කථා කරන්න කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I did that, Hon. Member.

Order, please. The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Kaveenthiran Kodeeswaran. You have eight minutes.

[பி.ப. 1.00]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றையதினம் கௌரவ வலுசக்தி அமைச்சரால் கொண்டுவரப்பட்டுள்ள இலங்கை மின்சாரம் (திருத்தம்)

சட்டமூலம் மிகவும் முக்கியமானது. விசேடமாக, மின்சாரம் என்பது இந்த நாட்டு மக்களின் அடிப்படைத் தேவைகளில் ஒன்றாகவே தற்பொழுது பார்க்கப்படுகின்றது. மின்சாரத்தைப் பெறுகின்ற பயனாளிகள், மின்சார சபையில் வேலைசெய்கின்ற ஊழியர்கள் பாதுகாக்கப்பட வேண்டியவர்கள். மின்சார சபையில் வேலைசெய்கின்ற ஊழியர்களின் உரிமைகளைப் பாதுகாக்கவேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசுக்கு இருக்கின்றது. கடந்த காலத்தில் ஆட்சியில் இருந்தவர்களும் தற்போது ஆட்சியில் இருக்கின்றவர்களும் கூறிய ஒரு விடயம்தான் அரச நிறுவனங்களை தனியார்மயப்படுத்துவதில்லை என்பது. குறிப்பாக, “அரச நிறுவனங்களை தனியார்மயப்படுத்துவதை தடுத்து நிறுத்துவோம்; தனியார்மயப்படுத்தலுக்கு முக்கியத்துவம் கொடுக்கமாட்டோம்” என்று மாண்புமிகு சனாதிபதி அவர்கள்கூட சொல்லியிருந்தார்கள். எனவே, இந்த அரசு மின்சார சபையை தனியார்மயப்படுத்துவதை அல்லது அதன் பங்குகளை தனியாருக்குக் கொடுப்பதை நிறுத்த வேண்டும். மின்சார சபையை தனியார்மயப்படுத்தும்போது, அதில் வேலைசெய்கின்ற பெரும்பாலான ஊழியர்கள் பாதிக்கப்படக்கூடிய சூழ்நிலை ஏற்படும். அதுமாத்திரமன்றி, அவர்கள் வேலையற்று இருக்கவேண்டிய சூழ்நிலையும் ஏற்படும்.

தற்பொழுது, மின் கட்டணம் மிகவும் அதிகரித்துச் செல்கின்றது. இதனால் பாதிக்கப்படுகின்றவர்கள் யார் என்று பார்த்தால், ஏழை மக்களே! மின்சாரத்தைப் பெறுவதிலும் மின் கட்டணத்தைச் செலுத்துவதிலும் மிகவும் பாதிப்புக்கு உள்ளாகின்றவர்களாக ஏழை மக்களே காணப்படுகின்றார்கள். அவர்களின் வாழ்க்கைச் செலவு மிகவும் உயர்ந்து செல்கின்ற அதேநேரம், அவர்களின் வருமானம் மிகக் குறைவாகக் காணப்படுகின்றது. இந்த நாட்டின் நிலை தற்பொழுது அப்படியாகத்தான் காணப்படுகின்றது. சாதாரண ஒரு குடிமகன் மின் இணைப்பைப் பெற வேண்டும் என்றால், கிட்டத்தட்ட 42,000 ரூபாயை மின்சார சபைக்குச் செலுத்த வேண்டும். இதனால் வறுமைக் கோட்டுக்குக்கீழ் வாழ்கின்ற ஓர் ஏழை மகன் மின் இணைப்பைப் பெறுவதில் சிக்கல்களை எதிர்நோக்குகின்றான். அவனுக்குப் போதியளவு வருமானம் இல்லாத நிலையில், இந்தத் தொகையைச் செலுத்துவதில் பல தடங்கல்களைச் சந்திக்கவேண்டி உள்ளது. எனவே, வறுமைக் கோட்டுக்குக்கீழ் இருக்கின்றவர்கள் மின் இணைப்பைப் பெற்றுக்கொள்ளக்கூடிய வகையில் அரசாங்கமானது மானிய அடிப்படையிலான திட்டங்களை நடைமுறைப்படுத்த வேண்டும். கடந்த காலத்தில் இருந்த அரசாங்கம் சில மானியத் திட்டங்களை வழங்கியது. அதேபோல் இந்த அரசாங்கமும் மானியத் திட்டங்களை வழங்க வேண்டும்.

இந்த நாட்டில் மிகவும் கஷ்டப் பிரதேசங்கள் இருக்கின்றன. அங்கு தற்பொழுதுகூட மின்சார வசதி இல்லாத நிலைமையே காணப்படுகின்றது. உதாரணத்துக்கு, அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற கஞ்சிகுடிச்சாறு, தங்கவேலாயுதபுரம், தாண்டியடி, சங்கமம் கிராமம், பொத்துவில் போன்ற பிரதேசங்களிலுள்ள எத்தனையோ குடும்பங்கள் மின் இணைப்பைப் பெறமுடியாமல் இன்றும் இருளிலே இருக்கின்றன. நூறு சதவீதம் மின்சாரம் வழங்கப்பட்டு இருப்பதாக இங்கு சொல்கிறார்கள். அப்படியல்ல! அம்பாறை மாவட்டத்திலுள்ள கூடுதலான தமிழ் பிரதேசங்கள் மின்சார வசதி இன்றிய நிலையிலே காணப்படுகின்றன. கனகர் கிராமத்தில் - 60ஆம் கட்டையில் - 76 குடும்பங்களை மீள்குடியேற்றுவதற்கு அங்கீகாரம் பெறப்பட்டது. எனினும், அந்த மீள்குடியேற்ற கிராமத்தில் மின்சார வசதி எதுவுமில்லாமல் வாழவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைக்கு அம்மக்கள் தள்ளப்பட்டு இருக்கிறார்கள். அங்கு குறிப்பிட்டதொரு வீட்டுத்திட்டம் வழங்கப்பட்டு இருக்கின்றது. எனினும், அங்கு வீடுகளை அமைத்து அவர்களால் இருக்க முடியாத நிலை காணப்படுகின்றது. ஏனெனில், அங்கு இருள் சூழ்ந்த நிலை காணப்படுகின்றது. இதனால் அந்த மக்கள் யானைகளின் தாக்குதலுக்கு உள்ளாகி மரணிக்கின்ற துர்ப்பாக்கிய நிலையும் காணப்படுகின்றது. தற்பொழுது, இச்சபையில் விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் இருக்கிறார். பொத்துவில், கனகர் கிராமத்திலுள்ள மீள்குடியேற்ற கிராமத்துக்கு மின்சார வசதியை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் தயவாகக் கேட்டுக்கொள்கின்றேன்.

அம்பாறை மாவட்டத்தின் சில இடங்களில் மின்சாரத் தூண்கள் - electrical poles - இன்றும் RDAஇன் அனுமதி இல்லாமல் அல்லது பிரதேச சபையின் அனுமதி இல்லாமல் அமைக்கப்படுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமை காணப்படுகின்றது. அதுமாத்திரமல்ல, ஏற்கெனவே அமைக்கப்பட்ட சில மின்சாரத் தூண்கள் வீதியின் நடுவில் காணப்படுகின்றன. அவற்றை அகற்ற வேண்டும். ஏனெனில், அதனால் பல உயிரிழப்புகள் ஏற்பட்டிருக்கின்றன; பல அனர்த்தங்கள் ஏற்பட்டிருக்கின்றன. எனவே, இதனைத் தடுத்து நிறுத்தவேண்டிய கடமையும் பொறுப்பும் அரசாங்கத்துக்கு இருக்கின்றது.

விசேடமாக, இந்த அரசாங்கம் பயங்கரவாத தடுப்புச் சட்டத்தை நீக்க வேண்டும். இந்த அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்னர் இருந்த அரசாங்கங்கள் பயங்கரவாத தடுப்புச் சட்டத்தை நடைமுறைப்படுத்தின. அதனால்தான் இந்த நாடு மிகவும் பாரதூரமான சூழ்நிலைக்குள் தள்ளப்பட்டது. கடந்த கால அரசாங்கம் பயங்கரவாத தடுப்புச் சட்டத்துக்குப் பதிலாக பயங்கரவாத எதிர்ப்புச் சட்டத்தைக் கொண்டுவர இருந்தது. அப்போது தற்போதைய சனாதிபதி அவர்கள், "பயங்கரவாத தடைச் சட்டத்தை முற்றுமுழுதாக நீக்க வேண்டும், அதற்குப் பதிலாக எந்தவொரு சட்டத்தையும் நாங்கள் அனுமதிக்க மாட்டோம்" என்று சொன்னார். இன்று நீங்கள் ஆட்சிக்கு வந்து ஒரு வருடம் ஆகிவிட்டது. எனினும், பயங்கரவாத தடைச் சட்டம் நீக்கப்படவில்லை. அதற்குப் பதிலாக இன்னொரு சட்டத்தை இந்த அரசு கொண்டுவரக் கூடாது! பயங்கரவாத தடைச் சட்டத்தின் காரணமாகத்தான் JVPஇன் ஸ்தாபகத் தலைவர் ரோஹண விஜேவீர அவர்கள் கொல்லப்பட்டார்கள். அதுமாத்திரமல்ல, JVPஐச் சேர்ந்த ஆயிரக்கணக்கான இளைஞர்கள் கொல்லப்பட்டதற்கும் காரணம், இந்தப் பயங்கரவாத தடைச் சட்டம்தான். எனவே, இந்த அரசாங்கம் பயங்கரவாத தடைச் சட்டத்தை முற்றுமுழுதாக நீக்க வேண்டும். கடந்த கால அரசு பயங்கரவாத தடைச் சட்டத்தைப் பயன்படுத்தி இந்த நாட்டிலுள்ள உயிர்களை குறிப்பாக, தமிழ் மக்களை இனப்படு கொலை செய்தது. அதேவிதத்தில் எந்தச் செயற்பாடும் நடைபெறுவதற்கு இந்த அரசு உறுதுணையாக நிற்கக்கூடாது எனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Mahinda Jayasinghe. You have ten minutes.

[අ.භා. 1.08]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට අද අපේ රටේ අනාගතය සම්බන්ධයෙන්, රටේ ජනතාවගේ ජීවිත සම්බන්ධයෙන් ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳව සාකච්ඡාවට ගන්නා දිනයක්. විපක්ෂයේ මන්ත්‍රීවරු සඳහන් කළා වාගේම, 1969 අංක 17 දරන විදුලි පනත අවස්ථා ගණනාවකදී සංශෝධනය කරන්න උත්සාහ කළා. දැන් මෙතුමන්ලා කියනවා, අපි, විශේෂයෙන්ම අපේ වෘත්තීය සමිති ඒ හැම දෙයකටම විරුද්ධ වුණාය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1996 ඕස්ට්‍රේලියානු සමාගමකට විදුලිබල මණ්ඩලය කෑලි කඩා විකුණන්න හදනකොට එදාත් මේ රටේ වෘත්තීය සමිති එයට විරුද්ධ වුණා, මට මතකයි. "Operation Shock" දාලා තමයි එදා වෘත්තීය සමිති මර්දනය කරන්න එවකට සිටි පාලකයෝ කටයුතු කළේ. ඊට පසු 2002 ගෙනාවා දැන් මෙතැන මහ ලොකුවට වර නඟපු කරු ජයසූරියගේ පනත් කෙටුම්පත. එදාත් මොකක්ද වුණේ? සමාගම් 12කට කඩලා මේක විකුණන්නයි සූදානම් වුණේ. ඔව්, ඒ වෙලාවේ අපේ වෘත්තීය සමිතියට නායකත්වය දීපු, අද කඩුවෙල නගරාධිපති වශයෙන් කටයුතු කරන රන්ජන් ජයලාල් සහෝදරයා ඇතුළු අපේ වෘත්තීය සමිතිය ඒකට විරුද්ධ වුණා. ඒක පරාජය කළා. ඒ මොහොතේ ඒක පරාජය කළ යුතුයි. විදුලිබල මණ්ඩලය කෑලි කඩලා විකුණන්න හදනවා නම්, වෘත්තීය සමිති විධියට ඒකට එරෙහි නොවී ඉන්න පුළුවන්කම තිබෙන්නේ කාටද? ඒ නිසා එදාත් අපි විරුද්ධ වුණා. ඒ වාගේම තමයි, දැන් කංචනගේ පනත් කෙටුම්පත ගැන හරි ලොකුවට කථා වුණා. මොකක්ද කිව්වේ? ඡන්දය පෙනි පෙනී කංචන නිර්භීත තීන්දුවක් ගත්තාය කිව්වා. ඔව්, දී කිරට බළල්ලුත් සාක්කි නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එදා කංචන කෑලි 12කට කඩලා මේක විකුණන්න හදනකොට අපි ඒකට විරුද්ධ වුණා. හැබැයි, ඒ විරෝධය නොතකා ඒ පනත් කෙටුම්පත සම්මත කළා. අද අපි මේ පනත සංශෝධනය නොකළා නම් ඔක්තෝබර් මාසය වෙනකොට කංචනගේ පනතින් විදුලිබල මණ්ඩලය කෑලි 12කට කඩලා විකුණා දමන්න හදනකොට ඒ,-

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මට පොඩි කාරණයක් අහන්න ඉඩ දෙනවාද?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

මොකක්ද? *[බාධා කිරීමක්]* මගේ කථාවට බාධා කරන්න එපා. මොකද, මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මම බාධා කරන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑ ඕනෑ එකට නැඟිටින එක විපක්ෂය දැන් පුරුද්දක් කරගෙන තිබෙනවා. අනේ මන්ත්‍රීතුමා, මම ඔබතුමාගේ නම කිව්වෙත් නැහැ. කරුණාකර, මගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Kabir Hashim, I request you to not to interrupt him, please.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

ඔබතුමා ඊළඟට කථා කරන කෙනෙකුට ඔය ප්‍රශ්නය දෙන්න, අහන්න කියලා. *[බාධා කිරීමක්]* නැහැ, මම ඉඩ දෙන්නේ නැහැ. දී කිරට බළල්ලුත් සාක්ෂි! ඒක නේ, මේ නැඟිටින්නේ. මොකද, ඊයෙත් අර දේශබන්දුව ඉවත් කරන්න ගෙනාපු යෝජනාව පිළිබඳ කථා කරන වෙලාවේ වැඩිපුරම විරුද්ධ වුණේ කවුද? පොහොට්ටුවේ නාමල් රාජපක්ෂ. ඡන්දයවත් දුන්නේ නැහැ, තුන්දෙනාම ගියා. ඒ විතරක් නොවෙයි. මෙතුමන්ලාගේ 30දෙනෙක් ඡන්දයට ආවේ නැහැ. අද ඔය වගාඩම්බර කියන දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා ඊයේ ඡන්දය දෙන්නේ නැතිව ගියා. එහෙම තමයි රටේ අවනීතිය රජයන්න මේ මහත්වරු ඉඩ දීලා තිබෙන්නේ. සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු 30දෙනෙක් ඊයේ ඡන්දය අවස්ථාවේ සිටියේ නැහැ. අදත් එහෙමයි. 2002දී කරු ගෙනාපු පනතට, මේ විදුලිබල මණ්ඩලය කෑලි 12කට කඩලා විකුණන්න 2024දී කංචන ගෙනාපු පනතට පක්ෂව අද කථා කරනවා. එදා කංචන ගෙනාපු පනත් කෙටුම්පත අනුව සියයට සියයක් රජය සතු සමාගම් තුනයි තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තව එක් සමාගමක් විතරයි, සියයට 51ක් තිබුණේ. ඉතිරි සමාගම් 8හිම හිමිකාරිත්වය නිශ්චිත නැහැ. විදුලිබල මණ්ඩලයේ වැඩ කරන සමස්ත සේවක මණ්ඩලය 23,000යි. ඒ 23,000න් 15,000ක් කංචනගේ ඉතිරි සමාගම් 8හි සේවය කරන්න නියමිතව තිබුණා. ඔවුන්ගේ රැකියා සුරක්ෂිතතාව පිළිබඳව බරපතළ ප්‍රශ්න, ගැටලු මතුවෙලා තිබුණා. ඒ විතරක් නොවෙයි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපි මේ කිසිදු සේවකයෙක් අයින් කරන්නේ නැහැ. එදා කංචන ගෙනාපු පනත් කෙටුම්පතෙන් 23,000ක් වූ විදුලිබල සේවකයින් 12,000 දක්වා අඩු කරන්න සූදානම් වෙලා සිටියා. එදා කංචනගේ පනත් කෙටුම්පතට අත ඔසවපු සමහර වෘත්තීය සමිති පසුගිය දවස්වල උද්ඝෝෂණය කරනවා අපි දැක්කා. හොඳයි, වෘත්තීය සමිතිවලට අයිතිය තිබෙනවා, උද්ඝෝෂණ කරන්න. හැබැයි, කංචන ඒ පනත් කෙටුම්පත ගෙනෙනකොට, විදුලිබල මණ්ඩලය කෑලි 12කට කඩනකොට, සේවකයින් 15,000කගේ විතර අනාගතය අවිනිශ්චිත වෙනකොට ඒ ගැන "මීක්" සද්දයක් නැතිව හිටපු මහත්වරු අද අපේ පනත් කෙටුම්පත ගැන කථා කරනවා. ඒක වෙනස් කරලා, ගිය ගමන් මඟ සම්පූර්ණයෙන් අනෙක් පැත්ත හරවලා, විදුලිබල මණ්ඩලය සියයට සියයක් රජය සතු සමාගම් 5ක් බවට පත් කරලා, සේවක අයිතිවාසිකම් සියල්ල ආරක්ෂා කරන්න ඕනෑ කරන කොන්දේසි සියල්ල අපි ඇති කරලා තිබෙනවා. සියලු සේවක අයිතිවාසිකම් ආරක්ෂා වෙනවා. ඔවුන්ගේ විශ්‍රාම වැටුප රැකෙනවා; අර්ථසාධක අරමුදල රැකෙනවා. ඒ විතරක් නොවෙයි. ඔවුන්ට අවශ්‍ය නම් ස්වකැමැත්තෙන් විශ්‍රාම යන්නත් අයිතිය දීලා තිබෙනවා. එහෙම කරද්දිත් මේ පනත් කෙටුම්පතට විරුද්ධව විවිධ වැරැදි මත සමාජය මත දක්වන්න උත්සාහ කරමින් සිටිනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විදුලිබල මණ්ඩලයේ සේවක කාර්ය මණ්ඩලයෙන් වැඩිම පිරිසක් කොහේ අයද? එක්කෝ රත්නපුර, එක්කෝ කෑගල්ලේ, නැත්නම් මාතර. ඔය දිස්ත්‍රික්ක තුනේ කාර්ය මණ්ඩලය තමයි වැඩිපුර ඉන්නේ. ඒ ඇයි කියලා තමුන්නාන්සේලාත් දන්නවා කියලා මම හිතනවා. රත්නපුරය, කෑගල්ල, මාතර අය තමයි වැඩිපුරම මේකේ ඉන්නේ. හැබැයි, එහෙම කියලා අපේ ආණ්ඩුව මේ කිසිදු සේවකයෙක් ඉවත් කරන්න සූදානම් නැහැ. ඉතාම පැහැදිලිව

විදුලිබල මණ්ඩලයේ මේ ගොඩනැඟෙන රාජ්‍ය සමාගම් ඉදිරියට ගෙනයන්න ඔවුන්ගේ ඵලදායී දායකත්වය ලබා ගන්න අපි සූදානම් වෙලා ඉන්නවා.

මම ඉතාම පැහැදිලිව තව දෙයක් කියන්න ඕනෑ. දැන් මෙතුමන්ලාගේ පැත්තෙන් කිව්වා, මේක පුබුදු නිරෝෂන්ගේ පනත් කෙටුම්පතක් කියලා. මේ ආණ්ඩුව කුමාර ජයකොඩිගේ, පුබුදු නිරෝෂන්ගේ, අනුර දිසානායකගේ විතරක් නොවෙයි. මේ ආණ්ඩුව කියන්නේ ජාතික ජන බලවේගයේ සහ ඔයගොල්ලන්ගේ ආණ්ඩුව. ඔයගොල්ලන් කළේ එහෙම තමයි. තනි තනි පුද්ගලයින්ට, තනි තනි නමට මේ දේවල්වල අයිතිවාසිකම් කියාගන්න තමයි ඔයගොල්ලන් ඉතිහාසය පුරාම කටයුතු කළේ. හැබැයි, අපේ ආණ්ඩුවේ -ජාතික ජන බලවේගය ආණ්ඩුවේ- 159දෙනා සහ ජනාධිපතිතුමා ඇතුළු 160දෙනාම වගකියන ප්‍රතිපත්තිමය තීරණ මිස එක් එක්කෙනාගේ කැමැත්තට අනුව ප්‍රතිපත්තිමය තීන්දු ගන්නේ නැහැ. ඒ නිසා මේක කාගේවත් පනත් කෙටුම්පතක් නොවෙයි. මේක අපේ ආණ්ඩුවේ පනත් කෙටුම්පතක්. විදුලිබල මණ්ඩලය කැලිවලට කඩලා විකුණනවාට ඉතිහාසය පුරා අපි ඉතාම පැහැදිලිව විරුද්ධ වුණා. මීට කලින් කථා කළ මන්ත්‍රීතුමාත් කිව්වා, අපි පෞද්ගලීකරණයට විරුද්ධයි කියලා. ඔව්, අපි විරුද්ධයි. එදත් විරුද්ධයි, අදත් විරුද්ධයි. හැබැයි, විවිධ අවශ්‍යතා පරිදි පෞද්ගලික ව්‍යවසායකත්වය කැඳවන එකට අපි කිසිසේත්ම විරුද්ධ නැහැ. අදටත් පෞද්ගලික ආයතන විදුලිය ජනනය කරනවා. විදුලිබල මණ්ඩලය ඒවා මිලදී ගන්නවා. ඒක අදත් තිබෙනවා, හෙටත් තිබෙනවා. මේ පනත නිසා ඒක අහෝසි වෙන්නේ නැහැ; ඒක නැති වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා අපි විශේෂයෙන්ම අවධාරණය කරන්න ඕනෑකම තිබෙනවා, මේ පනත හරහා මේ රටේ ජනතාවට කිසිදු ලෙසක හානියක් වෙන්න ඉඩ තියන්නේ නැහැ කියන එක. ඒ විතරක් නොවෙයි. වැඩ කරන විදුලිබල සේවකයින් 23,000කගේ කිසිදු අයිතියක් අහෝසි වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ. ඔවුන්ගේ රැකියා සුරක්ෂිත වෙනවා. ඒ වාගේම අපි කිසිදු සේවකයෙක් සේවයෙන් ඉවත් කරන්නේ නැහැ. ඒ 23,000ක් වූ සේවකයන්ගේ රැකියා ආරක්ෂා වෙනවා. ඔවුන්ගේ විතරක් නොවෙයි. ඔවුන් මේ සමාගම්වලට අනුයුක්ත වුණා කියලා ඔවුන්ගේ සේවය කිසිදු ලෙසකින් කඩවීමක් වෙන්නෙත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකත් අපි අවධාරණය කරන්න ඕනෑ. ඔවුන්ගේ විදුලිබල මණ්ඩලයේ සේවය ඒ ආකාරයෙන්ම අඛණ්ඩව ඉදිරියට යනවා; ඒ ආකාරයෙන්ම අඛණ්ඩව ඉදිරියට යනවා. ඒ වාගේම මම කලිනුත් සඳහන් කළා වාගේ කැමති නම් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ අයිතියත් ඔවුන්ට තිබෙනවා. මේ අගෝස්තු 28වන දා වෙනකොට ඔවුන්ට දැනුම් දෙනවා, මේ සමාගම්වලට අනුයුක්ත කිරීම සඳහා ඔවුන්ගේ කැමැත්ත පළ කරන්න කියලා. ඊට පසු මාස දෙකක් ඇතුළත ඔවුන්ව ඒ සමාගම්වලට අනුයුක්ත කරන්න කටයුතු කරනවා.

අද අපි සංශෝධනය කරන්න ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත කංචනගේ පනත නොවෙයි; 2002 කරුගේ පනත නොවෙයි; ඊට කලින් ඕස්ට්‍රේලියානු සමාගමට විකුණන්න හදපු පනත නොවෙයි. මේ පනත් කෙටුම්පත, විදුලිබල මණ්ඩලය රාජ්‍යය සතු සමාගම් 5කට වෙන් කරලා ඒ සමාගම් හරහා රටේ ජනතාවගේ අයිතිය, ස්වෛරීත්වය ආරක්ෂා කරන පනත් කෙටුම්පතක් වෙනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පත සේවකයින්ගේ අයිතීන් ආරක්ෂා කරන පනත් කෙටුම්පතක් කියන කාරණය අපි ඉතාම නිරවුල්ව, නිවැරදිව මේ රටේ ජනතාවට අවධාරණය කරනවා. ඒ නිසා අපි විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා. විරුද්ධ විය යුතු තැන විරුද්ධ වෙන්න. සාධනීය ලෙස කරුණු පෙන්වා දිය යුතු තැන්වලදී සාධනීය ලෙස කරුණු පෙන්වා දෙන්න. ඒකට කමක් නැහැ. "ඉතිහාසයේ ඒවා ඔක්කොම හොඳයි; කරුගේ එකත් හොඳයි, කංචනගේ එකත් හොඳයි, මේක තමයි වැරදි" කියන එකට නම් අපට එකඟ වෙන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේ කෙටුම්පතේත් තව මොනවා හෝ අඩුපාඩු තිබෙනවා නම් ඒ ගැන පෙන්වා දෙන එක වෙනම එකක්. හැබැයි, අරවා හොඳයි, මේක නරකයි කියලා රටේ ජනතාවට වැරදි මතයක් හදන්න උත්සාහ කරන්න එපා. ඊයේත් දේශබන්දු සම්බන්ධ විවාදයේ දී ඒක හොඳයි, හැබැයි මේ මේ ඒවා තිබෙනවා කිව්වා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mahinda Jayasinghe, your time is up.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එහෙම නැත්නම්, පසුගිය 2024 වර්ෂය දක්වා පාර්ලිමේන්තුවේ හිටපු අපේ මන්ත්‍රීවරුන් තුන්දෙනා මේවාට විරුද්ධ වුණේ නැහැ, අපි තමයි මේක කළේ කියන ඒ ජාතියේ බාල කථා, බාල විවේචන ගොඩනඟන්න උත්සාහ කරන්නේ නැතිව සාධනීය විවේචන ගොඩනඟමින් අපි මේ පනත සාර්ථක කර ගන්න කටයුතු කරමු. ඒ වාගේම විදුලිබල මණ්ඩලය මේ සමාගම් හරහා තවදුරටත් රටේ ජනතාවට අඩු මුදලට විදුලිය, ඒ වාගේම රටේ විදුලිබල අවශ්‍යතාව ඉටු කරන්න පුළුවන් විදුලි සැපයුමක් ලබා දෙන්න අවශ්‍ය මැදිහත්වීම අපි කරමු කියන ඉල්ලීම කරමින්, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. S.M. Marikkar. You have seven minutes.

[අ.භා. 1.19]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මේ ආයතන කිසිසේත්ම පෞද්ගලීකරණය කරන්න දෙන්නේ නැහැ කියලා. අන්න, අර ගැලරියේ පුබුදු නිරෝෂන් ඇති. අහන්න, අවුරුදු දෙකකින් unbundle කරන්න ආලා තිබුණේ, දැන් අවුරුද්දකට එකඟ වෙලා තිබෙන්නේ. පනත කියවා බලන්න. අමාත්‍යාංශ ලේකම්තුමාත් ඇති. ඇමතිතුමාත් දන්නවා, මේක. ඒ නිසා බොරු කියන්න එපා; බොරු කියන්න එපා. අවුරුදු දෙකකට ආපු එක අවුරුද්දකින් unbundle කරන්න එකඟ වෙලා තිබෙන්නේ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මගේ වෙලාවේදී බැහැ, ඔබතුමා පසුව උත්තර දෙන්න, ගරු ඇමතිතුමනි. කරන දේ භය නැතිව කෙළින් කියන්න. බොරු කියලා ජනතාව අන්දන්න එපා. අවුරුද්දකින් unbundle කරන්න එකඟ වෙලා තිබෙන්නේ. මේ මාර දැක්මක් ඇතිව නේ කථා කරන්නේ. ලංකා විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රේෂණ පද්ධතිය අනිවාර්යයෙන්ම දියුණු කරන්න ඕනෑ. එහෙම නැතිව අපට ඉදිරියට යන්න බැහැ. ඔබතුමන්ලාගේ දැක්ම කියන්නකෝ. ඒකට ඩොලර් බිලියන 5ක් යනවා ලු. කොහෙන්ද, ඩොලර් බිලියන 5ක් හොයන්නේ? ආණ්ඩුව දානවාද, ඩොලර් බිලියන 5ක්? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මම අපේ දේශපාලන මත පැත්තක තියලා රජය ප්‍රතිපත්තිමය වශයෙන් ගෙනෙන කරුණුවලට සාධනීයව සංශෝධන දීලා තමයි මේ කෙටුම්පතට එකඟ වුණේ. හැබැයි, බොරු කියනවාට අපි විරුද්ධයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් සම්ප්‍රේෂණ ජාලය පුළුල් කරනවා කිව්වාට, සල්ලි හොයා ගන්නේ කොහෙන්ද කියලා අදහසක් නැහැ. පෞද්ගලීකරණය කරන්නේත් නැහැ ලු. හැබැයි පෞද්ගලික ව්‍යවසායකත්වයට ඉඩ දෙනවා ලු. මට තේරෙන්නේ නැහැ, මේ සිංහල වචන දෙකේ වෙනස මොකක්ද කියලා. පෞද්ගලීකරණය කරනවා කියන්නේ පෞද්ගලික ව්‍යවසායකයෙක් ඇවිල්ලා ගන්නවා වාගේ තමයි ඉතින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපි ඉතාම පැහැදිලිව මේ ගැනත් කියන්න ඕනෑ. මෙහිදී තව දෙයක් වෙලා තිබෙනවා. අපි ඉස්සරහට ඒක ගන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් Cabinet Paper එකක් දලා තිබෙනවා, මට මතක විධියට අප්‍රේල් මාසයේ 23වෙනි දා වෙන්න ඕනෑ. කෙරවලපිටියේ "සඟස්දනව්" බලාගාරය හදන තීරණය අනුමත කළ Cabinet Paper එකේ තිබෙනවා, ඩීසල් ලීටරය රුපියල් 110යි කියලා. ඒ වාගේම ඒකේ දාලා තිබෙනවා, ඩොලර් එක රුපියල් 180යි කියලා. එදිනෙදා බස් එකේ යන එන සාමාන්‍ය මනුස්සයෙක් පවා දන්නවා, ඩීසල් ලීටරය 286ට ගිය නිසා තමයි බස් ගාස්තු වැඩි වුණේ කියලා. කැබිනට් මණ්ඩලය අනුමත කරනවා, ඩීසල් ලීටරය රුපියල් 110ට තිබෙනවා කියපු Cabinet Paper එක. හන්දියේ ත්‍රීවීලර් පදවන කෙනාගේ ඉඳලා, මෝටර්බයිසිකලයේ යන කෙනාගේ ඉඳලා මේ රටේ ඉන්න සියලුදෙනාම වාගේ දන්නවා, ඩොලර් එක රුපියල් 300යි - රුපියල් 300 හෝ ඊට වඩා එහා මෙහා යන ගණනක් - කියලා. ඒ Cabinet Paper එකේ තිබෙනවා, ඩොලර් එක රුපියල් 180යි කියලා. ඒ අනුව විදුලිය ඒකකයක් නිෂ්පාදනය කරන්න රුපියල් 20ලු යන්නේ. මම දන්නේ නැහැ, මේක කරන්න පුළුවන් වන්නේ කොයි රටේ ද කියලා. මේක අර ගෝඨාභයගේ ආණ්ඩුව කාලයේ හදපු Cabinet Paper එකේ දිනය මාරු කරලා දාලා කියලා තමයි මට හිතෙන්නේ. විදුලිය ඒකකයක් රුපියල් 20කට හදන්න බැහැ. අනිවාර්යයෙන් රුපියල් 70ක් විතර වෙනවා. එතකොට ඒවා දිරි ගන්වන්නේ මොන පදනමින්ද කියලා අපි අහනවා. මට මේ සම්බන්ධව තව ගොඩක් කරුණු දේශපාලනිකව කියන්න පුළුවන්. කමිටුවේ හිටපු නිසා මම ඒ ගැන තවත් කියන්නේ නැහැ. Unbundling වෙනවා. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවේම තවත් කාරණයක් ගැන කියන්න මම මේ අවස්ථාව යොදා ගන්නවා. මේ ශ්‍රී ලංකා ජනරජය ඊශ්‍රායල්කරණය වෙන එක ගැනත් මම යමක් කියන්න ඕනෑ. විපක්ෂයේ සිටි කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ මේ සාමාජිකයින් පලස්තීනයට පක්ෂපාතීව ඇමෙරිකානු තානාපති කාර්යාලය ඉදිරිපිට විරෝධතා සිදු කළා විතරක් නොවෙයි, නොයෙකුත් වැඩ වර්ජන, උද්ඝෝෂණ කරමින් පලස්තීන මිත්‍ර සංගමයේ සභාපති ධුරය පවා දරමින් කටයුතු කළා. නමුත් අද ඒ අය දෙමුහුන්, තෙමුහුන් ප්‍රතිපත්තියක සිටිමින් කටයුතු කරනවා. අද වන විට පොතුවිල්, අරුගම්බේ, සින්නවුල් කියන ප්‍රදේශවල ඉඩම් ඊශ්‍රායලයට සින්න වෙමින් තිබෙනවා. ඊශ්‍රායල හමුදාවේ මිනී මරපු අය විතරක් නොවෙයි, යුද අපරාධ කරපු අයත් ඔවුන්ගේ සැනසුම් කාලය ගත කරන්න ලංකාවට ඇවිල්ලා, ඒ පැතිවල restaurants දමනවා. හැබැයි, ඒවාට ශ්‍රී ලාංකිකයන්ට යන්න බැහැ, "Foreigners only". මේක කොහේ ආණ්ඩුවක්ද? මේක ඉන්දියාවේ ආණ්ඩුවක්ද? කිව්වේ කොහොමද? අපි තරම් රට ගැන කැක්කුමක් තිබෙන කවුරුවත් නැහැ කියලා නේ කිව්වේ. අද වන විට වීසා අවලංගු වී මාස හය පැනපු ඊශ්‍රායල සංචාරකයෝත් ඕනෑ තරම් මේ රටේ ඉන්නවා. ඒවා ගැන වගේ වගක් නැහැ. ඒ මදිවට ඔන්න free visa දෙන්නත් හදනවා. අපි අහනවා, මේ ආණ්ඩුවේ ඉන්න මුස්ලිම් මන්ත්‍රීවරුන් කෝ, ඇමතිලා කෝ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න නිසා මම ඒ ගැන මොකුත් කියන්නේ නැහැ. හැබැයි, ඉතින් ඇහෙනවා නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you have two more minutes.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

හොඳයි, මම කථාව අවසන් කරන්නම්. අවශ්‍ය නම් තව විනාඩියක් දෙයි, අපේ සංවිධායකතුමා.

අද ඒ ප්‍රදේශවල මුස්ලිම් ජාතිකයින්ට වඩා ක්‍රිස්තියානි සහ ද්‍රවිඩ ජාතික තරුණ කාන්තාවන්, ළමයින් ඊශ්‍රායල ජාතිකයින්ගේ අතකොළු වෙලා තිබෙනවා. අද යුද හමුදාවට තේරුම් ගිහින් තිබෙනවා, ඒ ප්‍රදේශ පාලනය වෙන්නේ කොහොමද කියා. මම දන්නේ නැහැ, පොලිසියට මේ සම්බන්ධව කොහෙන් හරි උපදෙස් දීලාද කියලා. මොකද, ඔවුන් ඒ කිසි දෙයක් දැක්කේ නැහැ වාගේ ඉන්නවා. මේ රටේ ඇතැම් ප්‍රදේශ ඊශ්‍රායල කොලනියක් කරන්න, යුද අපරාධකරුවන්ගේ තෝතැන්නක් බවට පත් කරන්න මේ ආණ්ඩුව ඉඩ දෙනවාද කියා අපි අහන්න කැමැතියි. *[බාධා කිරීමක්]* මගේ වෙලාවෙන් නම් දෙන්නේ නැහැ. අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, දැන්වත් ආණ්ඩුව මේ සම්බන්ධව පියවරක් ගන්න කියලා. මේ ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරුන්ට අපි කියනවා, ඔබතුමන්ලා ඒ පීඩනය ආණ්ඩුවට එල්ල කරන්න කියලා.

ගරු බලශක්ති ඇමතිතුමනි, මට විදුලිබල මණ්ඩලය සම්බන්ධව තව එක දෙයක් කියන්න අමතක වුණා. මම මේක එම අමාත්‍යාංශයේ ලේකම්තුමාට පෞද්ගලිකව කියන දෙයක් නොවෙයි. අමාත්‍යාංශයේ ලේකම් විදුලිබල මණ්ඩලයේත් සභාපති, LTL Holdings (Pvt.) Limited එකේත් සභාපති. එතකොට දෙමුහුන් නොවෙයි, තෙමුහුන්. පුද්ගලයෙක් එසේ තනතුරු තුනක ඉන්නකොට, ඔහුගේ interest එක එන්නේ කොතැනටද? ගරු ඇමතිතුමනි, ඒ නිසා අපි ඔබතුමාට යෝජනා කරනවා, අතිරේක ලේකම්වරයෙක්ව ඒ සඳහා පත් කරන්න කියලා. මොකක්ද, මේ ප්‍රශ්නය? රුපියලක්වත් හොරකම් නොකරන ආණ්ඩුවක් නම් එක එක කයිකතන්දර අහගන්න ඕනෑ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම කථාව අවසන් කරනවා, තව තත්පර කිහිපයක් දෙන්න.

මම ගරු ඇමතිතුමාට යෝජනාවක් කරනවා, LTL එකේ සභාපතිවරයා හැටියට වෙන අතිරේක ලේකම්වරයෙක් පත් කරන්න කියලා. නැත්නම් නිකම් බොරුවට මේ වාගේ කථා අහගන්න වෙනවා. දැන් ඉතින් ඕනෑ දෙයක් කියාගන්න. මම හරියට කථාව කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Manjula Suraweera Arachchi. You have ten minutes.

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Riyas Farook, what is your point of Order?

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මරික්කාර් මන්ත්‍රීතුමා ඇහුවා, මේ රටේ ඇතැම් ප්‍රදේශ ඊශ්‍රායලයට සින්නක්කරව දෙන්නද හදන්නේ කියලා. එහෙම දෙනකම් අපි බලාගෙන ඉන්නවාද, මේ ආණ්ඩුවේ මුස්ලිම් මන්ත්‍රීවරු කෝ කියලාත් එතුමා ඇහුවා. එතකොට මේ ඉඩම් සින්නක්කර විකුණලා, බිල්ඩින් හදලා ඔක්කෝම දෙනකම් මෙච්චර කල් පැවැති ආණ්ඩු කොහේද හිටියේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, that is not a point of Order.

Hon. Manjula Suraweera Arachchi, would you please begin your speech? Your time starts now.

[අ.භා. 1.26]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ ඓතිහාසික මොහොතේ ඒ සම්බන්ධව කථා කරන්න මටත් අවස්ථාවක් ලැබීම ගැන සතුටු වෙනවා.

මම පසුගිය දවස්වල නෝර්ටන් බ්‍රිජ් විදුලිපුර කියන ප්‍රදේශයට ගියා. එසේ යනකොට මම දැක්කා, එහි සමරු ඵලකයක සටහන් කර තිබුණු පාඨයක්. එහි සඳහන් කර තිබුණේ, "අප හැම දෙන නුවන් අලු කරනු පිණිස සිය නුවන් අඳුරේ ගිල්වූ ඔබෙ නම් සිහි කරත්වා" යනුවෙනුයි. 1940ගණන්වල නෝර්ටන් බ්‍රිජ්වල පළමු ජලවිදුලි බලාගාර සංකීර්ණය ඉදිකිරීම සඳහා උමං කපද්දී 140දෙනෙකුට ආසන්න පිරිසකට ජීවිත අහිමි වුණා. එසේ ජීවිත පරිත්‍යාග කරමින් ලංකාවට විදුලිය ලබා දෙන්න කටයුතු කරපු ඒ ශ්‍රමික පිරිස ගැන තමයි එම ඵලකයේ එසේ සඳහන් කර තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969දී ඉටිපන්දම් එළියෙන් තමයි සම්මත කරන ලද ලංකා විදුලිබල මණ්ඩලය පනතට අත්සන් කර තිබෙන්නේ. ඒ විධියට ඉතිහාසය පුරා වැඩ කරන ජනතාව එකතු වෙලා කටයුතු කළා වාගේම මේ මොහොත වනවිට විදුලි බලය නිෂ්පාදනය කරමින් ලංකාව අඳුරෙන් එළියට ගෙන එන්න සේවකයන් විධියට වාගේම රටේ ජනතාව විධියට ඔවුන් දැවැන්ත කැප කිරීමක් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වෙනකොට ලංකාවේ ජල විදුලි බලාගාර 17කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම, තාප විදුලි බලාගාර 7කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මෙගාවොට් 100ක විතර ධාරිතාවක් සහිත සුළං විදුලි බලාගාරයකුත් අපට තිබෙනවා. ඒත් එක්කම කුඩා ජල විදුලි බලාගාර - mini-hydropower stations - 200කට ආසන්න ප්‍රමාණයක් ලංකාවේ තිබෙනවා. ඊට අමතරව සූර්ය බලශක්තිය ලෝක ප්‍රවණතාවක් වෙලා තිබෙන මේ වෙලාවේ සියයට 6කට ආසන්න ප්‍රමාණයක් ඒ තුළින් අපේ ජාතික පද්ධතියට එකතු වෙමින් තිබෙනවා. නමුත්, විදුලිබල නිෂ්පාදනය සම්බන්ධයෙන් මේ වෙනකොට ලෝකයේ ඇති වෙලා තිබෙන ප්‍රවණතාවලට සාපේක්ෂව ලංකාවේ අපි කොතැනද ඉන්නේ කියන එක පිළිබඳව අපිට අදහසක් තිබෙනවා. ඒ නිසා ජාතික ජන බලවේගය ආණ්ඩුව බලය අත්පත් කර ගැනීම සඳහා ගෙන යන අරගළයේදී ඉතා පැහැදිලිව කිව්වා, මේ රටේ විදුලි බලය කියන එක මීට වඩා පුළුල් මාතෘකාවක් බවට පත් කර ගන්න ඕනෑ, මීට වඩා සැලසුම් සහගත, විධිමත් ආකාරයකට විදුලි බලය කියන එක ඉදිරියට ගෙන යන්න ඕනෑ කියලා. ඒ අනුව අපි ඊට අදාළ සැලසුම් සකස් කරන්න කටයුතු කරමින් තමයි බලය ඉල්ලුවේ.

මේ වෙනකොට ලෝකයේ විදුලි බලයේ නිම් වළලු පුළුල් වෙලා තිබෙනවා. ජල විදුලිය, තාප විදුලිය වාගේම න්‍යෂ්ටික බලය ආදී විවිධ ක්ෂේත්‍ර මඟින් මේ මොහොතේ දැනුමට සාපේක්ෂව එකතු කර ගන්න පුළුවන් පරිසර හිතකාමී ප්‍රභව හරහා විදුලිය උත්පාදනය කර ගනිමින් ඉන්නවා. නමුත්, 1969න් පස්සේ මේ ගත කරපු කාල සීමාව තුළ පත් වෙච්ච ආණ්ඩු, පරිසර හිතකාමී, ජනතාවට සහන සපයන්න පුළුවන් විධියට වාගේම ලෝකයට ගැළපෙන විධියට විදුලි බලය නිෂ්පාදනය කළාද, ඒවා පාරිභෝගිකයාට බෙදා හැරියාද, ඒවායේ නඩත්තු කටයුතු කරගෙන ගියාද කියන කාරණා පිළිබඳව ගත්තොත්, අද මෙතැනදී පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි සියලුදෙනා ඒ සම්බන්ධයෙන් කනගාටු වෙන්න ඕනෑ. ඒ වාගේම තමන්ගේ පැත්තෙන් නැවත හැරිලා බලන්න ඕනෑ, පාර්ලිමේන්තුවේදීත්, ඒ වාගේම පිටතදීත් නිවැරැදි දේ වෙනුවෙන්, තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් කටයුතු කළාද, යෝජනා ගෙන ආවාද කියන එක පිළිබඳව. අපි ඒ ගැන පශ්චාත්තාප වෙන්න ඕනෑ. ඒ අනුව අද ලෝකයේ තිබෙන්නේ බලශක්තිය පිළිබඳ කථාවක්. විදුලි බලය කියන එකෙන් ඔබ්බට ගියපු බලශක්තිය පිළිබඳ කථාවක තමයි ලෝකය තිබෙන්නේ. ඒ නිසා අද අපි දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කරන මේ පනත් කෙටුම්පත හරහා අනාගතයේ අප අලුත් හැඩරුවකට යන්න සූදානම් වෙලා තමයි ඉන්නේ. ඒ නිසා කංචන විජේසේකරලා 2024 අවුරුද්ද වෙනකොට ස්වාධීනව කැබැලි 12කට කඩලා, 23,000ක් වූ සේවකයන්ගෙන් 12,000ක් එළියට

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

දාලා, මේ රටේ විදුලි බලය කියන මර්මස්ථානය පෞද්ගලික අංශය කේන්ද්‍ර කරගෙන, දක්කන්න හදපු ගමන නිමා කිරීම වෙනුවෙන් අදාළ පියවරක් තමයි අපි මේ තබන්නේ. අපි දන්නවා, ලෝකයේ ඕනෑම දෙයක් ගත්තොත් සාදා නිම කරපු එකක් නිර්මාණය වෙන්නේ නැහැ කියන එක. අපි විශ්වාස කරනවා, අද මේ ගනු ලබන ඓතිහාසික තීන්දුව සංක්‍රාන්තික පියවරක් කියලා. ඉදිරි වසර කිහිපය ඇතුළත විදුලි බලයේ සිට බලශක්තිය දෙසට අභිමුඛ වෙන මාවත් විවර වෙන අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා තමයි අපි අද මේ උත්සාහ කරමින් ඉන්නේ.

අපි දන්නවා, ලංකා විදුලිබල මණ්ඩලය දීර්ඝ කාලයක් තිස්සේ මාෆියාවක් බවට පත් වෙලා තිබුණු බව. අපි දැක්කා, කැගල්ල පැත්තේ, සබරගමුව පැත්තේ, මාතර පැත්තේ අයගේ තෝතැන්නක් බවට පත් වෙලා තමයි මේ ආයතනය තිබුණේ කියන එක. ඒ නිසා පුනර්ජනනීය බලශක්තිය පැත්තට, ජල විදුලි ව්‍යාපෘති පැත්තෙන් ඔබ්බට ගියපු ඩීසල් සහ ගල් අඟුරු පැත්තට වැඩි අවධානය යොමු කරමින්, ඊට අදාළ ගජ මිතුරු කල්ලි සනසන ව්‍යාපෘති හරහා වූ ගමන් මහක තමයි ගිහිල්ලා තිටියේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ මොහොතේ රටක් විධියට අපිට විශාල පරිවර්තනයකට යන්න අවශ්‍ය නම් ලෝකයේ අනෙක් රටවලට සාපේක්ෂව අපේ විදුලි බිල යම් පහළ මට්ටමකට ගෙනෙන්න ඕනෑය කියලා.

ආයෝජකයන්ට අවශ්‍ය තෝතැන්නක් බවට පත් කරන්න අදාළ විදුලි බලය නැත්නම් බලශක්තිය හිතකර පරිසරයකට ගේන්න ඕනෑ. ඒ තුළ පාරිභෝගිකයා ආරක්ෂා කර ගන්න වෙනවා. නිෂ්පාදනය පැත්තේදී පරිසර හිතකාමී තැනකට එය පරිවර්තනය කර ගන්න වෙනවා. ඒ වාගේම විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ පැත්තෙන් ගත්තොත්, ඔවුන් ඉතාම දුෂ්කර කොන්දේසි යටතේ කැප කිරීමක් කරමිනුයි ඉන්නේ. විශේෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කය වාගේ ප්‍රදේශයක් ගත්තොත්, විදුලි බලය බිඳ වැටීමකදී පවා සොබාදහමේ පිහිටීම් සහ දුෂ්කරතාවල අභියෝගවලට ලක් වෙමින් උදේ සිට මධ්‍යම රාත්‍රිය වෙනකම් තෙමී තෙමී කඳු මුදුන්වල නඟිමින්, පල්ලම් බහිමින් අතිදුෂ්කර කොන්දේසි යටතේ තමයි ඔවුන් වැඩ කරමින් ඉන්නේ. ඔවුන්ගේ අයිතිවාසිකම් පැත්තට අදාළ දේවල් පසුගිය ආණ්ඩුවලින් කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ අනුව මේ පනත් කෙටුම්පත් හරහා සම්මත වෙන්නේ වැඩ කරන ජනතාවගේ ජීවත් වීමේ අයිතිය සහ රටේ බලශක්ති අනන්‍යතාව රටට හිතකර විධියට ඉදිරියට ගෙන යැමයි.

විශේෂයෙන්ම මේ වෙලාවේ හුඹස් බිය මවන, බිල්ලෝ මවන කණ්ඩායමක් ඉන්නවා. මොකද, ලංකා විදුලිබල මණ්ඩලය කෑලි 12කට කඩනකොට නිහඬ වෙලා හිටපු, අරගළ නොකරපු, ඊට එරෙහිව කථා නොකළ අය අද ඒ සම්බන්ධයෙන් කථා කරනවා. සේවකයෝ 23,000න්, 12,000ක් එළියට යනකොට නිහඬ වෙලා හිටපු අය අද බිල්ලෝ මවන්න පටන් අරගෙන තිබෙනවා. සමහර අයට දෛවයේ සරදමකට ලක් වෙන්න වෙලා තිබෙනවා. කොමිස් කුට්ටි ගජ මිතුරන්ට දෙනකොට නිහඬ වෙලා හිටපු අයට දැන් කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය බිලියන 500ක ණය බරක හිර කරලා, ඒකේ බර රටේ විදුලි පාරිභෝගිකයන්ගේ කර මත දාපු යුගයක නිහඬ වෙලා හිටපු අය දැන් නැවත කිඹුල් කඳුළු හෙළන්න පටන් අරගෙන තිබෙනවා. මතක තියා ගන්න ඕනෑ, මේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක් බව. ලංකා විදුලිබල මණ්ඩලය ආරම්භ කරපු කාලයේ සිට විදුලිබල මණ්ඩලයත්, සේවකයාත්, පාරිභෝගිකයාත් රැක ගැනීම වෙනුවෙන් කොන්දේසි විරහිතව අරගළ කළ දේශපාලන ව්‍යාපාරයක සාමාජිකයෝ අපි. අපි බලය ඉල්ලා තිබෙන්නේ මේ රට හදන්න. ඒ නිසා විශේෂයෙන්ම මේ කිඹුල් කඳුළු හෙළන මහත්වරුන්ට, ජනතාව උසිගන්වන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වාගේම විශේෂයෙන්ම විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට සහ රටේ ජනතාවට අපි සපථ කරලා කියනවා, ඔබට කිසිදු හානියක් වෙන, ඔබගේ වෘත්තීයභාවයට කිසිදු හානියක් වෙන, ඔබගේ විදුලිබල මණ්ඩලය පෞද්ගලික දිශාවට හරවලා සේවය අනතුරට හෙළන කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව සහතික වෙනවා කියන එක. ඒ නිසා ඔබ බිය විය යුතු නැහැ, සතුරා විසින් හෙළන උගුල්වලට හසු විය යුතු නැහැ, ප්‍රබන්ධවලට හසු විය යුතු නැහැ. ඒ නිසා තරයේ විශ්වාස කරන්න, ජාතික ජන බලවේගය. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ප්‍රමුඛ ජාතික ජන බලවේගය ආණ්ඩුව විසින් අනාගතයේදී ඉතා අඩු මිලට, තරගකාරීව, විනිවිදභාවයෙන් යුක්තව, සියයට සියයක් රජයේ අනුග්‍රහය මත පවත්වාගෙන යන විදුලිබල මණ්ඩලයකින් අනාගතය සුරක්ෂිත කර ගැනීම සඳහා අදාළ වටපිටාව නිර්මාණය කරන බව පවසමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa. You have six minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Aravinda Senarath to the Chair?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Sir, I propose that the Hon. Aravinda Senarath do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த செனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.*

[අ.භා. 1.36]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශ්වාස කරනවා, රටේ විදුලි පාරිභෝගිකයින්ට අඩු මිලට අඛණ්ඩව විදුලිය ලබා දීමත්, ඒ වාගේම පිරිසිදු බලශක්තිය - clean energy - ක්‍රියාත්මක කිරීමත් ජාතික බලශක්ති ප්‍රතිපත්තියක, රටේ ජාතික න්‍යාය පත්‍රයේ ප්‍රධානතම අරමුණු බවට පත් විය යුතුයි කියන කාරණය. එය කිරීම සඳහා ශක්තිමත් නියාමනයකට ලක් කරලා, ඒ වාගේම ජාතික ආරක්ෂක ඉලක්කත් සම්පූර්ණ කරගෙන, බලශක්ති ක්ෂේත්‍රයට අවශ්‍ය දෙස් විදෙස් ආයෝජන ලැබෙන ආකාරයේ ප්‍රතිසංස්කරණයකට යොමු විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

අපි බලන්න ඕනෑ 2025 වසරේ මේ විදුලිබල සංශෝධන පනත තුළින් මේ ඉලක්ක සම්පූර්ණ කරනවාද කියලා; පාරිභෝගිකයාට අඩු මිලට, අඛණ්ඩව විදුලිය ලබා දෙනවාද, පිරිසිදු බලශක්තිය, පිරිසිදු විදුලිය නිර්මාණය කරනවාද කියලා. ඇත්තවශයෙන්ම මේ පනත හරහා පාරිභෝගික ආරක්ෂණ නියාමන යන්ත්‍රණයත් දුර්වල කරනවා; ආයෝජනයට අවශ්‍ය ඉඩ කඩත් නැති කරනවා.

ඒ විතරක් නොවෙයි. අපට ඇහුණා රාජ්‍ය පාර්ශ්වයෙන් කථා කරනවා, විදුලිබල ක්ෂේත්‍රයේ ඉන්න සේවක මහත්ම මහත්මීන් 23,000 ගැන. අද ඒ අයගේ අයිතිවාසිකම් ගැන කථා කරන්නට විදුලිබල ඇමතිවරයා ප්‍රමුඛ බලධාරින් වෙලාවක් දෙන්නේ නැහැ. සාකච්ඡා කරන්න අවස්ථාවක් නැහැ. ඒ නිසා පැහැදිලියි, මේ විදුලිබල සංශෝධන පනත මේ රටේ විදුලිබල ක්ෂේත්‍රය ශක්තිමත් කරන පනතක් නොවෙයි කියන එක. 2002 වසරේ ප්‍රතිසංස්කරණ ආරම්භ කරනකොට මේ රජයේ සාමාජිකයන් ඒවාට විරුද්ධ වුණා. 2024 වසරේදී යම් යම් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරනවා කියන නාමයෙන් ආපු පනතට අපි විරුද්ධ වුණා. මොකද, ඒ තුළ තිබුණු ප්‍රතිගාමීත්වය නිසා. නමුත්, අද මේ පනත විදුලිබල ක්ෂේත්‍රය සත්‍ය වශයෙන්ම දුර්දාන්තය කරා ගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම වෙලාව ගන්නම්. මට ඒ අවස්ථාව තිබෙනවා. ගැටලුවක් නැහැ.

විශේෂයෙන්ම මම අහන්න කැමැතියි, මේ කාරණයත්. මේ රජය බලයට පත් වුණේ මොකක් කියලාද? පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරනවා කියලායි මේතුමන්ලා බලයට පත් වුණේ. පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරනවා කියලා බලයට ආපු රජය අද තාප බලාගාර මාෆියාවේ ග්‍රහණයට හසු වෙලා; ඉන්ධන බලාගාර මාෆියාවේ හිරකරුවන් බවට පත් වෙලා; පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය හිතා මතාම විනාශ කරනවා. හොඳම නිදසුනක් තමයි සහස්දනව් ව්‍යාපෘතිය. සහස්දනව් ව්‍යාපෘතියට; මෙගාවොට් 300ක ද්‍රවීකෘත - Liquified Natural Gas - බලාගාරයක් හැටියට දියුණු කිරීමේ යෝජනාවට වර්තමාන රජය විසින් 2025 ජනවාරි 31වැනි දා අනුමැතිය ලබා දෙනවා. මෙය, LNG ව්‍යාපෘතියක්. හැබැයි මේ ව්‍යාපෘතියට අනුමැතිය ලබා දෙන්නේ, සත්‍ය නොවන බොරු දත්ත කේන්ද්‍ර කරගෙන. එහි සඳහන් වෙනවා, ජනන පිරිවැය ඒකකයට රුපියල් 20.15යි කියලා. හැබැයි, මේ ගණනය කිරීම් ඔක්කොම කරලා තිබෙන්නේ, ඩීසල් ලීටරයක මිල රුපියල් 110ක් කියලා හිතාගෙන; ඇමෙරිකානු ඩොලරයට තිබෙන විනිමය අනුපාතය 195ක් කියලා හිතාගෙන. හැබැයි කුඩා දරුවෙකු වුණත් දන්නවා, එදා දවසේ ඩීසල් ලීටරයක මිල රුපියල් 286යි කියලා. රුපියල් 110 නොවෙයි. විනිමය අනුපාතය 195 නොවෙයි, 300යි. මේ වරද පිළිබඳව, මේ දත්ත දෝෂ සහිතයි කියලා මහජන උපයෝගිතා කොමිෂන් සභාව -PUCSL- විසින් විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිඛිතව දැනුම් දෙනවා අප්‍රේල් 03වැනි දා. ඒ වාගේම මහජන උපයෝගිතා කොමිෂන් සභාව - PUCSL එක - අවස්ථා 3ක් පිළිබඳව කථා කරලා කියනවා. ඒ අවස්ථා, scenarios, තුන ගැන කථා කළොත්, රුපියල් 35.81යි, රුපියල් 43.25යි, එහෙම නැත්නම් රුපියල් 72.11යි වශයෙන් තමයි සඳහන් වන්නේ. බොරු දත්ත කියලා කියන්නේ අපි නොවෙයි, මහජන උපයෝගිතා කොමිසම. එහෙම කියලා මහජන උපයෝගිතා කොමිසම තවදුරටත් කියනවා, වැරදි දත්ත මත ඉදිරිපත් කරලා අනුමත වුණු කැබිනට් පත්‍රිකාව මඟින් ඉදිරිපත් කරපු මේ දත්ත වැරදියි, වැරදි ගණනයක් කරලා තිබෙන්නේ කියලා කරුණාකරලා කැබිනට් මණ්ඩලයට දැනුම් දෙන්න කියලා. හැබැයි මොකක්ද, රජය කරන්නේ? ඒ ඔක්කෝම පැත්තකට විසි කරලා පසුගිය අප්‍රේල් මාසයේ තුන්වැනි හෝ හතරවැනි සතිය තුළ විදුලිබල මණ්ඩලයත්, LTL එකත් අතර සහස්දනව් බලාගාරයේ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමත් අත්සන් කරනවා. දැන් බලන්න, කැබිනට් මණ්ඩලය එය අනුමත කරලා තිබෙන්නේ වැරදි දත්ත මත කේන්ද්‍රගත වුණු සහස්දනව් ව්‍යාපෘතියේ ජනන පිරිවැය වැරදි විධියට ගණනය කරලා; ඩීසල් ලීටරයේ මිල හරියට දමන්නේ නැතුව, විනිමය අනුපාතය හරියට දමන්නේ නැතුව. අපි නිකමට ගත්තොත්, මහජන උපයෝගිතා කොමිසම කියන විධියට අර තුන්වැනි scenario එක නම් ක්‍රියාත්මක වෙන්නේ, රටට සිදු වෙන පාඩුව රුපියල් කෝටි 7,300ක් වෙනවා, මේ වැරදි දත්ත මත ක්‍රියාත්මක වෙන වැඩසටහන නිසා. හැබැයි රජය රටට කිව්වේ මොකක්ද? පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරනවාය කියලා කිව්වා. එහෙම කියපු මේ රජය මොකක්ද කරන්නේ? දැන් මේ කැපිල්ල, මේ කප්පාදුව පටන් ගත්තේ පසුගිය රජය සමයේ. Rooftop solar panelsවලින් නිපදවන විදුලිය ඒකකයක tariff rate එක පසුගිය රජය රුපියල් 37 ඉඳලා රුපියල් 27 දක්වා අඩු කළා. මේ රජය ඒක අඩු කරනවා, රුපියල් 19 දක්වා. එය පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට; සූර්ය බලශක්තියට එල්ල කරපු මරු පහරක්. හැබැයි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඒ අය කියනවා, වසර 5ක් ඇතුළත සූර්ය බලශක්තිය මෙගාවොට් 2,000ක් විදුලිබල පද්ධතියට එකතු කරනවා කියලා. නමුත් එහෙම කළේ නැහැ. අහිංසක ව්‍යවසායකයින්ව නොමඟ යවලා, බොහෝදෙනා සූර්ය බලශක්තියට යොමු කරවලා, ඒ අයව අනාථ කිරීමක් සිදු වෙලා තිබෙන්නේ. මතක තබාගන්න, සූර්ය බලශක්තිය ක්‍රියාත්මක කරන්න සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ ආයතන 680ක් අද ලියාපදිංචි වෙලා ඉන්නවා කියලා. ඍජු සහ වක්‍ර රැකියා 100,000ක් තිබෙනවා. වහල මත ක්‍රියාත්මක වන සූර්ය බලශක්ති පැනල හරහා - rooftop solar හරහා - විදුලිය මෙගාවොට් 1,709ක් අද නිපදවනවා. Ground-mounted solar panelsවලින් මෙගාවොට් 140ක් ලබා දෙනවා. මේ වාගේ විශාල කණ්ඩායමකට ඉතාම බරපතළ හානියක්, මේ සූර්ය බලශක්තිය තුළ විදුලිය ඒකකයකට ලබා දෙන ගෙවීම් රුපියල් 37 ඉඳලා රුපියල් 19 දක්වා අඩු කරලා පසුගිය ආණ්ඩුව ගිය අඩි පාරේම ගොස් සූර්ය බලශක්තිය විනාශ කරන්නට මේ රජය කටයුතු කිරීම. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

මේ රජය එක පැත්තකින් පුනර්ජනනීය බලශක්තිය විනාශ කරනවා වාගේම අනෙක් පැත්තෙන් රටේ පාරිභෝගික ජනතාවට පොරොන්දු වුණු දේ දිනපතාම කඩ කරමින් යනවා. අපි මේ කාරණය අහන්න කැමැතියි. වර්තමාන ජනාධිපතිවරයා එදා මැතිවරණ වේදිකාවේ කිව්වා, "කිසි ප්‍රශ්නයක් නැහැ, රුපියල් 9,000 විදුලි බිල රුපියල් 6,000 කරනවා, රුපියල් 3,000 බිල රුපියල් 2,000 කරනවා, සියයට 33කින් විදුලි බිල අඩු කරනවා" කියලා. එහෙම කියපු කණ්ඩායම බලයට ආපු හැටියේ මේ මොහොත වනවිට කරලා තිබෙන්නේ විදුලි බිල වැඩි කිරීම. ඇයි, විදුලි බිල වැඩි කරන්නේ? IMF කොන්දේසියක් නිසා. බලයට ආවේ IMF කොන්දේසි ටික වෙනස් කරන්න සාකච්ඡා කරලා අලුත් IMF ගිවිසුමකට යනවාය කියලා. අවසානයේදී මොකක්ද කළේ? පසුගිය රජය අනුගමනය කරපු IMF ගිවිසුමම අකුරක් නැර, තිතටම ක්‍රියාත්මක කරන්න ජනතාවාදී යැයි කියන මේ රජය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කටයුතු කළා. ඒ නිසා තමයි මැතිවරණ වේදිකාවේ කියපු විදුලි බිලෙන් සියයට 33 අඩු කරන්නට බැරිව රජය අද අතරමං වෙලා සිටින්නේ. හැබැයි රජයටත් වඩා අතරමං වෙලා සිටින්නේ, මේ රටේ සුවහසක් පාරිභෝගික ජනතාවයි. ඒ නිසා මම රජයෙන් ඉල්ලීමක් කරනවා. මොකද, ඔබ මේ දියත් කරන සංශෝධන පනත් කෙටුම්පත හරහා බලාපොරොත්තු වන ප්‍රතිසංස්කරණ සිද්ධ වන්නේ නැහැ; බලාපොරොත්තු වන පෞද්ගලික ආයෝජන, ඍජු ආයෝජන පෞද්ගලික අංශයෙන් ලැබෙන්නේ නැහැ. එපමණක් නොවෙයි, අර tariff rate එක අඩු කරපු නිසා, ඒ ගෙවන මුදල් අඩු කරපු නිසා අද සූර්ය බලශක්තිය නිෂ්පාදනයේ නිරත වී සිටින ව්‍යවසායකයන් අතිවිශාල පිරිසක් බරපතළ මූල්‍ය ගැටලුවකට ලක් වෙලා සිටිනවා. අද ඒ බොහෝදෙනා සූර්ය බලශක්තිය නිෂ්පාදනයෙන් ඈත් වීම ආරම්භ වෙලා තිබෙනවා. ඒ ව්‍යවසායකයන්ට ණය ටික ගෙවාගන්න බැහැ. ඒ ව්‍යවසායකයන් යටතේ සේවය කරන ලක්ෂයකට ආසන්න පිරිසට ගෙවීම් කර ගන්න බැහැ. ඒ වාගේ අසරණභාවයකට පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය වැටී තිබෙන මොහොතක අපි පැහැදිලිවම ප්‍රකාශ කරනවා, ප්‍රගතිශීලී විපක්ෂයක් හැටියට සමගි ජන බලවේගයත්, සමගි ජන සන්ධානයත් ජාතික න්‍යාය පත්‍රය තුළ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට ලබා දිය යුතු ඉහළම ප්‍රමුඛතාව ලබා දීලා, එය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම, ඉහළින්ම ක්‍රියාත්මක කරන්නට සැදී පැහැදී සිටින බව.

ස්තුතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඉතාම කෙටියෙන් කියන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
කෙටියෙන් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු විපක්ෂ නායකතුමා LNG සම්බන්ධයෙන් සංඛ්‍යාලේඛන වගයක් ඉදිරිපත් කළා. ඒක 2021 කැඳවපු ටෙන්ඩරයක්. ඒකේ evaluation එකට පාවිච්චි කරපු විචල්‍යයන් තමයි එතුමා කියන්නේ. ඒවා අදට අදාළ නැහැ තමයි. Evaluation එකේදී compare කරන්න ගත්තු ඒවා. ඒවා අපට අදාළත් නැහැ. 2021දී තමයි ඒ ටෙන්ඩරය close කරලා වැඩ ටික ඔක්කෝම කරලා තිබෙන්නේ; Cabinet approval එක දීලා තිබෙන්නේ. පාර්ලිමේන්තුවට එන්න බැරි වෙච්ච ගම්මන්පිල මහත්මයා වාගේ අය දෙන ලුණු විශ්වාස කරලා එන්න එපා. ඒක ඔබතුමාට හොඳ නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. ඒකයි මම කියන්නේ, මේ කාරණය හරියටම තේරුම් ගන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අනිල් ජයන්ත ඇමතිතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තත්ත්පර 30ක් දෙන්නම්, ගරු විපක්ෂ නායකතුමා. ඉතා කෙටියෙන් කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ නම සඳහන් කළ නිසා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියනවා මා ඉදිරිපත් කරපු දත්ත වැරැදියි කියලා. ඇයි එහෙම නම්, මහජන උපයෝගිතා කොමිසම බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමාට ලියන්නේ, "මේ ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය අනුමත කරපු සහස්දනව් බලාගාරය වැරැදි දත්ත මතයි අනුමත කරලා තිබෙන්නේ, මෙන්න අපි ඉදිරිපත් කරනවා හරි දත්ත ටික. කරුණාකරලා කැබිනට් මණ්ඩලය දැනුවත් කරන්න" කියලා? බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ටයි එසේ ලියන්නේ. මේක හැමෝම දන්නා කාරණාවක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අනිල් ජයන්ත ඇමතිතුමා, ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.52]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව දුන්නාට බොහොම ස්තුතියි.

අද දින විවාදයට ගැනෙන කාරණා අතරින් ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයට සම්බන්ධ වන 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත යටතේ නියමය සම්බන්ධවත් මම පළමුවෙන්ම වචන කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත යටතේ නීතිමය ප්‍රතිපාදනයක් තිබෙනවා, සිගරැට්, සුරුට්ටු, බීඩි හා සිගරැට් ආදේශක වැනි භාණ්ඩ නිෂ්පාදනය ඉලක්ක කරගෙන බදු පැනවීමක් කරන්නට. නමුත් ඒක ඒ විධියටම ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ අනුව ග්‍රාමීය මට්ටමින් නිෂ්පාදනය වන බීඩි සඳහා 2023දී රුපියල් දෙකක බද්දක් පනවා තිබෙනවා. ඉතින් අපි අය වැයේදී තීන්දුවක් ගත්තා, එය රුපියල් තුන දක්වා වැඩි කරන්න. ඒ අනුව අවුරුදු දෙකකට පස්සේ තමයි ඒ වැඩි වීම සිද්ධ වන්නේ. ඒකට තවත් හේතුවක් තිබෙනවා. සිගරැට් සහ දුම්කොළ ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන සඳහා උද්ධමනය ගළපමින් ඒ අදාළ වැඩි කිරීම් සිද්ධ කරනවා. මේ සඳහා උද්ධමනය ගළපා නොතිබූ නිසා ඒ වැඩි කිරීම සිදු කරලා එහි නීතිමය අවශ්‍යතාවක් විධියට තමයි මේ ගැසට් පත්‍රය නිකුත්

කර තිබෙන්නේ. ඒ, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගැනීමේ අදහසින්. ඒ නිසාම මෙය යම් ආකාරයක නියාමනයකට ලක් කළ යුතු, බොහොම ළඟින් විමර්ශනය කළ යුතු ක්ෂේත්‍රයක් වනවා. ඒ සඳහා Excise Department එකත්, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවත් අනෙකුත් වැඩ කටයුතු සිදු කරමින් තිබෙනවා.

අද දින දෙවන වර කියවීමට භාජන වන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීමට ප්‍රථමව මම අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. පසුගිය සති දෙකතුනේ - සමහර විට මාසයකටත් වැඩි කාලයක් තුළ - විශේෂයෙන්ම ඇමෙරිකානු එක්සත් ජනපදය විසින් පනවන ලද reciprocal tariffs පිළිබඳ විශාල සංවාදයක් ලංකාවේ ඇති වුණා. අපි නිරන්තරයෙන් ඒ ගැන කිව්වා. ඒක අපේ රට ඇතුළේ තීන්දුවක් නොවෙයි. බාහිරව ඇමෙරිකානු එක්සත් ජනපදය ගත්තු තීන්දුවක ප්‍රතිඵලයක් විධියටයි එය ඉදිරියට ආවේ. කෙසේ වෙතත්, අප ඒ වෙනුවෙන් ඉතාම නිවැරැදිව මැදිහත් වෙමින්, රාජ්‍ය තාන්ත්‍රිකව මැදිහත් වෙමින් සියලු කටයුතු කරනවා කියලා අපි කිව්වා. හැබැයි, විපක්ෂය නිරන්තරයෙන් මේ පිළිබඳව සමාජයේ අසත්‍යය මතු කළා; වෙනත් ක්‍රමවේද යෝජනා කළා, එහෙම නොවෙයි කළ යුත්තේ කියලා. අද වනකොට අපට පුළුවන්කම ලැබී තිබෙනවා, එහි සැලකිය යුතු සන්ධිස්ථානයකට ළඟා වෙන්න. අපේ රටට සියයට 44ක් කියලා නියම කරපු ඒ reciprocal tariff එක, සියයට 20 දක්වා පහළට ගෙන එන්න අපට හැකියාව ලැබී තිබෙනවා. නමුත්, ඒ නිසාම මේ මොහොත වනකොට ඒ කථාව යට ගිහින් තිබෙනවා. ඇත්තටම අපි ඒ කථාවත් යම් අගය කිරීමකට ලක් කරගත යුතු වෙනවා.

ප්‍රධානම මාතෘකාව බවට පත් වන්නේ විදුලිබල පනතයි. අපේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පතේ අන්තර්ගතය ගැන සාකච්ඡා කරන කොට මෙය හුදෙකලාව වෙනත් පනත් කෙටුම්පතක් විධියට අරගෙන, එහෙම නැත්නම් මේ පනත් කෙටුම්පතේ අන්තර්ගතය ගැන විතරක්, එමඟින් ආර්ථිකයට ඇති වන බලපෑම ගැන විතරක් හිතලා සාකච්ඡා කරලා හරියන්නේ නැහැ. මෙය සමස්තයක් විධියට ගත යුතු වෙනවා. ඒකට හේතුව තමයි විදුලි බලය කියන්නේ බලශක්තිය කියන ක්ෂේත්‍රය - energy sector එක - යටතේ තිබෙන එකක් වීම. ලෝකය අරගෙන බැලුවත්, ලෝකය විකාශනය වෙලා එනකොට ලබා ගත්තු ආර්ථික ජයග්‍රහණ, අත්පත් කර ගැනීම්වලට විශාල දායකත්වයක් ලබා දී තිබෙන්නේ මේ කියන බලශක්තියයි. බලශක්තියේ ප්‍රධානම අංගයක් වන විදුලි බලය තමයි එහිදී විශාලම දායකත්වය ලබා දී තිබෙන්නේ.

කාර්මික විප්ලවයෙන් පස්සේ භාණ්ඩ නිෂ්පාදනය, නිෂ්පාදන මහා පරිමාණයෙන් වැඩි කර ගැනීම, නිෂ්පාදනයේ පිරිවැය අඩු කර ගැනීම, කාර්යක්ෂමතාව කියන කාරණාවලදී විදුලිය විශාල කාර්යභාරයක් කර තිබෙනවා. එහෙම නම්, අපි විදුලිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්, රාජ්‍ය ප්‍රතිපත්තියක් සැලකිල්ලට භාජන කරද්දී, සමස්තය සැලකිල්ලට ගෙන කටයුතු කරන්න ඕනෑ. අපි දන්නවා, ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳ විද්වතුන්, ඒ හා සම්බන්ධ ඉංජිනේරුවන්, වැඩ කරන අය විවිධ වූ වැඩ කටයුතු කර තිබෙන බව; විවිධ සැලසුම් සකස් කර තිබෙන බව. මේ වනකොට අප අත්පත් කර ගත් තත්ත්වයන් මොනවාද? ඉදිරියේදී පුනර්ජනනීය බලශක්තියේ තමයි පිරිවැය අඩු වෙන්නේ; ධාරිතාව වැඩි වෙන්නේ. දැන් ඒ සඳහා යන ගමන් මාර්ග සකස් කර තිබෙනවා. වෙනත් රටවල් ඒ ජයග්‍රහණ අත්පත් කර ගනිමින් තිබුණත්, දේශපාලනීකරණය නිසා අතීත දේශපාලන යන්ත්‍රණය ඇතුළේ අවාසනාවකට අපට අත් දකින්න ලැබුණේ මෙන්න මේ කියන සැලසුම් ඉදිරියට අරගෙන ඇවිත් එහි ප්‍රතිඵල මහජනතාවටත්, ආර්ථිකයටත් ලබා දෙන තත්ත්වයක් නොවෙයි. ඒ නිසා අපට එකවර ක්‍රියා මාර්ග දෙකකට යන්න සිදු වෙනවා. එකක් තමයි, බලශක්ති ක්ෂේත්‍රය තුළ තිබෙන විදුලි බලය සම්බන්ධයෙන්, විවිධ ආණ්ඩු කාලවලදී කරන ලද ගැටලුකාරී ක්‍රියා නිසා ඇති වෙලා තිබෙන අනර්ථකාරී තත්ත්වයන් වෙනස් කිරීම. ඒ ගමන්ම අනාගත බලශක්තිය සඳහා වූ පුළුල් ප්‍රතිපත්තියකට අවශ්‍ය අඩිතාලම සකස් කරන්නත් ඕනෑ. අන්න ඒ සඳහා වෙච්ච පදනමක් විධියට තමයි මේ විදුලිබල පනත පිළිබඳ සංශෝධනය අපි 2025 අවුරුද්දේ ගෙන එන්නේ.

අපි පැරණි විදුලිබල පනත පිළිබඳව මොහොතකට අවධානය යොමු කරමු. විශේෂයෙන්ම මෙහිදී අදහස් මතු වුණා, එම පනත ඉතාම ප්‍රගතිශීලී එකක්, ඒක වෙනස් කරලා අපි අනර්ථකාරී පනත් කෙටුම්පතක් ගෙනැල්ලා තිබෙනවා කියලා. ඇත්තටම හරියට බැලුවොත්, 2024දී යෝජනා කරපු පනත තමයි අනර්ථකාරී. ඒ ආණ්ඩුවල භාවිතාව නිසාම වෙන්න ඇති මේ ආර්ථිකයේ ප්‍රතිපත්තිවල භාවිත කරන සමහර වචන -ආයෝජන කියන වචනය, පෞද්ගලීකරණය කියන වචනය ආදිය- ඉතා පටු තේරුම්වලින් යුක්ත වෙලා තිබෙන්නේ. මේවා ඒ ගොල්ලන්ට තිබිච්ච එකම ක්‍රියා මාර්ගය බවට පත් වෙලා තිබුණා. මීට කලින් විපක්ෂයේ අදහස් දක්වපු මන්ත්‍රීවරයෙක් පෞද්ගලීකරණය, එහෙම නැත්නම් විකිණීම, ආයෝජන කැඳවීම ආදි ඔක්කෝම එකම දෘෂ්ටිකෝණයක්, එකම නිර්වචනයක් යටතේ තමයි ඉදිරිපත් කළේ. ඇත්තටම පෞද්ගලීකරණය කියන්නේ රාජ්‍ය සතු දෙයක් පෞද්ගලික අංශයට පැවරීම. හැබැයි, පෞද්ගලික ව්‍යවසාය කියන්නේ ඊට එහා ගිය කාරණයක්. මේ පනතට අපි කරන සංශෝධනය ඇතුළේ කිසිම විධියකට රාජ්‍ය සතු දේවල් කුණු කොල්ලයට විකිණීම හෝ පෞද්ගලීකරණය කිරීමකට යන්නේ නැති අතර, ඇත්තටම ව්‍යවසායකත්ව කැඳවීමට, ආයෝජන කැඳවීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කරනවා. යෝජනා කරලා තිබුණු පනතට අනුව සමාගම් 12ක් තිබුණා. ඒ පනතේ තිබුණු ගැටලුව තමයි, යම් රාජ්‍ය දේපළක්, රාජ්‍ය වත්කමක් විනාශ කරන්න ඕනෑ නම් ඒවා එක යන්ත්‍රණයක් ඇතුළට ගෙනෙන්නේ නැතුව, ඒවා කඩලා වෙන වෙනම කොටස් විධියට තියන එක. ඒ සමාගම් 12ට තිබුණේ හුදෙක්ම පෞද්ගලික අංශයේ හෝ වෙනත් අංශවල තනි තනි ක්‍රියාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වීමක් මිසක්, එකට කටයුතු කිරීමක් නොවෙයි. අපි යෝජනා කරන පනත් කෙටුම්පතේ ඒ සියලු දේ, විදුලිබල ක්ෂේත්‍රයට අදාළ සියලු යන්ත්‍රණය රාජ්‍ය පාලනය සහ නියාමනය කිරීමට යටත් වෙන එක් යන්ත්‍රණයකට ගෙනෙනවා. ඒ තුළ විදුලිය බලය ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, පාරිභෝජනය කිරීම, පද්ධතිය නඩත්තු කිරීම වැනි විවිධ ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා.

අපි අවබෝධ කර ගන්න ඕනෑ, විදුලිය යනු හුදෙක්ම සාම්ප්‍රදායික භාණ්ඩයකට වඩා එහා යන එකක් කියලා. සාම්ප්‍රදායික භාණ්ඩයකදී නිෂ්පාදකයා හා පාරිභෝගිකයා සම්බන්ධ වෙන කොට ඒ ඉල්ලුම සහ සැපයුම අනුව නිෂ්පාදකයාට පුළුවන් වෙනවා, ඒ තත්ත්ව වෙනස් කර ගන්න. ඒ අනුව හැඩය, මිල ආදිය වෙනස් කර ගන්න පුළුවන්. හැබැයි, විදුලිය එහෙම නොවෙයි. කවුරු නිෂ්පාදනය කළත්, මොන මාර්ගයෙන් නිෂ්පාදනය කළත් අවසානයේ විදුලිය එන්නේ කිලෝවොට්, මෙගාවොට් විධියට. ඒ කියන්නේ එකම ආකාරයට තමයි පාරිභෝජනය සිද්ධ වන්නේ. ඒ නිසා ලෝකයේ කිසිම රටක විදුලිය, විවෘත වෙළෙඳ පොළට ඕනෑ විධියට විකිණිලා යන වෙළඳ පොළ භාණ්ඩයක් විධියට නිශ්චය කරන්නේ නැහැ. නමුත් යම් ආකාරයක මැදිහත් වීම් තිබෙනවා. ඒ නිසා අපට වගකීමක් සහ වගවීමක් තියෙනවා, විදුලිය නිසි ආකාරයට යම් නියාමනය කිරීමකට යත්ව සිදු කරන්න. අන්න ඒ නියාමන යන්ත්‍රණය ප්‍රධාන වශයෙන් අරමුණු කර ගන්නේ හැකිතාක් දුරට පිරිවැය අඩු කරගන්නයි. ඒ පිරිවැය අඩු කිරීමත් ක්‍රමිකව, කාලානුරූපවයි

[ගරු අනිල් ජයන්ත මහතා]

කෙරෙන්නේ. ඒ වෙනුවෙන් තමයි 2030 වෙනකොට අපේ පුනර්ජනනීය බලශක්තිය සියයට 70ක ළඟා කරගත යුතු ඉලක්කයක තිබෙන්නේ.

අපට ජල විදුලිය වැඩිපුර තිබෙන නිසා, ඉදිරියේදී සුළං සහ සූර්ය බල ශක්තියෙන් මීට වැඩි විභවතාවක් අත්පත් කර ගන්න ඕනෑ. ඒ සඳහා යන ඉලක්කයේදී අපට දැනටමත් පුළුවන්කම ලැබිලා තිබෙනවා, ඒ සියයට 70 ඉලක්කයට පහසුවෙන් ළඟා වෙන්න. ඊයේ අපේ විපක්ෂ නායකතුමා කිව්වා, ඒවා සඳහා මැදිහත් වෙලා නැහැ කියලා. ඒ සියයට 70 අපේ ඉලක්කය ඊයේ වෙන කොටත් ලකුණු වෙලා තිබුණා. ඒ කෙසේ වෙතත්, තවදුරටත් පිරිවැය අඩු කර ගන්න ඕනෑ. අපි අනර්ථකාරී වැඩි මිල ගණන්වලට විදුලි බලය මිලදී ගැනීමේ දිගු කාලීන ගිවිසුම්වලට ගියොත් විදුලි බිල අඩු කර ගන්න, පිරිවැය අඩු කර ගන්න බැරි වෙනවා. අපි සමස්ත සැලැස්මක් යටතේ, energy policy එකක් යටතේ තමයි වැඩ කටයුතු කර ගන්න ඕනෑ. ඒ නිසා මෙතැනදී ඵලදායිතාව වැඩි කර ගැනීම, කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම වැනි කාරණා ගණනාවක් සැලකිල්ලට භාජන කරනවා. මොකද, විදුලිය හුදෙක් තවත් භාණ්ඩයක් නොවෙයි. විදුලිය අපේ ආර්ථික නිෂ්පාදනයේ අනාගත කාර්මික පුනරුදය ඇති කිරීමේ ප්‍රධානම මෙවලමක් බවට අපි පත් කර ගන්න ඕනෑ.

ඒ වාගේම තවත් චෝදනාවක් ඉදිරිපත් කළා unbundling ගැන. ඔව්, unbundling කියන්නේ මේක වෙනස් කර ගැනීම. හැබැයි, ඒ ගොල්ලන් unbundling විධියට දැක්කේ විකුණන එක විතරමයි. ඒ නිසා වෙනත් ආකාරයක unbundling ඒගොල්ලන් දකින්නේ නැහැ. මේ unbundling කරන්නේ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමටත්, ක්‍රියාකාරිත්වය පහසු කර ගැනීමටත්.

ඉහළින්ම තිබෙන රාජ්‍ය සමාගම, ඒ කියන්නේ generation සම්බන්ධයෙන් තිබෙන සමාගම - GenCo - යටතේ ඕනෑ තරම් අනුසමාගම් හැදෙන්න පුළුවන්. මොන තරම් අනුසමාගම් හැදුණත්, ආයෝජන කැඳවුණත් ඒවා නියාමනය සහ පරිපාලනය රාජ්‍ය සමාගම යටතේ තිබෙනවා. ඒකෙන් අදහස් වන්නේ නැහැ, ඒකාධිකාරියක් කියලා. මොකද, ඒකාධිකාරිය දකින්නේ විවෘත වෙළෙඳ පොළ තුළ තිබෙන භාණ්ඩවලදී. මෙතැන තිබෙන්නේ, රාජ්‍යයේ වගකීම, වගවීම නිසා නියාමනය කිරීමයි. විදුලි බලය කියන එක හුදෙක්ම රාජ්‍ය ආරක්ෂාව පිළිබඳත් ප්‍රශ්නයක් තිබෙනවා. ජාතික ආරක්ෂාව කියන කාරණයේදී එහෙමයි. මොකද එකවර විදුලිය ඇන හිටියොත් සියලු දේ ඇන හිටිනවා. ඒක නිසා අපි ඉතා වගවීමෙන් වැඩ කටයුතු කරන්නට ඕනෑ.

ඒ වාගේම මේ යෝජනා කරලා තිබෙන ව්‍යුහය ඇතුළේ අපි සැලකිල්ලට භාජන කරලා තිබෙනවා, generation company එක යටතේ මේ ඉඩප්‍රස්ථාව දෙන ගමන්ම, සම්ප්‍රේෂණය - transmit - කිරීමේදීත් රාජ්‍ය අයිතිය තියෙන ගමන් පුද්ගලික අංශයේ ආයෝජන කැඳවීමට ඒ ඉඩකඩ අපි අහුරලා නැහැ. සමහර අවස්ථාවලදී අපට ධාරිතාව වෙනස් කර ගැනීම, සම්ප්‍රේෂණ වැඩි කර ගැනීම සිදු කරන්න වෙනවා. මොකද, ඉදිරියේදී අපේ සැලසුම් තිබෙනවා, අපේ රටේ තිබෙන විභවතා සැලකිල්ලට අරගෙන සූර්ය බල ශක්තිය, සුළං බලය වාගේ ශක්තිය වැඩි දේවල් ලංකාවේ නිෂ්පාදනය කරන්න. අතිරේකව නිෂ්පාදනය කළොත් විදේශීය වෙළෙඳ පොළට පවා අපනයනය කිරීමට තිබෙන හැකියාව ගැනත් අපි සොයා බලන්න ඕනෑ.

මේ සම්ප්‍රේෂණයට සම්බන්ධ සමාගමක් තිබෙනවා. ඒ වාගේමයි බෙදා හැරීමත්. මෙහිදී විශේෂයෙන්ම අවධාරණය කරන්න ඕනෑ, මේ සම්ප්‍රේෂණය සම්බන්ධයෙන්. ලෝකයේ හැම තැනම වයර් හරහා යන සම්ප්‍රේෂණය - wired transmission - කියලා තිබෙනවා, non-wired transmission තිබෙනවා. බොහෝදුරට මේ දෙකම එකක් විධියට තිබෙන්නේ. අපි ඒ ගැන අධ්‍යයනය කරලා ඒක වෙන් කර තිබෙනවා. ඒකට හේතුව තමයි, wired transmissionවලින් කරන ක්‍රියාකාරකමත්, non-wired transmissionවලින් කරන ක්‍රියාකාරකමත් එකට තිබ්බොත්, මේ ක්‍රියාකාරකම්වල ගැටලුවක් ඇති වීම. ඒ නිසා තමයි National System Operator කියලා අපි non-wired එක අයින් කරලා තිබෙන්නේ. ඇත්තටම අධ්‍යයනය කළොත් අපට පෙනෙනවා, මොන ආකාරයකටද මේ පසුබිම නිර්මාණය කර තිබෙන්නේ කියලා. බලශක්තිය ඉදිරියට අරගෙන යන්න තිරසාර බලශක්තියත්, පුනර්ජනනීය බලශක්තියත් ලංකාව ඇතුළේ ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පදනම -පසුබිම- මේ පනත් කෙටුම්පත තුළින් අපි ඉදිරිපත් කර තිබෙනවා. නමුත් සමාජයේ මතයක් හදනවා, මේක විකුණන්න යනවා, මේ පනත් කෙටුම්පතෙන් සේවකයන්ගේ රැකීරක්ෂා අහිමි වෙනවා කියලා. නමුත්, කිසිදු ආකාරයකින් කිසිම සේවකයකුගේ රැකීරක්ෂා අහිමි වීමක් වෙන්නේ නැහැ.

ලංකා විදුලිබල මණ්ඩලය සතුව තිබෙන අරමුදල් -EPF එක, විශ්‍රාම වැටුප් අරමුදල- තිබෙන්නේ වෙනත් සමාගමක් යටතේ සියයට සියයක්ම ඒගොල්ලන්ගේ දායකත්ව අරමුදලක් විධියටයි. ඒ නිසා සැලකිය යුතු අරමුදලක් තිබෙනවා. ඒ අරමුදල නිසියාකාරව කළමනාකරණය කරමින් මේ සේවකයන් සම්බන්ධයෙන් වැඩ කටයුතු කරන්න අවශ්‍යයි. ඒ නිසා පළමුකොටම මේ සේවකයන්ට අවස්ථාව ලබා දීලා තිබෙනවා, තමන්ගෙන් රුචිකත්වය මත මේ සමාගම්වලින් -ප්‍රධාන වශයෙන් සමාගම් 6ක් හැදෙනවා- කොහේටද යන්නේ කියලා තීරණය කරන්න. හැබැයි, ඒ ඔක්කොම එකම ආයතනයකට යන්න ඉල්ලුම් කළොත් අපට යම් මැදිහත්වීමක් කරන්න සිද්ධ වෙනවා. ඔවුන්ගේ ප්‍රමුඛතාවත්, ඉල්ලුමත් සැලකිල්ලට භාජන කරමින් සේවකයන් සියලුදෙනාම මේ ආයතනවලට අනුයුක්ත කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, නියමිත වෙලාව අවසන්.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ අනුව විශේෂයෙන්ම අවධාරණය කර තිබෙනවා, කිසිම සේවකයකුට දැනට හිමි ප්‍රතිලාභ ශතයකින්වත් අඩු නොකරන විධියට මේ කටයුත්ත කරන බවට. ඒ නිසා මම විපක්ෂයට විශේෂයෙන්ම මේ කාරණය අවධාරණය කරන්න කැමැතියි. මෙය අපේ අනාගත බලශක්ති ප්‍රතිපත්තියේ ප්‍රධාන භූමිකාවක් සිද්ධ කරන විදුලි බලයේ දිශානතිය වෙනස් කරන, පුනර්ජනනීය විදුලි බලයෙන් අපේ කාර්මීකරණය, අපේ ආර්ථිකය, ඒ වාගේම මහජනතාවගේ ජීවිත නඟා සිටුවීම සඳහා ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. ඒ නිසා මේ පනත් කෙටුම්පතට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්නය කියා යෝජනා කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.06]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත ගැන ආණ්ඩුවත්, විපක්ෂයත් කරුණු ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කළ නොයෙකුත් කාරණාවලදී , යම් යම් තාක්ෂණික කරුණු ඉදිරිපත් වුණා. ඒ කෙසේ වුවත්, විෂයභාර අමාත්‍යතුමා ඉන්න වෙලාවේ මම යම් කාරණයක් මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, රටේ ප්‍රශ්නය මේක නොවෙයි. මේ සංශෝධන පනත් කෙටුම්පත දිහා නොවෙයි මිනිස්සු බලාගෙන ඉන්නේ. මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නවා, ඒ අයට සහනයක් ලැබෙන්නේ කොහෙන්ද කියලා. ඒ, අය මාසිකව ගන්න පඩියෙන් ජීවත් වීමේදී ප්‍රධාන සාධකයක් වෙච්ච විදුලි බිල දිහා බලනවා.

විශේෂයෙන්ම මම මතක් කරනවා, 2024 අගෝස්තු මස 17වැනි දා ගාල්ලේ පැවතුණු ජන රැලියේදී අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වෙන්න ඉස්සෙල්ලා කරපු ප්‍රකාශය. එතුමා කිව්වා, බලය ගත්ත ගමන් තුනෙන් එකකින් මේ රටේ ජනතාවගේ විදුලි බිල අඩු කරනවා කියලා. මේවා වැරදි තොරතුරු නොවෙයි. ඒ එදා කියපු දේ. එතුමා ප්‍රකාශ කරපු දේ. එතකොට මේ රටේ ජනතාව ඒ බලාපොරොත්තුව හිස් මුදුනින් තියා ගත්තා. සාමාන්‍යයෙන් රුපියල් 9,000ක විදුලි බිලක් ගෙවන කෙනෙක් බලාගෙන හිටියා, රුපියල් 9,000 බිල රුපියල් 6,000ට අඩු වනකල්. එතකොට මාසයේ පඩි පැකට් එකෙන් රුපියල් 3,000ක් ඉතුරු වෙනවා. ඒ, මිනිස්සු බලාපොරොත්තු වෙච්ච දේ. එතකොට ඒ මිනිස්සු බලාපොරොත්තු වෙච්ච දේ අද ඉටු වුණාද කියන එක තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ලබන මාසය සැප්තැම්බර් මාසය. සැප්තැම්බර් මාසයේ 21වැනි දා කියන්නේ, ජනාධිපතිතුමා මේ රට භාරගෙන හරියටම අවුරුද්දක් වන දවස. මම ඒකයි කිව්වේ. මේ පනත් කෙටුම්පත්වලට සංශෝධන ගෙනෙන්න ඕනෑ.

මේක යාවත්කාලීන කරන්න ඕනෑ. නව ක්‍රමවේද හඳුනා ගන්න ඕනෑ. හැබැයි, ඒ ක්‍රමවේද හඳුනා ගන්න එකට වැඩිය මේ රටේ සිටින මිනිස්සු ඉල්ලන්නේ මොකක්ද? කෙක්කෙන් හරි කොක්කෙන් හරි අපට විදුලි බිල අඩු කරන්න කියන එකයි. මෙන්න මේක තමයි මිනිස්සු ඉල්ලන්නේ. දැන් ඔබතුමා ඉදිරිපත් කරපු මේ සංශෝධන පනත් කෙටුම්පත මේ රටේ මිනිසුන්ගෙන් සියයට කීදෙනෙක් කියවනවාද, මේක බලනවාද? මේක බලන්නේ නැහැ. මොකද, ගෙදර ඉන්න ළමයින්ට කියනවා, කරුණාකරලා ඉක්මනට ඔන්න ඔය ලයිට් එක ඕෆ් කරපන් දුවේ; පුතේ නැත්නම් අපේ බිල වැඩි වෙනවා කියලා. ඉතින්, විදුලි බිල අඩු කරන එකයි මිනිස්සු බලාපොරොත්තු වුණේ. අන්න ඒක ඉටු කරන්න. මෙය ඉටු කරන්න තිබෙද්දී, ඉදිරි අනාගතයේ මොකක්ද සිද්ධ වෙන්නේ?

මම ගරු ඇමතිතුමාගේ කථාව අහගෙන හිටියා. මම බලාපොරොත්තු වුණා, එතුමාගෙන් පණිවුඩයක් ලැබෙයි කියලා. "අපි 2025 වර්ෂයේ දී අනිවාර්යයෙන්ම විදුලි බිල අඩු කරනවා" කියන පණිවුඩය ඔබතුමාගෙන් ලැබුණා නම්, ඔබතුමාමේ වෙලාවේ hero - ඔබතුමා වීරයෙක් වෙනවා. මොකද, හේතුව මේ වෙලාවේ යම් යම් තැන්වල යම් යම් ඇමතිවරු ලකුණු කපා ගන්නකොට එක් කෙනෙක් දෙන්නෙක් හරි ලකුණක් දා ගන්න ඉන්න එපා යැ. එහෙම ලකුණු දමා ගන්නා hero කෙනෙක් වෙයි කියලා මම හිතුවා. ඉතින් මම හිතුවා, "නැහැ, නැහැ අපි අනිවාර්යයෙන් එදා ජනාධිපතිතුමා කියපු එක අනුව, අපි බලයට එන්න ඉස්සෙල්ලා කියපු එක අනුව අපි විදුලි බිල අඩු කරනවා" කියන එක අද ඔබතුමා කියයි කියලා. ඔබතුමාගෙන් එහෙම ඇහෙයි කියලා මම බලාපොරොත්තු වුණා. ඔබතුමාත් උත්සාහ කරනවා ඇති. හැබැයි, වෙලා තිබෙන්නේ අපි එළියේ ඉන්නකොට කියපුවා නොවෙයි, ඇතුළට ආවාම තිබෙන්නේ කියලා පෙනෙනවා. මම දන්නා දෙයක් මේ කියන්නේ. එළියේ ඉන්නකොට යම් යම් දේවල් කියනවා. හැබැයි, ඇතුළට ආවාම දැනෙනවා, මේකේ තිබෙන තත්ත්වය මොකක්ද කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම මම තව කාරණයක් මතක් කරන්න කැමැතියි. ඔබතුමා COPA කමිටුවේ හිටපු සභාපතිවරයා. ඔබතුමා අද ඉල්ලා අස් වුණා. ඔබතුමා අද මූලාසනයට ආ එක හොඳයි. මට කාරණයක් පැහැදිලි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජූලි මාසයේ 23 වෙනිදා COPA කමිටුවට අධ්‍යාපන අමාත්‍යාංශය කැඳවා තිබුණා. මමත් COPA කමිටුවේ සාමාජිකයෙක්. නමුත් මම එදා ආවේ නැහැ. මම ආපු නැති ඒ දවසේ ඔබතුමා මූලාසනයේ ඉඳගෙන පවත්වපු COPA කමිටුවට එනවා, අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක්. එතැනදී මතු වෙනවා, වසා දැමූ පාසලක් යම් පුද්ගලයෙක් පළාත් සභාවෙන් බදු අරගෙන ඔහු ඒක නොදී ඉන්නවා කියන කාරණය. ඔබතුමා ඒක ප්‍රශ්න කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කියනවා, "ඔව්, ඒ අය දැන් අපිත් එක්ක නඩු කියනවා" කියලා. ඊට පස්සේ අහනවා, කවුද මේක ගත්ත පුද්ගලයා කියලා. ගත්ත පුද්ගලයාගේ නම කියනවා, සරත් අබේගුණවර්ධන කියලා. ඔබතුමාත් පොඩ්ඩක් බලනවා, අබේගුණවර්ධන කියනකොට. මොකද, පාර්ලිමේන්තුවෙත් එකෙක් ඉන්නවා නේ. මේ එකා නේ **යකා**. නම අබේගුණවර්ධන නිසා මේක ගන්නවා. අරගෙන කියනවා, මේ ගැන සොයා බලන්න කියලා. ඒක හොඳයි. ඔබතුමා කියනවා, මේ ගැන සොයා බලන්න කියලා. හොයලා බලන්න. ඒක නේ, COPA කමිටුවේ වගකීම. ඊට පස්සේ මොකක්ද වෙන්නේ? සමන්මලී ගුණසිංහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය TV එකේ ඒ ගැන කියනවා, මම දකිනවා. ඒ හඬ පටය තිබෙනවා, මම ඒක ඉදිරිපත් කරන්නම්. මට වෙලාව මදි, මම ඒක ඉදිරිපත් කරන්නම්. එතුමිය කියනවා, "මේ බලන්න, මෙන්න පාසලක් වසා තබලා. ඒක මේ වෙනකොට කා ළඟ ද තිබෙන්නේ? ප්‍රබල දේශපාලනඥයෙක් ළඟ. ඒ කවුද? රෝහිත අබේගුණවර්ධනගේ එකම සහෝදරයා සරත් අබේගුණවර්ධන" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඉන්නේ එකම සහෝදරයායි. ඒ රෝහණ අබේගුණවර්ධන. එක සහෝදරයයි. හැබැයි, සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය මා පිළිබඳව මේ වැරදි ප්‍රකාශය කරනකොට; මේ චෝදනාව කරනකොට මම දැනගෙන හිටියේ නැහැ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ඔබතුමා තව විනාඩියක් හරි දෙන්න. මේක ඔබතුමාගේත් ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමිය මට මේ චෝදනාව නඟනකොට මම දැනගෙන හිටියේ නැහැ, එතුමිය බිමල් රත්නායක අපේ ගරු සභානායකතුමාගේ බිරිඳ කියලා. මම දැනගෙන හිටියේ නැහැ, දෙයි හාමුදුරුවනේ! අපි ළඟ එහෙම personal agenda නැහැ. ඊට පස්සේ තමයි මම දැන ගත්තේ මේ ගරු මන්ත්‍රීතුමිය, සභානායකතුමාගේ බිරිඳ බව. මම එකක් ප්‍රකාශ කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අබේගුණවර්ධන පවුලේ මගේ තාත්තාගේ තාත්තා වෙද මහත්තයෙක්. අපේ තාත්තාගේ පවුලේ 17ක්. පිරිමි 15යි; ගැහැනු 2යි. ඒ මහ පවුලේ ඊට වඩා වැඩියි. අබේගුණවර්ධනලා විසිරිලා ඉන්නවා, අපේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, ගාල්ලෙත් ඉන්නවා.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

වැරදිලාවත් සුමනදාස අබේගුණවර්ධන වරදක් කළොත්, දෙවිහාමුදුරුවනේ! රෝහිත අබේගුණවර්ධන ඒකට ඉල්ලාගෙන කන්න ඕනෑද? ඒකද, දේශපාලන සදාචාරය? අනුර කුමාර දිසානායක වත්මන් අතිගරු ජනාධිපතිතුමා ගැන දැන් බලමු. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමියගේ හිටපු ලේකම් පී. දිසානායක දැන් හිර ගෙදර ඉන්නවා. එතකොට, පී. දිසානායක කරපු වරදට පී. දිසානායක හිරේ ගියාම, ඒකට අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා වගකියන්න ඕනෑද? ඒ නිසා මම පැහැදිලිව කියනවා, - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කමිටු සභාපතිත්වයෙන් ඉල්ලා අස් වුණේ ඇයි කියලා මම දන්නේ නැහැ. COPA එකයි, COPE එකයි හිතනවා නම් යම් විධියකට - COPE එකේ සභාපතිවරයා හැටියට මම වැඩ කළා; ඒ කමිටුවේ සාමාජිකයකු හැටියට අවුරුදු ගණනක් සිටියා - හැබැයි මේ කමිටු හිතනවා නම්, මේක හොරු අල්ලන තැනක් කියලා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
විනාඩියෙන් කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් කරන්න තිබෙන හොඳම වැඩේ තමයි COPE එකටයි, COPA එකටයි ඒ තැන්වලම හිර කූඩු දෙකක් හදන්න කියලා ගරු කථානායකතුමාට යෝජනා කරන එක. එතකොට "මූ හොරා" කියලා තීන්දු කරපු ගමන් අල්ලලා ටක්ගාලා ඇතුළට දමන්න පුළුවන්. එහෙම කරන්න බැහැ නේ. අපට පුළුවන් නිර්දේශ කරන්න. ඔබතුමා කමිටුවේ සභාපති හැටියට අභවල් ආයතනවලට නිර්දේශ ලබා දෙනවා. CID එකට දෙන්න පුළුවන්, Bribery Commission එකට දෙන්න පුළුවන්, එහෙම නැත්නම් පොලීසියට දෙන්න පුළුවන්. එතකොට ඒ ගොල්ලෝ තමයි තීන්දු ගන්නේ. එම නිසා ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේම තමයි මම මේ වැරැද්ද නිවැරදි කරන්නේ.

අවසාන වශයෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලා උත්සාහයක් දරන බව පෙනෙනවා. හැබැයි, පොළොවේ පය ගහපු දේශපාලනඥයකු හැටියට මම ඉල්ලීමක් කරනවා, මෙහි අවසාන ප්‍රතිඵලය යන්න ඕනෑ විදුලිය පාවිච්චි කරන මේ රටේ ජනතාවට. අන්න ඒ අහිංසක මිනිස්සු දිහා බලන්න. ඒ අහිංසක මිනිස්සු ඔබ කෙරෙහි විශ්වාසයක් තැබුවා. ලංකා දේශපාලන ඉතිහාසයේ මන්ත්‍රීවරු 159ක් සහිතව ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ගෙනාවා. එසේ ගෙනාපු ඔවුන් ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වුණු යමක් තිබෙනවා. ඒක ඉටු කළොත් හොඳයි. ඉටු නොකළොත් වෙන්නේ, ඔබතුමන්ලා නොහිතන විධියට ජනතාව ඔබලාගෙන් ඈත් වන එකයි. ඒ පණිවුඩයත් මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.15]

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1969 දී තමයි විදුලි දෙපාර්තමේන්තුව, ලංකා විදුලිබල මණ්ඩලය බවට පත් කරන පනත ආවේ. එතැනින් පස්සේ 1988, 2002, 2009, 2024 වගේ කාලවල එම පනතට වෙනස්කම් ඇති කළා. ඒකට හේතුව තමයි, කාලීනව බලශක්ති ක්ෂේත්‍රය තුළ ඇති වන වෙනස්කම්, පරිවර්තනීය වෙනස්කම්, ඒ වාගේම ඒ ක්ෂේත්‍රය තුළ තිබිය යුතු කාර්යක්ෂමතාව, ගුණාත්මක භාවය, තරගකාරිත්වය වගේ දේවල් ඇති කරන්න නම් එම වෙනස්කම් ඇති කරන්න ඕනෑ.

ඒ අනුව තමයි ජාතික ජන බලවේගය හැටියට "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 167හි අපි කිව්වේ, විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය තුළ අනිවාර්යයෙන් සිදුවිය යුතු ප්‍රතිව්‍යුහගත කිරීම් සිදු කළ යුතු බව. විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රතිපත්තියක් හැටියට අපි පිළිගන්නා කාරණයක් තමයි, අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය වගේ මහජන සුබසාධන සේවාවන් වාගේම, බලශක්තිය, මූල්‍ය, තොරතුරු තාක්ෂණය වාගේ උපායමාර්ගික වශයෙන් වැදගත් වන ක්ෂේත්‍ර කෙරෙහි රාජ්‍ය මැදිහත් වීම ශක්තිමත්ව තිබිය යුතුයි කියන කාරණය. ඒ ප්‍රතිපත්තිය තුළ ඉඳගෙන තමයි ජාතික ජන බලවේගය කටයුතු කරන්නේ. හැබැයි රාජ්‍ය මැදිහත් වීම ශක්තිමත් විය යුතුයි කියන එකෙන් අපි අදහස් කරන්නේ නැහැ, මේක තුළ පෞද්ගලික අංශයට අවකාශයක් නැහැ කියලා. පෞද්ගලික අංශයට අවකාශය සලසා දෙමින් රාජ්‍ය මැදිහත් වීම ශක්තිමත් කරලා ඒ ක්ෂේත්‍රවල කිසියම් විධියක නියාමනයක්; පාලනයක් ඇති කිරීම සඳහා රාජ්‍ය මැදිහත් වීම ශක්තිමත් කිරීම තමයි අපේ අරමුණ.

ඒ අනුව දැනටමත් ප්‍රකාශ කර තිබෙන විධියට අපි කථා කරන මේ 2024 අංක 36 දරන පනත සංශෝධනය වෙන්නේ, අන්න ඒ දුර්වල කිරීමට යෝජිතව තිබුණු රාජ්‍ය මැදිහත් වීම ශක්තිමත් කිරීමට බව අපි දන්නවා. ඒ වාගේම පෞද්ගලික අංශයේ දායකත්වයට බාධාවක් නොවන විධියට එම රාජ්‍ය මැදිහත් වීම අපි ශක්තිමත් කරනවා. උදාහරණයක් විධියට ගත්තොත්, දැනටමත් අපි දන්නා විධියට කලින් තිබුණු පනතේ, ඒ කියන්නේ 2024 පනතේ සම්ප්‍රේෂණ සමාගම සියයට 50ක සීමාව ඉවත් කරලා -ඒ තුළ තිබුණේ සියයට 50ක අයිතියක් විතරයි- සියයට 100ක රජයේ අයිතියක් තබා ගැනීම සඳහා කටයුතු කරලා තිබුණා. නමුත් අතිරේක සම්ප්‍රේෂණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී පෞද්ගලික අංශයට අවස්ථාව ලබා දෙන්නත් අද දින සංශෝධන ඉදිරිපත් කරනවා.

ඒ අනුව කලින් තිබුණු විධියට තිබුණා නම් භාණ්ඩාගාර ලේකම්තුමාට අවස්ථාව සැලසෙනවා, ඒ පනතේ ප්‍රතිපාදන අනුව අවශ්‍ය විටක ලන්සු කැඳවා ඒ කොටස් බැහැර කරන්න. නමුත්, අපි මේ පනතෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන එක කරුණක් තමයි, මුල් පනතට සීමා වෙන්නේ නැතිව නිශ්චිත ජාතික බලශක්ති ප්‍රතිපත්තියක් තුළ කටයුතු කරන්න අවස්ථාව සැලසීම. මේ පනතට අදාළ මේ සංශෝධනය තුළින් එක පැත්තකින් අපි උත්සාහ කරනවා, විදුලිබල ක්ෂේත්‍රයට විතරක් නොවෙයි බලශක්ති ක්ෂේත්‍රයටම ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා වන අවකාශය උදා කර ගන්න. ඒ වාගේම ඒ වෙනකොට ඒ පනතෙන් පදනම් විරහිතව සමාගම් 12කට බෙදා හරින්න තිබුණු විදුලිබල මණ්ඩලය විද්‍යාත්මක පදනමින්, හේතු සහිතව, විධිමත් ප්‍රධාන සමාගම් 5කට බෙදා හරින්න මේ පනතෙන් අපි කටයුතු

කරනවා. ඒ වාගේම මේකෙන් අපට අවස්ථාව සැලසෙනවා, දීර්ඝ කාලීන සැලැස්මකට අනුව ජාතික පද්ධති ක්‍රියා කිරීම සඳහා විදුලිය මිලදී ගැනීමට නියාමන අනුමැතිය ලබා ගන්න.

මේ සාකච්ඡාවේදී අහන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, මේ පනත තුළින් විදුලි බිල අඩු කිරීම සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්නේ කොහොමද කියන එක. අපි දන්නවා, විදුලි බිල අඩු කිරීම පනතකින් විතරක් කරන්න පුළුවන් එකක් නොවෙයි කියන එක. ඒ සඳහා අපි විශේෂයෙන් කරන්න ඕනෑ දේ තමයි, අපේ generation cost එක අඩු කරන එක. අපට මේ පනත තුළින් generation cost එක අඩු කරගැනීම සඳහා එක පැත්තකින් අවස්ථාව සැලසෙනවා. මෙහිදී මම විශේෂයෙන් කියන්න ඕනෑ, හදිසි මිලදී ගැනීම් කියන එක පසුගිය කාලවල විදුලි බිල වැඩි වෙන්න ප්‍රධාන හේතුවක් වූ බව. කිසිම නියාමනයක් නැතිව, නිශ්චිත කාලයකට සීමා නොවී විදුලිය හදිසි මිලදී ගැනීම් සඳහා පරණ පනත තුළ අවස්ථාව සැලසී තිබුණා. නමුත්, මේ පනතෙන් ඒක සීමා කරනවා. ඒ කියන්නේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන අවුරුද්දක කාලයක් සඳහා පමණයි ඇත්තටම හදිසි මිලදී ගැනීම් කරන්නේ. ඒ අනුව ගත්තාම, අනවශ්‍ය ලෙස විදුලි බිල වැඩි කිරීම සඳහාත්, අනවශ්‍ය ලෙස සිදු කරන හදිසි මිලදී ගැනීම් වැළැක්වීම් සඳහාත් අවශ්‍ය ප්‍රතිපාදන මේ පනත තුළින් ඇති වෙනවා.

ඒ වාගේම මේ පනත් සංශෝධනයත් එක්ක සමාජය තුළ ඇතිවන කථා බහ කීපයක් ගැනත් මම අවධානය යොමු කරන්න කැමැතියි. විශේෂයෙන් මේ ප්‍රතිව්‍යුහගත කරන ක්‍රියාවලිය හරහා ලංකා විදුලිබල මණ්ඩලයේ කිසිම සේවකයෙකුට ඉවත් වීමට මේ පනත තුළ අවස්ථාව සැලසෙන්නේ නැහැ. ඉදිරියේදී ඇතිවන ඒ සමාගම් පහ තුළට ඔවුන් සියලුදෙනාම නියුක්ත කරනවා. මෙතැනදී තවත් කරුණක් කෙරෙහි මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරන්න මා කැමැතියි. 2024.09.18වැනි දා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා වෙත චක්‍රලේඛයක් නිකුත් කරලා කියනවා, 2024.09.13වැනි දා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබිච්ච දේවල් ක්‍රියාත්මක කරන්න කියලා. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබිච්ච -ඒ තුළ තිබෙන නිර්දේශයේ- කරුණු දෙකක් සම්බන්ධයෙන් මම අවධානය යොමු කරන්න කැමැතියි.

එම නිර්දේශවල 3.3 යටතේ කියනවා, "තාක්ෂණික ශ්‍රේණි හැර, වත්මන් සේවක සංඛ්‍යා මට්ටම යටතේ ලංකා විදුලිබල මණ්ඩලයෙහි තාක්ෂණික නොවන සේවක පිරිස 11,293 සිට 9,578 ලෙස සීමා කිරීමට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත නියෝග කරනු ලැබීමට." යනුවෙන්. ඒ වාගේම එහි 3.4 යටතේ කියනවා, "මානව සම්පතෙහි සිදු කෙරෙන පරිවර්තනයෙහි වෙනස්වීම මඟින් සේවක සංඛ්‍යාව 12,000 දක්වා අඩු කිරීම." යනුවෙන්.

ඇත්තටම අපි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මේ සංශෝධනය හරහා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය ඇති කරනවා විතරක් නොවෙයි, කලින් යෝජනා වෙලා තිබිච්ච සේවකයන් ඉවත් කිරීම කියන එක මේ පනතෙන් ඉවත් කරනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ විධියට මේ සමාගම් පහට යනකොට සේවකයන්ට තෝරා ගැනීමක් කරන්නත් අවස්ථාව ලැබෙනවා. හැබැයි, මොන සමාගමටද තමන් යන්නේ කියන එක තීරණය කරන්නේ තාක්ෂණික කරුණු මත වාගේම දක්ෂතාව හා හැකියාව මත.

තමන් කිසියම් සමාගමකට අනුයුක්ත කළාට පස්සේ, ඊට අකැමැති කෙනෙක් ඉන්නවා නම්, ඔවුන්ට ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමයකුත් මේ සංශෝධන සම්මත වීමෙන් පසු ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අගෝස්තු 27වැනි දාට කලින් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට දැනුම් දෙනවා, ඒ අය අයිති වෙන්නේ මොන සමාගමකටද කියලා. ඒ වාගේම ඔවුන්ට තෝරා ගැනීමේ අවස්ථාවකුත් මෙහිදී ලැබෙනවා. තාක්ෂණික අංශයට උනන්දුවක් ඇති අයට ඒ අංශය තෝරා ගන්නත්, ඒ වාගේම සම්ප්‍රේෂණය, බෙදා හැරීම යන අංශ තෝරා ගැනීමේ අරමුණු සහිතව ඉන්න අයට පවතින පුරප්පාඩු ප්‍රමාණයේ සීමාවට යටත්ව සේවා ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදයකුත් මෙම සංශෝධන සම්මත වෙලා 27වැනි දායින් පසුව මේ රටේ සිටින විදුලිබල සේවකයින්ට ලබා දෙනවාය කියන කාරණයත් මේ අවස්ථාවේ සඳහන් කරන්න මම කැමැතියි.

ඒ වාගේම සමහර අවස්ථාවල සාකච්ඡාවට බඳුන් වුණා, මේ පනත මඟින් මහජන උපයෝගිතා කොමිසමේ බලය සීමා කිරීමකට ලක් වෙනවාද කියලා. නැහැ, ඇත්තටම එහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. අපි දන්නවා, මහජන උපයෝගිතා කොමිසමට පැවරී ඇති කාර්යභාරය අතර ජලය, විදුලිය, ඉන්ධන වාගේ උපයෝගිතා ක්ෂේත්‍ර නියාමනය කිරීමේ කාර්යභාරයත් පැවරිලා තිබෙන බව. ඒ පිළිබඳව කිසිම බාධා කිරීමක්, සීමා කිරීමක් මේ පනත තුළින් ඇති කරන්නේ නැහැ. නමුත් එක පැත්තකින් ගාස්තු තීරණය කිරීමේදී, නියාමනය කිරීමේදී මුදල් අමාත්‍යාංශය විමසා එය සිදු කළ යුතු බව මේ පනතට ඇතුළත් කර තිබෙනවා. ඒකෙන් අදහස් කරන්නේ නැහැ, මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිවයි මේ කටයුත්ත කරන්න ඕනෑ කියලා. In consultation with the Ministry of Finance මිසක්, මේ සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත ප්‍රකාරව ජාතික විදුලි අයක්‍රම ප්‍රතිපත්තිය සැකසීමේදී බලශක්ති අමාත්‍යාංශයත්, ඒ වාගේම අනෙකුත් නියාමන පාර්ශ්වයනුත් උපදේශනය ලබා ගත යුතු බවත් සඳහන් වෙනවා. ඒ අනුව කිසිම විධියකින් මහජන උපයෝගිතා කොමිසමේ කර්තව්‍යයන් සීමා කිරීමක් මේ පනත මඟින් සිද්ධ වෙන්නේ නැහැ.

ඒ වාගේම මේ සාකච්ඡාව තුළ මතු වුණු තවත් සමහර කරුණු ගැනත් මම අවධානය යොමු කරන්න කැමැතියි. විපක්ෂයේ එක් මන්ත්‍රීවරයෙකු සඳහන් කළා, unbundlingවලින් පස්සේ පෞද්ගලීකරණය සඳහා අවස්ථාවක් ලැබෙනවා කියලා. හැබැයි මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි, අවුරුද්දකින් පස්සේ මේ unbundling කියන එක සිදු වුණත්, අපි මේ කථා කරන සමාගම් පහේ අයිතිය රාජ්‍ය සමාගම් හැටියට ක්‍රියාත්මක වන බව. ඒවා කිසි ලෙසකින්වත් පෞද්ගලික සමාගම් බවට පත් වන්නේ නැහැ. නමුත්, ඒ මඟින් පෞද්ගලික ආයෝජනයට තිබෙන අවස්ථාව ඇහිරීමකට ඉඩ සැලසෙන්නේත් නැහැ.

එමෙන්ම, consumer protection සහ පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ කිසිම සටහනක් මේ පනතට ඇතුළත් වෙන්නේ නැහැ කියලා මෙතැනදී සඳහන් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි මේ කථා කරන්නේ මේ පනතට ඉදිරිපත් කරන සංශෝධන ගැනයි. හැබැයි, සංශෝධනය නොවන වගන්තිත් මේ තුළ තිබෙනවා. ඒ අනුව, මුල් පනතේ 10වන කොටසේ තිබෙන 31වන වගන්තිය තුළින් තමයි ඇමතිවරයාට බලය සැලසෙන්නේ, ඒකාධිකාරයක් ඇති වීම හෝ අනවශ්‍ය තරගකාරිත්වය නිසා පාරිභෝගිකයාට සිදු වන අවාසි සම්බන්ධයෙන් මාර්ගෝපදේශන සලසන්න. ඒ අනුව එම වගකීම එන්නේ ඇමතිවරයාට. ඒ වගන්තිය කිසිම ලෙසකින් සංශෝධනය නොවී ඉදිරියට එනවා.

මේ පනත ගැන නොවුණත්, අද දවසේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙකු කරපු ප්‍රකාශයක් ගැන මම අවසාන වශයෙන්

[ගරු අනුර කරුණාතිලක මහතා]

පොඩි කාරණයක් පැහැදිලි කරන්නම්. එතුමා ප්‍රකාශ කළා, මහරගම පවතින උද්ඝෝෂණයකට සහභාගි වීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් පිරිසක් NB 6640 දරන වාහනයේ නැඟලා යනවා කියලා. ඇත්තටම එතැන සිද්ධවෙලා තිබෙන්නේ මේකයි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ - CPC එකේ - සිටින දෛනික වැටුප් ලබන සේවකයින් එහි සාමාන්‍යාධිකාරිවරයා සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත වෙලා තිබුණා. ඒ සාකච්ඡාව සඳහා එම සේවක පිරිස කොළොන්නාවේ ඉඳලා දෙමටගොඩ දක්වා අදාළ වාහනයෙන් ඇවිල්ලා තිබෙනවා. ගම්මන්පිල මහතා බලශක්ති විෂයය භාර ඇමතිවරයා හැටියට සිටි කාලයේ බඳවා ගත් පිරිසක් තමයි ඒ ආවේ. ඔවුන් දෛනික වැටුප් ලබන අය. එම සේවකයින්ට ගැටලු ගණනාවක් තිබුණා. ඒ ගැටලු නිරාකරණය කිරීමේ සාකච්ඡාවකට ආපු එක ගැන තමයි දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා සඳහන් කළේ. එතුමා මේ වෙලාවේ සභාවේ නැති එක ගැන මට කනගාටුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරනවා.

ඒ සාකච්ඡාවට යෑම තමයි උද්ඝෝෂණයකට පහර දීමක් හැටියට හුවා දක්වමින් ඒ මන්ත්‍රීතුමා කථා කළේ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව හැටියට අපි විපක්ෂයේ හෝ වෙනත් ඕනෑම කණ්ඩායමක හඬට කන් දෙන්න කැමැතියි. උද්ඝෝෂණ සහ අදහස් ප්‍රකාශ කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදීව ඇති අයිතියට කිසිම විධියකින් අපි බාධා කරන්නේ නැහැ. නමුත්, ඔය වාගේ තිබෙන කෙඳිරි ගෑම් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට බාධාවක් හෝ බලපෑමක් නොවන බවත් මම සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත සංශෝධනය කිරීමෙන් අපි බලාපොරොත්තු වෙන්නේ වර්තමානයේදීත්, අනාගතයේදීත් බලශක්ති ක්ෂේත්‍රයේ ඇති වන පරිවර්තනීය වෙනස්කම් සඳහා අවශ්‍ය වන අවකාශය සැලසීමයි. මෙම සංශෝධන පනතට සහයෝගය ලබා දීමෙන් ඒ සඳහා එකතු වන්න කියලා ආරාධනා කරමින් මම නිහඬ වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.29]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කිරීම කෙසේ වෙතත් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නම් ආණ්ඩුව පැත්තෙන් දීර්ඝව අදහස් ඉදිරිපත් කළා. පසුගිය ආණ්ඩුවෙන් ගෙනාපු ශ්‍රී ලංකා විදුලිබල පනත සම්බන්ධව මැතිවරණය වෙලාවේදී කිව්වේ, බලයට ආවාම ඒක විසි කර දමනවාය කියායි. හැබැයි, බලයට ආවාට පස්සේ, ඒක විසි කර දමන්න බැහැ කියලා තේරුණාම ඒකටත් නැති, මේකටත් නැති මැද තැනකට ඇවිල්ලා තිබෙනවා. "ආයතන 12, 5ක් කරනවා; ආයතන 12ක් හදන එක අපි 5කට ගෙනාවා, අපි ඒකාධිකාරිය කැඩුවා, පෞද්ගලික අංශයට දෙන්නේ නැහැ, ඒ නිසා ආණ්ඩුවේ සමාගමක් හැදුවා, ඒ සමාගමේ ඕනෑ කෙනෙකුට ආයෝජනය කරන්න පුළුවන්" කියලා කියනවා. එතකොට පෞද්ගලික අංශයට දෙන්නේ නැහැ නේ, ආණ්ඩුවේ සමාගමක්. හැබැයි, ඒ සමාගමට ආයෝජනය කරන්න පුළුවන්. ඉතින්, මේ එකම දේ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා පසුගිය ආණ්ඩුව ගෙනාපු පනතට විරුද්ධ වෙලා, බලයට ආපු ගමන් ඒ පනත විසි කර දමනවා කිව්වා. බලයට ආවා. හැබැයි, බලයට ආවාට පස්සේ ඒක විසි කර ගන්න බැහැ කියලා තේරුණා. ඒ නිසා දැන් දෙකටම නැති මැද තැනකට ඇවිල්ලා.

අද විෂය භාර අමාත්‍යවරයා කථාව පටන් ගත්තේම අවුරුදු 40ක් විදුලිබල ක්ෂේත්‍රය කෑවා කියලා. ඔව්. ඒ, තමුන්නාන්සේලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ට්‍රාන්ස්ෆෝමරය ගිනි තබපු තැන ඉඳන් 2005 අවුරුද්ද වනකොටත් මේ රටේ විදුලිබල ක්ෂේත්‍රයට ලංකාව පුරා විදුලිය ලබා දෙන්න හැකියාවක් තිබුණේ නැහැ. 2005 - 2015 කාල සීමාවේදී තමයි විදුලිය උත්පාදනයේ ඉඳන් විදුලි බලය ලබා දීම සැලසුම් සහගතව ක්‍රියාත්මක වුණේ. හැබැයි, 2015 අවුරුද්දේ ඉඳන් අද වන කල් එක ව්‍යාපෘතියක්වත් මේ රටේ ක්‍රියාත්මක වුණේ නැහැ. එදා උමා ඔය ව්‍යාපෘතිය හදනකොට තමුන්නාන්සේලා කිව්වා, එහි හිලක් තිබෙනවා කියලා. එහෙම නේද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතකයි නේ. අපි එක ගමේ නේ. උමා ඔයේ හිලක් තිබෙනවාය කිව්වා. එහෙම කියලා, ඒ ව්‍යාපෘතියට විරුද්ධ වුණා. උද්ඝෝෂණ කළා. ඊළඟට, සාම්පූර් බලාගාරය හදනකොට මොකක්ද කළේ? තමුන්නාන්සේලා උසාවි ගියා. ඉන් පසුව යහ පාලන ආණ්ඩුව පත් වුණා. යහ පාලන ආණ්ඩුව එක්ක deal එක දා ගත්තා. ව්‍යාපෘතිය නැවැත්වුවා. හැබැයි, අපි 2005 - 2015 කාල සීමාව තුළ ලංකාවේ ගෙවල්වලින් සියයට සියයකට විදුලි බලය ලබා දුන්නා විතරක් නොවෙයි, විදුලි බිල අඩු කරන්නත් අපට හැකියාව ලැබුණා. එවකට ලෝකයේ අඩුම පිරිවැයකින් අපි විදුලිය නිෂ්පාදනය කළා. ඒ කාල සීමාවට අනුව ලෝකයේ අඩුම පිරිවැයකින් විදුලිය නිෂ්පාදනය කරන්න පුළුවන් තැනට අපේ විදුලිබල ක්ෂේත්‍රය පරිවර්තනය කළා. සාම්පූර් බලාගාරය ඇති වුණේ එහෙමයි. අදටත් සාම්පූර් බලාගාරයෙන් රටේ විදුලි අවශ්‍යතාවෙන් සියයට 33ක විදුලිය උත්පාදනයක් කරනවා. *[බාධා කිරීමක්]* සමාවෙන්න, නොරොච්චෝලේ බලාගාරය. එදා ඔබතුමන්ලා ඒකට විරුද්ධ වුණා. හැබැයි, නොරොච්චෝලේ බලාගාරය ආරම්භ වුණා විතරක් නොවෙයි, එම බලාගාරය ආරම්භ කළාට පසුව විදුලි බිලත් සියයට 25කින් අඩු කරන්න එදා ආණ්ඩුවට හැකියාව ලැබුණා. විදුලි බිල අඩු කළා කියලා ලංකා විදුලිබල මණ්ඩලය පාඩු ලැබුවේ නැහැ. 2015 අවුරුද්ද වන කල් ලංකා විදුලිබල මණ්ඩලය ලාභ ලැබුවා. හැබැයි, 2015න් පස්සේ ඔබතුමන්ලා මොකක්ද කළේ? උමා ඔය ව්‍යාපෘතියට විරුද්ධ වුණා; ඒක නැවැත්වුවා. සාම්පූර් බලාගාරය හදනවාට විරුද්ධ වුණා; ඒක නැවැත්වුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, හම්බන්තොට LNG power plant ව්‍යාපෘතිය නැවැත්වූවා. අවසානයේ මේ රටේ විදුලිබල පද්ධතිය සම්පූර්ණයෙන් කඩාවට්ටලා, බලශක්ති සුරක්ෂිතතාවෙන් මේ රට ඈත් කරන්න තමුන්නාන්සේලා කටයුතු කළා. එහෙම කටයුතු කළ තමුන්නාන්සේලා අද කථා කරනවා, විදුලිබල පද්ධතිය තුළ යම් වර්ධනයක් කරන්න ඕනෑ, පෞද්ගලික ආයෝජන ගෙනෙන්න ඕනෑ, අරවා ගෙනෙන්න ඕනෑ, මේවා ගෙනෙන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට PUCSL එක ගැන කථා කළා. ඒක ස්වාධීන ආයතනයක්. නමුත්, ස්වාධීන ආයතනයක් මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් ගන්නවාය කියන්නේ, එතැනින් එහාට ඒකේ ස්වාධීනකම ගැන අහන්න දෙයක් නැහැ කියන එකයි. එක්කෝ, එය ස්වාධීන ආයතනයක් නොවෙයි කියලා කියන්න ඕනෑ. අනෙක් එක තමයි, PUCSL එකේ ඉංජිනේරුවරු ඉන්නවා. ඒ formula එක හදන්න දන්න අය එහි ඉන්නවා. නමුත්, මුදල් අමාත්‍යාංශයේ එහෙම අය නැහැ නේ. ඉතින්, ඔබතුමන්ලා කළ යුත්තේ මොකක්ද? මේ රටේ විදුලිබල පද්ධතියට අලුතෙන් විදුලි බලය එකතු කරන්න ඕනෑ. එසේ කරන්නේ නැතුව, ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ නැතුව අනෙක් හැම දේම කරනවා.

අනික් පැත්තෙන්, සේවකයෝ ගැන කථා කරනවා. සේවකයන් වැඩි නිසා විදුලිබල මණ්ඩලය පාඩු ලබනවාය කියනවා. නැහැ. සේවකයින් වැඩි වෙන්න පුළුවන්. හැබැයි, විදුලිබල මණ්ඩලය ලාභ ලබන තැනක් බවට පරිවර්තනය වෙලා තිබුණා. ඉතින්, ඔබතුමන්ලාට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගන්න බැරි වෙනකොට, අදටත් එදා සේවකයෝ වෙනුවෙන් පෙනී සිටි ඔබ, මොනවාද කරන්නේ? මොකද, කංචන හිටපු ඇමතිතුමා ඔය පනත ගෙනෙනකොට ඔබතුමන්ලා කිව්වා, ඔබතුමන්ලාගේ පක්ෂය බලයට ආපු ගමන් ඒක ගිනි තියනවා කියලා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගිනි තියන්නේ නැහැ, වෙනස් කළා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔව්, ඔව්, වෙනස් කළා. අපට පෙනෙනවා නේ වෙනස් කර තිබෙන විදිය. මේකේ ඇති වෙනසක් නැහැ, ඇමතිතුමා. ඕක කියවා බලන්න. පිට කවරයේ විතරයි වෙනස, පනතේ වෙනසක් නැහැ. අර ආයතන 12, ආයතන 5ක් දක්වා අඩු කරලා, තිබුණු ස්වාධීන ආයතනයටත් වැඩේ දීලා, ඒක මුදල් අමාත්‍යාංශයට අරගෙන තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම් කියන්නේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙක්. ස්වාධීනයි කියලා ආයෙත් ඕවා දෙස බලා වැඩක් වෙන්නේ නැහැ. මේ වැඩ පිළිවෙළ ඇතුළේ තමුන්නාන්සේලාට මේ රටේ ජනතාව මත පටවා ඇති මේ විදුලි බිල අඩු කරන්න සැලැස්මක් නැති බව පැහැදිලිවම පෙනෙනවා. මම ඔබතුමන්ලාගෙන් ප්‍රශ්නයක් අහනවා. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා මාස 10ක් ගත වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මේ ප්‍රශ්නය අහන්න මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අද වෙනකොට provisional approvals කීයක් දීලා තිබෙනවාද? පුනර්ජනනීය බලශක්තිය ගැන නේ කථා කරන්නේ. එක් සමාගමක් හැරිලා ගියා. තව සමාගමක් ටෙන්ඩර් දාලා ගත්තා. ඒ ටෙන්ඩර් දාලා ගත්ත සමාගම අද වෙනකොට කොතරම් දුරට තමන්ගේ ආයෝජනය මේ රටේ තහවුරු කර තිබෙනවාද? තහවුරු කර නැහැ, අද වෙනකොට. එක provisional approval එකක්වත් දීලා නැහැ. මොකක්ද, තව විදුලි උත්පාදනය කරන්න තිබෙන්නේ? තමුන්නාන්සේලාගෙන් අපි මේ කාරණය දැනගන්න කැමැතියි. මේක ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක්. ඒ පිළිබඳව ඔබතුමන්ලා කථා කළා. රිළවෙක් පැන්නාම විදුලිය කැපෙනවා. මේ තත්ත්වය නැති කරගන්න ඕනෑ. ඒ නිසා තමයි මම මේ කාරණය අහන්නේ. Provisional approvals දීලා නැහැ, තමුන්නාන්සේලා මේ මාස 10ට. අනික් පැත්තෙන් වසර ගණනාවක් තිස්සේ කණ්ඩායම් ඉන්නවා, ගරු ඇමතිතුමනි. ඔවුන් ටෙන්ඩරය දමනවා, වෙන කෙනෙකුට ගන්න බැරි වෙන්න අඩු මිලක් දමනවා, ටෙන්ඩරය ගන්නවා, හැබැයි project එක කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල මණ්ඩලය තමන්ගේ generation plan එකේ ඒක දාගෙන බලාගෙන ඉන්නවා. හැබැයි, ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොකද, ඒ අය හදන්නේ නැහැ. ඉතින්, මේ අයත් එක්ක තමුන්නාන්සේලා තවදුරටත් ඩීල් දානවාද එහෙම නැත්නම් ඒ සමාගම්වලට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරනවාද කියන ප්‍රශ්නයත් අපි අහනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තවශයෙන්ම බලශක්ති ක්ෂේත්‍රය තුළ වෙනසක් සිද්ධ විය යුතුයි කියන එක අපි විවාදයෙන් තොරව පිළිගන්න ඕනෑ කාරණයක්. මීට පෙර මේ උත්තරීතර සභාව ආමන්ත්‍රණය කරපු ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ උත්තරීතර සභාවට ඒත්තු ගන්වන්න උත්සාහ කළා, අපි මේ ඉදිරිපත් කරන සංශෝධනවලින් අප කලින් අය කරපු දේම කරන්න යනවා, පිට කවරය විතරයි වෙනස් වෙලා තිබෙන්නේ කියලා. එතුමාට මම කියන්න ඕනෑ, එතුමා ඇතුළු එතුමාගේ පවුලේ අය මේ රට පාලනය කරපු කාලය තුළ ඒ වෙනස්කම් සිද්ධ කරලා ඒ දේවල් කරන්න තිබුණාය කියන එක. හැබැයි, එහෙම දෙයක් සිදු වුණේ නැහැ. ඒ වාගේම, විදුලි බිල වැඩියි, ජනතාව පීඩා විඳිනවා, ට්‍රාන්ස්ෆෝමර් ගිනි තැබුවා කියන කාරණා මතු කළා. එතුමා දැන් මේ සභාවෙන් පිටව ගියා. එතුමා මේ සභාවේ හිටියා නම් මම එතුමාට ඒ ගැන පැහැදිලි කරනවා. මොකද, ඒ පාලනය තුළ මේ රටේ සමස්ත ජනතාවගේ ජන ජීවිතයම ගිනි තබා තිබෙන්නේ. විදුලි බිල මේ විදියට ඉහළ ගිහින් තිබෙන්නේ විදුලිබල ක්ෂේත්‍රය තුළ නිවැරදි ප්‍රතිසංස්කරණ මේ රටට හඳුන්වා දුන්නේ නැති නිසායි කියන එක මම මේ සභාවට ඒත්තු ගන්වන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු ගීතා හේරත් මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් විධියට අපි මේ ජන වරම ලබාගෙන බලයට ඇවිල්ලා, විදුලිබල ක්ෂේත්‍රයේ වෙනසක් කරන්න ඕනෑ කියන තැන ඉඳලා තමයි මේ ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කර තිබෙන්නේ. රටේ ආර්ථිකයට ගැළපෙන විධියට, අනෙක් අතින් සේවකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන ආකාරයට සහ පාරිභෝගිකයින්ට සහන සැලසෙන ආකාරයට තමයි අපි මේ ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කර තිබෙන්නේ. මේ ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලිය හරහා අපි බලාපොරොත්තු වෙන්නේ රටේ ආර්ථිකයට වාගේම විදුලි පාරිභෝගිකයින්ට දැනෙන වෙනසක් සිද්ධ කිරීමයි. ඉතිහාසය ගත්තොත්, 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත මඟින් ලංකා විදුලිබල මණ්ඩලය පිහිටුවා තිබෙනවා. හැබැයි, මේ වනකොට අවුරුදු 50කට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ කාලය වෙද්දී ඒ පනත සාර්ථකයි. ඒ ප්‍රතිපාදන හොඳයි, ඒ කාලයට ගැළපෙන්න. හැබැයි, දැන් ඒවා යල් පැන ගිහින්. මේ කඩා වට්ටා තිබෙන ආර්ථිකය ගොඩගන්න, අධික පිරිවැයක් දරන එක නවත්වන්න, ජනතාවට විදුලි බිල අඩු කරන්න වාගේ දේවල් කරන්න නම් අපි වෙනසකට යන්න ඕනෑ.

ඒ සඳහා තමයි අපි මේ සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ. එතැනදී මේ බලශක්ති ක්ෂේත්‍රයේ පරිවර්තනයක් අවශ්‍යයි කියන තැන ආණ්ඩුවක් විධියට අපි ඉන්නවා. අපි වෙනත් රටවල් එක්ක ගත්තාම සිංගප්පූරුව, තායිලන්තය, මලයාසියාව, පිලිපීනය වාගේ රටවල් මේ ප්‍රතිව්‍යුහගතකරණය තුළින් ඉදිරියට ගිහින් තිබෙනවා. ඒ නිසා, අපිට මේක හොඳ නැහැ කියලා කියන්න බැහැ. 2024 අංක 36 දරන විදුලිබල පනත ගෙනැල්ලා තිබුණා. හැබැයි, ඒ පනත ක්‍රියාත්මක වුණා නම් එතැනදී පෞද්ගලීකරණයක් තමයි සිදු වෙන්නේ. එතැනදී විදුලිබල මණ්ඩලයේ කටයුතු සමාගම් 12කට බෙදිලා යන විධියට තමයි තිබුණේ. එහිදී පෞද්ගලීකරණය වීමක් වෙන්නේ. හැබැයි, අපි ඉදිරිපත් කර තිබෙන සංශෝධනය තුළින් මේ බලතල සමාගම් හතරකට බෙදිලා යනවා. ඒ බෙදිලා යන්නේ කොහොමද කියනවා නම් ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ පද්ධති පාලනය - generation, transmission, distribution and system control - කියන ඒවාට තමයි බෙදිලා යන්නේ. හැබැයි, අයිතිය රජය සතු කර ගන්නවා. එතකොට මෙතැනදී කිසිසේත්ම පෞද්ගලීකරණය කිරීමක් සිදු වෙන්නේ නැහැ. හැබැයි, 2024 පනතෙන් පෞද්ගලීකරණයට ගිය අවස්ථාව අපි මේ සංශෝධන තුළින් මඟ හැරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විපක්ෂයේ කලින් කරුණු දක්වපු ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා සඳහන් කළා, 2001 වෙනකොට ඒ අය මේ විදුලිබල පනත සංශෝධනය කරමින් කෙටුම්පත් ගෙනාවා කියලා. ඉතින් මම කියන්න ඕනෑ මේ වෙනකොට අවුරුදු 25ක පමණ කාලයක් ගත වෙලා තිබෙනවා කියන එක. එතුමන්ලාට ඕනෑ නම් ඒ කාලවලදී ඒ දේවල් ක්‍රියාත්මක කර ගන්න තිබුණා. හැබැයි, ක්‍රියාත්මක කර ගන්න බැරි වුණු, අවුරුදු 25කට කලින් හදාගෙන හිටපු පනත් කෙටුම්පතක් ගැන එතුමා දැන් කථා කරනවා. අපි දැන් කථා කරන්න ඕනෑ වඩා හොඳ ප්‍රතිව්‍යුහගතකරණයකට ගිහිල්ලා අපේ ආණ්ඩුවෙන් මේ ඉදිරිපත් කරන දේ අඩු පාඩු තිබෙනවාද, නැද්ද කියන එකයි. ඒ ගැන තමයි විවාදයට ගන්න ඕනෑ. ඉතින් එතුමාට අද මේ ඉදිරිපත් කරන සංශෝධනවල වැරැද්දක් කියා ගන්න බැරි නිසා, අපි මේ සංශෝධන කරන නිසා හිතේ අමාරුවට වෙන්න ඇති, 2001දී එතුමන්ලා සකස් කරපු ලියවිල්ලක් ගැන මේ ගරු සභාවට කියන්න ඇත්තේ කියලා මම හිතනවා.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පතේ පරමාර්ථ ගත්තොත්, ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ කොටසක් විධියට ජාතික විදුලිබල පද්ධතියක් සකස් කිරීම සඳහා මෙහි විධිවිධාන සලස්වා තිබෙනවා කියන එක මම මේ උත්තරීතර සභාවට කියන්න කැමැතියි. ඒ වාගේම සියලු පාරිභෝගිකයින් සඳහා තරගකාරී හා කාර්යක්ෂම විදුලිබල සැපයුමක් ලබා දීම සඳහා විවිධ වර්ගයේ විදුලිබල වෙළෙඳ පොළවල් හඳුන්වා දීම සිදු කරනවා. ඒක හොඳ තත්ත්වයක් කියලා මම කියන්න කැමැතියි. ඒ වාගේම ජාතික විදුලිබල උපදේශක සභාව සඳහා වන විධිවිධාන අහෝසි කිරීමත් අඛණ්ඩ හා විශ්වසනීය විදුලිබල සැපයුමක් සහතික කිරීමත්, ඒ වාගේම විදුලිබල ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂමතාව, තරගකාරීත්වය හා විනිවිදභාවය ඉහළ නැංවීමටත් මේ තුළින් අපේක්ෂා කරනවා.

ඇත්තටම බලශක්ති පරිවර්තනයක් සිද්ධ කරද්දී, වර්තමාන ලෝකය තුළ රජයට විතරක් ඒ දේ කරන්න බැහැ. ඒ නිසා විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් අපිට අනිවාර්යයෙන්ම පෞද්ගලික අංශයේ ආයෝජන ගැනත් සලකා බලන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ ප්‍රතිව්‍යුහගත කිරීම හරහා කුමන දේ සිදු කළත් අවසානයේ මේ වෙනස දැනෙන්නේ පාරිභෝගිකයන්ටයි. පාරිභෝගිකයින්ට ඒ වෙනස සිදු වෙන්නේ බෙදා හැරීම් අංශය හරහායි. එතැනදීත් අපි බෙදා හැරීමේ අංශය මීට වඩා සුමට, සුහුරු පද්ධතියක් බවට පත් කිරීම සඳහා අනිවාර්යයෙන්ම පෞද්ගලික අංශයේ ආයෝජන වෙත යෑමට කටයුතු කරලා තිබෙනවා. මම මතක් කරන්න ඕනෑ, අපි හඳුනා ගෙන තිබෙන ගැටලුවලින් එකක් තමයි අධික විදුලි පිරිවැය. විදුලි බිල අඩු කරන්නේ නැද්ද කියන කාරණය දැන් මතු කළා. ඊට කලින් අපි මේ විදුලි පිරිවැය අඩු කර ගන්න ඕනෑ. අධික විදුලි පිරිවැය ඒ වාගේම ආනයනික පොසිල ඉන්ධන මත අධිකව යැපීම, නව විදුලි උත්පාදන බලාගාර විදුලිබල පද්ධතිය වෙත එක් කිරීම, ඒ වාගේම අකාර්යක්ෂමතාව මඟ හරවා ගැනීම යනාදී කරුණු වෙනුවෙන් අපිට මේ ප්‍රතිව්‍යුහගත කිරීම අනිවාර්යයෙන් කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා මම මුලින්ම කිව්වා වාගේ සමාගම් 4කට බලය පැවරීමක් සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, මේ සම්බන්ධව සමාජය තුළ කථා බහට ලක් වෙන කාරණයක් ගැනත්. ඒ තමයි මේ සංශෝධනයෙන් එහි ඉන්න සේවකයින්ට මොකක්ද වෙන්නේ කියන කාරණය. සේවකයින් 23,000ක් පමණ සිටිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ඍජුවම බලපාන පාර්ශ්වය වන ඒ සේවකයින්ගේ අයිතිවාසිකම් අපි ආණ්ඩුවක් විධියට සුරක්ෂිත කරනවා. එතැනදී කිසිම සේවකයෙකුට රැකියාව අහිමිවීමක් සිද්ධ වන්නේ නැහැ. ඒ වාගේම විශ්‍රාම වැටුප් අරමුදල හා අර්ථසාධක අරමුදල සම්බන්ධ කටයුතු වෙනමම සමාගමකට පවරනවා. මේ තුළ සිටි සහ දැනට සිටින - විශ්‍රාම ගිය අයගේ වෙන්න පුළුවන්, දැනට සේවයේ යෙදෙන අයගේ වෙන්න පුළුවන් - සියලුම සේවකයන්ගේ විශ්‍රාම වැටුප් අරමුදල්, අර්ථසාධක අරමුදල් අපි සහතික කරනවා. ඔවුන්ට ලැබෙන කිසිදු දීමනාවක්, ප්‍රතිපාදනයක්, ප්‍රතිලාභයක් අහිමි වෙන්නේ නැහැ. රැකියාව අහිමිවීමක් සිද්ධ වෙන්නේ නැහැ. අනුයුක්තවීමක් සිද්ධ වෙනවා. එතැනදීත් සේවකයන්ගේ කැමැත්ත අනුවයි එය සිද්ධ කරන්නේ. ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමටත් හැකියාව තිබෙනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, ජනතා හිතවාදී ආණ්ඩුවක් විධියට සේවකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරනවා වාගේම බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා ප්‍රගතිශීලී සංශෝධනයක් තමයි අපි ඉදිරිපත් කර තිබෙන්නේ කියන එක. ඒ ගැන සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට මිනිත්තු 8ක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு அரவிந்த செனரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. ARAVINDA SENARATH left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 2.45]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල ක්ෂේත්‍රය ගැන කථා කරනකොට මම කියන්න කැමැතියි, අපේ රට විදුලිය ලබා දීම පැත්තෙන් - electrification පැත්තෙන් - අද දකුණු ආසියාවේ ඉදිරියෙන්ම සිටින රටක් බව. මම දකිනවා, එහි ඓතිහාසික සන්ධිස්ථාන දෙකක්. එකක් තමයි, මෙගාවොට් 1,200කට වැඩි ප්‍රමාණයක් ජාතික විදුලිබල පද්ධතියට ජල විදුලියෙන් එකතු කළ ජයවර්ධන යුගය. ඒක තමයි පළමුවැනි පෙරළිය මේ විදුලිබල ක්ෂේත්‍රය තුළ සිදු වුණු. අනෙක් එක තමයි, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ නොරොච්චෝලේ බලාගාරය හදන්න කටයුතු කිරීම. මේ රටේ සිදු වුණු දෙවැනි පෙරළිය ඒකයි. ඒ වාගේම අපිට මේ ක්ෂේත්‍රය තුළ අභිමිවීම් තිබෙනවා. අපිට මේ විදුලිබල ක්ෂේත්‍රයට ගන්න තිබුණු තවත් දැවැන්ත පියවරයන් අහිමි වුණු අවස්ථා දෙකක් තිබෙනවා. එයින් පළමුවෙනි එක තමයි, සාම්පූර් ගල් අඟුරු බලාගාරය නොහැදීම. දෙවැනි එක තමයි, LNG supply එක සඳහා New Fortress Energy සමාගම සමඟ ගිවිසුම්ගත වෙලා එම කටයුතු ඉස්සරහට කරගෙන යන්න නොලැබීම.

මේ පනත් කෙටුම්පත ගැන කථා කරන අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි, FSRU - Floating Storage Regasification Unit- එකක් හදන්න 2020දී කැඳවීම් කළ බව. ඒ අවස්ථාවේදී China Harbour Engineering Company සහ Engro Corporation කියන කොම්පැනි Joint Venture - JV - එකක් විධියට ඉදිරිපත් කළා, ඔවුන්ගේ අභිලාෂ. එම Joint Venture - JV - එකේ technical qualifications fulfil කළේ Engro Corporation කියන කොම්පැනිය. ඔවුන් තමයි FSRU එකට අවශ්‍ය, එහෙම නැත්නම් LNG supply එකට අවශ්‍ය තාක්ෂණික දැනුම තිබුණු කොම්පැනිය. අද මේ ආණ්ඩුව මේ සමාගමට මේ අවස්ථාව දෙන්න හැදුවත්, Engro Corporation කියන කොම්පැනිය - මම හිතන විධියට ඒක පාකිස්තාන සමාගමක් - එම JV එකෙන් ඉවත් වෙලා තිබෙනවා. එසේ ඉවත් වීම හරහා මොවුන්ගේ qualifications අද ඉවත් වෙලා තිබෙනවා. මොකද, එම JV එකේ technical qualifications තිබුණු සමාගම තමයි එසේ ඉවත් වෙලා තිබෙන්නේ.

මෙහි තිබෙන බරපතළම කාරණය මේකයි. මුලින් මේකට LTL Holdings සහ ඇමෙරිකානු සමාගමකුත් bid කළා. හැබැයි, ඒගොල්ලන් ඒ වෙලාවේ ස්ථානය මාරු කිරීමට ඉල්ලීමක් කළා. මොකද, මේක මුහුදේ පාවෙන - floating - unit එකක්. මේ unit එකේ ස්ථානය මාරු කරන්න ඕනෑය කියා ඒ වෙලාවේ ඒගොල්ලන් තාක්ෂණිකව ඉල්ලීම් කළා, ඒ සමහර නැව් මීටර් 15කට එහා ආරක්ෂිත තැනක berth කරන්න ඕනෑ නිසා. හැබැයි, ඒගොල්ලන්ට ඒ අවස්ථාව දෙන්නේ නැතුව disqualify කරලා, අද වෙනකොට China Harbour Engineering Company එකට ඒ අවස්ථාව ලබා දීලා ස්ථානය වෙනස් කිරීමේ අවස්ථාවත් ඔවුන්ටම දීලා තිබෙනවා. එතකොට මේක කාගේ වුවමනාවක්ද?

ඒ විතරක් නොවෙයි, මේ FSR Unit එක ඩොලර් මිලියන 250කට මිලදී ගන්න පුළුවන්. එසේ ඩොලර් මිලියන 250කට මිලදී ගත හැකි මේ FSR Unit එකට China Harbour Engineering Company එක ලංසුව ඉදිරිපත් කර තිබෙන්නේ අවුරුදු 10කට lease කරන්න. එතකොට ඒ අවුරුදු 10ට අපිට වැය වෙනවා, US Dollars 1 billion; ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක් එතකොට ඒකට වියදම් වෙනවා. එකවරම ඇමෙරිකානු ඩොලර් මිලියන 250කට ගන්න පුළුවන් එක අවුරුදු 10ක lease එකට අරගෙන, අන්තිමට ඒකත් ඒගොල්ලෝ ආපහු අරගෙන යනවා. කාටද මේ ගනුදෙනුවේ වුවමනාව තිබෙන්නේ? මෙහි බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ ගැන ඔබතුමා දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ කියා මම හිතනවා. ඒ තොරතුරු සහිත list එක ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **table*** කරනවා.

මේ කාරණා අනුව අපට බරපතළ සැකයක් තිබෙනවා, මේක දූෂිත ගනුදෙනුවක් කියලා. එදා New Fortress Energy සමාගම එද්දී ඔබතුමන්ලා විරුද්ධ වුණා. මේ කාරණය කෙරෙහි මම ඔබතුමන්ලාගේ අවධානය යළිත් යොමු කරවනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට විනාඩි 8ක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, විපක්ෂයට නියමිත කාලය අඩු වෙලා තිබෙන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකතුනක් දෙන්න.

ගරු ඇමතිතුමනි, ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා පසුගිය කාලයේ LTL Holdings එකේ IPO එක නැවැත්වූවා. ඒක අපේ රටේ දැවැන්ත IPO එක, public සඳහා කොටස් නිකුතුව. ඔබතුමන්ලා ඒක නැවැත්වූවා. ඒක නැවැත්වූයේ ඇයි? ඒ IPO එකට Ceylon Petroleum Corporation එකේ රුපියල් බිලියන 8.5ක් දමන්න ඔබතුමන්ලා තීන්දු කළා. ඔබතුමන්ලා ආයෝජකයන්ට එන්න කියනවා. ආයෝජකයන් එයිද, ඔබතුමන්ලා මේවාට මේ විධියට මැදිහත්වීම් කරද්දී? අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ ඔබතුමන්ලා ගත්තු වැරැදි තීන්දු තීරණ නිසා.

ඒ වාගේම අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ reform එක ඇතුළේ කවුද ඉන්නේ? පුබුදු නිරෝෂන් මහත්මයා තමයි ඉන්නේ. අපට පෙනෙනවා, ඔහු CEB එකේ සභාපති වෙන්න හදනවා කියලා. ඒ වාගේම ඔහු transmission company එකේත් සභාපති වෙන්න හදනවා කියලාත් සැකයක් තිබෙනවා. LTL Holdings එකේත් සභාපති වෙන්න හදනවා. ඔහු ඒ හැම එකේම සභාපති වෙන්න හදනවා. පුබුදු නිරෝෂන් මහත්මයා තරුණ ඉංජිනේරු මහත්මයෙක්; සමාගම් කිහිපයක වැඩ කරලා තිබෙනවා. හැබැයි, එහෙම නොවෙයි, මේ වාගේ reform එකක් කරන්න මීට වඩා පුළුල් කණ්ඩායමකට භාර දෙන්න ඕනෑ. ගරු ඇමතිතුමාට මම එදාත් මේ කාරණය කිව්වා. අපට බොහොම පැහැදිලිව පෙනෙනවා, තනි පුද්ගලයෙකුට මෙහි වගකීම භාර දීලා මේ කරන reform එක හරහා ඉදිරියේදී ලංකා විදුලිබල මණ්ඩලයට දැවැන්ත තර්ජනයක්, අපේ රටේ ආරක්ෂාවට දැවැන්ත තර්ජනයක්, අපේ විදුලි පාරිභෝගිකයාට දැවැන්ත තර්ජනයක් ඇති වෙනවා කියලා. මොකද, තනි පුද්ගලයෙකුටයි මේ reform එක භාර දීලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා අද ඔබතුමන්ලාගේ ජන වරමට යටත්ව නොවෙයි කටයුතු කරන්නේ. ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ ජන වරමෙන් පිට වැඩ කරන්නේ. එදා ලංකා විදුලිබල මණ්ඩලය ගැන කථා කරපු රන්ජන් ජයලාල් මහත්මයා, අද කඩුවෙල මහනගර සභාවට කොටු කරලා. ලංකා විදුලිබල මණ්ඩලය රැක ගන්නවත්, විදුලිබල මණ්ඩලය ගැන කථා කරන්නවත් අද රන්ජන් ජයලාල් මහත්මයා නැහැ. එතුමා කඩුවෙල මහනගර සභාවේ කුණු අදිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව විනාඩියකින් කථාව අවසන් කරනවා.

මට මතකයි, අපි 2015දී ලංකා විදුලිබල මණ්ඩලයේ කොන්ත්‍රාත් සේවකයන් 6,000ක් ස්ථිර කළා. ඒකට මූලික වුණේ මම. හැබැයි, අන්තිමට ඒගොල්ලෝ පිටුපසින් ඉඳන් form එකක් පුරවාගෙන ඒ අය ඒගොල්ලන්ගේ වෘත්තීය සමිතියට බඳවා ගත්තා. ඒ විතරක් නොවෙයි. ගරු ඇමතිතුමනි, මම තවත් කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ලංකා විදුලිබල මණ්ඩලයේ ඉන්නවා ඌන උපයෝජිත ඉංජිනේරුවන්. අපේ විදුලි අධිකාරිවරු -සුදුසුකම් සම්පූර්ණ කරලා තිබෙන අය- 167දෙනෙක් ඉන්නවා. ඒ අය මේ විදුලි ක්ෂේත්‍රයේ, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු අංශයේ පුරප්පාඩු සඳහා බඳවාගන්න කටයුතු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. ලංකා විදුලිබල මණ්ඩලය ගැන කථා කරලා, කිඹුල් කඳුළු හෙළලා බලයට ආපු අය, අද විදුලිබල මණ්ඩලය විතරක් නොව, අපේ විදුලි පාරිභෝගික ජනතාවගේත් අවසන් පස් පිඩැල්ල කපලා, ජනතාව විනාශ කරමින්, ජනතාව මරණයට පත් කරමින්, ජනතාව විතරක් නොව, මේ රටේ ආර්ථිකය ද මරණයට පත් කරමින් තිබෙනවා. අපට ඇමෙරිකාවෙන් ලැබුණා, සියයට 20ක tariff එකක්. හැබැයි, අද බංග්ලාදේශයත් එක්ක, වියට්නාමයත් එක්ක compete කරද්දී, මේ වාගේ විදුලි බිලක් තිබියදී තරගකාරිත්වයක් දෙන්න අපට හැකියාවක් නැහැ. එහෙම නම්, ඇමෙරිකාවේ සියයට 20ක tariff එක දිහා අපි බලන්න ඕනෑ අපේ විදුලි බිල කියන කාරණයත් එක්කයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.52]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ බලශක්තිය පිළිබඳව තිබෙන ප්‍රතිපත්තියට අදාළව, "සුරක්ෂිත බලශක්ති කේන්ද්‍රයක් - තිරසර විනිමය ප්‍රභවයක්" යන තේමාව යටතේ අපේ රටේ බලශක්තිය භාවිත කිරීමේ ක්‍රමවේදය ධනාත්මක දිශානතියකට පරිවර්තනය කිරීම සඳහා යන ගමනේදී, ඊට අදාළව කටයුතු කිරීම හා සම්බන්ධිත 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත විවාදයට ගන්නා මේ මොහොතේ අපි දන්නවා, බලශක්තිය කියන්නේ අපේ රටේ ජාතික ආර්ථිකය සහ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළු සමස්තය සඳහා ඉතා වැදගත්කමකින් යුක්ත වන උපාය මාර්ගිකව වැදගත්කමක් උසුලන ක්ෂේත්‍රයක් බව.

අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රය ගත්තාම, විදුලි බලය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම ඇතුළුව විදුලිබල ක්ෂේත්‍රයට අදාළ සමස්ත ක්‍රියාවලිය මේ තාක් විවාදයට භාජන කරන ලද 2024 අංක 36 දරන පනතට අනුව කොටස් 12කට බෙදලා, අනුසමාගම් 12කට වෙන් කරලා සමාගම් 12ක් යටතේ කටයුතු කරන්න තමයි නියමිතව තිබුණේ. ඒ සමාගම් 12න් සියයට සියයක් රජයේ අයිතිය යටතේ තිබෙන්නේ සමාගම් තුනක් විතරයි. සෙසු සමාගම් සියල්ල පෞද්ගලික අංශයට නිරාවරණය වන සමාගම් විධියට තමයි තිබුණේ. දැන් අපි මොකක්ද කළේ? අප මේ පනතට ගෙනාපු සංශෝධනය අනුව එම සමස්ත

ක්‍රියාවලිය විදුලිය උත්පාදනය -ජනනය-, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ පද්ධති පාලනය, සේවකයන් සම්බන්ධව කටයුතු කිරීම, EPF සහ pension සම්බන්ධව කටයුතු කිරීම යනාදි වශයෙන් සමාගම් 5ක් යටතේ වර්ගීකරණය කරලා තිබෙනවා. අපි සියලු දෙනා ප්‍රකාශ කළා, මේ සමාගම් සියල්ලේම අයිතිකාරිත්වය සියයට සියයක් රජයට හිමි වෙනවා කියලා. මෙහිදී විපක්ෂය මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපට කියනවා, "2024 කංචන ගෙන ආ පනතට අපි එකඟයි. හැබැයි, මේ කියන පනත් සංශෝධනයට අපි විරුද්ධයි" කියලා. 2024දී කරන්න ගියේ මොකක්ද? විදුලිබල ක්ෂේත්‍රයට අදාළ සමස්ත ක්‍රියාවලිය කොටස් 12කට කඩලා සමාගම් 12කට වෙන් කරලා ඒවායෙන් සමාගම් තුනක් විතරක් රජය යටතේ තියලා ඉතිරි 9 ම පෞද්ගලීකරණය කරන්න හෝ ඒ සඳහා ඉඩ කඩ විවර කරන්නයි නියමිතව තිබුණේ. දැන් අපි මේ සංශෝධනයෙන් මොකක්ද කරන්නේ? උපාය මාර්ගිකව වැදගත්කමක් තිබෙන ක්ෂේත්‍රයක් විධියට බලශක්ති ක්ෂේත්‍රය හඳුනාගෙන අපි ඒ සමාගම් පහේම අයිතිය සියයට 100ක් රජය යටතේ තබාගෙන තිබෙනවා. නමුත්, ඒකට විරුද්ධයි, කංචනගේ එක හොඳයි කියලා කියනවා. අපට තේරෙන්නේ නැහැ, ඇයි එහෙම කියන්නේ කියලා.

ඒ විතරක් නොවෙයි, විදුලිබල මණ්ඩලයේ සේවකයන් සම්බන්ධව ගත්තාම, ඒ සේවකයන් 23,000න් සැලකිය යුතු සේවකයන් සංඛ්‍යාවක් ඉවත් කරන්නයි නියමිතව තිබුණේ. හැබැයි, අපි මොකක්ද කිව්වේ? එක සේවකයෙකුවත් ඉවත් කරන්නේ නැතිව ඒ සේවකයන් අද දවසේ භුක්ති විඳින කොන්දේසි, වරප්‍රසාද, වැටුප් ආදි සියල්ල මේ තිබෙන මට්ටමේ හෝ ඊටත් වඩා ඉහළ මට්ටමක තියලා ඒ සේවකයන්ගේ වෘත්තීමයභාවය සුරක්ෂිත කරනවා කියලාත් අපි ප්‍රකාශ කර තිබෙනවා. එහෙම ප්‍රකාශ කර තිබියදීත් අප මේ ගෙනෙන පනත් කෙටුම්පතට එකඟ නොවෙනවා නම්, ඒ එකඟ නොවන්නේ වෙන කිසිවක් නිසා නොව, මේ පනත් කෙටුම්පත නිසා ඉදිරියේදී විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයේ සුරක්ෂිතභාවයක් ඇති වෙයි, එහෙම වුණොත් ඒක ආර්ථික සුරක්ෂිතභාවයට බලපානවා, එහෙම වුණොත් එය විපක්ෂයේ දේශපාලන සුරක්ෂිතභාවයට හානියක් වෙන්න පුළුවන් කියා හිතන නිසායි. ඒ හින්දා තමයි විරෝධය මතු කරන්නේ. අපි ඒ ගැන කනගාටු වෙනවා.

විපක්ෂය PUCSL එක සම්බන්ධ කාරණාවත් දිගින් දිගටම මතු කළා. අපේ පැත්තෙන් ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම කියනවා, මේකේ "in consultation" කියන වචන තිබෙනවා කියලා. PUCSL එක සම්බන්ධව සඳහන්ව තිබෙන කාරණාවේදී "in consultation" කියන වචන තිබෙනවා. අපි දන්නවා, මහජන උපයෝගිතා කොමිෂන් සභාව වග කියන්නේ විදුලිය සම්බන්ධයෙන් විතරක් නොවෙයි කියලා. ඒ කොමිෂන් සභාව විදුලිය, ජලය, පෙට්‍රෝලියම් යනාදි විවිධ ක්ෂේත්‍ර සඳහා වගකිව යුතු ආයතනයක් විධියට කටයුතු කරනවා. විදුලිබල ක්ෂේත්‍රය පමණක් ගත්තත්, විදුලිය ගාස්තුව අඩු කර ගැනීම පිළිබඳ තීරණය කිරීමට අමතරව විශාල කාර්ය භාරයක් PUCSL එකට පැවරිලා තිබෙනවා. ඒ අනුව විදුලි මිල තීරණය කිරීමේදී, අය ක්‍රමය තීරණය කිරීමේදී PUCSL එක පළාත් 9යේම ඉන්න ජනතාව ළඟට ගිහින් ජනතාවගෙන් අදහස් ගන්නවා; ජනතාවගෙන් තොරතුරු ගන්නවා. ඊට අමතරව, තොරතුරු ගත යුතු අනෙකුත් අයගෙන් තොරතුරු අරගෙන ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙන භාණ්ඩාගාරයෙන් තොරතුරු විමසීමක් කරනවා. ඒක approval එක ගැනීමක්, එහෙම නැත්නම් concurrence ගැනීමක් හෝ නොවෙයි. ඒ කිසිවක් නොවෙයි. එතැනදී සිද්ධ වන්නේ in consultation, එහෙම නැත්නම් විමසා බැලීමක්. ඒ සම්බන්ධව විමසීමක් කිරීම කිසිසේත්ම approval එකක් නොවෙයි. එම නිසා ඒ සම්බන්ධව කිසිදු ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මේ සම්බන්ධ කාරණාව ශ්‍රේෂ්ඨාධිකරණයේ අවස්ථා කිහිපයකදී challenge වුණා. ඒ හැම අවස්ථාවකදීම සඳහන් කරලා තිබෙන්නේ මොකක්ද? කිසිම ගැටලුවක් නැහැ, මහජන උපයෝගිතා කොමිෂන් සභාව සම්බන්ධ කාරණාවේදී අප ඉදිරිපත් කරන සංශෝධනය ව්‍යවස්ථාවට එකඟයි කියලා ප්‍රකාශ කරලා තිබෙනවා.

ඒත් එක්කම, විපක්ෂය තවත් කාරණාවක් සඳහන් කළා. ඒ තමයි, මේක පුබුදුගේ එකක්, බලශක්තිය වාගේ දෙයක් එක පුද්ගලයෙකුට දෙන එක වැරදියි කියන එක. ඒගොල්ලන්ගේ දේශපාලන සංස්කෘතිය අනුව, ඒගොල්ලන්ගේ දේශපාලන භාවිතාව අනුව, විපක්ෂයේ practice එක අනුව හිතනවා, මේකත් නිකම් one-man show එකක් වෙන්න ඇති කියලා.

ඉංජිනේරුවන්, වෘත්තිකයන්, ජනතාව, ප්‍රජාව - මේ සියලු දෙනා - සම්බන්ධ කරගෙන තමයි මේ පනතට අදාළ සංශෝධනය ගේන්නේ. විපක්ෂය බලයේ ඉද්දී, විපක්ෂය බලය හොබවද්දී ඒගොල්ලන්ට ඕනෑ විධියට one-man shows ගහලා තිබුණා, ඒගොල්ලන් heroesලා වෙලා තිබුණා. එක මන්ත්‍රීවරයෙක් කිව්වා අපේ විදුලිබල ඇමතිතුමාට hero වෙන්න තිබුණා කියලා; ප්‍රකාශයක් කළා නම් hero වෙන්න තිබුණා කිව්වා. ජාතික ජන බලවේගයේ අපි කාටවත් heroesලා වීමේ අවශ්‍යතාවක් ඇත්තේ නැහැ. Heroesලා වෙන්න හරි, එහෙම නැත්නම් one-man shows ගැහීමේ අවශ්‍යතාවක් අපට නැහැ. අපට තිබෙන්නේ අපේ බලශක්තිය උපාය මාර්ගික වැදගත්කමක් තිබෙන ක්ෂේත්‍රයක් විධියට නිවැරදිව හඳුනාගෙන, ඒ හඳුනා ගත්ත ක්ෂේත්‍රය ජාතික ආර්ථිකයට ධනාත්මකව ගොනු කිරීමේ අවශ්‍යතාවයි.

ඒත් එක්කම තව කාරණයක් කිව්වා. ඩීල් දේශපාලනයක් ගැන දැන් කථා කළා. ඒ කරුණු ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා කිව්වා ඩීල් දේශපාලනයක් තිබෙනවා, ඒක නිසා මේක සම්පූර්ණයෙන්ම ජාතික ආර්ථිකයත් එක්කම බරපතළ අර්බුදයකට යනවා කියලා. ක්‍රීඩා පිට්ටනියක් හැදුවත්, වරායක් හැදුවත්, එහෙම නැත්නම් ජාතික ආර්ථිකයට බලපාන mega projects ගෙනැල්ලා, ඒ mega projects ඇතුළේ ඩීල් දේශපාලනය ලංකාවට හඳුන්වා දීපු, ඒ ඩීල් දේශපාලනයට පීතෘත්වය දීපු, ආර්ථික වශයෙන් රට බංකොලොත් කරන්න නායකත්වය දීපු, ආර්ථික වශයෙන් රට බංකොලොත් කළ දේශපාලන ව්‍යාපාරයට නායකත්වය දීපු, 2029දී ජනාධිපති වීමේ සිහිනයෙන් පෙළෙන අය මොකක්ද කියන්නේ? ඩීල් දේශපාලනයක් මේකේ තිබෙනවා කියනවා. ඒ අයට තමන්ගේ practice එක ජානගත වෙලා, ලේවලට කාන්දුවෙලා තිබෙන්නේ. නමුත් රටේ මහජනතාවට අපි පොරොන්දුවක් දීලා තිබෙනවා බලශක්ති ක්ෂේත්‍රය විතරක් නොවෙයි, රටේ සමස්ත ක්ෂේත්‍ර නිවැරදිව හඳුනාගෙන, කළමනාකරණය කරලා ඒ ක්ෂේත්‍රවලට නිවැරදි දිශානතියකට මග පෙන්වනවා කියලා. ඒක නිසා අපට කියන්න තිබෙන්නේ අපි ඩීල් දේශපාලනයේ ඇත්තෙත් නැහැ, අපට one-man shows ගැසීමේ අවශ්‍යතාවකුත් නැහැ, herosලා වීමේ අවශ්‍යතාවකුත් නැහැ කියන එකයි. වග කිව යුතු ආණ්ඩුවක් විධියට අපි මේ රටේ මහ ජනතාවට වග කියන්න ඕනෑකම තිබෙනවා.

අපට කියන්න තිබෙන කාරණාව මේකයි. මේ ගෙනැල්ලා තිබෙන පනත් කෙටුම්පතට අදාළ සංශෝධන තුළින් මේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ තිරසරභාවය, නවෝත්පාදනය, කාර්යක්ෂමතාව, පාරදෘශ්‍යභාවය ඇති කරනවා. ඒ විතරක් නොවෙයි, විදුලි බලය සඳහා තරගකාරී වෙළෙඳ පොළක් නිර්මාණය කරලා ඒ වෙළෙඳ පොළ තුළ පිරිවැය අවම කරලා ජනතාවට අවම මිලකට විදුලිය ලබා දීම සඳහා අවශ්‍ය මැදිහත්වීම කරනවා. ඒක ලේසි වැඩක් නොවෙයි. උරුලෑවන් ගිය පාරක යන එක ලේසි නැහැ, ඒක ලේසි වැඩක් නොවෙයි. නමුත් අපි දන්නවා මේ පාර ශුද්ධ කරගෙන යන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

[ගරු රුවන් විජේවීර මහතා]

අවසාන වශයෙන් ජනතාවට කියන්න තිබෙන්නේ මේ පාර අපි නියත වශයෙන් ශුද්ධ කරනවා, මේ පාර නියත වශයෙන්ම clean කරලා ජනතාවගේ විදුලි බිල අඩු කරන්න, systematically විදුලි බිල අඩු කරන්න පුළුවන් ක්‍රමයකට අපි මේ රට ගෙනෙන බවයි. ඒ තාක් කල් ජනතාව අපිත් සමඟ අත්වැල් බැඳගෙන ඉන්න බව අපි දන්නවා.

ස්තුතියි, සියලුදෙනාටම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.01]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමාගේ කාලයත් ලබා ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද විවාදයට ගන්නා ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා ඇහුවාම මට තේරෙන දෙය තමයි, අන්ධයෙක්, නැත්නම් දෘශ්‍යාබාධිත කෙනෙක් අලියකුගේ කකුලක් අල්ලාගෙන "අලියා වංගෙඩිය වාගේයි" කියපු කථාව. ඒ වාගේ තමයි මේ පනත් කෙටුම්පත ගැන එතුමන්ලා කියන්නේ. මොකද, ආංශික අධීක්ෂණ කාරක සභාවේදී පුබුදු නිරෝෂන් මැතිතුමා ම කියලා තිබෙනවා අපි අවුරුදු දෙකකින් සමාගම් හැටියට කඩන්න තිබුණු එක දැන් අවුරුද්දකට ගෙනැල්ලා තිබෙනවා, අඩු කරගෙන තිබෙනවා කියලා. එහෙම කියලා තිබෙනවා කියලා ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා ම කිව්වා. එතකොට මන්ත්‍රීවරු එක දෙයක් කියනවා, ඒ අදාළ තැනැත්තා තව දෙයක් කියනවා. දැන් රන්ජන් ජයලාල්ලා නැහැ, මේවාට උද්ඝෝෂණය කරන්න. ඒගොල්ලන් වෙන වැඩක නිරත වෙලා ඉන්න අවධියේ මේ වාගේ ඉතාම වැදගත් කාර්යභාරයක් පිළිබඳව ආණ්ඩුවේ ක්‍රියාදාමය පිළිබඳව අපට විශාල සැක සංකා පහළ වෙනවා.

I must say, Hon. Presiding Member, that in the midst of the situation we are in, the very difficult recovery process from the devastating sovereign debt crisis that we are undergoing, we now face a very unprecedented existential threat. So, in this midst, it is important for us to consider legally unbundling the Ceylon Electricity Board, its core functions and push for a more competitive and transparent electricity market. It will enable attracting private capital and enhancing efficiency, which are critical to economic recovery and energy security. That would be considered a landmark step towards a more efficient and accountable energy future.

But, what are we trying to do now? We are trying to reverse the entire process started by the earlier Act presented by the previous Government. Now, we are trying to reconsolidate the CEB by placing generation, transmission and distribution under 100 per cent State control. That will inevitably entrench inefficiencies, deter private investment and further strain the already constrained public finances. That would be the end result, if we continue on this path.

The CEB's losses and infrastructure needs are fiscally unsustainable, all of us know that. Our ability to maintain the country's primary surplus and meet the International Monetary Fund commitments is well known. With that issue, we are going to further undermine the country's creditworthiness, limiting access to capital markets and affordable borrowing.

Then, take creating a range of investment opportunities, allowing private investors to engage in specific segments which align with their risk-return preferences. We should understand that unbundling has improved operational efficiency, transparency and service delivery, particularly when supported by competitive tendering and strong regulatory oversight. But, what are we doing now? We are even trying to cripple the existing regulatory framework and bring Finance Ministry's supervision over the regulator's functions.

Sir, now, I would like to read from an article in the "Daily FT" titled "Sri Lanka's Electricity Amendment Bill 2025: Trojan Horse for national economic collapse". This is what it states, I quote:

> "The National People's Power Government rose to power promising transparency, institutional reform and a green energy revolution. The President vowed to build an accountable electricity regime; the Energy Minister committed to regulator independence and market modernisation. Yet, the Electricity Amendment Bill 2025 delivers the opposite. It entrenches ministerial control, resurrects monopolies, enables corruption, and locks the nation into decades of coal dependence. Enacting this Bill will devastate donor confidence, repel investors, deepen energy poverty and reverse Sri Lanka's hard-earned progress."

So, that is what this particular article states. There are some details in it, but I do not want to go into those details.

Then, I will move on to some other issue which is now being discussed in the energy circles. That is regarding the 2025 tariff revision for Standard Power Purchasing Agreements governing projects up to 10 megawatts. Though this revision is presented as a routine, cost-reflective recalibration cloaked with references to the International Monetary Fund and its conditionality, the substance reveals a different story. This is not a correction; this is sabotage, a systemic, deliberate distortion by a group with vested interests that threatens to derail the Government's own renewable energy goals.

The new tariff structure pegs the cost of equity for solar power projects at 11.47 per cent, identical to the 10-year Treasury Bond yield. In doing so, it offers zero premium for risk. Let me repeat that, Sir. Investors in renewable energy are being offered no compensation for the risks they carry, including currency volatility, policy uncertainty, construction delays and regulatory risk. In global practice, even regulated utilities earn 3 per cent to 5 per cent premiums over risk-free government bonds. What signals are we sending to the local entrepreneurs and international investors? Is it that Sri Lanka does not reward risk or that we penalize clean energy? This rupee-denominated return only applies to projects under 10 megawatts. Meanwhile, the projects above 10 megawatts

are allowed US Dollar-pegged tariffs, protecting larger, often foreign-backed projects from foreign exchange risk. Why is this inconsistency? Are we creating a tariff regime that rewards size, not merit? Are we discouraging distributed, citizen-led renewable investments while paving the way for large, centralized fossil fuel infrastructure? This is not just poor design, but also structural discrimination.

Sir, I can go on, on this subject, but I want to move on to another important area. Now, we have a very efficient Secretary to the Ministry and Chairman of the CEB, Prof. Udayanga Hemapala, who is known to me. He had once served under me in an institution, to which I appointed him as Chairman, when I was Minister of Higher Education. He is a very efficient gentleman. Now, he is also going to be the Chairman of the Lanka Transformers Limited. While referring to that, I would say that the Government should initiate an investigation, starting from the roots, to understand how former public servants became shareholders of the LTL cartel, whether those former public servants paid fair consideration for their shareholding or whether they were beneficiaries of an orchestrated scheme hatched by the procurement mafia to incentivize a selected group of public servants to keep the procurement mafia fire burning whilst indirectly controlling the CEB.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කරුණාකර කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Parliament should request the subject Minister and the Hon. President to appoint a high-powered committee consisting of non-conflicted professionals who are not aligned to the power industry to deep dive and unravel the maze of entities with cross shareholding and also figure out the net worth of shareholdings of former public servants in this LTL venture. Sir, it is said that there are employees' trust companies which have been formed and are hidden. මේ කොටස් ව්‍යංගයෙන්, වක්‍රාකාරයෙන් පාලනය කරන පැළැන්තියක් මෙය අස්සේ ඉන්නවාද කියන එක පිළිබඳව අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මේ පිළිබඳව සොයා බැලිය යුතුයි; මේකේ තිබෙන වංචාව හෙළිදරව් කළ යුතුයි. Sir, we saw that there was an IPO worth almost Rs. 20 billion. This entity is worth more than Rs. 100 billion today. So, how can there be such a large amount of shareholding of a few public servants, who had been attached to the Ceylon Electricity Board, in charge of the LTL and are now controlling this mafia? Therefore, that has to be looked into. I call upon the Government to look into it very seriously; particularly, the Chairman of the LTL should now initiate an inquiry and let the public know what is happening inside that institution.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.11]

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)
අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රාජ්‍ය යන්ත්‍රණය තුළ තිබෙන පනත් අවුරුදු 40, 50 වගේ කල් ඉක්මවා ගිය ඒවා බව අපි දන්නවා. හැබැයි, පසුගිය කාලය තුළ ඒ පනත් විටින් විට සංශෝධනය කරන්න උත්සාහ කළ ආකාරය; සංශෝධනය කළ ආකාරය අපි දැක්කා. ඒ සංශෝධන සිදු කළේ ආර්ථිකයේ ඉදිරි සැලසුම් සහිතවද කියලා අපට සැකයක් තිබෙනවා. පනතක් අවුරුදු 30කට, 40කට කලින් හදනකොට ඒ කාලයේ තිබුණු සමාජයීය, ආර්ථික තාක්ෂණයේ දියුණුව සැලකිල්ලට ගනිමින් තමයි ඒ පනත් ඒ කාලයට ගැළපෙන විධියට නිර්මාණය වුණේ. නමුත්, අවුරුදු 40ක්, 50ක් තිස්සේ ඒ පනත් සංශෝධනය හෝ සංශෝධනය නොවුණු හේතුව අපි දැක්කා. ඒ පනත් සංශෝධන හරහා මොකද වුණේ? රාජ්‍ය දේපළ, රාජ්‍ය ස්වෛරීත්වය, සේවක අයිතිවාසිකම් හැම තිස්සේම තර්ජනයට ලක් වුණා. ඒ නිසා පනත් සංශෝධනයේදී විවිධ විරෝධතා මතු වුණා. ඒ චෝදනාව විපක්ෂයේ මන්ත්‍රීවරුන් දිගින් දිගටම අපටත් සම්බන්ධ කළා, අපේ සේවක සංගම් ඒවාට විරුද්ධ වුණා කියලා. ඔව්, අපි විරුද්ධ වුණා. ඇයි ඒ? සේවක අයිතිවාසිකම් කප්පාදු වෙනවා නම්, රාජ්‍ය දේපළවල තිබෙන අයිතිය තර්ජනයට ලක් වෙනවා නම්, රාජ්‍ය ආරක්ෂාව තර්ජනයට ලක් වෙනවා නම් අපි ඒ තැන්වලදී විරුද්ධ වුණා. අපි පනතක් හැදිය යුත්තේ, අදට විතරක් ගැළපෙන විධියට නොවෙයි. පනතක් හදනකොට තව අවුරුදු 10ක්, 15ක් ඉස්සරහට ඒ ක්ෂේත්‍රය හැසිරෙන ආකාරය ගැන දැක්මක් සහිතව තමයි අපි ඒ පනත හදන්න ඕනෑ. ඒ නිසා අපි බලයට පත් වෙලා ගත වුණු මාස නවයක වාගේ කාලය ඇතුළත මේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට අපට හැකියාව ලැබුණා. ඒ අදාළ ක්‍රියාවලියට පුබුදු නිරෝෂන්ගේ විතරක් නොවෙයි, ආංශික අධීක්ෂණ කාරක සභා සහ ඉතා විශාල පිරිසකගේ දායකත්වය ලැබුණා. රටේ ස්වෛරීත්වය, ජාතික ආරක්ෂාව, රාජ්‍ය දේපළ, ඒ වාගේම සේවා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ව්‍යාපාරයක් විධියට අපේ ජාතික ජන බලවේගයට හැකියාව ලැබුණා, - සුළු පිරිසකගේ එකඟ වීමක් නැති වුණත් - ඉතා විශාල පිරිසකගේ එකඟත්වයෙන් මේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා බහ යන අතරතුර පිරිසක් කිව්වා, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත හරහා අපි විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන්න යනවා කියලා. ඒ වාගේම සමහර පිරිසක් කිව්වා, මේ පනත් කෙටුම්පත හරහා පෞද්ගලික අංශයට තිබෙන ඉඩ ඇහිරෙනවා කියලා. මේ පිළිබඳ අවබෝධයක් නැතුවද, එහෙම නැත්නම් අවබෝධයක් හදා ගෙන වෙන චිත්‍රයක් මවන්න හදනවාද කියන එක තමයි අපට තිබෙන ගැටලුව. අපි මොකක්ද මේ කරන්න යන්නේ? මොකක්ද මේ පනත? අපි මේකේ පැහැදිලිවම කියලා තිබෙනවා, සියයයට

[ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා]

සියයක් රජයට අයිති සමාගම් 5ක් තමයි අපි මේ හරහා හදන්නේ කියන එක. සමහර සමාගම්වලට අපි පෞද්ගලික අංශයට ආයෝජනය කරන්න ඉඩ දෙනවා. ඒ කොහොමද? මම හිතන විධියට කලිනුත් බබෙක් කථා කළා, එයාටත් ඒක තේරිලා නැහැ. ව්‍යාපාරයක් කරන කෙනෙක් දන්නවා, සමාගමක් හදලා ඒ සමාගමේ අනු සමාගමක් හදන්න හැකියාවක් තිබෙන බව. උදාහරණයක් විධියට මගේ අමාත්‍යාංශයේ වරාය අධිකාරිය යටතේ තිබෙනවා, SLPMCS සමාගම. වරාය අධිකාරියට සියයට 40ක් තිබෙනවා; පෞද්ගලික අංශයට සියයට 60ක් තිබෙනවා. ඒ කියන්නේ, දැන් වරාය අධිකාරිය පෞද්ගලීකරණය වෙලාද? නැහැ නේ. මම හිතන විධියට මේක කිහිප වරක්ම කිව්වා. නමුත්, දිගින් දිගටම ඔය තර්කය මතු වෙනවා. පෞද්ගලික අංශයට ඉඩ දෙන්නේ අපි අනුසමාගම් සඳහා. මේ unbundling කියන එක privatization එකක් කියන්න දිගින් දිගටම විපක්ෂය උත්සාහ දරනවා. නමුත්, unbundling කියන එක අවුරුද්දකින් වෙනවාද, අවුරුදු දෙකකින් වෙනවාද කියන එකයි බලන්න ඕනෑ. අවුරුද්දකින් හෝ දෙකකින් වෙන එක privatization නොවෙයි. විපක්ෂය ඒක හොඳින් ධාරණය කර ගත්තොත් හොඳයි කියලා මම හිතනවා.

මේ පනත හරහා හැදෙන සමාගම් මොනවාද කියලා අපි දැන් බලමු. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් 4ක් තිබෙනවා කියලා අපි දන්නවා. ඒවා තමයි ජනනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම සහ පද්ධති පාලනය. අපි මේ පනත හරහා මේ ප්‍රධාන කාර්යන් 4ට සමාගම් 4ක් යෝජනා කරනවා. මේ සමාගම් 4 තුළ ප්‍රධාන වශයෙන්ම ඉන්නේ කවුද? NSO, ඒ කියන්නේ ජාතික පද්ධති ක්‍රියාකරු. ජාතික පද්ධති ක්‍රියාකරු තමයි මේකේ නියමුවා. පද්ධති පාලනය සියයට 100ක්ම රජයට අයිතියි වාගේම එහි පෞද්ගලික ආයෝජනයට ඉඩ නැහැ. මොකද, අපි සම්පූර්ණ විදුලිබල ව්‍යාපාරය කරගෙන යන්නේ මෙතැනින් තමයි කියලා අපි දන්නවා.

ඊළඟට, අනෙක් සමාගම් 3 ගැනත් අපි බලමු. දැනටමත් විදුලිය ජනනය සඳහා පෞද්ගලික අංශය දායක වෙනවා කියලා අපි දන්නවා. මොකද, විදුලි බිලෙන් සියයට 80ක්ම ජනනය සඳහා යන පිරිවැය කියලා අපි දන්නවා. අපි මෙතැනදී optimize කර ගත්තොත් අපිට විදුලි බිල අඩු කරගන්න පුළුවන්. විදුලි බිලත් අඩු කරන්න ඕනෑ, හැබැයි සෝලා විදුලිය ඒකකයටත් රුපියල් 37ක් විතර ගෙවන්න ඕනෑ කියලා විපක්ෂයෙන් කියනවා අපි දැක්කා. ඔය දෙකම කරන හැටි අපිට තේරෙන්නේ නැහැ. අපි සෝලා විදුලිය කඩාකප්පල් කරනවා, ඒකකයකට රුපියල් 37ක් ගෙවන එක රුපියල් 19කට අඩු කළා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් සඳහන් කළා. සූර්ය බලශක්තිය කියන්නේත් ව්‍යාපාරයක් කියලා අපි දන්නවා. ඕනෑම ව්‍යාපාරයක සාර්ථකත්වය රඳා පවතින්නේ ඒකේ තිබෙන ROI එක මත කියලා අපි දන්නවා. අපි ROI එක මත පදනම්ව තමයි මේ ගණනය සිදු කරන්නේ. එහෙම නැතුව විදුලි ඒකකයක මිල රුපියල් 37ද, රුපියල් 27ද, රුපියල් 19ද කියන එක මත නොවෙයි. ඒක නිසා අපි සූර්ය බලශක්තිය අධෛර්යවත් කරන්නේ නැහැ කියලා අපි පැහැදිලිව කියා සිටිනවා. හැබැයි අපි සූර්ය බලශක්තිය හෝ වෙනත් පුනර්ජනනීය බලශක්තිය ලබා ගැනීමේදී මෙතැනින් එහාට මේ පනත අනුව හැදෙන "GENCO" කියන කොම්පැනිය හරහා NSO එකට මේවා මිලදී ගන්නකොට අපිට Power Purchase Agreement - PPA - එකකට අනුගත වෙන්න වෙනවා. ඒකෙදි අපි හිතුමතේ වැඩි මිලට විදුලිය ගන්න එක සම්පූර්ණයෙන් නවතිනවා.

ඒ වාගේම, අපේ සම්ප්‍රේෂණ පද්ධතියේ, National Transmission Network Service Providerගේ - NTNSPහි - අයිතිය සියයට 100ක් රජයටයි තිබෙන්නේ. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු මේකත් පටලවාගෙනයි තිබෙන්නේ. මේක අපි පිළිගන්නවා. ඇත්ත. මේකට තමයි වැඩිපුරම investment එකක් අරගෙන තිබෙන්නේ. නමුත් මේක සමස්ත විදුලිබල ක්ෂේත්‍රයෙන් සියයට 5යි. සම්පූර්ණ විදුලිබල ක්ෂේත්‍රයේ තිබෙන ව්‍යාපාරයෙන් සියයට 5ක වාගේ ප්‍රමාණයක් තිබෙන්නේ. නමුත් අපිට මේකට විදේශ ආයෝජන ඕනෑ වෙනවා. නමුත් අපි grid දෙකක් හදන්නේ නැහැ. අපේ සම්ප්‍රේෂණ පද්ධතියේ එක grid එකක් තිබෙනවා. හැබැයි, එහි extensions තිබෙනවා. අපි මේ පනත හරහා additional transmission licensing කියන එක ගෙනෙන්නේ මේ නිසායි. අපට මෙතැනින් එහාට යන්න තිබෙන, grid එකේ extensions අපි private companiesවලට, investmentsවලට open කරනවා. NTNSP එකේ, දැනට තිබෙන grid එක සියයට 100ක් රජය සතු වන අතර, additional transmitting licensing හරහා ඉදිරියට එන investorsලාට අපි එය open කරලා තිබෙනවා.

ඊළඟ එක, බෙදා හැරීම. විදුලිය බෙදා හැරීම ගත්තොත්, දැනට විදුලිය බෙදා හැරලා තිබෙන්නේ geographically. ඒ කියන්නේ අපේ රටේ කලාප වශයෙන් වෙන් කරලා තමයි අපි විදුලිය බෙදාහැරීම සිද්ධ කරන්නේ. අපි CEB එකේ තිබෙන සේවාවත් එක්ක එකඟ නැත්නම්, වෙන සේවාවකට මාරුවෙන්න අපිට බැහැ. ඔයගොල්ලෝ phone එකේ SIM එක මාරු කරනවා වාගේ ඔයගොල්ලන්ට සේවාව වෙනත් පාර්ශ්වයකින් ගන්න අවශ්‍ය පහසුකම ලබා දෙන්න අපි මේ පනත හරහා ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. මේක Act එකක්. අපි පළමුවැනි වරට -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත් කාරණයකට,-

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
මගේ කථාව ඉවර වුණාම ඔබතුමා කථා කරන්න. මට විනාඩියක් දෙන්න, මම මේ කථාව ඉවර කරලා උත්තර දෙන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සූර්ය බල සංග්‍රාමය වැඩසටහන යටතේ අපේ ජාතික විදුලිබල පද්ධතියට අද වෙනකොට විදුලිය මෙගාවොට් 1,710ක් හෝ ඊට වැඩියෙන් අරගෙන තිබෙනවා. Ground-mounted solar panelsවලින් තවත් විදුලිය මෙගාවොට් 200ක් විතර අරගෙන තිබෙනවා. දැන් අලුත් ක්‍රමවේදය තුළ මීට පස්සේ මේ rooftop solar ප්‍රවර්ධනය කරන්නේ කොහොමද? ඒ සඳහා හදලා තිබෙන ආකෘතිය මොකක්ද? රජයේ දායකත්වයක් නැතුව පුරවැසියාගේ දායකත්වයෙන් අද බලශක්තින් විශාල ප්‍රමාණයක් අපේ grid එකේ වැඩියෙන් තිබෙනවා නේ. ඒක මේ පනතෙන් ධෛර්යවත් කරන්නේ කොහොමද? අන්න ඒක පැහැදිලි කරන්න.

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා දන්නවා, rooftop solarවලත්, ground-mounted solarවලත් tariff එක ඔබතුමන්ලා හැදුවේ මීට

අවුරුදු ගණනකට කලින් තිබුණු පිරිවැය මත කියලා. නමුත්, දැන් තිබෙන පිරිවැය ඒක නොවෙයි නේ. දැන් පිරිවැය වෙනස් වෙලා. ඉතින් ඒක මත අපට tariff එක වෙනස් කරන්න බැරි ද? මගේ ගෙදර ගහපු rooftop solar එකේ වියදම අවුරුදු දෙකහමාරෙන් recover වෙනවා. අවුරුදු දෙකහමාරෙන් වියදම recover වන බිස්නස් කොහේද තිබෙන්නේ? ඒක බිස්නස් එකක් නොවෙයි නේ. ඒක නිසා අපි මේකට සාධාරණ tariff එකක් ඉදිරිපත් කරනවා. ඒ, පාරිභෝගිකයා සහ investorsලා කියන දෙගොල්ලන්ටම සාධාරණයක් වන විධියට.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.22]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு ஒருசில கருத்துகளைக் கூற விரும்புகின்றேன்.

எமது பிரதேசமான வன்னித் தேர்தல் மாவட்டம் மிக நீண்ட காலமாக யுத்தத்தால் பாதிக்கப்பட்ட ஒரு பிரதேசம் என்பது அனைவருக்கும் தெரியும்! ஆரம்பத்தில் அங்குள்ளவர்கள் மின்சாரத்தைப் பெறுவதில் பாரிய சிக்கல்கள் இருந்தன. இன்று மின் இணைப்பைப் பெறுவதற்குரிய - main connectionஐப் பெறுவதற்குரிய - கட்டணத்தைச் செலுத்தியும் அதனைப் பெற முடியாதவர்களாக அவர்கள் இருக்கின்றார்கள். காரணம் என்னவெனில், insulators, utility poles, wires போன்ற உபகரணங்கள் இல்லாமைதான். மன்னர், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களில் மின் இணைப்பைப் பெறுவதற்குரிய கட்டணத்தைச் செலுத்தினாலும் உரிய உபகரணங்கள் இல்லாமையால் அதனைத் தரமுடியதெனக் கூறுகின்றார்கள். எனவே, விரைவாக இதற்குரிய ஏற்பாடுகளைச் செய்து, அவர்களுக்கு மின் இணைப்புகளை வழங்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

சில வாரங்களாக மன்னார் பகுதியில் மின் துண்டிப்பு கூடுதலாக நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. ஒரு நாளைக்கு 5-6 மணித்தியாலங்கள் என மின் துண்டிப்பு நடைபெறுகின்றது. சில வேளைகளில் 10-12 மணித்தியாலங்கள்கூட மின் துண்டிப்பு நடைபெறுகின்றது. இது அங்குள்ள மக்களுக்குப் பாரிய பிரச்சினையாக இருக்கின்றது. அங்குள்ள மக்கள், "மக்கள் பிரதிநிதிகள் என்ன செய்கிறார்கள்?" என்று கேட்கிறார்கள். அங்கு இந்த நிலைமை தொடர்ந்து இருக்காமல், அங்குள்ள மக்களும் ஏனைய பகுதிகளிலுள்ள மக்களைப்போல வாழக்கூடிய ஒரு நிலைமையை ஏற்படுத்தித் தரவேண்டுமென நான் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன். அங்கு wind powerஐ உற்பத்தி செய்வதற்குப் பாரிய ஏற்பாடுகள் செய்யப்பட்டு இருக்கின்றன. எனினும், அந்தப் பகுதியில்தான் இவ்வாறான மின் துண்டிப்பு நடைபெறுகின்றது. ஏதாவது பழுதுபார்க்கும் நடவடிக்கைக்காக மின் துண்டிப்பை மேற்கொண்டால் பரவாயில்லை. ஆனால், இந்த மின் துண்டிப்பு எந்த அடிப்படையில் மேற்கொள்ளப்படுகின்றது என்பது தெரியாமல் இருக்கின்றது. எனவே, இதுதொடர்பில் கவனம்செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். வேறு பிரதேசங்களின் தேவைப்பாடுகளுக்கு மின்சாரத்தை வழங்க முடியாவிட்டாலும், மன்னாருக்கு மின்சாரத்தை வழங்குவதாக அங்கு ஆரம்பத்தில் wind power stations அமைக்கப்படும்பொழுது சொல்லப்பட்டது. ஆனால், கடந்த காலங்களில் அந்த நிலைமை காணப்படவில்லை.

காற்றாலை மின் உற்பத்தியால் ஏற்பட்டுள்ள அழிவுகள் காரணமாகத்தான் இன்றைக்கு அங்குள்ள மக்கள் அதற்குப் பாரிய எதிர்ப்பைக் காட்டுகின்றார்கள். அந்த மக்கள் wind power என்றாலே பயப்படுகின்றார்கள். அதனால்தான் அங்கு இன்று ஆர்ப்பாட்டங்கள், போராட்டங்கள், கடையடைப்பு என்று எதிர்ப்பு தெரிவிக்கப்படுகின்றது. நேற்று நாங்கள் கௌரவ அமைச்சருடன் பேசியதன் அடிப்படையில், நாளை இது சம்பந்தமான விசேட கூட்டமொன்றை ஏற்பாடு செய்திருக்கின்றார். அதில் நல்ல முடிவு வர வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மன்னார் தீவுக்குள் காற்றாலை மின் உற்பத்தித் திட்டம் வேண்டாம் என்றுதான் அங்குள்ள மக்கள் கூறுகின்றார்கள். மன்னார் தீவின் நிலம் காற்றாலை மின் உற்பத்தித் திட்டத்துக்குப் பொருத்தமானதல்ல. மன்னார் மாவட்டத்தின் ஏனைய பகுதிகளில் இதனைச் செய்யலாம். குறிப்பாக, A-32 வீதியை அண்டியதாக நாயாற்றுவெளி, முண்டாம்பிட்டி, பள்ளத்துவெளி, பற்றுவெளி என்று பாரிய இடங்கள் இருக்கின்றன. அந்த இடங்களில் இந்தத் திட்டத்தைத் தாராளமாக மேற்கொள்ளலாம். எனவே, நீங்கள் மன்னார் தீவுக்குள் இந்தத் திட்டத்தை மேற்கொள்ளாமல், மன்னார் மாவட்டத்தின் மேற்கூறிய இடங்களில் இதனை மேற்கொள்ளப் பாருங்கள்! காற்றாலை மின் உற்பத்தித் திட்டத்தின் பாதிப்பால் அங்கு மீன்வளம் இல்லாமல் போவதாக அங்குள்ள மக்கள் கூறுகின்றார்கள். அதுமாத்திரமல்ல, அங்கு மழைபெய்தால் பாரிய வெள்ளம் ஏற்படுகின்றது. நாளை நடைபெறவுள்ள special meettingஇல் கௌரவ அமைச்சர் அவர்கள் இதனைக் கவனத்திற்கொள்வாரென நான் எதிர்பார்க்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தின் முத்துநகரில் விவசாயிகள் 50 வருடங்களுக்கும் மேலாக கிட்டத்தட்ட 1,000 ஏக்கர் நிலப்பரப்பில் விவசாயம் செய்து வருகின்றார்கள். இன்று அவர்களின் விவசாய நடவடிக்கைகள் பாதிக்கும் வண்ணம் அந்தக் காணிகள் மின்சார சபையின் ஏற்பாட்டினால் கம்பனிகளுக்கு வழங்கப்பட்டு இருக்கின்றன. இது பாரிய அநியாயம்! இச்செயற்பாட்டுக்கு எதிராக அங்குள்ள மக்கள் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டார்கள். அவர்களுக்கு அதிலும் வேதனையான அனுபவம்தான் கிடைத்தது. அன்று இவ்விடயம் தொடர்பில் சரியாகத் தீர்மானம் எடுத்திருந்தால், அங்குள்ள விவசாயிகள் பாதிப்படைந்து இருக்க மாட்டார்கள். அந்த விவசாயிகள் இரண்டு போகமும் செய்கை பண்ணக்கூடியவர்கள். வெங்காயம், கிழங்கு என பலவற்றை செய்கை பண்ணக்கூடிய அந்த விவசாயிகளுக்கு அந்தக் காணிகளில் அல்லாமல் வேறு காணிகளில் விவசாயம் செய்வதற்கு அனுமதிக்கப்பட்டது. அதாவது, இந்த விடயம் கடந்த அரசாங்க காலத்தில் gazette பண்ணப்பட்டிருந்தாலும், மாறி மாறி ஆட்சிக்கு வந்த ஒவ்வோர் அரசாங்கமும் gazette பண்ணப்பட்டிருந்த காணிகளை விடுவிக்காவிட்டாலும், அந்த விவசாயிகளுக்குப் பிரச்சினை ஏற்படுத்தவில்லை. "நாங்கள்

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

ஆட்சிக்கு வந்தால் இந்தப் பிரச்சினையிலிருந்து உங்களை விடுவிப்போம்" என்று நீங்கள் அவர்களுக்கு முழுமையாக நம்பிக்கை ஊட்டினீர்கள். ஆனால், இன்றைக்கு நீங்கள் அங்கு குறித்த கம்பனி போவதற்குரிய ஏற்பாட்டைச் செய்து கொடுத்து, அந்த மக்களுக்குப் பிரச்சினையை ஏற்படுத்தி இருக்கின்றீர்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

அந்தக் கம்பனிக்கு 300 ஏக்கரை வழங்கிவிட்டு, பாதைக்கு மறுபுறத்திலுள்ள காணிகளை அந்த விவசாயிகளுக்குக் கொடுத்து, அதற்குரிய ஆவணங்களையும் அவர்களுக்குக் கொடுங்கள்! ஏனெனில், அவர்கள் அங்கு காலங்காலமாக இருக்கின்றவர்கள். அங்கு பாடசாலைகள் இருக்கின்றன; பள்ளிவாசல் இருக்கிறது; கோவில் இருக்கிறது. எனவே, அதற்குரிய ஏற்பாடுகளை நீங்கள் செய்து கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். யுத்தத்துக்குப் பிறகு, எங்களுடைய பகுதியில் சாதாரணமாக கிராமங்களிலுள்ள 200 - 300 மீற்றர் அளவுடைய வீதிகளுக்கு - main roadக்கு - அண்மித்துள்ள வீடுகளுக்கு மின் இணைப்பு freeஆகக் கொடுக்கப்பட்டது. தற்பொழுது, அவர்கள் குறிப்பிட்டதொரு தொகையைச் செலுத்தியே மின் இணைப்பைப் பெற வேண்டும். இதனால் அந்த மக்களால் அதனைப் பெற முடியாமல் இருக்கின்றது. எனவே, கடந்த காலங்களில் போன்று அவர்களுக்கு மின் இணைப்பை இலவசமாகக் கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இவ்வாறு ஒவ்வொரு மாவட்டத்திலும் கிட்டத்தட்ட 2,500 குடும்பங்கள் மின் இணைப்பைப் பெறுவதற்கு காத்துக்கொண்டு இருக்கின்றன. அக்குடும்பங்களுக்கு மின் இணைப்பை இலவசமாக வழங்குவதற்குரிய ஏற்பாடுகளைச் செய்து கொடுக்குமாறு கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.28]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் எனக்கு வன்னித் தேர்தல் மாவட்ட உறுப்பினர் என்ற அடிப்படையில் பேசுவதற்கு விசேட சந்தர்ப்பம் வழங்கப்பட்டு இருக்கிறது.

தற்பொழுது பேசுபொருளாக இருக்கின்ற மன்னார் மாவட்டத்தில் மேற்கொள்ளப்படுகின்ற காற்றாலை மின் உற்பத்தித் திட்டம் மற்றும் இல்மனைட் அகழ்வு தொடர்பாக மிக மோசமான நிலையே காணப்படுகின்றது. எங்களுடைய ஆட்சிக் காலத்தில் இதுவரை மன்னாரில் காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை மேற்கொள்வதற்கு எந்தவொரு நிறுவனத்துக்கும் அனுமதி வழங்கப்படவில்லை. கடந்த காலங்களில் இருந்த அரசாங்கங்களால் மேற்கொள்ளப்பட்ட ஒப்பந்தங்களின் அடிப்படையில், சம்பந்தப்பட்ட திணைக்களங்களின் அனுமதிகளைப் பெற்று மேற்கொள்ளப்பட்டு வந்த நடவடிக்கைகளின் தொடர்ச்சியே தற்போது நடைபெற்று வருகின்றது.

மன்னாரில் வாழ்கின்ற மக்களிடமோ, அங்குள்ள மதகுருமாரிடமோ, யாரிடமோ எந்தவித கலந்துரையாடலும் மேற்கொள்ளப்படாமலேயே இந்தத் திட்டத்துக்கு கடந்த காலத்தில் அனுமதி வழங்கப்பட்டது. அதன் பிரதிபலனை தற்போது நாங்கள் அனுபவித்துக்கொண்டு இருக்கின்றோம். அதாவது, கடந்த காலத்தில் அம்மா, அப்பா இல்லாத நிலையில் கொண்டுவரப்பட்ட திட்டத்துக்கு தற்போது நாங்கள் பெயர் வைக்கவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்பட்டு இருக்கின்றோம். இருந்தாலும், மக்கள் நலன் சார்ந்த அரசாங்கம் என்ற வகையில், நாங்கள் இந்தப் பிரச்சினை தொடர்பில் மக்களுடன் கலந்தாலோசித்து, மக்கள் விரும்புகின்ற ஒரு தீர்மானத்துக்கு வருவதற்குத் தயாராக இருக்கின்றோம். அந்த அடிப்படையில், நாளைய தினம் காற்றாலை மின் உற்பத்தித் திட்டம் மற்றும் கனிய மணல் அகழ்வு தொடர்பான பிரச்சினைகள் சம்பந்தமாக வன்னித் தேர்தல் மாவட்ட பாராளுமன்ற உறுப்பினர்கள், மன்னார் மாவட்ட மதகுருமார், மீனவச் சங்கங்களின் தலைவர்கள் மற்றும் செயலாளர்கள், மன்னார் மாவட்ட பிரதிநிதிகள் குழுவினர், பிரஜைகள் குழுவினர், சமூக அமைப்புகளின் ஒன்றியத்தின் உறுப்பினர்களுடன் கலந்துரையாடுவதற்கென பாராளுமன்றக் கட்டிடத்தொகுதியில் கூட்டமொன்றை ஒழுங்குசெய்து இருக்கின்றோம். அதில் வலுசக்தி அமைச்சர், சுற்றாடல் அமைச்சர் உட்பட பலரும் கலந்துகொள்ள இருக்கிறார்கள். அந்தக் கூட்டத்தில் அந்த மக்களுடைய ஆதங்கங்கள், வேண்டுகோள்கள் என்பன கவனத்திற்கொள்ளப்படும்.

2024ஆம் ஆண்டு நவம்பர் மாதத்துக்கு முன்னர், குறித்த திட்டத்துக்குரிய அனுமதி வழங்கப்பட்டு, அதற்குரிய ஆரம்பக்கட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு, தற்போது அதன் தொடர்ச்சியே இடம்பெற்று வருகின்றது. மன்னார் தீவுப் பகுதியில் மீன்பிடியை வாழ்வாதாரமாகக் கொண்ட மக்களே அதிகமாக வாழ்ந்து வருகின்றார்கள் என்பது எங்களுக்குத் தெரியும்! அவர்களது வாழ்வாதாரத்துக்கு எந்தவிதப் பாதிப்பும் ஏற்படக்கூடாது என்பதில் அரசாங்கம் மிகுந்த கரிசனையுடன் இருக்கின்றது. அந்த வகையில், நாங்கள் முதற்கட்டமாக இந்தக் கலந்துரையாடலை நடாத்த இருக்கின்றோம். அதுமட்டுமல்ல, நேரடியாக அந்த இடங்களுக்குச் சென்று, அந்தந்தத் திணைக்களங்களுக்குரிய மதிப்பீடுகளை மீண்டும் செய்ய வேண்டுமெனவும் நாங்கள் தீர்மானம் எடுத்திருக்கின்றோம். மேலும், நாங்கள் மேற்குறித்த பிரதிநிதிகளுடன் கலந்துரையாடி தீர்க்கமான முடிவுகளை எடுக்க இருக்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு இன்னும் 30 செக்கன் தாருங்கள்!

கடந்த காலங்களில் இடம்பெற்ற இவ்வாறான செயற்பாடுகளில் இங்கிருக்கின்ற மக்கள் பிரதிநிதிகள் சிலரும் சம்பந்தப்பட்டு இருக்கிறார்கள். கடந்த காலங்களில் மன்னார் மாவட்டத்தில் ஆரம்பிக்கப்பட்ட காற்றாலை மின் உற்பத்தித் திட்டம் தொடர்பாக எடுக்கப்பட்ட நடவடிக்கைகள் என்ன? அப்போது அதற்கு எதிர்ப்புத் தெரிவிக்கவோ, அது தொடர்பில் மக்களை விழிப்புணர்வூட்டவோ யாரும் முன்வரவில்லை. ஆனால், அன்று அவர்கள் மேற்கொண்ட தீர்மானத்தால் இப்போது நாங்கள் பிரச்சினைக்கு உள்ளாக்கப்பட்டு இருக்கின்றோம். ஆனாலும், எங்களுடைய அரசாங்கம் மக்கள் நலன் சார்ந்த அரசாங்கம் என்ற வகையில், போச்சுவார்த்தைமூலம் நிச்சயமாக இதற்குச் சரியானதொரு தீர்வைக் காணும்; அந்த மக்களுக்கு நியாயமானதொரு தீர்வை வழங்கும். நாங்கள் எப்போதும் மக்கள் நலன் சார்ந்த முடிவுகளையே எடுப்போமென இவ்விடத்தில் கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.33]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔරිජිනල් විදුලිබල පනත සංශෝධනය කරන්න අපි ගොඩක් කල් උත්සාහ කළා. ඒකට හේතුව තමයි, විදුලි බිල අඩු කරන්න, පාරිභෝගිකයන්ට සහනයක් දෙන්න, කර්මාන්තකරුවන්ගේ පිරිවැය අඩු කරන්න සහ රටේ සමස්ත ආර්ථිකය තරගකාරී කරන්න. 2024 අවුරුද්දේ පනත ගෙනෙනකොට අපි සමස්තයක් හැටියට ඒකට එකඟ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, ඒ පනතේ සමහර කාරණාවලට අපි විරුද්ධ වුණා. මූලික වශයෙන් අපි විරුද්ධ වුණේ පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධයෙන්. කංචන විජේසේකර හිටපු ඇමතිතුමා 2024දී පනත හරහා කරන්න උත්සාහ කළේ තරගකාරිත්වයක් නිර්මාණය කරලා, ඒ හරහා කාර්යක්ෂමතාව වැඩි කරලා පිරිවැය අඩු කරන්නයි. ඒ කොහොමද? ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම ගැන බොහෝ දේ ගරු මන්ත්‍රීවරු අද උදේ ඉඳන් කථා කළා. ජනනය රජයට අයිති ආයතන කිහිපයකට කඩලා, ඔවුන් අතරේ තරගයක් නිර්මාණය කළා. ඊට අමතරව, අවශ්‍ය දැවැන්ත ආයෝජන ලබා ගන්න ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීමේදී අවස්ථා නිර්මාණය කළා. උදාහරණයක් ගත්තොත්, සම්ප්‍රේෂණය ගැන කථා කරනකොට grid එක stabilize කරන්න, බොරුවට වඳුරෝ මත මේක පටවන්නේ නැතුව අවශ්‍ය ආයෝජන සඳහා රජය සහ පෞද්ගලික එකඟතාව හරහා.

මම හිතන විධියට අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාත් කිව්වා, අවශ්‍ය තැන්වලට පෞද්ගලික ආයෝජනය ගේන්න ඔවුන් සූදානමින් ඉන්නවා කියලා. නමුත්, දැන් සමහරු මේ සභාවේදී කියනවා, කිසි දවසක ඒකට ඉඩ තියන්නේ නැහැ කියලා. එතකොට මෙතැන කථා දෙකක් කියන්නේ. ජනනයේදී අවශ්‍ය අරමුදල් ලබා ගැනීමට UNP එක හදපු මහවැලි ජලවිදුලි බලාගාර සදාකාලිකවම සියයට සියයක් රජයේ අයිතියට යටත්ව තමයි 2024 පනතට අනුව තිබුණේ. ඒක මෙතැනින් වෙනස් කරලා නැහැ. කවුරුවත් ඒවා විකුණන්න ගියේ නැහැ. හැබැයි, Norochcholai West Coast Diesel Thermal Renewable Plantsවල අයිතිය යම් අවස්ථාවකදී දේශීය හෝ විදේශීය ආයෝජකයන්ට කොටසක් ලබා දීමට, එහෙම නැත්නම් කොටස් වෙළෙඳ පොළේ ඒකක නිකුතුවක් හරහා කිරීමට අවකාශය ලබන්න ඉඩ තිබුණා. 2024දී ගෙනෙන ලද පනතින් පෞද්ගලීකරණය කරන්න උත්සාහ කළේ නැහැ. නමුත්, අවශ්‍ය ආයෝජනය ලබා ගන්නට පසු දවසක අවස්ථාව තිබුණා. බෙදා හැරීමේදී, LECO වැනි ඉතා ඉහළ කාර්යක්ෂමතාවක් ඇති ආයතන නිර්මාණය කිරීම හරහා අපට පුළුවන් to provide concession agreements to distribute and compete for the market, not compete in the market, at a given quality of service at lowest tariff. නමුත්, මේ ආපසු හැරවීම හරහා 2024දී ගෙනා පනතේ මූලික හරය සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා.

ඒක තමයි ADB එක, World Bank Group එකේ IFC එක, JICA එක ලියුමක් ලියලා රජයට - Hon. Minister of Energy Kumara Jayakodyට - දැන්වූවේ, "කරුණාකරලා මේක කරන්න එපා" කියලා. ඒ ලිපිය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

කාරණා හතරක් ඔවුන් ඉදිරිපත් කළා. හැබැයි ඔවුන් කිව්වේ, මේක ආර්ථික වර්ධනයට සෘණාත්මකව බලපානවා කියන එකයි. එහි මෙහෙමයි කියන්නේ, I quote:

> "These changes could undermine the overarching objectives of the Electricity Act and the commitments made by the Government under the Asian Development Bank's Policy-based Loan..."

> "... weaken attractiveness of Sri Lanka for investors..."

> "We urge the Government to consider the points stated in this letter....."

ඊට පස්සේ, ඔවුන්ට අමතරව Ceylon Chamber of Commerce, විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රාමාණික දැනුමක් තිබෙන විශේෂඥයෝ, ආයෝජක ප්‍රජාව යන සියලුදෙනා මේ පනතට අද ගෙනෙන සංශෝධනයට විරුද්ධ වුණා. හැබැයි, ඒ සියලුදෙනාගේ උපදෙස් කුණු බක්කියට දමලා, ඒවා සතේකට ගණන් ගන්නේ නැතුව කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්ව විධියට පුබුදු නිරෝෂන් මැතිතුමා,- මොකද, මේක 'පුබුදු නිරෝෂන් සංශෝධනය' කියලා තමයි අපි දකින්නේ. ඒකට හේතුවකුත් තිබෙනවා. මොකද, අර ලියුමට උත්තර ලියන්නේ පුබුදු නිරෝෂන් මැතිතුමා. මම ඒ ලියුමත් සභාගත කරන්නම්. නමුත්, එතුමා මේ සභාවේ නැහැ නේ. සමහර විට එතුමා රාජ්‍ය නිලධාරින්ගේ මැදිරියේ අහගෙන ඇති, මන්ත්‍රී කෙනෙක් නොවන නිසා සභාව ඇතුළට එන්න බැරිව. ඒකයි මේ පුබුදු නිරෝෂන් කියන කෙනා සම්බන්ධයෙන් කියන්නේ. මම මේ අවස්ථාවේදී ඒ ලිපියත් **සභාගත*** කරනවා.

ඒ ලියුම සහ මේ කරන දේ තුළින් අද පාර්ලිමේන්තුව හරහා ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය දැවැන්ත පසුබෑමකට ලක් කරනවා. මේ සංශෝධනය නිසා අපේ රටේ ආර්ථික වර්ධනයට තිබෙන ඉඩකඩ අවහිර වෙනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තවත් විනාඩි දෙකක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පෞද්ගලික ව්‍යාපාරික ප්‍රතිලාභ මොනවාද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, එක දෙයක් අද කියනවා හොඳට අහගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහුට හෝ ඔහුට සම්බන්ධ කෙනෙකුට ඔහු විසින් අද නිර්මාණය කරන මේ ආයතනවල කිසිම වගකීමක් ගන්න කිසිසේත් හැකියාවක් නැති බව ඉතා හොඳට දැනගන්න. එහෙම වුණොත් මෙකේ මූලික හේතුව මොකක්ද කියන එක කාටත් පැහැදිලි වෙයි.

වෙලාව මදි නිසා සංශෝධන දෙකක් පිළිබඳව විතරක් මම කථා කරන්නම්. මම SOC එකේදී ලේකම්තුමාගෙන් ඇහුවා, ඔබතුමන්ලාගේ Transco එකේ investmentsවලට ඉදිරියේදී කොච්චර බලාපොරොත්තු වෙනවාද කියලා. පුබුදු නිරෝෂන් මැතිතුමා තමයි ඒකට උත්තර දුන්නේ, ලේකම් නොවෙයි. ඒක Minutesවල තිබෙනවා. ඔහු කිව්වා, ඩොලර් බිලියන 5ක් ඊළඟ අවුරුදු 8ට අවශ්‍ය වෙනවා කියලා. එතකොට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, extension licence එකක් ගන්න පුළුවන් transmission network එක extend කරන්න, ඒ නිසා private කට්ටිය US Dollars 1 billion සහ ආණ්ඩුව US Dollars 4 billion ගෙනෙනවා කියලා. ඇත්තවශයෙන්ම ADB එකයි, World Bank එකයි මේ policy-based loan එක හරහා දෙන්න බලාපොරොත්තු වෙලා හිටියේ ඩොලර් මිලියන 200යි. එතකොට පුබුදු නිරෝෂන් මැතිතුමා ඒ වෙලාවේදී කිව්වේ, "අපට ඒවා අදාළ නැහැ. අපි ගන්නේ AIIB එකෙන් තමයි" කියායි. මොකද, "ඒවා අදාළ නැහැ" කියන එකට හේතුව තමයි මම කලින් සභාගත කරපු ලියුම. ඔවුන් කියනවා, "මේක කරන්න එපා. කළොත් policy-based loan එකට object වෙනවා" කියලා. ළඟදී Public Finance Committee එකට ආවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Treasury එකේ Public Debt Management Office එකේ DG. අපි ඒ වෙලාවේදී ඇහුවා, මේ පොලී අනුපාත කොයි විධියටද CEB එකට ලබා ගන්න පුළුවන් වන්නේ කියලා. ඔවුන් කිව්වා, "අපි test එක කළා, ඒගොල්ලන්ට elevated risk එකක් තිබෙනවා, risk premium එක පමණක් Treasury එකට ගෙවන්න ඕනෑ CEB එක සියයට 4.8ක්, government guarantee එකක් ගන්න" කියලා. On top of that, AIIB එකෙන් ගන්න පුළුවන් floating SOFR එකක්, සියයට 6ක ප්‍රමාණයකට. අපි දෙවරක්ම ඒ ගැන ඇහුවා. එතකොට එතුමිය කිව්වා, "ඔව්, CEB එක ණයක් ගන්නවා නම් අද ඇමෙරිකානු ඩොලර්වලින් සියයට 11ක් ගෙවන්න ඕනෑ" කියලා. සියයට 11ක්, ඇමෙරිකානු ඩොලර්වලින්. ඉතින් මම අහන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කට්ටිය මේක තේරුම් ගත්තාද කියන එකයි. ඇත්තවශයෙන්ම ADB එකයි, JICA එකයි පසුගිය අවුරුදු 10ටම අපට ලබා දීලා තිබෙන්නේ ඩොලර් බිලියන 1යි. AIIB එක පටන් ගත්ත දවසේ ඉඳලා අපට ලබා දීලා තිබෙන්නේ, ඩොලර් මිලියන 460යි; විදුලිබල ක්ෂේත්‍රයට ලබා දීලා තිබෙන්නේ, ඩොලර් මිලියන 0යි. ADB එක කියනවා නම්, "මේක කරන්න එපා. මොකද, ඔබතුමන්ලාට අවශ්‍ය ආයෝජන ලබා ගන්න බැහැ" කියලා, එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

තව කාරණයක් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි, මේගොල්ලෝ estimate කරලා තිබෙන්නේ, Transco එකේ annual revenue එක ඩොලර් මිලියන 75ක් කියලා; ඩොලර් මිලියන 75ක annual revenue එක තිබෙන ආයතනයක්, මේක. මමත් international consultant කෙනෙක් හැටියට ADB එකේ power sector එකේ ගොඩක් රටවල්වල වැඩ කරලා තිබෙනවා. කිසිම දවසක ඩොලර් බිලියන 4ක ණයක් ගන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේකට ඉංග්‍රීසියෙන් කියන්නේ "pie in the sky" කියලා.

කාලය සීමිත වුණත් මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මේ ඔක්කෝම උත්සාහ කළේ tariff එක අඩු කරගන්න. මොකද, cost-reflective tariff එකක් තමයි තිබෙන්නේ. මේ විධියට inefficient agencies හදලා cost එක වැඩි වෙනවා නම්, ඒ cost එක tariff එක හරහා කාටද යන්නේ? යන්නේ පාරිභෝගිකයාට, කර්මාන්තකරුවාට. ඒ නිසා අද ගේන්නේ මේ රටට ආලෝකය ලැබෙන පනතක් නොවෙයි, මේ රට අඳුරට ගෙන යන පනතක් කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වෛද්‍ය නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.42]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස පුරාම මෙම විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සහ මෙහි තාක්ෂණික කාරණා පිළිබඳව සාකච්ඡා ඇති වුණා; ඉදිරියටත් සාකච්ඡා ඇති වෙනවා. මේ කථාවේදී මම විශේෂයෙන්ම අවධාරණය කරන්න කැමැතියි, මෙම තාක්ෂණික කාරණා සම්බන්ධ සාකච්ඡා අතරතුර අපේ ප්‍රතිපත්ති සම්බන්ධ ප්‍රශ්න කිරීමකුත් සිදු වුණා කියන එක. විශේෂයෙන් අපි බලයට එන්න කලින් කිව්වේ මොකක්ද? අපි බලයට එන්න කලින් කිව්ව කාරණාව සමහර අය සමහර තැන්වලදී විකෘතිත් කළා. බලයට එන්න කලින් ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලිකවම විදුලි බිල ගැන අපි ඉදිරිපත් කරපු දේ, ප්‍රකාශ වුණු දේ තමයි -විදුලි බිල අඩු කිරීම ගැන ගොඩක් අදහස් මතු කරපු නිසා- වසර තුනක් ඇතුළත විදුලි බිල තුනෙන් එකකින් ස්ථාවරව අඩු කරනවා කියන එක. විදුලි බිල තුනෙන් එකකින් අඩු කළ යුතුයි, එහෙම නැතුව මේ රටේ කර්මාන්තවලට, සේවාවලට සහ මේ රටේ සාමාන්‍ය ජනතාවට ඉදිරියට යන්න බැහැ කියන එක අපි කිව්වා. ඔව්. හැබැයි, එය වසර තුනක් ඇතුළත සැලසුමක් සහිතව කරන දෙයක්. මොකද, කලින් මන්ත්‍රීවරයෙකුත් කිව්වා වාගේ කෙක්කෙන් හරි, කොක්කෙන් හරි විදුලි බිල අඩු කරන්න බැහැ. කලින් එහෙම කළා. මේ දෙගොල්ලෝම කළා. 2014 ඉඳලා 2020, 2022 වෙනකල් විදුලි බිල එක ගණනක තිබුණා. විදුලිබල මණ්ඩලයට ඒ බර තවම තිබෙනවා. විදුලිබල මණ්ඩලය ඒ බර අදිමින් ඉන්නවා. කවුරුවත් වෙන තැනකින් ඇවිල්ලා ගෙවන්නේ නැහැ. එම නිසා මේක කෙක්කෙන් හරි, කොක්කෙන් හරි කරන දෙයක් නොවෙයි. ජනතාව අපෙන් බලාපොරොත්තු වුණේ මේක ස්ථාවරව, සැලසුමක් ඇතුව, පිළිවෙළකට කිරීමයි. මේක ස්ථාවරත්වයක් සහිතව කෙරෙන්න ඕනෑ දෙයක්. එතකොට ඒකට අදාළ සැලසුම් තමයි මේ සකස් වෙන්නේ. එතකොට නිකම් බිල අඩු කරන්න බැහැ, කෙක්කෙන් කරන්නත් බැහැ. පුනර්ජනනීය බලශක්තියට යොමු වෙන්න, ඒකට අදාළ පසුබිම සකසන්න ඕනෑ. ඒ සියල්ල වෙනුවෙන් තමයි අපේ සැලසුම් සකස් වෙලා තිබෙන්නේ.

මුලිකව ආණ්ඩුව පත්වෙලා මාස 10ක් ඇතුළත අපට මේ ආකාරයේ පනත් කෙටුම්පතක් ගෙන එන්න සිද්ධ වුණේම, මීට කලින් පනතක් තිබුණු නිසා සහ ඒ පනත වෙනස් කරන්න අවශ්‍ය වුණු නිසායි. ඒ පනත සම්බන්ධයෙන් විවේචනයක් අපට මැතිවරණයට පෙරත් තිබුණා, දැනුත් තිබෙනවා. අපි මැතිවරණයට පෙර කියපු ආකාරයට දැන් අපට ඒක වෙනස් කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒක අලුත් දෙයක් නොවෙයි. මේක අපි මුල ඉඳලාම කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 පනත ගැන අපට මූලිකවම විවේචනයක් තිබුණා. මේ රට බංකොලොත් වෙලා ඔක්කෝම වෙලා ඉවර වුණාට පස්සේ, දැන් විදුලිබල මණ්ඩලය තුළ ප්‍රශ්න තිබෙනවා කියලා අපි පිළිගන්නවා. හැබැයි, ප්‍රශ්න විසඳන්න සාධනීය ප්‍රවේශයක් අවශ්‍යයි නේ. ඒ ප්‍රශ්න අතර මේගොල්ලෝ ආණ්ඩු, කරපු කරපු අවස්ථාවල සේවකයෝ බඳවාගන්න, -සේවකයෝ පුරවාගන්න- කටයුතු කර තිබෙනවා. ඒ නිසා මෙතැන අකාර්යක්ෂමතා තිබෙනවා. ඒ දේවල් තිබුණා. හැබැයි, නැවත ඒ මිනිසුන්ගේ ජීවිතත් සුරක්ෂිත කරන ගමන්, විදුලිබල මණ්ඩලයත් සුරක්ෂිත කරන ගමන්, රටේ ආර්ථික, දේශපාලන දිශාවත් සුරක්ෂිත කරන ගමන් තමයි මේක කරන්න ඕනෑ. මොකද, අපි මේ කථා කරන්නේ රටක බලශක්තිය ගැනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මේකේ කවරය විතරයි, වෙනත් කිසිම වෙනසක් නැහැ කියලා. ඊට කලින් කිව්වා, අපි මේක විසි කරනවාය කිව්වා කියලා. නැහැ, අපි විසි කරනවා කියලා කිව්වේ නැහැ. විසි කරනවා නොවෙයි, මේක වෙනස් කරනවා කියලා අපි කිව්වේ. මොකද, අපිත් පිළිගත්ත දේවල් දෙකක් තිබුණා. ප්‍රතිව්‍යුහගතකරණය අවශ්‍යයි. කාර්යක්ෂම කරන්න නම් ප්‍රතිව්‍යුහගතකරණය අවශ්‍යයි. ඒ වාගේම පෞද්ගලික අංශයේ ආයෝජන අපි පිළිගන්නවා. විදුලිබල මණ්ඩලයේ විදුලිය ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම කියන ඒවායින් විදුලිය ජනනය සහ බෙදා හැරීම සඳහා දැනටත් පෞද්ගලික අංශය ආයෝජනය කරලා තිබෙනවා. එහෙම නැතුව පුනර්ජනනීය බලශක්තිය තුළ අපි හිතන තරම් වේගවත් නැම්මක් ගන්න ලැබෙන්නේ නැහැ. අපි ඒක පැහැදිලිව ඉදිරිපත් කළා. නමුත්, කොටස් 12කට කඩන එක ඇතුළේ පැහැදිලිව තිබුණා, කොටස් 08ක් සම්බන්ධව සියයට 50ක් දක්වා පෞද්ගලික අංශයට විකුණන්න, නැත්නම් පෞද්ගලික අංශයට පවරන්න හැකියාව. අපි ඒක නැති කරලා තිබෙනවා. අපට විවේචනයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ ඒකට. මේකේ දෙපැත්තෙන්ම විවේචන එනවා. උදාහරණයක් විදියට, කවරය විතරයි, වෙන කිසිම වෙනසක් නැහැ කියලා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වාට, මීට මාස දෙකකට කලින් Ministry of Energy වෙත World Bank, ADB, JICA කියන සියල්ලෙන්ම ප්‍රසිද්ධ ලිපියක් එවලා තිබුණා. ඒ ලිපියෙනුත් ඔවුන් පිළිගෙන තිබෙනවා, මෙහි සියයට 100ක්ම අයිතිය රජය සතු වෙනවා කියලා.

World Bank එක පැත්තකින් තියන්නකෝ. නාමල් රාජපක්ෂ මහත්තයාගේ තාත්තා -මහින්ද රාජපක්ෂ මහත්තයා- ගිය අවුරුද්දේ මැයි මාසයේ 13වැනි දා පරණ විදුලිබල පනතට අදාළව ප්‍රසිද්ධ statement එකක් කරනවා. මාධ්‍යවල ඒ ලිපිය පළ වුණා, හොයලා බලන්න, ඒකේ කියනවා, "ඡන්දය අවසන් වෙනකල්වත් මේක කරන්න එපා. රාජ්‍ය දේපළ විකුණන එක කරන්න එපා" කියලා, ගිය අවුරුද්දේ මැයි 13වැනි දා පැවති පනත ගැනත් කියනවා. මේ පනත් කෙටුම්පතත් ඒකම නම්, නාමල් රාජපක්ෂ මැතිතුමා මෙතැනට ඇවිල්ලා කියලා හරියන්නේ නැහැ නේ. මහින්ද රාජපක්ෂ මහත්තයා ලියුමක්වත් ගහන්න එපා යැ. මේ පනත් කෙටුම්පත වෙනස්. ඒ වෙනස තමන්ට තේරෙන්නේ නැත්නම්, තමන් ඒවා ගැන කියවලා නැත්නම් ගෙදර ගිහිල්ලා තමන්ගේ පියාගෙන් හරි අහන්න ඕනෑ. ඒ නිසා තමයි එතුමා ලියුමක් ගහන්නේ නැතුව ඉන්නේ.

ඒ වාගේම අනෙක් පැත්තෙන් දිගටම අදහසක් හැදුවා -අද පාර්ලිමේන්තුවේ ඒක මතු වුණා අඩුයි. නමුත් පසුගිය කාලයේ පොඩි ආතතියක් හදලා තිබුණා- මේකෙන් විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට රැකියා අහිමි වෙනවා වාගේ දේවල් සිදු වෙනවා කියලා. ඒක ඉතාම වැරැදියි. මේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය තුළ මේ ඉන්න සේවකයන් එළියට දමන්න සැලැස්මක් නැහැ. ඒක පැහැදිලිව ඇමතිතුමාගෙනුත්, අනෙක් අයගෙනුත් කියැවුණා. හැබැයි, මෙහි සේවකයන් දැන ගන්න ඕනෑ, අපි මේ පනත වෙනස් කරලා මේ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම හරහා තමයි ඔවුන්ගේ රැකියා සුරක්ෂිත වෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මගේ අතේ තිබෙන්නේ 2024.09.18 දින ඡන්දයට දවස් තුනකට කලින් නිකුත් කළ circular එකක්. මේ circular එක විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබෙනවා, කැබිනට් තීරණයක් quote කරලා. මේකේ තිබෙනවා, 26,783ක් එවකට ඉන්න සේවක සංඛ්‍යාව අදියර තුනකින් 12,000 දක්වා අඩු කරන ආකාරය. මේක තමයි කරන්න නියමිතව තිබුණේ. එතකොට ඒ පනත වෙනස් කරලා, ඒ ප්‍රතිපත්තිය වෙනස් කරලා මේ හැරවුම අපි ජාතික ජන බලවේගය ආණ්ඩුවෙන් අරගෙන තිබෙන හින්දා තමයි සේවකයන්ගේ රැකියා සුරක්ෂිත වෙලා හෙට දවසේ වැඩ කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ගැන එහෙම බොරු පතුරුවන්න එපා කියා අපි කියනවා. අපි පැහැදිලිවම මුලින්ම කියලා තිබෙනවා වාගේ මේක ජාතික ප්‍රතිපත්තියක් යටතේ ක්‍රියාත්මක විය යුතු එකක්. බලශක්තිය කියන්නේ රටේ ස්වෛරීත්වයට බලපාන දෙයක්. ඒ වාගේම අපේ රටේ ඉදිරි ආයෝජන සැලැස්මට, අපේ රට ණය අර්බුදයෙන් ගොඩ යන එකට -මේ සියල්ලට- අපේ රටේ බලශක්තිය පිළිබඳව ඉදිරි සැලැස්මක් ඇතුව කටයුතු කිරීම හරහා තමයි පාර කැපෙන්නේ. ඒක ඉලක්ක කරගෙන පසුගිය ආණ්ඩුවලින් ගනිපු වැරැදි තීරණ ආපසු හරවන්න අදාළව අපි ගෙනෙන පනතක් මේක. මේක පැහැදිලිව අද ඊයේ නොවෙයි, ආණ්ඩුව පත් වෙච්ච දවසේ ඉඳන්ම, ඊට කලින් ඉඳන්ම සාකච්ඡා කරලා ඉදිරියට එන එකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡාවෙන් එහාට ගිහිල්ලා මේ කාරණය ගැනත් මම සඳහන් කරන්න ඕනෑ. අපි අද දවසේ විදුලිබල පනත් කෙටුම්පත ගැන කථා කරනවා නේ. ඊයේ දවසේත් මේ පාර්ලිමේන්තුව තුළ මේ රටේ තීරණාත්මක විවාදයක් තිබුණා. ඒ ගැන ඡන්දයක් තිබුණා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට, මේ පොලිස්පතිතුමා වැරැදි 23න් 19ක් සම්බන්ධයෙන් වැරැදිකරුවෙක් බවට කමිටුවෙන් ඔප්පු කරලා තිබෙනවා. මුළු රටම දන්නා කුප්‍රකට පුද්ගලයෙක්. ඊයේ විවාදයේදී නාමල් රාජපක්ෂ මහත්තයාට ඇරෙන්න කාටවත් ඒ ගැන විවාදයක් තිබුණේත් නැහැ. එහෙම තමයි තිබුණේ. හැබැයි, මම එක කාරණයක් ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මොකද, ඉතිහාසය අපි ලියද්දී මේ දේවල් වෙද්දී, මේ ඔක්කෝම සලකුණු වෙලා යන්න ඕනෑ. දැන් ඒ Debate එක කරලා ඉවරයි නේ. ඒකේ විවාදයක් නැති වුණත් මම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. ඊයේ දවසේ තමයි ඒ ගැන අවසන් ඡන්දය තිබුණේ. ඒ අවසන් ඡන්දයේදී මොකක්ද වුණේ? 177දෙනෙක් යෝජනාවට පක්ෂව ඡන්දය දුන්නා. ඉතුරු පිරිස ආවේ නැහැ. ඒ ඡන්දයේදී කාටවත් රෙද්දක් ඇඳගෙන විරුද්ධව ඡන්දය දෙන්න බැහැ. මේ රටේ හැමෝම දැකපු ඉතිහාසයකට තමයි ඊයේ ඒ ඡන්දය තිබුණේ. නාමල් රාජපක්ෂ මහත්තයා සහ ඔබතුමන්ලාගේ ඒක ගැන ගැටලුවක් නැහැ. කථාව කිව්වා, ස්ථාවරය ප්‍රකාශ කළා, ඡන්දය දීමෙන් වැළකී සිටියා. හැබැයි, මුළු විවාදය පුරාම සමඟි ජන බලවේගය අපිත් එක්ක තර්ක කළේ කොහොමද? අපට වඩා එතුමන්ලා තමයි මහන්සි වුණේ, දේශබන්දු මහත්තයා එළවන්න, නැත්නම් පත් වෙන එක නවත්වන්න, අපි මොනවාද කළේ කියන එකයි ඇහුවේ. විපක්ෂ නායකතුමා ඇතුළු හැමෝම ප්‍රශ්න කළේ,

[ගරු නජිත් ඉන්දික මහතා]

ඒක. හැබැයි, අවසානයේ ඡන්දයේදී මොකක්ද වුණේ? ඒ ප්‍රශ්නය අහපු අය ඇතුළුව මන්ත්‍රීවරුන් 40න්, 30ක් ඡන්දය දීලා නැහැ. මොකක්ද, ඒ කර තිබෙන්නේ? මෙතැන පාර්ලිමේන්තුවේ කථා කරලා යන එක නොවෙයි, ඔබ අපි හැමෝගේම ඡන්දයෙන් තමයි එතුමා අයින් කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට තත්පර 30ක් දෙන්න.

තුන් හතර දෙනෙක් ඡන්දය නොදී යන එක ගැන හිතා ගන්න පුළුවන් නේ. යම් යම් වැඩකටයුතු නිසා එහෙම වෙන්න පුළුවන්. නමුත් හතරෙන් තුනක් -40න්, 30ක්- කොහොමද ඡන්දය නොදා ඉන්නේ? ප්‍රබලයෝ කවුරුවත් නැහැ. කබීර් හෂීම් මහත්තයා නැහැ. දයාසිරි ජයසේකර මහත්තයා නැහැ. රංජිත් මද්දුම බණ්ඩාර මහත්තයා නැහැ. රවුෆ් හකීම් මහත්තයා නැහැ. අජිත් පී. පෙරේරා මහත්තයා නැහැ. සුජීව සේනසිංහ මහත්තයා නැහැ. නලින් බණ්ඩාර, රෝහණ බණ්ඩාර, රෝහිණී කවිරත්න, හර්ෂණ රාජකරුණා, ජගත් විතාන කියන මන්ත්‍රීවරුන් කවුරුවත් නැහැ. විවාදය වෙලාවේදී භාගයක් මේ සභාවේ හිටියා. ඒ නිසා ඡන්දය සලකුණු කරලා යන්න ඕනෑ. මොකද අපට වඩා ඔවුන් නම් කළේ, අපි එතැන ඉඳන් ටික නම් අරගෙන ගියේ, ඔවුන් ඡන්දය දෙන්න ඕනෑ. ඊයේ කළේ හරියට relay එකේ baton එක අරගෙන මෙහාට ඇවිල්ලා අපි baton එක දුන්නාට පස්සේ අනෙක් පැත්ත හැරිලා දිව්වා වාගේ වැඩක්. ඒක කළ යුතු දෙයක් නොවෙයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair and THE HON. PROF. SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 3.51]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறுகின்றேன். இன்று விவாதத்துக்கு எடுத்துக் கொள்ளப்பட்டுள்ள Sri Lanka Electricity (Amendment) Bill சம்பந்தமாக கௌரவ (கலாநிதி) ஹர்ஷ த சில்வா அவர்கள் தனது உரையில் நிறைய விடயங்களைத் தொட்டுச் சென்றார். அந்த விடயங்களோடு உடன்பட்டவனாக, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள மன்னார் மாவட்ட மக்கள் சார்பாக இங்கு ஒருசில விடயங்களை முன்வைக்க விரும்புகின்றேன்.

கடந்த இரண்டு - மூன்று தினங்களாக மன்னாரில் மக்கள் பாதையில் இறங்கி போராட்டம் நடத்தி வருகின்றார்கள். அதாவது, மன்னாரில் நடைபெறுகின்ற wind power திட்டத்துக்கு எதிராக உங்களுடைய Citizens Committeeஇன் தலைவர் Fr. Marcus அவர்களும் அந்தக் Committeeஇல் உள்ளவர்களும் பொதுமக்களும் அரசியல் பிரமுகர்களும் அரசியல் பேதங்களுக்கு அப்பால் ஒன்றுசேர்ந்து, தள்ளாடியில் இரவு பகலாக ஜனநாயக ரீதியான ஒரு போராட்டத்தை முன்னெடுத்து வருகின்றார்கள். ஏன் அவர்கள் போராட்டம் நடத்துகிறார்கள்? என்பதை அறியவேண்டிய அவசியம் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. Wind power திட்டத்துக்கு அல்லது அரசாங்கம் கொண்டுவருகின்ற அபிவிருத்தித் திட்டங்களுக்கு மன்னார் மக்களோ அல்லது மன்னார் மாவட்டத்தில் இருக்கின்ற மக்கள் பிரதிநிதிகளாகிய நாங்களோ எதிரானவர்கள் அல்லர். என்றாலும், இத்தகைய திட்டங்களைக் கொண்டுவரும்பொழுது, அங்குள்ள மக்களோடும் மக்கள் பிரதிநிதிகளோடும் பேசவேண்டிய தார்மீகப் பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. இந்தத் திட்டம் சம்பந்தமாக மக்களுடைய எதிர்ப்பு வந்தபொழுது, நாங்கள் DCC கூட்டத்தில் இந்த விடயத்துக்குப் பொறுப்பான அமைச்சரைச் சந்தித்து இது பற்றி பேச வேண்டுமெனச் சொன்னோம். அந்தக் காலப் பகுதியில் கௌரவ அமைச்சர் அவர்கள் மன்னாருக்கு வந்திருந்தார். எனினும், அவர் NPP அல்லது JVPஇனரை மாத்திரம் அழைத்துப் பேசிவிட்டுச் சென்று விட்டார். இந்தக் கலாசாரம் மாற வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அங்கு ஒரு முதலீட்டாளருக்கு ஏற்பாடுகளைச் செய்துகொடுக்கும்பொழுது, அதற்கு அங்குள்ள மக்களுடைய எதிர்ப்பு வரும்பொழுது, நாங்கள் அது பற்றி DCC கூட்டத்தில் சொல்லும்பொழுது, அது தொடர்பாக ஒரு முடிவை எடுப்பதற்கு நீங்கள் மன்னாருக்கு வந்து சம்பந்தப்பட்டவர்களுடன் கதைக்க வேண்டும். நீங்கள் இந்த முறைதான் முதன்முறையாக இந்தப் பாராளுமன்றத்துக்குத் தெரிவாகி வந்திருக்கிறீர்கள். ஆனால், நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் சுமார் 25 வருடங்களாக இருக்கிறோம். இவ்வாறான பிரச்சினைகள் வரும்பொழுது, உரிய அமைச்சர்கள் அந்தப் பகுதிகளுக்கு வந்து, அங்குள்ள அரசியல் தலைவர்களையும் மக்கள் பிரதிநிதிகளையும் சந்தித்து, அவர்களுடைய கருத்துகளையும் கேட்டறியவேண்டிய தார்மீகப் பொறுப்பு இருக்கிறது. அதனை மறந்து, சண்டித்தனமாகச் செயற்பட நீங்கள் முற்படுகிறீர்கள். நீங்கள் ஒன்றை நினைவில் வைத்துக் கொள்ளுங்கள்!

அதாவது, உங்களிடத்தில் 159 அல்லது 200 உறுப்பினர்கள் இருந்தால் என்ன, மன்னார் தீவுக்குள் சண்டித்தனத்தினூடாக எதையும் செய்வதற்கு நாங்கள் அனுமதிக்க மாட்டோம்.

நாங்கள் மக்களோடு மக்களாக நிற்போம். நீங்கள் பொலிஸாரை, STFஐ அனுப்பி அங்குள்ள மக்களைப் பயமுறுத்தி திட்டங்களை நடைமுறைப்படுத்த நினைத்தால், அதில் failஆகுவீர்கள் என்பதை நான் உங்களுக்குச் சொல்லிவைக்க விரும்புகின்றேன். நாளை நீங்கள் மன்னார் மாவட்ட பிரதிநிதிகளைச் சந்திக்க இருப்பதாக நாங்கள் அறிகின்றோம். பரவாயில்லை! நாளையாவது நாங்கள் சந்திப்போம். நான் உங்களுக்கு ஒன்றைச் சொல்லி வைக்க விரும்புகின்றேன். அதாவது, உங்களுடைய நல்ல விடயங்களுக்கு எங்களுடைய ஆதரவு என்றும் இருக்கும். எனினும், அவற்றை முன்னெடுக்கும்போது, உரிய பிரதேசத்திலுள்ள மக்களினதும் மக்கள் பிரதிநிதிகளினதும் கருத்துகளைக் கேளுங்கள்! நாங்கள் நல்ல விடயங்களுக்கு எதிரானவர்கள் அல்லர்.

Mannar Island என்பது ஓர் அழகான தீவு! அது இந்த நாட்டில் இருக்கின்ற ஒரேயொரு internationally renowned island. ஏற்கெனவே, அங்கு wind power திட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டு இருக்கின்றன. அதனால் இன்று அங்கு மக்கள் வாழ முடியாத சூழ்நிலை ஏற்பட்டு இருக்கின்றது; மீன்பிடிக்க முடியாத சூழ்நிலை ஏற்பட்டு இருக்கின்றது. இவ்வாறான முதலீட்டாளர்களை அங்கு கொண்டுசெல்வதால் அங்குள்ள மக்களுக்கு ஐந்து சதம்கூட பிரயோசனம் இல்லை. CEBஇல் Mannar Islandஐச் சேர்ந்த ஒருவருக்குக்கூட வேலைவாய்ப்பு இல்லை. ஆனால், அங்கு நூற்றுக்கணக்கான 'மெகாவொட்' மின்சாரம் உற்பத்தி செய்யப்படுகின்றது. அந்தத் திட்டத்தால் அங்குள்ள மக்கள் எந்தவிதமான நன்மையும் அடையாமல் இருக்கிறார்கள்; அவர்களின் மீன்பிடிக்கும் அப்பிரதேசத்தின் சுற்றுலாத்துறைக்கும் பாதிப்பு ஏற்படுகின்றது. இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையில் பாலம் அமைக்கப்பட்டால், ஒரு காலத்தில் அந்தப் பிரதேசம் பொருளாதார முக்கியத்துவம் வாய்ந்த ஒரு பிரதேசமாக மாறும். தயவுசெய்து, அதனை இல்லாமல் செய்யக்கூடிய வேலைகளைச் செய்யாதீர்கள்! அங்குள்ள கனிய வளத்தை எடுப்பதற்காக அவுஸ்திரேலிய கம்பனி, சீனக் கம்பனி எனப் பல கம்பனிகள் அங்கு சென்றிருக்கின்றன. எனவே, Mannar Islandஐக் காப்பாற்றவேண்டிய பொறுப்பு எங்களுக்கு இருக்கின்றது; எங்களுடைய எதிர்காலச் சந்ததியினருக்கு இருக்கின்றது. அதனால்தான் நான் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன், மன்னார் தீவுக்கு வெளியே இருக்கின்ற பெரிய நிலப்பரப்பை உடைய பகுதிகளுக்கு இந்தத் திட்டத்தை மாற்றுங்கள் என்று.

இப்போது எமது நாட்டில் இஸ்ரேலியர்களின் ஆதிக்கம் அதிகரித்து வருகின்றது. இந்த விடயம் அரசாங்கத்தில் இருக்கின்ற கௌரவ முனீர் முலாபர் மௌலவிக்கும் தெரியும்! இன்று முஸ்லிம் சமூகம் மட்டுமல்ல, உலகத்தில் நியாயத்தை எதிர்பார்க்கின்ற அத்தனை பேரும் இஸ்ரேலின் அடாவடித்தனத்துக்கு எதிராகக் குரல் கொடுக்கின்றார்கள். பச்சிளம் பாலகர்களைக்கூட கொன்று குவிக்கின்ற கொடுமையாளர்கள்தான் இஸ்ரேலியர்கள்! அந்தக் கொடுமையாளர்களும் அவர்களுடைய இராணுவத்தினரும் rest எடுக்கின்ற இடமாக இன்று இலங்கை மாறியிருக்கின்றது. நீங்கள் அவர்களுக்கு free visa கொடுத்திருக்கிறீர்கள். இன்று அவர்கள் அறுகம்பை பகுதியில் காணிகளை வாங்குகின்றார்கள்; ஹோட்டல் அமைக்கின்றார்கள்; 'ஆட்டோ' ஓட்டுகின்றார்கள்; motorcycle ஓட்டுகின்றார்கள். Immigration தூங்கிக்கொண்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, அவர்களை இன்னும் தட்டிக்கொடுக்கிறார்கள். ஆனால், இந்தியாவில் இருந்து கொண்டுவரப்பட்ட harvest machinesஐ ஓட்டுவதற்காக அங்கிருந்து வந்த ஒரு சிலர் எமது பகுதியில் வேளாண்மை அறுவடையில் ஈடுபட்டுக்கொண்டு இருக்கும்போது, "உங்களுடைய 'விசா' காலம் முடிந்துவிட்டது, நீங்கள் tourist visaஇல் வந்திருக்கிறீர்கள்" என்று கூறி, உடனேயே அவர்களை இந்தியாவுக்கு அனுப்பி விட்டார்கள். அதனால் அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை, வன்னி போன்ற பிரதேசங்களில் வேளாண்மையை முழுமையாக அறுவடை செய்ய முடியாமல் மக்கள் கஷ்டப்படுகின்ற நிலையை நாங்கள் காண்கின்றோம்.

நீங்கள் இந்தியர்களுக்கு இவ்வாறு செய்துவிட்டு, இஸ்ரேலியர்களை மாலை போட்டு வரவேற்கிறீர்கள்; visa இல்லாமல் அவர்களை வரவழைக்கிறீர்கள். அவர்கள் தங்களது driving licenceஐ வைத்துக்கொண்டு 'ஆட்டோ' ஓட்டுகிறார்கள். அதுமாத்திரமன்றி, அங்கிருக்கின்ற சாதாரண மக்களுடைய தொழில்களையும் கைப்பற்றிக் கொள்கிறார்கள். அவர்கள் அங்கு சலூன் நடத்துகிறார்கள்; கடை நடத்துகிறார்கள்; bars நடத்துகிறார்கள்; ஹோட்டல் நடத்துகிறார்கள்; 'ஆட்டோ' ஓட்டுகிறார்கள். அந்த அளவுக்கு இந்த நாட்டை குட்டி இஸ்ரேலாக மாற்றுகின்ற மிக மோசமான செயற்பாடுகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. தயவுசெய்து, இதில் கவனம் செலுத்துங்கள்! இல்லையென்றால், பலஸ்தீன் மக்களுக்கு நடந்ததுபோல, இலங்கை மக்களுக்கும் ஏற்படும். சொந்த நாட்டையே இழக்கவேண்டிய நிலை இலங்கையர்களுக்கு ஏற்படும் என்பதைச் சொல்லி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.58]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

உண்மையிலேயே இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் கொண்டுவரப்பட வேண்டியது காலத்தின் தேவையாகும். நான் மின்சார சபை ஊழியராகக் கடமையாற்றி இருக்கின்றேன். அன்றைய காலகட்டத்தில் அசமந்தப்போக்குடன் பல திட்டங்களை முன்னெடுத்ததன் நிமித்தமாகத்தான் இன்று நாட்டு மக்கள் மின் கட்டணத்தைச் செலுத்த முடியாமல் பாரிய பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றனர். எம்மைப் பொறுத்தவரை, பயணிக்கவேண்டிய பாதையொன்று இருக்கின்றது. அந்தப் பாதையில் பயணிப்பதற்குச் சிறந்த சட்டங்கள் இந்த நாட்டுக்குத் தேவையென்ற அடிப்படையிலேயே, இந்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டு இருக்கிறது. அதையிட்டு, நான் பெருமகிழ்ச்சி அடைகின்றேன்.

[ගරු කේ. ඉලංකුමාරන් මහතා]

கடந்த காலத்தில் 23,000 மின்சார சபை ஊழியர்களில் அரைவாசிப் பங்கினரை வெளியேற்றுவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டு இருந்தது. ஆனால், எமது அரசாங்கம் அந்த ஊழியர்களின் தொழிலை இந்தச் சட்டமூலத்தின் ஊடாக உறுதிப்படுத்தி இருக்கின்றது. அவர்களின் தொழிலுக்கு எந்த வகையிலும் பங்கம் ஏற்படாத வகையிலேயே இந்தத் திருத்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டு இருக்கின்றது. இந்த 23,000 ஊழியர்களது வேதனங்களையோ, கொடுப்பனவுகளையோ, சலுகைகளையோ குறைக்காத வகையிலேயே நாங்கள் இச்சட்டமூலத்தைத் தயாரித்து இருக்கின்றோம். தனியாரும் மின்சாரத் துறையில் பாரியளவில் முதலீடு செய்வதற்கு எத்தனிக்கிறார்கள். மின்சாரம் என்பது ஒரு நாட்டின் அத்தியாவசிய தூண் என்றே நாங்கள் நினைக்கின்றோம். தொழில்நுட்ப வளர்ச்சியால் எமது நாட்டுக்குள் electric cars வருகின்றன; மின் பாவனை அதிகரிக்கின்றது. எமது அரசாங்கத்தின் இலக்குகூட, எதிர்வரும் காலத்தில் தெற்காசியாவில் மின் கட்டணம் குறைந்த நாடாக எமது நாடு இருக்க வேண்டும் என்பதுதான். அதைச் செய்ய முடியுமென நாங்கள் திடமாக நம்புகின்றோம். அந்தப் பாதையில் பயணிப்பதற்கு ஏற்ற வகையிலும், நாட்டுக்கும் நாட்டு மக்களுக்கும் எதிர்காலச் சந்ததியினருக்கும் பாதகம் இல்லாத வகையிலுமே நாங்கள் இந்தச் சட்டமூலத்தைக் கொண்டுவந்து இருக்கின்றோம். எதிர்வரும் காலத்தில் மின்சார சபையைப் பலப்படுத்தி, மக்களுக்குக் குறைந்த விலையில் மின்சாரத்தை வழங்குவதே எமது இலக்காகும்.

மன்னாரில் நடைபெறுகின்ற நடவடிக்கைகளை மையப்படுத்தி பலர் இன்று எம்மைக் குறைகூறுகின்றார்கள். கடந்த காலத்தில் மன்னாரில் காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை மேற்கொள்ளும்போது அசமந்தப்போக்குடன் நடவடிக்கைகளை எடுத்திருக்கிறார்கள். அதன் விளைவையே இன்று நாங்கள் அனுபவிக்கின்றோம். ஆனாலும், விஞ்ஞான ரீதியாக ஆய்வுகளைச் செய்யவேண்டிய கடப்பாடு எங்களுக்கு இருக்கின்றது. நாளைய தினம் பாராளுமன்றத்தில் கௌரவ வலுசக்தி அமைச்சரை வன்னித் தேர்தல் மாவட்ட நாடாளுமன்ற உறுப்பினர்கள் சந்திக்க இருக்கிறார்கள். அதன்போது, அவர்களுக்கு காற்றாலை மின் உற்பத்தி தொடர்பான சில விடயங்களைத் தெளிவுபடுத்துவதற்கு நாங்கள் நடவடிக்கை எடுத்து இருக்கின்றோம். இங்கு பேசிய சக பாராளுமன்ற உறுப்பினர் கூறியிருந்தார், "கௌரவ அமைச்சர் அவர்கள் மன்னாருக்கு விஜயம் செய்தபோது அங்குள்ள மக்கள் பிரதிநிதிகளைச் சந்திக்காமல் NPP உறுப்பினர்களைச் சந்தித்துவிட்டுப் போய்விட்டார்" என்று.

கௌரவ அமைச்சர் அவர்களின் மன்னார் விஜயமானது, தனிப்பட்ட ஒரு விஜயமாகவே அமைந்திருந்தது. அவர் மடு தேவாலயத்துக்குச் சென்று, அங்கு வழிபாடுகளை மேற்கொண்டு, மதகுருவைச் சந்தித்துவிட்டுச் சென்றிருக்கிறார். அதைப் பிழையாக விளங்கிக்கொண்டு, தங்களுடைய அரசியல் நலனுக்காக இவ்வாறான சந்தர்ப்பத்தைப் பயன்படுத்துகின்றனர். குறித்த உறுப்பினர் கடந்த காலத்தில் எவ்வாறு செயற்பட்டார் என்பது எங்களுக்குத் தெரியும்! காடுகளையும் இயற்கை வளங்களையும் தான்தோன்றித்தனமாக அழித்துவிட்டு, இப்போது இங்கு வந்து ஊளையிடுகின்றார். அவ்வாறானவர்கள் கூறுவதை நம்பாது மக்கள் உண்மையை உணர்வார்கள் என்ற திடமான நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. பலர் இந்தச் சபையைப் பிழையாக வழிநடத்த நினைக்கின்றார்கள். நாங்கள் மக்களுடைய பக்கமே நிற்போம். மக்களுக்கும் நாட்டுக்கும் பங்கம் ஏற்படாத அபிவிருத்திகளை முன்னெடுப்பதற்கே நாங்கள் நினைக்கின்றோம். முன்னைய அரசாங்கங்கள் அவ்வாறான நடவடிக்கைகளை எடுக்கவில்லை.

கடந்த காலத்தில் தேர்தலுக்காக அரச திணைக்களங்களைப் பயன்படுத்தினார்கள். நான் மின்சார சபையின் ஊழியராக இருந்த காலத்தில் நடந்ததைச் சொல்கின்றேன். அமைச்சர் ஒருவர் வருவதென்றால், அங்கு பாரிய வேலைத்திட்டங்கள் நடக்கும்; மக்களுடைய பணம் வீண்விரயம் செய்யப்படும். அதுமாத்திரமல்ல, தேர்தல் காலத்தில் விவசாயிகளுக்கு மின் கட்டணத்தைக் குறைக்கப்போவதாக பாரியளவில் பிரசாரம் செய்தார்கள். அன்று அமைச்சராக இருந்த ஒருவர் அங்குள்ள தோட்டத்துக்குச் சென்று தண்ணீர் பாய்ச்சுவதற்குக்கூட, வெள்ளை மண்ணை போடச் சொல்லி உத்தரவு இட்டார். ஏனெனில், அவருடைய வேட்டியில் செம்மண் பட்டுவிடுமாம். அப்போது அங்கிருந்த விவசாயி கூறினாராம், "நீங்கள் தோட்டத்துக்கு வெள்ளை மண்ணைப் போடுவதால் எமது விவசாய நிலம் பாதிக்கப்படும்" என்று. அதனைக் கவனத்திற்கொள்ளாமல் அங்கு வெள்ளை மண்ணைப் போட்டார்கள். வெள்ளை மண்ணைப் பரப்பிய பிறகுதான் அவர் தோட்டத்துக்குத் தண்ணீர் பாய்ச்சினார். இதனை நான் எனது கண்களூடாகக் கண்டேன். அவ்வாறானவர்கள்தான் கடந்த காலங்களில் அமைச்சர்களாக இருந்தார்கள். ஆனால், இன்று எமது அமைச்சர்கள் எல்லா இடங்களுக்கும் இலகுவாகச் சென்று வருகின்றார்கள்.

நான் இந்த இடத்தில் இன்னுமொரு விடயத்தைக் கூற வேண்டும். அதாவது, நீதி அமைச்சர் அவர்கள் கூறியதாக பொய்யானதொரு தகவலை நேற்று பின்னேரம் இங்கு உரையாற்றிய சக பாராளுமன்ற உறுப்பினர் ஒருவர் கூறியிருந்தார். செம்மணிப் புதைகுழி விவகாரம் செவிவழி வந்த செய்தியென கௌரவ அமைச்சர் அவர்கள் கூறியதாக அவர் கூறினார். கௌரவ அமைச்சர் அவர்கள் அவ்வாறு கூறவில்லை. நானும் அந்த இடத்தில்தான் இருந்தேன். கௌரவ சிறீதரன் அவர்கள் மண்டைதீவில், மண்கும்பானில் மனித புதைகுழி இருப்பதாக கருத்துத் தெரிவித்தபோது, கௌரவ நீதி அமைச்சர் அவர்கள், " இவ்வாறான தகவல்கள் செவிவழியாகத்தான் வருகின்றன. அதனை உறுதிப்படுத்த வேண்டுமென்றால், நீங்கள் சட்டத்துறையை நாடுங்கள் அல்லது குற்றப்புலனாய்வுத் திணைக்களத்தில் முறைப்பாடு செய்யுங்கள்! வழக்குகளைத் தொடரும்போது அது தொடர்பான நடவடிக்கைகளை எடுப்பதற்கு நாங்கள் ஆயத்தமாக இருக்கின்றோம்" என்றுதான் கூறியிருந்தார். ஆனால், செம்மணிப் படுகொலை விவகாரம் செவிவழியாக வந்த தகவல் என்று கௌரவ நீதி அமைச்சர் அவர்கள் கூறியதாக சக பாராளுமன்ற உறுப்பினர் இங்கு கூறி, இந்தச் சபையை பிழையாக வழிநடத்தினார்.

எமது அரசாங்கத்தால்தான் அந்தப் புதைகுழிகளைத் தோண்டுவதற்கு நிதி விடுவிக்கப்பட்டு, நடவடிக்கைகளும் எடுக்கப்பட்டு வருகின்றன. இந்த நிலையில், இவ்வாறு பாராளுமன்றத்தில் கூறுவதனூடாக மக்களிடம் பிழையான தகவல்களைச் கொண்டு சேர்க்கிறார்கள். ஆனால், மக்கள் உண்மையை உணர்வார்கள் என்ற திடமான நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. உண்மை என்றும் வெல்லும்! நாங்கள் பயணிக்கும் பாதை இன்னும் நான்கு வருடங்களுக்கு மேல் செல்லும் என்ற திடமான நம்பிக்கையும் எங்களுக்கு இருக்கின்றது. ஏனெனில், நாங்கள் மக்களுக்குக் கடுகளவேனும் துரோகம் செய்யப்போவதில்லை. குறித்த உறுப்பினர் மக்களைக் குழப்பும் விதமான நடவடிக்கைகளை

மேற்கொள்வதற்குக் காரணம், நாங்கள் இவ்வாறான சட்டத் திருத்தங்களைக் கொண்டுவரும்போது அதைக் குழப்பியடித்து அதில் குளிர்காய்வதற்குத்தான். அவ்வாறானவர்கள்தான் இங்கு இருக்கிறார்கள். எதிர்வரும் காலத்தில் மக்களின் மனங்களை வென்று, அவர்கள் உலகளாவிய ரீதியில் 'இலங்கைப் பிரஜைகள்' என்று தற்றுணிவுடன் கூறுமளவுக்கு, இந்த நாட்டைச் சிறந்ததொரு நாடாக உருவாக்கியே தீருவோம் என்று இந்த இடத்தில் கூறி, விடை பெறுகின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. විශේෂයෙන්ම අරුගම්බේ සහ ඊශ්‍රායලය පිළිබඳව කරුණු කාරණා පැහැදිලි කළා. මම හිතන විධියට, අපි දේශපාලනය කරනකොට අවංක විය යුතුයි. වර්තමාන රජය යටතේ නොවෙයි මේ තත්ත්වය රට තුළ උදා වුණේ. එතුමන්ලා තර්ක කරනවා නම්, ඉතිහාසය අරගෙන බැලුවා නම්, එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව යටතේ ඒ සඳහා සියලු සහයෝගය ලැබුණා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඉතාම කෙටියෙන් ප්‍රකාශ කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
විශේෂයෙන්ම මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. අරුගම්බේ ප්‍රදේශයේ ජීවත් වන වෛද්‍යවරු ඇතුළු විවිධ පාර්ශ්ව අද දිනත් මේ පිළිබඳව සඳහන් කළා. අපි දේශපාලනය කරමු. හැබැයි, ඒ දේශපාලනය ජාතිවාදයෙන් තොරව, ආගම්වාදයෙන් තොරව ශ්‍රී ලාංකිකත්වය අගය කරමින් කරමු කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[4.06 p.m.]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
Hon. Presiding Member, the new Sri Lanka Electricity (Amendment) Act of 2024, being a bold move to restructure the CEB, does not go far enough in creating a transparent, competitive and future-proof organizational and institutional structure. Therefore, the Amendments proposed by this Government have been introduced to bring in critical structural changes and digital innovations needed to ensure that the electricity sector could serve our citizens efficiently, attract investments, reduce tariffs and pave the way for a future of sustainable energy.

The people of this country gave this Government a clear mandate to reform the broken systems, dismantle inefficiencies, end corruption and to deliver affordable and reliable services to all. As articulated in the NPP Energy Policy, our energy transition by restructuring one monolithic organization such as the CEB would increase efficiency and transparency, inviting innovation and putting the people at the centre of the energy system.

Sir, I will briefly explain a few main structural changes proposed by these Amendments. Planning and procurement, dispatching of electricity and its system operation will be done by the National System Operator - NSO - which will be 100 per cent owned by the Government. The National Transmission Network Service Provider will handle the power flow from generating companies to distribution companies, again 100 per cent owned by the Government. However, there could be additional players of providing transmission services based on the national requirement. Multiple generation companies including those generating renewable energy and Independent Power Producers - IPPs - will compete to provide electricity at a lower price. Then, multiple distribution companies will serve the consumers. The existing distribution arm of the CEB will be restructured into a separate organization 100 per cent owned by the Government and new distribution companies may come up in the future.

Introduction of competitive bidding to build power plants and bulk purchase of electricity by NSO is essential in driving down costs and improving service quality. Sri Lanka is not alone in this journey. Many countries which started with a monolithic government organization for electricity, that is to handle from generation to distribution, like the CEB have successfully navigated in this path of restructuring. For example, Australia introduced real-time electricity bidding and day -ahead power procurement through its National Electricity Market - NEM. That has led to lower prices and improved reliability. Through Tenaga Nasional Berhad -TNB, Malaysia unbundled its operations while retaining government control in transmission. Independent Power Producers now generate a significant portion of electricity under competitive frameworks in

[ගරු එරංග වීරරත්න මහතා]

that country. India also reformed its State-owned electricity boards into separate generation, transmission and distribution entities. Singapore operates its electricity sector under the Energy Market Authority - EMA - allowing consumers to choose among multiple electricity retailers. The market features real-time wholesale trading, smart grid integration and strict regulatory oversight to ensure competition, reliability and low system losses. South Africa, too, currently undergoes unbundling of Eskom into three separate entities for generation, transmission and distribution to overcome chronic inefficiencies and load shedding.

In this restructuring, digitalization is not optional, but would be the foundation to make our electricity sector more efficient, accountable and more affordable. For example, smart grids will enable automated real-time monitoring, reduce technical losses and allow catering for flexible demands from customers. Then, smart meters would empower consumers to monitor their usage of electricity and shift consumption during peak times, support for prepaid electricity and eliminate billing errors, which happen in the current way of doing business. AI and data analytics will optimize grid operations, forecast demand, predict failures and support preventative maintenance, thereby reducing operational costs. Digital tendering and procurement platforms for transparent, competitive and auditable procurements are mandatory. Also, land management portals will fast-track project approvals and give investors clear, real-time access to land availability, reducing delays and risks. So, at the end of the day, digitalization will empower the citizen, improve investor confidence and drastically reduce the cost of electricity through operational excellence.

Sir, one main question asked by the Opposition and the public is, will this restructuring reduce the tariff? The short answer is, yes, but with a realistic and phased approach. So, immediate cost reductions will come from introducing competition in power procurement, phasing out costly emergency power purchases, reducing technical and commercial losses and leveraging digital efficiencies. The other question asked is whether there will be an issue for the current workforce. This reform is not for dismantling of the workforce, but for transformation of the institution. The proposed Amendments include a 100 per cent government-owned employees' fund to secure pensions and welfare. Then, there will be employment guarantee for the employees in this transition to the new institutions under this new restructuring or the excess employees could go on voluntarily retirement through a VRS, safeguarding the current staff and their rights. Also, this restructuring involves training and upskilling of the current CEB employees to take on the future-ready roles. Then, transparent communication and HR restructuring to prevent uncertainty and fear are also included in the plan.

In conclusion, I would like to say that these Amendments present a critical step in unleashing the true potential of Sri Lanka's electricity sector. They reflect our commitment to the people's mandate, our confidence in technology and our responsibility to future generations.

Let us rise above short-term political goals and act in the long-term national interest. Let us make electricity efficient, affordable, transparent and digital, as in any modern economy. I urge this House to pass these Amendments not for political credit, but for the benefit of the people we have been elected to serve.

I thank you, Sir, for giving me the opportunity to speak in this Debate.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.14]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் சம்பந்தமான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதில் மகிழ்ச்சி அடைகின்றேன்.

அதலபாதாளத்தில் இருக்கின்ற இந்த நாட்டின் பொருளாதாரத்தை மையமாக வைத்து, எல்லா விடயங்களிலும் வரி விதிக்கின்ற ஒரு நிலைமையையே நாங்கள் பார்க்கின்றோம். அதுபோன்றுதான் இலங்கை மின்சார சபையை மாற்றி அமைப்பதற்கான சீர்திருத்தங்களையும் நாங்கள் பார்க்கவேண்டி இருக்கின்றது. குறிப்பாக, இலங்கையில் பொருளாதார நெருக்கடி ஏற்பட்ட காலத்தில் சுமார் 5 இலட்சம் மின்பாவனையாளர்களின் மின் இணைப்பு துண்டிக்கப்பட்டது. அந்த மக்களுடைய பிரச்சினைக்கு என்ன தீர்வு எட்டப்பட்டு இருக்கிறது என்பதை நான் இந்த அவையில் கேட்க விரும்புகின்றேன்.

இந்த நாட்டின் பொருளாதாரத்தையும் கடனையும் மாற்றி அமைக்கின்ற ஒரு நிகழ்ச்சிநிரலில், சாதாரண ஏழை எளிய மக்களுடைய அல்லது அரச உத்தியோகத்தர்களுடைய வருமானத்தைப் பெற்று, இலங்கை மின்சார சபைக்குச் செலுத்துகின்ற ஓர் அலகுக்கான கட்டணத்தைக் குறைப்பதற்கு அல்லது இந்த நாட்டிலுள்ள சாதாரண தொழில் நிறுவனங்களை முன்னெடுத்துச் செல்கின்ற, தொழில்வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுக்கின்ற தொழில் முனைவோருக்கு ஏதாவது சலுகைகளை வழங்குவதற்கு இந்த மாற்றங்கள் செய்யப்பட இருக்கின்றதா? என்றால், இல்லை! நாட்டின் பொருளாதார நெருக்கடிக்கு கடந்த அரசாங்கங்கள்தான் காரணம் என்று வாய்கூசாமல் சொல்கின்ற இந்த அரசாங்கம், அதனை விடவும் மிக மோசமான, படுபாதாள நிலைக்கு இந்த நாட்டிலுள்ள ஏழை எளிய மக்களைக் கொண்டுசெல்வதை நாங்கள் பார்க்கின்றோம். கடந்த அரசாங்கங்களைக் குறைசொல்கின்ற இந்த அரசாங்கம், அந்த அரசாங்கங்களால் முன்னெடுக்கப்பட்ட வேலைத்திட்டங்களை அதே பாணியில் தொடர்ந்து முன்னெடுப்பதைத்தான் இதிலும் நாங்கள் பார்க்கின்றோம்.

இன்று நாங்கள் எங்களுடைய பிரதேசங்களுக்குச் சென்றால், அங்குள்ள ஏழை எளிய மக்கள் எங்களிடம் வந்து, "எங்களுடைய வீட்டின் மின் இணைப்பு துண்டிக்கப்பட்டு விட்டது. அதனை மீளப் பெற்றுவதற்கு உதவி செய்யுங்கள்! குடிநீர் இணைப்பு துண்டிக்கப்பட்டுவிட்டது. அதனை மீளப் பெறுவதற்கு உதவி செய்யுங்கள்!" என்று கூறுகின்றார்கள். இவ்வாறு சாதாரண பொதுமக்கள் கூறுகின்ற அளவுக்கு இந்த நாட்டின் எல்லா விடயங்களும் காணப்படுகின்றன. எனவே, இதில் மாற்றத்தைக் கொண்டுவர வேண்டும். முன்னர் 20,000 ரூபாய்க்கு உட்பட்ட தொகையைச் செலுத்தி புதிய மின் இணைப்பைப் பெறுவதற்கு வாய்ப்பு இருந்தது. அதுமாத்திரமன்றி, மின் இணைப்பைப் பெறுவதற்கு 'சமுர்த்தி', 'அஸ்வெசும' பயனாளிகளுக்கு மிகக் குறைந்தளவு கட்டணத்தையே விதித்திருந்தார்கள். மானிய அடிப்படையில் புதிய மின் இணைப்பைப் பெறுவதற்கான திட்டங்களும் கடந்த அரசாங்க காலத்தில் இருந்தன. ஆனால், இந்த அரசாங்கத்தில் எதுவுமே இல்லை. "ஊழலைத் தடுப்போம்; ஏழைகளைப் பாதுகாப்போம்!" என்று கூறி ஆட்சிக்கு வந்த இந்த அரசாங்கம், அது சம்பந்தமாக எந்தவிதமான நடவடிக்கையையும் எடுத்ததாகத் தெரியவில்லை.

இலங்கை மின்சார சபை தொடர்பில் கொண்டுவரப்பட்டுள்ள மாற்றங்களால் ஏழைகளுக்கும் சாதாரண சம்பளம் பெறுகின்ற அரச உத்தியோகத்தர்களுக்கும் எந்தவிதமான நன்மையும் கிடைப்பதாகத் தெரியவில்லை. இன்று தொலைபேசிக் கட்டணம், நீர்க் கட்டணம், மின் கட்டணம், பிள்ளைகளின் பாடசாலை உபகரணங்கள் கொள்வனவு என்பவற்றை மேற்கொண்டால், அரச உத்தியோகத்தர்கள் எடுக்கின்ற சம்பளம் வீடுவந்து சேராத ஒரு சூழலே காணப்படுகின்றது. எனவே, இந்நிலையை மாற்றியமைப்பதற்கான திட்டங்களையும் இதில் இணைத்துக்கொண்டு, எதிர்வரும் காலங்களில் சிறந்த சேவைகளை மக்களுக்கு வழங்குவதற்கு இந்த அரசாங்கம் முன்வர வேண்டுமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්කම් ඉල්යාස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.18]

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම පිළිතුරක් දෙන්න කැමැතියි, කලින් කථා කරපු ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාට. එතුමා කිව්වා, මන්නාරම කියන්නේ ධන උල්පතක් කියලා. ඒ ධන උල්පතේ තිබෙන ආයෝජනවලින් ප්‍රයෝජන ගන්න එපා වාගේ කථාවක් එතුමා කිව්වා. එතුමා මේ ධන උල්පත නියෝජනය කරමින් අවුරුදු 25ක් මන්ත්‍රී කෙනෙක් සහ ඇමති කෙනෙක් විධියට ඉඳලාත් තවමත් එම දිස්ත්‍රික්කය ලංකාවේ තිබෙන දුප්පත්ම දිස්ත්‍රික්කයක් කියලා ඇත්තටම මම හිතනවා. ඒ ජනතාවත් ලංකාවේ සිටින දුප්පත්ම ජනතාවක්. ජාතික ජන බලවේග ආණ්ඩුවක් වශයෙන් අපි ඒ පැත්තට ගොඩක් ආයෝජන අරගෙන යද්දී, ඒවාට අකුල් හෙළන්න එපා කියලා මුලින්ම මම කියනවා.

විශේෂයෙන්ම ඒ පැත්තේ තිබෙන ඛනිජ ද්‍රව්‍ය වෙනත් ප්‍රදේශවල සිටින ව්‍යාපාරිකයන්ට දීලා, ඒ ව්‍යාපාරිකයන්ට අවස්ථා ලබා දෙනවාට වඩා අපි උත්සාහ කරනවා, ඒ ආයෝජනවලින් ඒ ප්‍රදේශයේ ජනතාව අනිවාර්යයෙන් දියුණු තත්ත්වයට පත් කරලා ඇත්තටම පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගත කරන්න පුළුවන් අවස්ථාව ඔවුන්ට උදා කිරීමට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගත්තොත්, විදුලිය අද ලෝකයේ මූලික අවශ්‍යතාවලින් ප්‍රමුඛතම එකක් බවට පත්වෙලා තිබෙනවා. අඛණ්ඩව පැය 24 පුරා විදුලිය සැපයීම සහ දරාගත හැකි සාධාරණ මුදලකට විදුලිය සැපයීම යන මූලික නිර්ණායකවලට වඩා බොහෝ ඈතට අද ලෝකය ගමන් කරලා තිබෙනවා. තරගකාරී මිල ගණන් යටතේ විනිවිදව, කාර්යක්ෂමව විදුලි අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කටයුතු කරමින් සිටින යුගයක අද අපි ඉන්නේ. විශේෂයෙන්ම ගුණාත්මක, ප්‍රමාණාත්මක සේවයක් තරගකාරී වෙළෙඳ පොළක් යටතේ ඇති කිරීම මඟින් අපට විශාල වාසි රාශියක් රටක් වශයෙනුත්, පාරිභෝගිකයන් වශයෙනුත් ලබා ගැනීමේ අවස්ථා මෙම පනත් සංශෝධනය හරහා ලැබිලා තිබෙනවා. විශේෂයෙන් සියලු පාර්ශ්වයන්ගේ ශුභසිද්ධිය පිළිබඳව ඉතා පුළුල්ව අධ්‍යයනය කරලා තමයි අපි මෙම ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ සංශෝධනයේ වටිනාම පාර්ශ්වය වන්නේ ලංකාවේ ඉන්න මිලියන 7ක පමණ විදුලි සම්බන්ධතා ඇති පාරිභෝගිකයන්. මේ අයගේ අවශ්‍යතා සපුරාලීම තමයි මෙහි මූලිකම පරමාර්ථය.

දැන් ලංකාවේ පැය 24 පුරා විදුලිය දෙනවා කියනවා. ඒ වාගේම සියලු පුරවැසියන්ට විදුලිය සැපයීම ගත්තොත්, සියයට 100ක් ආවරණය කර තිබෙන බවත් කියනවා. නමුත් මම ජීවත් වන මාතර ප්‍රදේශයේත් තවම විදුලි supply එකේ ප්‍රශ්න තිබෙනවා. කර්මාන්ත පුරවරයට 220ක voltage එකක් හරියට ලබා ගන්න බැරි තත්ත්වයක් තවමත් තිබෙනවා. මෙන්න මේවා හරියට කළමනාකරණය කරමින් ජනතාව වෙනුවෙන්, ඒ වාගේම පාරිභෝගිකයන් වෙනුවෙන් සේවය ලබා දීමට අදාළ පනත් කෙටුම්පතක් තමයි අපි අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. මම ඒ සඳහන් කළේ එක පාර්ශ්වයක් ගැන.

ඊළඟට අනික් පාර්ශ්වය තමයි, විදුලිබල මණ්ඩලය ඇතුළු එහි සේවය කරන සේවකයන්. ඒ සියලු සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාව, සියලු දීමනාවල සුරක්ෂිතතාව අපි තහවුරු කරලා තිබෙනවා. ඒ වාගේම වැදගත්ම දෙයක් වශයෙන්, ජාතික ආරක්ෂාවට හා ජාතික ආර්ථිකයට තර්ජනයක් නොවන පරිදි සියයට 100ක් ලංකා විදුලිබල මණ්ඩලය යටතේ තිබුණු ඒ වත්කම් සියල්ලම එලෙසම පවත්වා ගනිමින් තමයි අපි මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. තවදුරටත් විදුලිබල ශක්තිය රටට බරක් නොවී, එය පාරිභෝගිකයාටත්, රටටත් වාසියක් වන විධියට ලබා දීම සඳහා තමයි අපි මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මෙතැන තිබෙන වැදගත්ම දේ තමයි, තරගකාරී තත්ත්වයක් යටතේ ගුණාත්මක සේවයක් ලබා දීමට අපට හැකි වීම. අපේ රටේ තිබෙන ගොඩක් රජයේ ආයතනවලට තිබෙන චෝදනාව තමයි, අකාර්යක්ෂමතාව. මේ අකාර්යක්ෂමතාව නිසා තමයි ගොඩක් වෙලාවට රජයේ ආයතනවලට ගිහිල්ලා, අපේ මිනිස්සු බැණ බැණ එන්නේ වැඩක් හරියට සිද්ධ වෙන්නේ නැහැ කියලා. මෙන්න මේ සංශෝධන පනත් කෙටුම්පතේ තිබෙන ප්‍රතිව්‍යුහගතකරණය තුළින් අපට පුළුවන්කම ලැබෙනවා, සියයට 100ක් රජයේ අයිතිය තබා ගනිමින්, ඒ වාගේම සියයට 100ක් රැකියා සුරක්ෂිතතාව තබා ගනිමින් ඒ ආයතන තුළ තරගකාරීත්වයක් ඇති කරලා, ඒ තරගකාරීත්වය හරහා රටේ ජනතාවට සේවයක් කරන්නට. උදාහරණයක් විධියට කිව්වොත්, අද රටේ විදුලිය බෙදා හැරීම සඳහා ආයතන දෙකක් ලංකාව තුළ තිබෙනවා. විශාලම ආයතනය CEB එක. අනික් ආයතනය,

[ගරු අර්කම් ඉල්යාස් මහතා]

LECO එක. නමුත් පාරිභෝගිකයාට අවස්ථාවක් නැහැ, මොන service providerගෙන්ද මේ service එක අපි ලබා ගන්න ඕනෑ කියන එක ගැන. ඒ නිසා මේ පනත් සංශෝධනය තුළින් අපි smart service එකක් ලබා දෙන්න smart system එකක් introduce කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ smart service එක හරහා අපට පුළුවන් වෙනවා, අපට ඕනෑ CEB එකේ supply එකද, එහෙම නැත්නම් LECO එකේ supply එකද, එහෙමත් නැත්නම් තවත් මොකක් හරි සමාගමක supply එකකින් මේක ලබා ගන්නවාද කියලා තීරණය කරන්න. මේ වාගේ ගොඩක් අවස්ථා අපේ පාරිභෝගිකයන්ට මේ තුළින් ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම GenCo කියන company එකක් form කරන්න අපි ලැහැස්ති වෙලා ඉන්නවා. ඒකෙන් පුළුවන් වෙලා තිබෙනවා, විදුලි ජනනය අවස්ථා සම්බන්ධවත් විවෘත වෙළෙඳ පොළේ තරග කරන්න.

මම තවත් දෙයක් කියන්න කැමැතියි. අපේ රටට හොඳ මානව සම්පතක් තිබෙනවා. අද වුණත් ලංකාවේ සමහර consultancy firmsවල ඉන්නවා, පිට රටවලට ගිහිල්ලා විදුලිය සම්බන්ධව තමන්ගේ දැනුම consultancy විධියට පාවිච්චි කරන අය. මමත් personally දන්නා එවැනි සමාගම් ගොඩක් තිබෙනවා. විශේෂයෙන්ම ඔවුන් අප්‍රිකානු මහාද්වීපයේ රටවලට ගිහිල්ලා තමන්ගේ දැනුම පාවිච්චි කරනවා. ලංකා විදුලිබල මණ්ඩලයට අයිති සමාගම්වලටත් මේ සමාගම් හරහා මේ දේ කරන්න පුළුවන්. ඇත්තටම අපි දන්නවා, අද චීනය වාගේ රටවල ගොඩක් වෙලාවට companies විධියට එන්නේ ඒ රටේ තිබෙන රාජ්‍ය සමාගම් බව. ඒ වාගේ හොඳ අවස්ථාවක් ලංකා විදුලිබල මණ්ඩලයට අනුයුක්තව තිබෙන සමාගම්වලට ලබා ගන්න පුළුවන් වනවා. මම හිතන්නේ, මේක ලංකාව තුළට විදේශ විනිමය තවදුරටත් අරගෙන ඒමට ලැබෙන ලොකු අවස්ථාවක්.

ඒ වාගේම තව එක දෙයක් මම කියන්න කැමැතියි. කලින් කථා කළ මන්ත්‍රීවරයෙක් කිව්වා, 2021-2022 කාලයේදී රුපියල් කෝටි 12,600කුත්, 2024-2025 කාලයේදී රුපියල් කෝටි 18,200ක විශාල මුදලකුත් ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට දරාගන්න සිද්ධ වුණා කියලා. ඇත්තටම ඒකට ලොකුම හේතුව තමයි, හදිසි මිලදී ගැනීම්. ඉස්සර මොකක් හරි ප්‍රශ්නයක් වුණාම සිද්ධ වුණේ මොකක්ද කියලා අපි දන්නවා. ලංකා විදුලිබල මණ්ඩලයේ තිබෙන මොකක් හෝ පද්ධතියක් බිඳ වැටුණාම හදිසි මිලදී ගැනීම්වලට ගියා. මේ හදිසි මිලදී ගැනීම් අපි මේ වතාවේ ගොඩක් නියාමනය කර තිබෙනවා. උදාහරණයක් කිව්වොත්, 2016-2021 කාලයේදී Ace Power Embilipitiya (Pvt.) Limited එකෙන් අපි අවස්ථා 5කදී රුපියල් බිලියන 59.454කට විදුලිය මිලදී ගෙන තිබෙනවා. එම වියදම සංසන්දනාත්මකව බැලුවොත්, 2018-2027 කාලය තුළ දීර්ඝ කාලීන transmission සංවර්ධන සැලැස්මේ ඇස්තමේන්තු කළ මුදලින් සියයට 32ක්. අපි ලොකු සැලැස්මක හිටියා නම්, ඒකෙන් සියයට 32ක් මේ මිලදී ගැනීම්වලට ගිහිල්ලා තිබෙනවා. ඒ පැත්තෙන් බලනකොට ඒක එහෙමයි. අනෙක් පැත්තෙන් ඒ ආයතනයේ ලාභාංශ බැලුවොත්, ඒගොල්ලන් ආයෝජනය කරපු මුදල වාගේ සියයට 885 ගුණයක් ලාභ ලබා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් බිලියන 14ක මුදලක් ලාභයක් විධියට ඒගොල්ලන් ලබා තිබෙනවා. මෙන්න මේ වාගේ දේවල් තමයි ඉස්සර පැවති ආණ්ඩු කාලයේ සිද්ධ වුණේ.

ඒ වාගේම තවත් විශේෂ දෙයක් මම විදුලිබල ඇමතිතුමාට කියනවා. විදුලිබල ක්ෂේත්‍රයේ සමහර projectsවල හිටපු නිසා මේ ගැන මම දන්නවා. විදුලිබල ක්ෂේත්‍රයේ තිබෙන අපි සලකා බැලිය යුතු තවත් එක් දෙයක් තමයි, gold-plated standards. සමහර standards යුරෝපයේ තිබෙන standardsවලටත් වඩා වැඩියි, ඇමෙරිකාවේ තිබෙන standardsවලටත් වඩා වැඩියි. සාමාන්‍යයෙන් යුරෝපයේ සහ ඇමෙරිකාවේ Factor of Safety 1.5 වෙනකොට අපේ CEB එක, ඒක 2.5ක් බලනවා. ඇත්තටම මේකෙන් වෙන්නේ අපේ රජයේ මුදල් නාස්ති වන එක. මම හිතනවා, ඒ පිළිබඳවත් පොඩ්ඩක් සලකා බලන්න ඕනෑය කියලා. ඒ වාගේම standards පිළිබඳවත් අපි පොඩි සමාලෝචනයක් කරන්න ඕනෑ. ඒකෙන් ගුණාත්මක සේවයක් වාගේම රටේ මුදල් අවභාවිත වෙන්නේ නැති හොඳ සේවයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මේ පනත මඟින් අපේ රටට හොඳ ගුණාත්මක සේවයක් ලබා ගන්න පුළුවන් බව. රටේ ඉදිරි අනාගතය -තව අවුරුදු 20ක්, 25ක්- ගැන හිතලා තමයි අපි මේ පනත ඉදිරිපත් කර තිබෙන්නේ. මේ පනත තුළින්, බලශක්ති ක්ෂේත්‍රයට හොඳ ආරම්භයක් ලබා ගන්න අපට පුළුවන් වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.26]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதற்குக் கிடைத்த சந்தர்ப்பத்துக்கு நன்றி கூறிக்கொள்கின்றேன். காலத்துக்குக் காலம் பொருளாதார சவால்களை எதிர்நோக்குவதன் காரணமாக சட்டத் திருத்தங்கள் மேற்கொள்ளப்பட வேண்டியது மிக முக்கியமான விடயமாக இருக்கின்றபோதிலும், அவற்றின்மூலம் இந்த நாட்டில் உள்ள மக்களுக்கு வரப்பிரசாதங்கள் கிடைக்கக் கூடியதாக அமைய வேண்டும் என்பதே எங்களுடைய விருப்பமாக இருக்கின்றது. மேற்கொள்ளப்படுகின்ற சட்டத் திருத்தங்கள் தனியார் துறையை ஊக்குவிப்பதாகவோ அல்லது அரச துறையை ஊக்குவிப்பதாகவோ அமைந்தாலும், மின்பாவனையாளர்களுக்கான சலுகைகள் மற்றும் மின்பாவனை தங்குதடையின்றி கிடைக்கக்கூடிய சூழ்நிலை உருவாக்கப்படுகின்றபோது அவற்றை நாங்கள் வரவேற்கக்கூடியதாக இருக்கும்.

மிக முக்கியமாக, கடந்த காலத்தில் பொருளாதார நெருக்கடிக்குள் நாடு சிக்குண்டபோது நாம் எதிர்கொண்ட வலுசக்திப் பிரச்சினையே பாரிய பிரச்சினையாக இருந்தது. அதன் காரணமாக தொழிற்சாலைகளை, அரச நிறுவனங்களை அல்லது வைத்தியசாலைகளை இயங்கவைக்க முடியாத நிலை ஏற்பட்டது. சூரிய சக்தி - solar power - மூலம் மின்சாரத்தைப் பெறுகின்ற விடயத்தை ஊக்குவிப்பதற்கான திட்டம் இந்த மின்சாரம் (திருத்தம்) சட்டமூலத்தில் உள்ளடக்கப்பட்டு இருக்கின்றனவா? அதனூடாக மக்கள் சலுகைகளைப் பெற்றுக்கொள்ளக்கூடிய சந்தர்ப்பம் இருக்கின்றனவா? என்று பார்க்கவேண்டிய தேவை இருக்கின்றது.

தற்போதைய சூழ்நிலையில், மட்டக்களப்பு மாவட்டத்தில் அல்லது வடக்கு, கிழக்கின் ஏனைய பிரதேசங்களில் solar panel சம்பந்தமாக சலுகைகளை அல்லது சேவைகளை அல்லது

அதனூடாகப் பயன்களைப் பெற்றுக்கொள்வதில் நெருக்கடிகள் இருக்கின்றன. மிக முக்கியமாக, கடந்த காலங்களில் அவை நியாயமான விலையில் கிடைக்கப்பெற்றபோதிலும் தற்போது அவற்றின் விலை குறைந்திருக்கின்றது. Battery backup ஊடாகக் கொடுக்கப்படுகின்ற solar power சேவைகள்மூலம் உருவாக்கப்படுகின்ற மின் சக்திக்குரிய விலை அதிகமாகவும், அதற்கு அடுத்ததாக டீசல் மூலம் உருவாக்கப்படுகின்ற மின் சக்திக்குரிய விலை மிகக் கூடுதலாகவும் இருக்கின்றது. சூரிய சக்திமூலம் மிக இலகுவாகப் பெறப்படுகின்ற மின் சக்திக்கு விலை குறைவாக இருந்தாலும், அதனைப் பெற்றுக்கொள்வதில் மட்டக்களப்பு மாவட்டத்தில் பல்வேறு இடங்களில் பாரிய நெருக்கடிகள் இருக்கின்றன. அதற்குத் தேவையான உபகரணங்கள் மற்றும் transformers தேவையான அளவு இல்லை. தற்போது solar இணைப்பைப் பெறுகின்றபோது three-phase currentஐ எடுக்கவேண்டிய தேவையிருக்கிறது. இவ்வாறான நடைமுறைசார் நெருக்கடிகளுக்கான தீர்வுகள் இந்தச் சட்டமூலத்தில் இருக்கின்றனவா? என்ற கேள்வியை இங்கு எழுப்ப விரும்புகின்றேன். மிக அதிகமான மக்கள் இந்தச் சேவையைப் பெற்றுக்கொள்வதற்கு விரும்புகின்றபோதிலும், மின்சார சபையினூடாக மின்பிறப்பாக்கத்துக்கான அந்த சேவையை வழங்குவதில் பாரிய நெருக்கடி இருக்கின்றது. Transformers பொருத்துவதற்கு நீண்ட காலம் எடுக்கின்றது; three-phase currentகூட ஒரு குறிப்பிட்ட வரையறையூடாகவே கொடுக்கப்படுகின்றது.

ஆகவே, இந்த விடயத்திலே நீங்கள் கவனம் செலுத்த வேண்டும். அந்த மக்களுக்கு அச்சேவை கிடைக்கக்கூடியதாக இருக்க வேண்டும். அதற்கப்பால், அடிப்படையாக மின்நுகர்வுத் தேவையைப் பெறுகின்ற சாதாரண மக்கள் ஆகக்குறைந்தது 40,000 ரூபாய் செலுத்தி புதிய இணைப்பைப் பெறவேண்டிய தேவை இருக்கின்றது. அதுவும் 50 மீற்றருக்கு உட்பட்ட இடைவெளியில் மின்சாரம் வழங்கும் சேவை நிலையம் இருந்தால் மட்டுமே 40,000 ரூபாய்! அதற்கு அதிகமான தூரம் என்றால் அதைவிட பாரியளவு நிதியைச் செலுத்த வேண்டிய தேவையிருப்பதனால் பல குடும்பங்கள் மின் இணைப்பைப் பெறுவதிலே பாரிய சவால்களை எதிர்கொள்கின்றன.

முன்னைய காலங்களில், 30 மீற்றருக்கான சலுகை முறை ஒன்று இருந்தது. அதாவது, பத்துக் குடும்பங்கள் மின்சார இணைப்பைப் பெறுகின்றபோது கிடைக்கின்ற 300 மீற்றருக்கான சலுகை முறை தற்போது மாற்றப்பட்டு இருக்கின்றது. தங்களுடைய வதிவிடம் மின்சாரம் வழங்கும் சேவை நிலையத்தில் இருந்து 50 மீற்றருக்கு மேற்படுகின்றபொழுது, புதிதாகக் குடியேறுகின்ற அல்லது புதிதாக வீடு அமைத்துக்கொள்கின்ற சாதாரண வருமானம் பெறுகின்ற மக்களால் அந்த வசதியைப் பெற்றுக்கொள்ள முடியாதிருக்கின்றது. அதனை நிவர்த்தி செய்யக்கூடிய வகையிலே இந்தச் சட்டமூலத்தில் அதற்கான திருத்தம் ஏற்படுத்தப்படுமா? என்பதை நான் இவ்விடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். ஏனெனில், மக்களின் அடிப்படைத் தேவையாக மின்சாரம் இருக்கின்றது. எதிர்காலத்தில் அவர்கள் தங்களுடைய தொழில்முயற்சிகளை மேற்கொள்வது பாரிய சவாலாக இருக்கும். தொழிற்சாலைகளில் solar powerமூலம் மின்சாரத்தைப் பெறுகின்றபொழுது, கட்டாயமாக three-phase power பெற்றுக்கொள்ள வேண்டிய தேவை இருக்கின்றது. ஆனால், அதனைப் பெற்றுக்கொள்வதற்கான வரையறைகளில் ஒரு நெருக்கடியான சூழ்நிலை இருக்கின்றது. ஆகவே, இந்த விடயங்கள் எதிர்காலத்திலே நிவர்த்தி செய்யப்பட வேண்டும்.

கடந்த காலங்களில் எமது மாவட்டத்தில் மின்சார விநியோகத்தின்போது பாதைகளின் அருகில் நடப்பட்ட மின்கம்பங்கள் அபிவிருத்தித் திட்டங்கள் நடைபெறுகின்றபோது அல்லது வீதிகளை அகலப்படுத்துகின்றபொழுது அவை வீதிகளின் நடுவில் காட்சியளிக்கின்றன. அவற்றை அகற்றவேண்டிய தேவை ஏற்படுகின்றது. அதனுடன் சம்பந்தப்பட்ட நிறுவனங்களோ அல்லது வீதி அபிவிருத்தி அதிகாரசபையோ அல்லது பிரதேச சபைகளோ அவற்றை அகற்றுவதற்கு மேலதிக நிதியைச் செலவு செய்யவேண்டி உள்ளது. இதன் காரணமாக, அந்தக் கம்பங்கள் அகற்றப்படாமல் அப்படியே உள்ளன. வீதிகளை அகலப்படுத்தியும்கூட அதனை முழுமையாகப் பயன்படுத்த முடியாத நிலை இருக்கின்றது. இவ்வாறான விடயங்களுக்கு இந்த மின்சாரம் (திருத்தம்) சட்டமூலத்தால் தீர்வுகள் கிடைக்கப்பெறுமா? என்பதையும் நான் இவ்விடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

எமது பிரதேசத்தில் மின்சார சபையுடன் தொடர்புபட்ட பல்வேறு பதவிகளுக்கு வெற்றிடங்கள் காணப்படுகின்றன. போதியளவு மானி வாசிப்பாளர்கள் அங்கு இல்லை. அத்துடன், அடிப்படை வசதிகளும் மின்சார சபைக்கு அங்கு இல்லை. குறிப்பாக, பல பகுதிகளிலே மின்சார சபைக்குச் சொந்தமான கட்டிட வசதிகள்கூட இல்லை. தங்களுடைய அலுவலகங்களை அடிக்கடி மாற்றிக்கொள்ள வேண்டிய தேவை அவர்களுக்கு ஏற்படுகின்றது. இவற்றுக்கான மாற்றீட்டுத் திட்டங்கள் இருக்கின்றனவா? எனக்கு முன்னர் பேசிய உறுப்பினர் ஒருவர், மின்சார சபை ஊழியர்களின் அடிப்படையான எண்ணிக்கை பாதுகாக்கப்படும் என்று கூறியிருந்தார். தேவைப்படுகின்ற இடங்களுக்கு அந்த ஊழியர்களை அமர்த்துவதற்கு அல்லது தேவையானவர்களைச் சேர்த்துக்கொள்வதற்கு எந்தவிதமான திட்டத்தை இந்தத் திருத்தச் சட்டமூலம் முன்வைக்கின்றது? அந்த வகையில், சில விடயங்களிலே நாம் கவனம் செலுத்தவேண்டி இருக்கின்றது.

கடந்த கால யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்களுக்கு அல்லது அடிப்படை வசதிகள் இல்லாத பிரதேசங்களுக்கு மின்சார சேவை வழங்கப்பட்டிருந்தாலும், வெள்ள அனர்த்தங்கள் மற்றும் பல்வேறு வகையான இடர்பாடுகளினால் அவை பாதிக்கப்படுகின்றபோது, அங்குள்ள வீதிகளின் ஊடாகப் பயணம் செய்ய முடியாத நிலை மின்சார சபையினருக்கு ஏற்படுகின்றது. இவ்வாறான நிலைமைகளிலே சீரான மின்விநியோகத்தை மேற்கொள்ளக்கூடிய வகையில் அல்லது அந்த மக்களுக்கான தேவைகளை நிவர்த்தி செய்யக்கூடிய வகையில் இந்தத் திருத்தச் சட்டமூலம் அந்த மக்களுக்குப் பிரயோசனப்படுமா? என்பதை நாங்கள் பார்க்கவேண்டி உள்ளது.

கடந்த காலங்களில் யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்களில், குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்திலுள்ள படுவான்கரைப் பிரதேசத்தில் அடிப்படையான மீள்கட்டுமானங்கள் பாரியளவில் இடம்பெற்றிருக்கவில்லை. அவர்களுக்கான அடிப்படைத் தேவையான மின்சார சேவையை 40,000 ரூபாய் கொடுத்துப் பெற்றுக் கொள்கின்றபொழுதும், தொடர்ச்சியாக சேவை வழங்குவதில் இடர்பாடுகள் இருக்கின்றன. அங்கு சில குடும்பங்கள் மிகவும் பின்தங்கிய பகுதிகளில் வாழ்கின்றன. அவர்களின் அடிப்படைத் தேவையாக இருக்கின்ற மின்சாரத்தைப் பெற்றுக்கொள்வதில் பாரிய சவால்கள் இருக்கின்றன. அதற்கு அப்பால், பல இடங்களில் solar panel மூலம் மின்சாரத்தைப் பெற்றுக்கொள்கின்ற வசதிகள் இல்லை. மேலும், அதற்குத் தேவையான உபகரணங்கள், கருவிகள் இல்லையென்றும்

[ගරු ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

transformers இல்லையென்றும் three-phase power line வசதி இல்லையென்றும் கூறி பல இடங்களில் அச்சேவை மறுக்கப்படுகின்றது. இவ்வாறான விடயங்களிலே முழு நாட்டினையும் கருத்தில் எடுக்கும்போது வடக்கு, கிழக்கிலே இந்தப் பிரச்சினை கூடுதலாக இருக்கின்றது. சவால்களை எதிர்கொண்டு இந்தச் சட்டமூலம் ஊடாக அதற்குத் தீர்வளிக்க முடியுமா? என்பதை நான் இவ்விடத்தில் கேட்கின்றேன். எனவே, இந்த விடயத்திலே எமது பிரதேசத்தை மிக உன்னிப்பாகக் கவனித்து, அதற்குரிய தீர்வை வழங்குவதற்கான செயற்பாடுகளை முன்னெடுக்குமாறு உங்களைக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.34]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1969ට පෙර විදුලිබල ක්ෂේත්‍රය සඳහා තිබුණේ දෙපාර්තමේන්තුවක්. එලෙස දෙපාර්තමේන්තුවක් විධියට පැවතුණු එක 1969 නොවැම්බර් මාසයේ 02වැනි දා ලංකා විදුලිබල මණ්ඩලය ලෙස පරිවර්තනය වුණා. විවිධ ආණ්ඩු අවස්ථා ගණනාවකදී 1969දී ගෙනා ඒ පනත වෙනස් කරන්න උත්සාහ කළත්, ඒක ප්‍රායෝගික තත්ත්වයෙන් සිදු කරන්න අසමත් වුණා. 1969දී ගෙනා ඒ විදුලිබල පනත රටේ භෞතික තත්ත්වය, ජනගහනය, රටේ අවශ්‍යතා වෙනස් වෙද්දී ඊට ගැළපෙන ලෙස, ඊට අදාළ ලෙස සංශෝධනය කරන්න දශක හයකට වැඩි කාලයක් අසමත්වෙලා තිබෙනවා. ඒ නිසා මේ වෙනස් වෙන ජාතික රාජ්‍යයේ අරමුණට, අපේක්ෂාවට ගමන් කිරීම සඳහා වැඩි වන ජනගහනයට සාපේක්ෂව ලෝකයත් එක්ක පසුපසින් ගාටන රාජ්‍යයක් වෙනුවට ලෝකයත් එක්ක එකට ගමන් කරන රාජ්‍යයක් බවට පත් කරන්න අපට විදුලිබල ක්ෂේත්‍රය පමණක් නොවෙයි, අපේ රටේ සමස්ත රාජ්‍ය ව්‍යුහය මුළුමනින්ම ප්‍රතිසංස්කරණය කරන්න සිද්ධවෙලා තිබෙනවා.

ඔබතුමන්ලා දන්නවා, අපි අධ්‍යාපන ක්ෂේත්‍රයේ බරපතළ වෙනස්කමකට අත තියලා තිබෙන බව. ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බිඳ වැටිලා තිබෙන ප්‍රාථමික සෞඛ්‍ය පිළිබඳව අවධානය යොමු කරලා, ඒ ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය ගොඩනඟන්න අපි කටයුතු කරමින් සිටිනවා. ප්‍රවාහන පද්ධතියේ මුළුමනින්ම වෙනස්කම් ඇති කරලා, නිෂ්පාදනය අරමුණු කරගත්ත ප්‍රවාහන පද්ධතියක් ඇති කර, ඒ පද්ධති අතරේ ඒකාබද්ධතාවක් ඇති කරන්න අපි කටයුතු කරමින් සිටිනවා. ඒ අතරේ රාජ්‍යයේ අරමුණට, අපේක්ෂාවට ගමන් කිරීම සඳහා විදුලිබල ක්ෂේත්‍රය පමණක් නොවෙයි, සමස්ත බලශක්ති ක්ෂේත්‍රයම පරිවර්තනය කරන්න අපි මේ වනකොට කටයුතු කරමින් සිටිනවා. ඒ නිසා මේක අපේ රට දියුණු රාජ්‍යයක් බවට පත් කරන්න, ජාතික රාජ්‍යය ගොඩනඟන්න අරමුණු කරගත්ත පොදු ක්‍රියාවලියක එක් කොටසක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධාකාරයේ රෝගාබාධ හැදිච්ච කීපදෙනෙක් විපක්ෂයේ ඉන්න බව නම් අපි දකිනවා. ඔබතුමා අහලා ඇති, 80 දශකයේ ටයිටස් තොටවත්ත මහතා හඬ කවපු "දොස්තර හොඳ හිත" කියලා කාටූන් කථාවක් තිබුණු බව. ඒකේ ඉන්නවා, "චව් චව්" කියලා පුද්ගලයෙක්. දොස්තර හොඳ හිත මහත්තයා මොන තරම් උසස් අරමුණකින් සැලසුම් කරලා යම් කාර්යයක් කරන්න හැදුවත් චව් චව් කියනවා, "ඕක නම් ලොවෙත් කරන්න බැහැ, ලොව් ගහෙත් බැහැ" කියලා. *[බාධා කිරීමක්]* එහෙම චව් චව්ලා කීපදෙනෙක් විපක්ෂයේ ඉන්නවා.

මීට මාසයකට කලින් ඇමෙරිකාව ලෝකයේ රාජ්‍යයන් විශාල ප්‍රමාණයකට තීරු බදු පැනෙව්වා. "ඇමෙරිකාව පනවපු සියයට 44ක තීරු බද්ද ලොවෙත් අඩු කරන්න බැහැ, මේගොල්ලන්ට ඉංග්‍රීසිත් බැහැ, කවුරුවත් අඳුරන්නේත් නැහැ, අඳුරන කෙනෙක්වත් නැද්ද අර White House එකට call එකක්වත් දෙන්න?" කියලා අහන මට්ටමේ නායකයෝ තමයි විපක්ෂයේ වාඩිවෙලා හිටියේ. රාජ්‍ය තාන්ත්‍රිකභාවය කියන්නේ ඒක, ඒගොල්ලන්ට. එහෙම කියලා මාසයක් ගත වුණේ නැහැ. ඒ tariff එක සියයට 44 ඉඳලා සියයට 20 දක්වා අඩු කරගන්න පුළුවන් වුණා, ඔය බැහැ කියපු අපේ ආණ්ඩු පක්ෂයේ ඉන්න බොහෝ නායකයන්ගේ මැදිහත්වීමෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය චව් චව්ලාට උත්තර දෙන්න අපි කාලය වැය කරන්න ඕනෑ නැහැ. ඔය බැහැ කියපු, නැහැ කියපු ගොඩක් දේවල් කරන්න සමත් බලයක් සහිතව තමයි අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක කාගේ අරමුණක්ද? දැන් නමක්, දෙකක් කියැවෙනවා. ඔබතුමා දන්නවා, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව කටයුතු කරන්නේ මොන මට්ටමේ ප්‍රතිපත්තිමය කාරණා එක්කද කියලා. අනුර දිසානායක සහෝදරයා ජනාධිපතිවරයා විධියට මුළු රාජ්‍යයක් නියෝජනය කරනවා. අගමැතිනිය ආණ්ඩුව නියෝජනය කරන නායිකාව විධියට කටයුතු කරනවා. ඒ වාගේම අපේ ආණ්ඩුව බලයට පත් වෙන්න කලින් සැලසුම් කළා, අපි බලයට පත් වුණාට පස්සේ මේ රට කොහොමද ගොඩනඟන්නේ, මේ රට කොතැනටද ගෙන යන්නේ, ජනතාවට වඩා යහපත් ජීවිතයක් ලබා දෙන්නේ කොහොමද, මේ රට දියුණු රාජ්‍යයක් බවට පත් කරන්නේ කොහොමද කියලා. එක එක ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම තිබෙන පිරිස්වලින් තමයි ඒ කමිටු සමන්විත වෙලා තිබෙන්නේ. අපි බලශක්ති ක්ෂේත්‍රයටත් එහෙම කමිටුවක් හැදුවා. ඒ බලශක්ති කටයුතු පිළිබඳ කමිටුවේ ඉන්නවා, විශේෂඥ දැනුම තිබෙන විශාල පිරිසක්. හැබැයි, ඒකට ඕනෑ නායකයෙක්, ඒක නියෝජනය කරන පුද්ගලයෙක්. ඒ අදහස ජනතාව අතරට හොඳින්ම ගෙන යන්න පුළුවන් පුද්ගලයන් අපට ඕනෑ. ඒ නිසා විදුලිබල ඇමතිතුමා වාගේම මේ බලශක්ති කටයුතු පිළිබඳ කමිටුව නියෝජනය කරපු විශාල පිරිසක් ඉන්නවා. ඔය පුබුදු නිරෝෂන් කියන නාමයත් තිබෙන්නේ එතැන. දැන් ඔබතුමන්ලා කියනවා, මේ හදන NSO එකේ Chairman බවට පත් වන එක ඔහුගේ පෞද්ගලික අරමුණක් කියලා. මොන කථාද මේවා? ඒ වාගේ ලාභ දේශපාලනයක් තමුන්නාන්සේලාට අදාළ ඇති, ජාතික ජන බලවේගයට එහෙම ලාභ දේශපාලනයක් අදාළ නැහැ. අපි පෞද්ගලික අරමුණු රටේ දේශපාලනය එක්ක සම්බන්ධ කර ගන්නේ නැහැ. එය සමූහයක අරමුණක් නියෝජනය කිරීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් අදහස් ප්‍රකාශ කරමින් කිව්වා, "අපි ලංකාවටම විදුලි බලය සපයලා ඉවරයි" කියලා. විදුලි බලය කියන්නේ, ගෙයක ලයිට් එකක් පත්තු කරන එක නොවෙයි. ඔබතුමා දන්නවා, අදටත් ග්‍රාමීය ප්‍රදේශවල power supply එකේ විශාල ලෙස drop එකක් තිබෙන බව. Power cut එකක් වුණොත් දවසක් හෝ දෙකක් යනවා නැවත විදුලිය ලැබෙන්න. මොකද, three-phase electricity lines නැහැ; voltage එක අඩුයි. සමහර ග්‍රාමීය ප්‍රදේශවල ස්වයං රැකියා කරන ව්‍යාපාරිකයෝ ඉන්නවා, three-

phase electricity line එකක් නැතුව තමන්ගේ කර්මාන්තය කර ගන්න බැරිව. ඒ විතරක් නෙවෙයි. ලංකාවේ දූපත්වලට විදුලිය ලබා දීලා තිබෙනවාද? අනලතිව් දූපත, ඩෙල්ෆ්ට් දූපත හා නාගදීපය වාගේ දූපත් ගත්තොත්, තවමත් ඩීසල් ජෙනරේටර්වලින් තමයි විදුලිය ලබා දෙන්නේ. ලංකාවටම විදුලිය දුන්නාය කියලා පරසක්වල ගහන ඒ මහත්වරු අවුරුදු 60ක් විතර රට පාලනය කළා. අපේ රටේ පැය 24 පුරා හුළං තිබෙනවා. දවස් 365න් 300කට වඩා සූර්යාලෝකය වැටෙනවා. හැබැයි, අවුරුදු හැත්තෑ ගණනක් රට පාලනය කරලාත් ඒ දූපත් ටිකට තවම විදුලිය ලැබෙන්නේ ඩීසල් ජෙනරේටර්වලින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තර්කයක් නැහැ, මෙම පද්ධතිය වෙනස් කළ යුතුයි. මේ රට හරියට කෙළින් හිටවන්න නම්, දියුණු රාජ්‍යයක් බවට පත් කර ගන්න නම්, වැඩි වන අවශ්‍යතා මත විදුලි බලය සපයන්න පුළුවන් මට්ටමට ගෙන යන්න නම්, මේ ව්‍යුහය ප්‍රතිසංස්කරණය කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් දෙගිඩියාවක් නැහැ.

මෙහි තිබෙන තව අරමුණක් තමයි, විදුලි බිල අඩු කිරීම. නේවාසික ජනතාවට වාගේම, කර්මාන්තකරුවන්ටත් දැරිය හැකි විදුලි බිලක් බවට පත් කර ගැනීම. විදුලි බිල සම්බන්ධව තීන්දු තීරණ ගන්න මහජන උපයෝගිතා කොමිසම තිබෙනවා තමයි. හැබැයි, පිරිවැය වැඩි නම් කොහොමද මහජන උපයෝගිතා කොමිසම විදුලි බිල අඩු කරන්නේ? එම නිසා පිරිවැය අඩු කිරීම සඳහා වූ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ඒ සඳහාත් පනතේ වෙනස් කම් කළ යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා, දක්ෂයෝ විශාල පිරිසක් මේ රට අත හැර ගිය බව. CEB එකේ cadre එක අනුව ඉංජිනේරුවරු 1,150කට වඩා ඉන්න ඕනෑ. දැන් ඉන්නේ 750කට වඩා අඩු ප්‍රමාණයක්. පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. 200කට වඩා පිරිසක් පසුගිය වසරවල රට අත හැරලා ගියා. එම නිසා අපට අවශ්‍යයි නැවත විමලසුරේන්ද්‍ර වැනි විශේෂඥයෝ ලංකාවේ බිහි කරන්න. නොරොච්චෝලේ ව්‍යාපෘතියේ සමස්ත drawings ටික, manuals ටික චීන අකුරුවලින් තිබෙන්නේ. ඒවා පවා කියවමින් අපේ රටේ ඉන්න දැනුම තිබෙන තරුණයෝ අද ඒ යන්ත්‍ර සූත්‍ර සකස් කරන්න පෙලඹිලා තිබෙනවා. එම නිසා විශේෂඥ දැනුම තිබෙන තරුණ කණ්ඩායම් ලංකාව තුළ රඳවා ගන්නත්, විදුලිබල ක්ෂේත්‍රය තුළ තියා ගන්නත් මෙම පනත සංශෝධනය විය යුතුයි. කලින් මේ පනත් ගෙනා මහත්වරු කටයුතු කළේ කොහොමද? මේ මගේ අතේ තිබෙනවා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවක්. විදුලිබල මණ්ඩලයේ එවකට සිටි 26,000ක් වුණු සේවක පිරිස 12,000ට අඩු කරන්න තීන්දු ගත්ත කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා. අද ඒ සේවකයෝ ගැන කිඹුල් කඳුළු හෙළන ඔය මහත්වරු 26,000ක් වූ සේවක පිරිස 12,000ට අඩු කරන්නයි ගියේ. අපි එහෙම කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි එම සේවකයන්ගේ රැකියා ස්ථිර කරලා තිබෙනවා. රාජ්‍ය සමාගම් පහෙන් ඔවුන් කැමැති එකකට යන්න හැකියාව අපි හදලා තිබෙනවා. ඒ වාගේම තමයි ඔවුන්ට VRS එකක් යටතේ ඉතාම හොඳ මුදලක් ලබාගෙන, සේවයෙන් විශ්‍රාම යන්නත් අවස්ථාව අපි හදලා තිබෙනවා.

ලංකා විදුලිබල මණ්ඩලය පාඩු ලබන තත්ත්වයට පත් කළේ, පසුගිය රජයන්වල වැඩ කරපු නායකයෝ. මෛත්‍රීපාල සේනානායක විදුලිබල ඇමති වුණා. එතුමා මැදවච්චියෙන් ඒකට සෙනඟ පිරෙව්වා. අනුරුද්ධ රත්වත්තේ පත් වුණා, එතුමා Ceylon Electricity Board එකට මහනුවරෙන් සෙනඟ පිරෙව්වා. යහ පාලනයේදී පී. දයාරත්න පත් වුණා, එතුමා ඡන්දය ඉල්ලුවේ අම්පාරෙන්. එතුමා අම්පාරෙන් සෙනඟ පිරෙව්වා. එතුමා පදිංචි වෙලා හිටියේ පොල්ගස්ඕවිට. පොල්ගස්ඕවිටිනුත් සෙනඟ පිරෙව්වා. පාඨලී චම්පික රණවක, ධර්ම රාජ්‍යයට ගිය මන්ත්‍රීවරයා විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලාගේ සිවුරු ඇරලා විදුලිබල මණ්ඩලයේ සේවකයෝ බව පත් කළා. පස්සේ call කරලා කියනවා, "ඔය ඇවිල්ලා ඉන්නේ හිමිනමක්. ඒ නිසා බරපතළ වැඩ ගන්න එපා" කියලා. ඒ විධියට තමයි පසුගිය කාලයේ විදුලිබල මණ්ඩලයට ඒ අය සේවකයෝ පිරෙව්වේ. ඒ කාලයේ නියෝජ්‍ය ඇමතිවරු හැටියට හිටපු අයත් දැන් විපක්ෂයේ ඉන්නවා. ඒ අයත් විදුලිබල මණ්ඩලයට සේවකයන් පිරෙව්වා. සියඹලාපිටියගේ අයියලා සල්ලි අරගෙන CEB එකට සේවකයෝ පිරෙව්වා. එහෙම පුරවපු ආයතන තමයි මේවා. අපි ඒ සේවකයන්ගේ රැකියා සුරක්ෂිත කරනවා. අපි ඒ සේවකයෝ ආරක්ෂා කරමින් තමයි මෙම පනත සංශෝධනය කරන්නේ. එම නිසා කිසිම සේවකයෙකුට මෙමඟින් අගතියක් වෙන්නේ නැහැ.

ඒ වාගේම මේ රටේ ජනතාවට අපි මේ කාරණය කියනවා. මෙම පනත ගෙනෙන්නේ ඔබ වෙනුවෙන්. මෙම පනත ගෙනෙන්නේ ජාතික රාජ්‍යය ගොඩනැඟීම වෙනුවෙන්. මෙම පනත ගෙනෙන්නේ දියුණු රාජ්‍යයක් බවට ලංකාව ඔසවා තැබීමේ අරමුණින්. වංචාවට හා දූෂණයට එරෙහිව, ඒවායින් තොරව රාජ්‍යය පාලනය කරන ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයාගේ ආණ්ඩුව මේ තිබෙන්නේ. එතුමාගේ නායකත්වයෙන් ගෙනෙන මෙම පනතින් මේ රටේ ජනතාවට, කිසිම පුරවැසියෙකුට, කිසිම ආයතනයකට අගතියක් සිදු වෙන්නේ නැහැ. දියුණු රාජ්‍යයක් බවට ලංකාව ඔසවා තැබීමේ අරමුණින් විතරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත ගෙනෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.44]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටුයි කියන්න, විදුලිබල මණ්ඩලයේ සේවකයෝ වැඩියි කියලා කියනවා නේ. දැන් විද්‍යානුකූලව වැඩ කරන ආණ්ඩුවක් බලයට පත් වුණා නේ. අද වෙද්දී විදුලිබල මණ්ඩලයේ සේවකයෝ 23,000ක් ඉන්නවා. විදුලිබල මණ්ඩලයට එකතුව හෝ වෙන් කර හෝ ඉන්න ඕනෑ සේවකයෝ සංඛ්‍යාව කීයද කියලා ගණනය කරන්න නම් ඒකට human resource audit එකක් කරන්න ඕනෑ. දැන් මේ විද්‍යානුකූල ආණ්ඩුව ඒ audit එක කළාද? ඉන්න ඕනෑ සේවක සංඛ්‍යාව, 23,000ද, 16,000ද, 15,000ද, 12,000ද කියලා ගණන් හැදුවේ කොහොමද? නිකම් කියනවාට කියනවා. ඒ වාගේම අපි වගකීමෙන් කියන්න ඕනෑ, විදුලිබල මණ්ඩලය අනුමත කළ cadre එකෙන් පිට එක සේවකයෙක්වත් අරගෙන නැහැ කියන එක. ඒ සංඛ්‍යාව වැඩි නම්, නවීන තාක්ෂණයට ගැළපෙන්නේ නැත්නම්, ඒකට human resource audit එකක් කරලා ඒ අනුව තීරණය කරන්න, අවශ්‍ය සේවකයින් ගණන කොච්චරද කියලා.

ඊළඟට, අද සේවකයින් විශාල තැති ගැනීමකින් ඉන්නවා, මේ අලුත් ක්‍රියාදාමය තුළ ඔවුන්ගේ රැකියා අහිමි වෙනවාද, වරප්‍රසාද අහිමි වෙනවාද, ඔවුන්ට හුරුපුරුදු රැකියාව කරන්න නැතිව අනාථ තත්ත්වයකට පත් වෙයිද, VRS එකක් දෙනවා කිව්වාට කීයක් ලැබෙයිද කියා. ඒ කිසි දෙයක් තවම තීරණය කරලා නැහැ. ඒ නිසා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සේවකයෝ උද්ඝෝෂණය කළේ මේ පනත් කෙටුම්පත සම්මත වෙන්න කලින් ඔවුන්ගේ සේවක අයිතිය සුරක්ෂිත කරන සාමූහික

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගිවිසුමකට ඇතුළත් වෙන්න කියලා. හැබැයි, කම්කරු අයිතිවාසිකම් ගැන කථා කරන, ඉතිහාසය පුරාම විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ අයිතිය පුරවැසියන්ගේ අයිතියට ඉහළින් සලකපු, අද බලයේ ඉන්න ආණ්ඩුවට බහුතරයක් තිබෙන වෘත්තීය සමිති ඒවා ගැන සොයන්නේ නැතිකොට අද බහුතරයක් සේවකයෝ අපේක්ෂා කරනවා ඔවුන්ගේ සේවක සුරක්ෂිතතාව. නමුත් ඒ සඳහා අවම ගණනේ සාමූහික ගිවිසුමක්වත් අත්සන් කරන්න අසමත් වෙච්ච ආණ්ඩුවක් තමයි අද මේ කථා කරන්නේ. පහුවෙලා හෝ ඒ පිළිබඳව නිශ්චිත කොන්දේසි, ගිවිසුම් සහිතව සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා පනතින් ඔබ්බට ගිහින්, පනතේ තිබෙන ආරක්ෂණයන්ගෙන් ඔබ්බට ගිහින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය දෙයක්. මොකද, ඒ සේවකයින් 23,000 කියන්නේ අපේ රටේ සිටින වැදගත්ම කණ්ඩායමක්; උගත්ම කණ්ඩායමක්; ප්‍රයෝජනවත්ම කණ්ඩායමක්; අත්‍යවශ්‍ය සේවයක් සපයන කණ්ඩායමක්.

ගරු ඇමතිතුමා අද පෙරවරුවේ මාත් එක්ක ලොකු ආරෝවකට පැටලුණා, මේ පනත මඟින් පාරිභෝගික ආරක්ෂාව පිළිබඳව ප්‍රමාණවත් ආරක්ෂාවක් නැහැයි කියලා මම පෙන්වා දෙනකොට. 2024 වික්‍රමසිංහ-විජේසේකර ආණ්ඩුව අරන් ආපු පනතේ, පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳව 2010 සහ 2013 පනත්වල තිබුණු, පාරිභෝගිකයෝ භුක්ති වින්ද, අහිමි කරපු අයිතිවාසිකම් එකතු කරන්න කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට සහ විපක්ෂයේ සභාපතිවරයෙක් ඉන්න කාරක සභාවක් හැටියට අපි සහයෝගය දුන්නා. අපි සහයෝගය දීලා කිව්වා, මේ පාරිභෝගික අයිතිය පිළිබඳ අත්හැරුණු වගන්ති ඇතුළත් කරන්න කියලා. ඒක වැරදිද? 2024දී ආණ්ඩු කළේ සමගි ජන බලවේගය නොවෙයි. 2024දී ඒ පනත් කෙටුම්පත අරගෙන ආපු වෙලාවේ පාර්ලිමේන්තුවේ ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා, කබීර් හෂීම් මැතිතුමා ඇතුළු අපේ විද්වත් මන්ත්‍රීවරු විකල්ප යෝජනා ඉදිරිපත් කළා, කළ යුතු සංශෝධන ගැන. ඔවුන් ඔබතුමන්ලා වාගේම ඒවා පිළිගත්තේ නැහැ. අද නීතිපතිවරයා කියනකොට මේ ඉදිරිපත් කර තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය පනත් කෙටුම්පතේ තිබෙන scheme එකට ඒකේ තිබෙන ආකෘතියෙන් පිට දෙයක් දාන්න බැහැයි කියලා, ඔබතුමන්ලා ඒක පිළිගන්නවා. ඒ වාගේම, හොඳටම දන්නවා මේ රජයට වැඩි අයිතියක් තිබෙන LTL Holdings Limited කියන සමාගම ලංකාව තුළ විදුලිබල මණ්ඩලයට අයිති බලාගාර හා සමාන බලාගාර ගණනක අයිතිය දරන; ධාරිතාවක අයිතිය දරන, ඒ වාගේම විදේශ රටවල් ගණනාවක ව්‍යාපාර කරන, විශේෂයෙන්ම ඉන්දියාවේ විදුලි ක්ෂේත්‍රයේ භාණ්ඩ නිෂ්පාදනය කරන, අන්තර්ජාතික මට්ටමට පත් වෙච්ච, රජයට බහුතරයක් හිමි සමාගමක් බව. ඉදිරි මාස කිහිපය තුළ ඔවුන් කොටස් වෙළෙඳ පොළට යන්න උත්සාහ කරනවා. මේක කළ යුතු දෙයක්. පුරවැසි අයිතිය ආරක්ෂා කරලා, රටේ ආණ්ඩුවේ අයිතිය ආරක්ෂා කරන ගමන් ඔවුන්ව ලෝකයට විවර කරන්න ඕනෑ. සුදුසු ආයෝජකයන් අරගෙන එන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ LTL Holdings Limited එක transmission සමාගමක් හැටියට තමයි අද මේ පනතේ ලැයිස්තුගත කර තිබෙන්නේ. මොන විහිළුවක්ද? ඔවුන්ගේ ව්‍යාපාරයට ලංකාවේ transmission අයිතිය තිබෙන්නේ කොහේද? ඔවුන්ට transmission අයිතිය තිබෙනවා කෙන්යාවේ, බංග්ලාදේශයේ. ඔවුන්ට ලංකාවේ transmission අයිතියක් නැහැ. ඔවුන් ලංකාවේ කරන්නේ generation සහ ඒ සමඟ තිබෙන transformers හදන කටයුත්ත. එහෙම නම්, ඔවුන් මේ පනතේ මුල් අවස්ථාවේම transmission කොම්පැනියක් කරපු එක වරදක්, විකෘතියක්. අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදී පක්ෂ භේදයක් නැතිව එකඟ වුණා, මේක H1 කියන කාණ්ඩයට දාන්න ඕනෑ කියලා. දැන් නීතිපතිතුමා කියනවා, 'මුලින් කිව්වේ නැහැ; ශ්‍රේෂ්ඨාධිකරණයේ සලකා බලන වෙලාවේ කිව්වේ නැහැ. ඒ නිසා දැන් අනුමැතිය දෙන්න බැහැ' කියලා. කමක් නැහැ, ආණ්ඩුවේ ස්ථාවරය ඒක නම් මගේ යෝජනාව තමයි, පාරිභෝගික අයිතිය ආරක්ෂා කරන වගන්ති සහ මඟ හැරුණු කාරණා ටික -ඒ කියන්නේ, අපි ඔක්කෝම එකතු වෙලා එකඟ වෙච්ච වගන්ති ටික, ඒ වාගේම LTL Holdings Limited එක මේ පනත අනුව නියමිත ස්ථානයේ හෙවත් ගැළපෙන ස්ථානයේ ස්ථානගත කරන්න තිබෙන අවස්ථාව ලබා ගැනීම- සම්බන්ධයෙන් අලුත් සංශෝධනයක් නැවත ගෙන ආ යුතුය කියන එක. ඒ සඳහා විපක්ෂයේ අපි ඔබතුමන්ලාගේ රජයට සහයෝගය ලබා දෙනවා. එතකොට මේ විකෘතිය යම් දුරකට සීමා කරගන්න පුළුවන්. ඒක තමයි අපට තිබෙන එකම ප්‍රායෝගික පියවර. නීතිපතිට කියන්න බැහැ, අලුත් පනත් කෙටුම්පතක් අරගෙන එන්න බැහැ කියලා. මොකද, ඒක ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අයිතියි. ඒක කරන්න පසුගිය ආණ්ඩුවේ හිටියාද, වෙනත් ආණ්ඩුවක හිටියාද කියන කථා වැඩක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනකොට මෙගාවොට් 5,192ක installed capacity එකක් මේ රටේ තිබෙනවා. ඒ මෙගාවොට් 5,192ම හැදුවේ ගතවූ අවුරුදු 76 තුළ. ජනතා විමුක්ති පෙරමුණ කවදාවත් මෙගාවොට් එකක්වත් ජාතික විදුලිබල පද්ධතියට එකතු කළේ නැහැ. ඒ අය Transformers පිච්චුවා. ලයිට් කණු කැඩුවා. ඒ නිසා මේ රටේ ජාතික විදුලිබල පද්ධතියේ අද අවශ්‍යතාවටත් වඩා වැඩි ප්‍රමාණයට විදුලිය නිෂ්පාදනය කරන ධාරිතාවක් -මෙගාවොට් 5,192ක installed capacity එකක්- හදලා තිබෙන්නේ කවුද? කලින් හිටපු ආණ්ඩු. ඒ, එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්, වෙනත් ආණ්ඩුවක් වෙන්නත් පුළුවන්. මේ රටේ ජල විදුලි බලාගාර, මහා පරිමාණ බලාගාර ඉදි කළේ, අපි. ඔබතුමන්ලා ඉදි කළේ නැහැ. ඒ නිසා මේ රට සියයට සියයක් විදුලියකරණය කරපු පක්ෂයක් හැටියට, ඒකට සහයෝගය දුන්නු පක්ෂයක් හැටියට ඒ සඳහා අයිතියක් තිබෙන මිනිසුන් හැටියට කටයුතු කරන්න අපට අයිතියක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් එක දෙයක් කියන්න ඕනෑ. මේ රටේ විදුලි පද්ධතිය නිසැක ලෙසම smart grid එකක් කරන්න ඕනෑ; එයට සූර්ය බලය, සුළං බලය උපරිම ලෙස ඇතුළත් කර ගන්න ඕනෑ. එහෙම කළොත් තමයි ගුණාත්මක සේවයක් ලබා දෙන්න පුළුවන්; එහෙම කළොත් තමයි මිල අඩු කරන්න පුළුවන්; එහෙම කළොත් තමයි මේ රටේ ආර්ථිකය දියුණු කරන්න කර්මාන්තකරුවන්, ආයෝජකයන් ගෙන්වා ගත හැකි වන විධියේ අඩු මිලක් මේ රටේ විදුලි පද්ධතිය තුළ සනාථ කරන්න පුළුවන්. අපි ආඩම්බරයෙන් කියනවා, මේ රටේ පුනර්ජනනීය බල ක්ෂේත්‍රයේ විශිෂ්ටතම ව්‍යාපෘතිය වන මෙගාවොට් 1,700කට වඩා වැඩි rooftop solar power generation, මෙගාවොට් 200කට වඩා වැඩි ground-mounted solar power generation මේ රටේ solar power generation පද්ධතියට එකතු කරපු සූර්යබල සංග්‍රාමයේ පුරෝගාමීන් හැටියට මේ ගැන කථා කරන්න අපට අයිතියක් තිබෙන බව. ඒ නිසා මේ ආණ්ඩුව පසුගාමී දේවලට යනවා නම්, මේ ආණ්ඩුව මේ රටේ පාරිභෝගිකයන්, මේ රටේ ව්‍යාපාර දුර්වල කරනවා නම්, ඒවා ආපස්සට අදිනවා නම්, ආයෝජනවලට හිතකර පරිසරයක් ගොඩනඟන්නේ නැත්නම් ඒවා පෙන්වා දෙන්න අපට අයිතියක් තිබෙනවා. හැබැයි, මම අවසාන වශයෙන් කියන්නේ විපක්ෂය හැටියට අපි ඔබතුමන්ලා කරන ධනාත්මක හැම දෙයකටම සහයෝගය දෙන්න කැමැතියි කියන එකයි. අපි ඒක අදාළ කාරක සභාවේදීත් පෙන්නුම් කළා. අපි ඔබතුමන්ලාට සුබ ප්‍රාර්ථනා කරනවා. නමුත්, මේ පනත් කෙටුම්පතේ තිබෙන අඩුපාඩුකම් නිසා ඔබ සමඟ එක්ව මෙයට ඡන්දය දෙන්න අපට බැහැ. අඩුපාඩු හදාගෙන එන්න. අපි එකඟ වෙන්නම්. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ත විද්‍යාරත්න අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.53]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පාර්ලිමේන්තුවේ වැඩිපුර වෙලාවක් ගත වුණේ විශේෂයෙන්ම ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පතේ සාකච්ඡාව සඳහායි. අද අපි එකවර කාරණා තුනක් ඉදිරිපත් කර තිබෙනවා, මුදල් අමාත්‍යාංශයට අදාළව හා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අදාළව.

මෙම විවාදයේදී ආණ්ඩු පක්ෂයේ අවසාන කථාව කරමින් මා පැහැදිලි කළ යුතු දෙයක් තිබෙනවා. විපක්ෂයේ කථා ටික අහගෙන හිටියාම ඒ කථාවලින් අපට පැහැදිලි වුණු දෙයක් තිබෙනවා. සමහර කථාවල තිබුණේ විලාප. සමහර ඒවායේ තිබුණේ අඳෝනා; ඇඬිලි. අපි ඒක පසුගිය කාලයක ඉඳන්ම විපක්ෂය පැත්තෙන් දකිනවා. ඒ පැත්තෙන් නීතිය ක්‍රියාත්මක වනකොට දරුවාගේ ප්‍රශ්නය මෙතැන කථා කරනවා; බිරිඳගේ ප්‍රශ්නය මෙතැන කථා කරනවා. ඒ කාරණා නිසා හද ගැස්ම ටිකක් වැඩි වෙනකොට ඔහොම වෙනවා කියලාත් අපට හිතෙනවා. අනෙක් පැත්තෙන්, තමන්ගේ ආණ්ඩුවල අවුරුදු 76ක නොහැකියාව රට හමුවේ ප්‍රදර්ශනය වනකොට, පෙන්නුම් කරනකොට, ඒ වාගේම අපේ ආණ්ඩුව හරියට කටයුතු කරනකොට, ප්‍රගතිශීලී යෝජනා එනකොට ඒවා දරා ගන්න බැරි ස්වභාවයකුත් අපට පෙනෙනවා. අන්න ඒ කාරණා ඉස්මතු වුණු සාකච්ඡාවක් තමයි අපට පෙනුණේ. ගුණාත්මක සංවාදයකට වඩා ඔන්න ඔය වාගේ සංවාදයක් විපක්ෂය පැත්තෙන් දැන් දිගින් දිගටම පෙන්නුම් කරනු ලබනවා. කොහොම නමුත් අපි හිතනවා, රටේ ජනතාව ඇත්ත තේරුම් ගනියි කියලා. ඔබතුමන්නාන්සේලා දෙගොල්ලන් විසින් කරපු අවුරුදු 76ක ආණ්ඩුකරණය සාර්ථක වුණා නම්, අප වාගේ කණ්ඩායමකට බලයක් ලැබෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ අසාර්ථකභාවය නිසා තමයි අප වාගේ කණ්ඩායමකට බලය එන්න පාර නිර්මාණය වුණේ. එක පැත්තකින්, අද විපක්ෂයේ සිටින ඔබතුමන්ලාම තමයි අපට මේ පාර හදා දීලා තිබෙන්නේ. සාර්ථක ලෙස ආණ්ඩු කළා නම් අද ඔබතුමන්ලා ඔය පුටුවල නොවෙයි ඉන්න ඕනෑ.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධවත් මම වචනයක්, දෙකක් කිව යුතුයි. දැන් මෙතැනදී විපක්ෂය වෙතින් කියැවුණා, "අපි විදුලිබල ක්ෂේත්‍රය වෙනුවෙන් මෙච්චර දේවල් කළා, මෙච්චර මෙගාවොට් ප්‍රමාණයක් නිෂ්පාදනය කළා" කියලා. පසුගිය අවුරුදු 76 තුළ හරියාකාරව විදුලි බලය නිෂ්පාදනය කළා නම්, මෙගාවොට් හත් අටදාහක් මේ රටේ නිෂ්පාදනය කර තිබෙන්න ඕනෑ. ඒ තරමට මුදල් නම් වැය කළා. හැබැයි, නිෂ්පාදනය ඉතාම දුර්වලයි. ඒ කාල සීමාව තුළ රටේ මිනිසුන්ට අවශ්‍ය විදුලිය පැය 24ම ලබා දෙන්න බැරි වුණා නම්, නිතරම විදුලිය බිඳ්ඬනය සිදු වුණා නම්, සාධාරණ මිලකට පාරිභෝගිකයාට විදුලිය ලබා දෙන්න බැරි වුණා නම් ඒවායේ වගකීම භාර ගන්න ඕනෑ ඔය පාර්ශ්වයයි. ඒ තිබුණු තත්ත්වය වෙනස් කරන්න නම් දැන් මේ අණ පනත්වල ගැඹුරු ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කරන්න ඕනෑ. ඒ නිසා දැන් ඒ වෙනස්කම් සිදු කර තිබෙනවා. ඒවායේ ප්‍රතිඵලය සමහර විට සමහර ඇත්තන්ට අද දකින්න බැරි වෙයි. අරික්කාලක් තරමට කල්පනාවක් නැත්නම් මරික්කාර්ලාට වුණත් මේවා තේරෙන්නේ නැහැ. ඕකයි තිබෙන ප්‍රශ්නය.

අපට කියන්න තිබෙන්නේ මේකයි. විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් ඔබතුමන්නාන්සේලා හදාගත්තු නීතියටම අනුව ගියොත්, ඒ නීති රීති තුළ මේ රටේ අප හිතන ආර්ථික වර්ධනය හෝ සමාජ සුබසාධනය හෝ කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා විශේෂයෙන්ම විදුලි ජනනය පැත්ත ගැන කල්පනා කරලා, සම්ප්‍රේෂණය පැත්ත ගැන කල්පනා කරලා, බෙදා හැරීම් පැත්ත ගැන කල්පනා කරලා, මෙහෙයුම් පැත්ත ගැන කල්පනා කරලා ඒ කාරණා ලෝකයේ නවීනත්වයට අදාළ විධියට සකස් කරලා පනත් කෙටුම්පතක් ගෙනැල්ලා තිබෙනවා.

ඔබතුමන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ ඉන්න මේ කාලයේ ඔබගේ හාවිතාවත්, අප විරුද්ධ පක්ෂයේ හිටපු කාලයේ අපගේ හාවිතාවත් ගත්තාම, දෙකක්. අපි විරුද්ධ පක්ෂයේ සිටියදී යමකට විරුද්ධ වුණා නම් විරුද්ධ වුණේ, රටට වන හානියට, රටට වන විපතට එරෙහිවයි. නාමල් මන්ත්‍රීතුමා මෙතැන කථා කරලා පැනලා ගියා. එතුමාගේ ස්වභාවය ඒකයි. යමක් කියලා පැනලා යනවා. වචන දෙකතුනක් කථා කරනවා, යනවා. එතුමා සඳහන් කළා, විදුලි බලය නිෂ්පාදනයේදී අප විරුද්ධ වුණු එක ව්‍යාපෘතියක් හැටියට, උමා ඔය ව්‍යාපෘතිය ගැන. ඔව්, ඒකට විරුද්ධ අපි ප්‍රධාන නායකත්වයක් දැක්වූවා. දේශපාලන ව්‍යාපාරයක් හැටියට උමා ඔය ව්‍යාපෘතියට අපි විරුද්ධ වුණා. ඒකට පදනමක් තිබෙනවා. ඒක ඔබතුමන්නාන්සේලා නොදන්නවා නොවෙයි. ඒක හිල නොවෙයි, රාජපක්ෂලා හදපු උගුල. ඒක, රාජපක්ෂලා හදපු හබක. ඒ කාරණය සම්බන්ධයෙන් අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු දැම්මා. උමා ඔය ව්‍යාපෘතියෙන් වුණු හානිය සම්බන්ධව ගොනු කළ එම නඩුවට 48 වතාවක් පෙනී ඉඳලා තිබෙනවා, කොළඹදී. ඉතින් අන්තිමේදී එවකට රජයම ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට වාර්තා දුන්නා, නිවාස 13,500 ගණනක් ඉරි තළා, පුපුරා විනාශ වෙලා කියලා. ඒක එවකට පැවැති රජයම පිළිගත්තා. කෝටි ගණනක වන්දිත් ගෙව්වා. තව වන්දි ගෙවන්නත් තිබෙනවා. උල්පත්, ළිං හිඳී ගියා 7,500 ගණනක්. වැඩ කරපු කුඹුරු, වගා බිම් පුරන් වුණා, අක්කර 15,000 ගණනක්. එතකොට විපතක් වෙලා නැද්ද? අපි විරුද්ධ වුණේ සංවර්ධනයට නොවෙයි. අපි විරුද්ධ වුණේ විපතකට; ජනතාවට වන හානියට. ඒ හානිය කළේ ඔය දෙපාර්ශ්වයයි. ඔය දෙපාර්ශ්වයම එම ව්‍යාපෘතිය කරගෙන ගියා. අපි කිව්වේ, නිවැරැදි ලෙස, විද්‍යානුකූල ලෙස එය කරන්න කියලායි. ඔය නාමල්ගේ ලොකු අප්පොච්චි ගිහිල්ලා මුල්ගල් තැබුවේ පරිසර අධ්‍යයන වාර්තා හදන්නේ නැතුවයි. අපි අධිකරණයට ගියාට පසුව -අවුරුදු එකහමාරකට පසුව- තමයි පරිසර අධ්‍යයන වාර්තාවක් හැදුවේ. එම වාර්තාව හැදුවේ මුල්ගල් තියපු ව්‍යාපෘතිය කරගෙන යන විධියට. ඒ නිසා විපතක් වුණා. සංවර්ධන ව්‍යාපෘතියකින් වෙච්ච විපතකට සහන සපයන්න ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට කැබිනට් තීන්දුවක් අරගෙන ලේකම් කාර්යාලයක් දැම්මා නම් ඒ දැම්මේ, උමා ඔය ව්‍යාපෘතියට අදාළවයි. ඒ කාරණා හරි පැහැදිලියි. එහෙම නම්, අපි විපක්ෂයේ සිටියදී විරුද්ධ වුණු ඒවාට පදනමක් තිබෙනවා. අපි තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ, දැන් මේ විරුද්ධ පක්ෂයේ සිටින අය මෙසේ විරුද්ධ වන්නේ අපේ ආණ්ඩුව නිවැරැදි විධියට නීති ටික හදාගෙන, සංවර්ධන කාර්යය හරියාකාරව කරගෙන යද්දී බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින සභාවේ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, කථාව කරගෙන යන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මම රටේ ජනතාවට කියනවා, දැන් විපක්ෂයේ ඉන්න මෙතුමන්ලාගේ විරෝධය හරියට තේරුම් ගන්න කියලා. මේ තිබෙන්නේ වෙනත් වේදනාවක්. දැන් දන්නවා, රට හරි පීල්ලට වැටිලායි තිබෙන්නේ කියලා; වංචා, දූෂණ නැවතිලා, සංවර්ධනය වේගවත් වෙලා ගමනක් යන පුනරුද යුගයක් ආරම්භ වුණා කියලා. ඒ වේදනාවයි මෙතැනදී පෙනෙන්නේ. අපි ඔබතුමන්නාන්සේලාට අභියෝග කරමින් කියනවා, ඔබතුමන්නාන්සේලා අවුරුදු 76ක් තුළ නිපද වූ මෙගාවොට් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් අපි මේ පාලන කාලය තුළ නිපදවා පෙන්වන බව. ඒවාට අදාළ ව්‍යුහාත්මක වෙනස්කම් තමයි මේ කරලා තිබෙන්නේ.

ඊළඟට, මා තවත් කාරණයක් ඔබතමුන්නාන්සේලාට කියන්න කැමැතියි. දැන් මෙතැනදී මෙතුමන්ලා අඬනවා, කම්කරුවන්ට මෙහෙම වෙනවා, ඔවුන්ගේ සේවය අනාරක්ෂිතයි කියලා. ඔබතමුන්නාන්සේලා මොන කටින්ද, ඔය කථා කරන්නේ? 1980දී රුපියල් 10කින් පඩි වැඩි කරන්න කියලා කිව්වාම ඔබතමුන්නාන්සේලාගේ මව් පක්ෂය රජයේ සේවකයන් ලක්ෂ ගණනක් දොට්ට දැම්මා මතක නැද්ද? රජයේ සේවකයන් වැටුපක් ඉල්ලුවාම, උසස්වීමක් ඉල්ලුවාම, උපාධිධාරීන් රක්ෂා ඉල්ලුවාම කඳුළු ගෑස්වලින් සලකපු විදිය මතක නැද්ද? ඔලු පළපු විදිය මතක නැද්ද, ලයිට් කණුවල එල්ලලා අපේ 60,000කට විතර වැඩේ දුන්නා මතක නැද්ද? ඒවා මතක නැහැ. *[බාධා කිරීම්]* ඒක තමයි තමුන්නාන්සේලාට කියන්නේ. ඒවා කියන කොට රිදෙනවා නේ, බොක්ක රත් වෙනවා නේ. ඒ නිසා තේරුම් ගන්න. කප්පරක් හොරකම් කරලා, වංචා කරලා, මේ රටේ කම්කරුවෝ මර්දනය කරපු මිනිස්සු දැන් කිඹුල් කඳුළු හෙළනවා.

තමුන්නාන්සේලා දැන ගන්න, මේ රටේ මතයක් තිබුණා මෙහෙම. ඒ තමයි, රාජ්‍ය සේවකයන්ට පාලකයන්ගෙන් ඉල්ලීමක් ගන්න බැහැ, බන්දේසියේ තියලා දෙන්නේ නැහැ කියලා. රාජ්‍ය සේවකයෝ ඉල්ලීම් දිනා ගන්න නම්, උද්ඝෝෂණවලට යන්න ඕනෑ, පෝස්ටර් ගහන්න ඕනෑ, වර්ජන කරන්න ඕනෑ, රෝහල් වහන්න ඕනෑ, පාසල් වහන්න ඕනෑ, විදුලිය ඇනහිටුවන්න ඕනෑ. එහෙමයි මිනිස්සු පඩි වැඩි කර ගත්තේ. රුපියල් 10ක් වැඩි කරලා ඉල්ලුවාම, ලක්ෂ ගණනක් දොට්ට දාපු ඔබතුමන්ලා මේවා තේරුම් ගන්න. මේ ආණ්ඩුව මේ රටේ රාජ්‍ය සේවකයන්ටත්, පෞද්ගලික අංශයේ සේවකයන්ටත් වැටුප් වැඩි කළේ, පෝස්ටර් ගැහුවාට පස්සේ නොවෙයි, උද්ඝෝෂණය කළාට පස්සේ නොවෙයි. බන්දේසියේ තියලා දුන්නා වාගේ දුන්නා. දැන් මේ රටේ කම්කරුවෝ රකින ආණ්ඩුවක් ඇවිල්ලා තිබෙන්නේ. දැන් කම්කරුවෝ රකින ආණ්ඩුවක් ඇවිල්ලා තිබෙන්නේ. අපි ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට මේක කියන්න කැමැතියි. ඔබ කිසි කෙනෙක් භය වෙන්න එපා. අපි මේ රටේ කම්කරුවන්ගේ ආණ්ඩුවක් හදලා තිබෙන්නේ. මේ රටේ ජනතාවගේ ආණ්ඩුවක් හදලා තිබෙන්නේ. ප්‍රගතිශීලි ආණ්ඩුවක් හදලා තිබෙන්නේ. රටට අනතුරුදායක වන කිසි දෙයක් කරන්න මේ ආණ්ඩුව සූදානම් නැහැ. ගරු අනුර කුමාර දිසානායක සහෝදරයා මූලිකත්වය දෙන ආණ්ඩුව, මේ රටේ ජනතාවාදී ආණ්ඩුවක්, ප්‍රගතිශීලි ආණ්ඩුවක් කියලා අපි තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි.

තමුන්නාන්සේලා ලංකා විදුලිබල මණ්ඩලය කෑලි කරලා, තමන්ගේ හිතවතුන්ට දීලා, සාක්කු පුරවා ගන්න හදපු ඉතිහාසය ඉවරයි. මේ රට කඩිනම් සංවර්ධනයකට ගෙනියන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා මේ රටේ කාර්යක්ෂමතාවක් ඇති කර ගන්න ඕනෑ. ලෝකයේ දියුණු රටවල් දිහා බැලුවාම, ඒ අය ඒ රටවල බලශක්තිය ඒ තත්ත්වයට ගෙනාවා, උත්පාදනය කර ගත්තා, සාධාරණ විදියට බෙදා හැරියා. අපේ රටේ මොකක්ද තිබෙන බලශක්තිය? එහෙම හදපු එකක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අන්තිමට සිද්ධ වුණේ, මේ රටේ ජනතාව කබලෙන් ළිපට ඇදලා දමපු තත්ත්වයට වැටුණු එක. අන්න ඒක වෙනස් කරන්න තමයි අපි කටයුතු කරන්නේ. ඒ කාරණය මතක් කරමින්, තමුන්නාන්සේලාට අපේ අමාත්‍යාංශයට අදාළ කාරණයකුත් මතක් කරන්න මම කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ සමහම විවාදයට ගන්නවා, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ, 1959 අංක 16 දරන තේ (අපනයන බදු සහ පාලන) පනත යටතේ ගෙනෙන නියෝගත්. අපනයන කරන සෑම නිමි තේ කිලෝවකටම රුපියල් 3ක බද්දක් අය වෙනවා. අපි ඒ බද්දේ සංශෝධනයක් තමයි මේ දාලා තිබෙන්නේ. ඒ බදු මුදල අය කරන්නේ, පසුගිය කාලයේ වාගේ වංචා, දූෂණ කරන්න නොවෙයි. ඒ බදුවලින් ලැබෙන මුදල ශ්‍රී ලංකා තේ මණ්ඩලයට එකතු කරලා, ඒකෙන් තේ වගාවට පොහොර දමන්න, තේ වගාව ප්‍රවර්ධනය කරන්න හා තේ වෙළෙඳ පොළ අත් පත් කර ගන්න අදාළ ප්‍රචාරණයට වෙන් කරන්න යොදනවා. ඒ නිසා තමයි අපි නිපදවා අපනයනය කරන තේ කිලෝවකට රුපියල් තුනක බද්දක් පනවලා තිබෙන්නේ. ඒ සඳහාත් අපි අද තමුන්නාන්සේලාගෙන් සහයෝගය ඉල්ලනවා, ඒකත් අපට සම්මත කරලා දෙන්න කියලා.

අපි දන්නවා, පසුගිය ඉතිහාසයේ මේ රටේ ගොවියාට මොකක්ද වුණේ කියලා, තේ වගාවට මොකක්ද වුණේ කියලා. මේ රටේ භාණ්ඩාගාරයේ රුපියල් හිඳුණා, ඩොලර් හිඳුණා. මේ රටට ඩොලර් ගෙනාපු, රන් පවුම් ගෙනාපු වතු, අද වෙනකොට පාළුවට ගිහිල්ලා තිබෙනවා, පාඩු ලබන තත්ත්වයට ගිහිල්ලා තිබෙනවා. අන්න ඒවා නැවත වගා කරන්න ඕනෑ, පාලු හිටවන්න ඕනෑ, සුද්දාගේ කාලයේ ගෙනාපු factoriesවල machines නවීන ලෝකයට අනුව හදන්න ඕනෑ. "Ceylon Tea" කියලා අපේ රට ඉස්සර හිටියේ පළමුවැනි තැනට වුණාට, තමුන්නාන්සේලාගේ ආණ්ඩු කෙරුවාව නිසා දැන් අපි හතරවැනි තැනට ඇවිල්ලා තිබෙන්නේ. චීනය පළමුවැනි තැනට ගිහිල්ලා, ඉන්දියාව දෙවැනි තැනට ගිහිල්ලා, කෙන්යාව තුන්වැනි තැනට ගිහිල්ලා, ලංකාව හතරවැනි තැනට වැට්ටුවා, මෙන්න මේ හතරගාතෙන් වැටිලා තිබෙන විපක්ෂය තමයි ඒවා වැට්ටුවේ. ඒවා හතරගාතෙන්

වට්ටලා තිබෙන්නේ මේ විපක්ෂයෙන්. ඒ හැම දෙයක්ම වට්ටලා, උදේ පාන්දර ඇවිල්ලා මෙතැනට නැඟිටලා බොරු සද්දයක් බද්දයක් දමනවා. මම කියන්නේ, තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ, මොනවාද රටට කළේ කියලා. අන්න ඒවා ජනතාව තේරුම් අරගෙන තිබෙනවා. ඒ පොහොර දමපු නැති තේ වලට පොහොර ටික දමන්න, මෙන්න අපි බද්දක් ගන්නවා. පාලු ටික හිටවන්න අපි ආදායමක් එකතු කර ගන්නවා. ඒ මේ රටට නැවත ඩොලර් ටික ගේන්න, ආදායම ගේන්න. ඒ නිසා අපි කියනවා, මේ සියලු සංශෝධන, මේ සියලු අණපනත් අලුත් වෙන්නේ, පැරණි රටාවේ ආණ්ඩු වෙනස් කරලා, පුනරුද යුගයකට යන්න නම්, මේ හැම දෙයක් තුළම සැබෑ වෙනසක් අවශ්‍යයි. ඒ වෙනසයි මේ කරලා තිබෙන්නේ. අන්න ඒ වෙනස සඳහා වෙච්ච මේ පනත් තුනේ සංශෝධන සකස් කරන්න මැදිහත් වෙච්ච නිලධාරීන්ට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ සඳහා සහයෝගය දීපු සුළු පිරිසක් විපක්ෂයේත් ඉන්නවා. එතුමන්ලාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම නිම කරනවා. තමුන්නාන්සේලාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම සභාව එකඟද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, බෙදීමක් අවශ්‍යයි.

*බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -*
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරයන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරයන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරයන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

***(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

මගේ වම් අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 121; විරුද්ධව 25; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 121; எதிராக 25; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 121; Noes 25; Abstain 0.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekarn | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 025. Nihal Abeysinghe | Yes |
| G 027. Wasantha Piyathissa | Yes |
| G 028. Gamagedara Dissanayake | Yes |
| G 031. Rathna Gamage | Yes |
| G 032. Mahinda Jayasinghe | Yes |
| G 033. Chathuranga Abeysinghe | Yes |
| G 034. Eranga Gunasekara | Yes |
| G 038. Prasanna Gunasena | Yes |
| G 039. Anton Jayakody | Yes |
| G 044. Susil Ranasinghe | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 057. Manjula Suraweera Arachchi | Yes |
| G 058. K. Ilankumaran | Yes |
| G 059. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 060. Samanmali Gunasingha | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Ajith Agalakada | Yes |
| G 064. Roshan Akmeemana | Yes |
| G 066. L.M. Abeywickrama | Yes |
| G 067. M.K.M. Aslam | Yes |
| G 068. Kaushalya Ariyarathne | Yes |
| G 069. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 070. Arkam Ilyas | Yes |
| G 071. Oshani Umanga | Yes |
| G 072. Krishnan Kalaichelvi | Yes |

| | |
|---|---|
| G 073. Upul Kithsiri | Yes |
| G 074. Wasantha Pushpa Kumara | Yes |
| G 075. Chaminda Lalith Kumara | Yes |
| G 076. Sarath Kumara | Yes |
| G 077. Nilanthi Kottahachchi | Yes |
| G 078. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 079. Lasith Bhashana Gamage | Yes |
| G 082. Ajantha Gammeddage | Yes |
| G 083. Ajith Gihan | Yes |
| G 084. Jagath Gunawardana | Yes |
| G 085. Aboobucker Athambawa | Yes |
| G 086. Ruwanthilaka Jayakody | Yes |
| G 087. Thushari Jayasingha | Yes |
| G 088. T.K. Jayasundara | Yes |
| G 089. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 091. Sellaththamby Thilaganathan | Yes |
| G 092. Anushka Thilakarathne | Yes |
| G 093. Chandana Thennakoon | Yes |
| G 094. Thanura Dissanayake | Yes |
| G 095. Dharmapriya Dissanayake | Yes |
| G 096. Sujeewa Dissanayake | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Susantha Dodawatta | Yes |
| G 099. Susantha Kumara Nawarathna | Yes |
| G 101. Najith Indika | Yes |
| G 102. Aruna Panagoda | Yes |
| G 103. Nimal Palihena | Yes |
| G 104. Nishantha Perera | Yes |
| G 105. Stepni Fernando | Yes |
| G 106. Kanthasamy Prabu | Yes |
| G 107. Lal Premanath | Yes |
| G 108. Nanda Bandara | Yes |
| G 109. Padmasiri Bandara | Yes |
| G 110. Ravindra Bandara | Yes |
| G 111. Sudath Balagalla | Yes |
| G 112. Sri Bavanandarajah | Yes |
| G 113. E. M. Basnayaka | Yes |
| G 114. Wijesiri Basnayake | Yes |
| G 115. Lakmali Hemachandra | Yes |
| G 116. S. Sandaruwan Madarasinghe | Yes |
| O 001. Mano Ganeshan | No |
| O 002. Kabir Hashim | No |
| O 006. R.M.Ranjith Madduma Bandara | No |
| O 007. Gayantha Karunathilleka | No |
| O 008. Sajith Premadasa | No |
| O 017. M.A.M. Thahir | No |
| O 021. Dayasiri Jayasekara | No |
| O 022. Harsha de Silva | No |
| O 023. Ajith P. Perera | No |
| O 024. Sujeewa Senasinghe | No |
| O 027. J. C. Alawathuwala | No |
| O 029. Hector Appuhamy | No |
| O 030. Hesha Withanage | No |
| O 031. Kavinda Heshan Jayawardhana | No |
| O 034. Imran Maharoof | No |
| O 041. Chaminda Wijesiri | No |
| O 042. Mujibur Rahman | No |
| O 046. W.H.M. Dharmasena | No |
| O 049. Chamindranee Kiriella | No |
| O 050. Chathura Galappaththi | No |
| O 051. Chithral Fernando | No |
| O 052. Amila Prasad | No |
| O 058. Abthul Wazeeth | No |
| O 062. Jagath Vithana | No |
| O 064. Nissam Kariyappar | No |
| O 065. Prageeth Madhuranga | Yes |
| O 066. Jagath Manuwarna | Yes |
| O 067. Ruwan Mapalagama | Yes |
| O 068. Nandana Millagala | Yes |
| O 069. Riyas Farook | Yes |
| O 070. Danushka Ranganath | Yes |
| O 071. Sanjeewa Ranasingha | Yes |
| O 072. Sunil Rathnasiri | Yes |
| O 082. A.M.M.M. Rathwaththe | Yes |
| O 083. Manoj Rajapaksha | Yes |
| O 084. Sunil Rajapaksha | Yes |
| O 085. Hasara Liyanage | Yes |
| O 086. Deepthi Wasalage | Yes |
| O 087. Kanchana Welipitiya | Yes |
| O 088. R. G. Wijerathna | Yes |
| O 089. Nishantha Samaraweera | Yes |
| O 091. Ruwan Wijeweera | Yes |
| O 092. Darmapriya Wijesinghe | Yes |
| O 093. Hiruni Wijesinghe | Yes |
| O 094. Athula Welandagoda | Yes |
| O 096. Dinindu Saman | Yes |
| O 097. Thilina Samarakoon | Yes |
| O 100. Chandana Sooriyaarachchi | Yes |
| O 101. G.D. Sooriyabandara | Yes |
| O 102. Aravinda Senarath | Yes |
| O 103. Kitnan Selvaraj | Yes |
| O 104. Janaka Senarathna | Yes |
| O 105.Chandima Hettiaratchi | Yes |
| O 106. Champika Hettiarachchi | Yes |
| O 107. Dinesh Hemantha | Yes |
| O 108. Geetha Herath | Yes |
| O 111. Ashoka Gunasena | Yes |
| O 112. Nandana Pathmakumara | Yes |
| O 113. Sunil Biyanwila | Yes |
| O 114. Samantha Ranasingha | Yes |
| O 115. Nishantha Jayaweera | Yes |

*Electronic Voting Results:*

Participants:

| | | |
|---|---|---|
| | Present | 146 |
| Votes: | | |
| | Yes | 121 |
| | No | 25 |
| | Abstain | 0 |

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 121යි; විරුද්ධව ඡන්ද 25යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

ඒ අනුව, න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම වැඩි ඡන්ද 96කින් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය:*
*''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු කුමාර ජයකොඩි මහතා]*

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு குமார ஜயகொடி]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Kumara Jayakody]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 1ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 4.- (*Amendment of section 1 of the principal enactment*)

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, 13 වන සහ 14 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සැලැස්ම සහ දීර්ඝකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම ලංකා විදුලිබල මණ්ඩලය' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 4, as amended, ordered to stand part of the Bill.*

## 5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 2ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 5.- (*Amendment of section 2 of the principal enactment*)

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 30 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යන වචන වෙනුවට, "විවිධාංග කරන ලද" ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5, as amended, ordered to stand part of the Bill.*

***6 සහ 7 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*6ஆம், 7ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 6 and 7 ordered to stand part of the Bill.*

## 8 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 8.- (முதன்மைச் சட்டவாக்கத்தின் 4ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 8.- (*Amendment of section 4 of the principal enactment*)

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "8 වන පිටුවේ, 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"ලැබිය හැකි ය." ; ' "

(2) "8 වන පිටුවේ 27 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(2ඉ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***8* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**
*8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 8, as amended, ordered to stand part of the Bill.*

***9* වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**
*9ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 9 ordered to stand part of the Bill.*

## 10 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 10.- (முதன்மைச் சட்டவாக்கத்தின் 10ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 10.- *(Amendment of section 10 of the principal enactment)*

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 9 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

> '(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ "ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ" යන වචන වෙනුවට, "අඛණ්ඩ සහ විශ්වාසදායක විදුලිබල සැපයුමක් සහතික කරමින් ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ" යන වචන ආදේශ කිරීමෙන්' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***10* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**
*10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 10, as amended, ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 11.- (முதன்மைச் சட்டவாக்கத்தின் 11ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 11.- *(Amendment of section 11 of the principal enactment)*

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"13 වන පිටුවේ, 30 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි තරගකාරී ආනුෂංගික සේවා' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***11* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**
*11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 11, as amended, ordered to stand part of the Bill.*

***12* වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**
*12ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 12, ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 13.- (முதன்மைச் சட்டவாக்கத்தின் 17ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 13.- *(Amendment of section 17 of the principal enactment)*

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "14 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '1 වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ), (ඌ) (i) සහ (ඌ)' "

(2) "15 වන පිටුවේ, 19 වන පේළියේ සිට 35 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'දක්වා ඇති සමාගම් සහ 1 වන උපලේඛනයේ (එ) (i) අයිතමයේ දක්වා ඇති ජල විදුලිබල උත්පාදනයට අදාළ සමාගම හැර, මේ වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද අනුප්‍රාප්තික සමාගම්වල කොටස්වලින් සියයට සියයක් ආරම්භයේදී භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරනු ලැබිය යුතු අතර, 1 වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) (ii) අයිතමවල දක්වා ඇති සමාගම් සහ 1 වන උපලේඛනයේ (එ) (i) අයිතමයේ දක්වා ඇති ජල විදුලිබල උත්පාදනයට අදාළ සමාගම සම්බන්ධයෙන් වන විට කොටස්වලින් සියයට සියයක් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ස්ථිරවම පවරනු ලැබිය යුතු ය. සහ' "

(3)"16 වන පිටුවේ, 1 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න:"

(4)"19 වන පිටුවේ, 7 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

> '(7) 1 වන උපලේඛනයේ (ඌ) (i) අයිතමයේ දක්වා ඇති සමාගමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු අතර ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය:-
>
> (අ) අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා අඩු නොවන තනතුරක් හෝ ඒ හා සමාන තත්ත්වයක් දරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නියෝජිතයකු;
>
> (ආ) භාණ්ඩාගාරයේ යම් නියෝජ්‍ය ලේකම්වරයකු;
>
> (ඇ) විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනික කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඇ) ප්‍රසම්පාදනය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඉ) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු:-

(i) මූල්‍ය කළමනාකරණය;
(ii) ආර්ථික විද්‍යාව;
(iii) ගිණුම්කරණය; හෝ
(iv) වාණිජ නීතිය.' "

(5) "19 වන පිටුවේ,10 වන පේළිය සහ 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත්' "

(6) "20 වන පිටුවේ, 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(iv) වාණිජ නීතිය;

(ඈ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරමින් සිටින සේවානියුක්තයන් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවානියුක්තයන් අතරින් තැනැත්තන් හතර දෙනෙකු.' "

(7) "20 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල' "

(8) "20 වන පිටුවේ, 11 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(ඇ) (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල සහ I වන උපලේඛනයේ (එ)(i) සහ (එ)(ii) වන අයිතම වල දක්වා ඇති සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ

අධ්‍යක්ෂවරයකු ලෙස ධුරය භාර ගැනීමට පෙරාතුව ඔවුන්ගේ පත්වීමේ දිනය වන විට පවතින ස්වකීය බැඳියාවන් පිළිබඳ පොදු අනාවරණය කිරීමක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉදිරියේ දී සලකා බැලිය යුතු යම් කාරණයක් සම්බන්ධයෙන්, සෘජුව හෝ වක්‍රව යම් බැඳියාවක් ඇති (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල සහ I වන උපලේඛනයේ (එ) (i) සහ (එ)(ii) වන අයිතම වල දක්වා ඇති සමාගම්වල යම් අධ්‍යක්ෂවරයකු විසින් එකී බැඳියාවේ ස්වභාවය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කරනු ලැබිය යුතු අතර එම කාරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු ය.

(ඉ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ හෝ නියෝජිතයකු නොවන යම් තැනැත්තකු විසින් I වන උපලේඛනයේ (අ) වන, (ඉ) වන, (ඊ) වන, (උ) වන, (ඌ)(i) වන, (එ) (i) වන සහ (එ)(ii) වන අයිතම වල දක්වා ඇති සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල දෙකක හෝ ඊට වැඩි ගණනක සාමාජිකයකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය.' "

(9) "20 වන පිටුවේ, 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(9) (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*13ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 13, as amended, ordered to stand part of the Bill.*

## 14 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 14.- (முதன்மைச் சட்டவாக்கத்தின் 18ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 14.- (*Amendment of section 18 of the principal enactment*)

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "21 වන පිටුවේ, 14 වන පේළියේ සිට 23 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (ආ) ඡේදයේ 'අවුරුදු දෙකකට පසු නොවන දිනයක' යන වචන වෙනුවට, 'අවුරුදු එකකට පසු නොවන දිනයක' යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) ඡේදයේ -

(i) 'I වන උපලේඛනයේ (අ), (ඊ) සහ (ඌ) (ii) අයිතමවල' යන වචන සහ ඉලක්කම් වෙනුවට, 'I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) (ii) අයිතමවල' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) 'බැහැර කරනු ලැබිය හැකි ය:' යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට, 'බැහැර කරනු ලැබිය හැකි ය.' යන වචන ආදේශ කිරීමෙන්; සහ' "

(2) "22 වන පිටුවේ, 3 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ වගකීම්" යන වචන වෙනුවට, "සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ වගකීම්" යන වචන ආදේශ කිරීමෙන්"; "

(3) "22 වන පිටුවේ, 9 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කිරීමෙන්;' "

(4) "22 වන පිටුවේ, 9 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(ඈ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ "අරමුදල් මූලාශ්‍රය හඳුනා ගනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට, "අරමුදල් මූලාශ්‍රය හඳුනා ගනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

(ඌ) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පෙරාතුව ම වූ දිනයේ දී (මේ ඡේදයේ 'උත්පාදන සමාගම' යනුවෙන් සඳහන් කරනු ලබන) I වන උපලේඛනයේ (අ) අයිතමයේ දක්වා ඇති උත්පාදන සමාගමේ ධුර දරන සියලුම නිලධරයන් සහ සේවකයන් -

[ගරු කුමාර ජයකොඩි මහතා]

(i) උත්පාදන සමාගම විසින් නිසි පරිදි හඳුනා ගනු ලබන බවට;

(ii) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට මාස හතරක් ඇතුළත, I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති අදාළ අනුප්‍රාප්තික සමාගම් වෙත, ඔවුන්ගේ යෝජිත අනියුක්ත කිරීම සම්බන්ධයෙන් උත්පාදන සමාගම විසින්, දැනුම් දෙනු ලබන බවට; සහ

(iii) (ii) වන උපඡේදයේ දක්වා ඇති දැන්වීම ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති එකී අදාළ අනුප්‍රාප්තික සමාගම්වලට අනියුක්ත වීමට ඔවුන් තෝරා ගන්නේ ද නැති ද යන්න උත්පාදන සමාගම වෙත දැනුම් දිය යුතු බවට,

සහතික විය යුතු අතර, අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පසුව වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්ත ගිවිසුම යටතේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන් විසින් භුක්ති විඳිනු ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම සහ කොන්දේසි මත අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති එකී අනුප්‍රාප්තික සමාගම් වෙත අනියුක්ත කරනු ලැබිය යුතු ය. යම් සේවා නියුක්තයකු අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති යම් අනුප්‍රාප්තික සමාගමකට අනියුක්ත වීමට තෝරා නොගන්නා අවස්ථාවක දී, එකී සේවානියුක්තයා ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයකට හිමිකම් ලැබිය යුතු අතර, එකී යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට මාස හතරක් ඇතුළත නියම කරනු ලැබිය යුතු ය; සහ

(එ) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පෙරාතුව මවූදිනයේ දී (මේ ඡේදයේ "බෙදාහැරීමේ සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) I වන උපලේඛනයේ (උ) අයිතමයේ සඳහන් බෙදාහැරීමේ සමාගමේ ධුර දරන සියලුම නිලධරයන් සහ සේවකයන්-

(i) බෙදාහැරීමේ සමාගම විසින් නිසි පරිදි හඳුනා ගනු ලබන බවට;

(ii) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේපළ කිරීමේ දිනයේ සිට මාස හතරක් ඇතුළත, I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති අදාළ අනුප්‍රාප්තික සමාගම් වෙත, ඔවුන්ගේ යෝජිත අනියුක්ත____කිරීම සම්බන්ධයෙන් බෙදාහැරීමේ සමාගම විසින් දැනුම් දෙනු ලබන බවට; සහ

(iii) (ii) වන උපඡේදයේ දක්වා ඇති දැන්වීම ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත, I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති එකී අදාළ අනුප්‍රාප්තික සමාගම්වලට අනියුක්තවීමට ඔවුන් තෝරා ගන්නේ ද නැතිද යන්න බෙදාහැරීමේ සමාගම වෙත දැනුම් දිය යුතු බවට,

සහතික විය යුතු අතර, අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පසුව වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්ත ගිවිසුම යටතේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන් විසින් භුක්ති විඳිනු ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම සහ කොන්දේසි මත අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති එකී අනුප්‍රාප්තික සමාගම් වෙත අනියුක්ත කරනු ලැබිය යුතු ය. යම් සේවානියුක්තයකු අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති යම් අනුප්‍රාප්තික සමාගමකට අනියුක්ත වීමට තෝරා නොගන්නා අවස්ථාවක දී, එකී සේවානියුක්තයා ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයකට හිමිකම් ලැබිය යුතු අතර, එකී යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට මාස හතරක් ඇතුළත නියම කරනු ලැබිය යුතු ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*14ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 14, as amended, ordered to stand part of the Bill.*

***15 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*15ஆம் வாசகத்திலிருந்து 18ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 15 to 18 ordered to stand part of the Bill.*

## 19 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම)

## வாசகம் 19.- (முதன்மைச் சட்டவாக்கத்தின் 52ஆம் பிரிவைத் திருத்துதல்)

## CLAUSE 19.- (*Amendment of section 52 of the principal enactment*)

**ගරු කුමාර ජයකොඩි මහතා**

(மாண்புமிகு குமார ஜயகொடி)

(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"27 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'උපාය මාර්ග සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඊට පසුව සිදු කරන ලද ප්‍රතිශෝධන සහ යාවත්කාලීන කිරීම් අදහස් වේ;';' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 19, as amended, ordered to stand part of the Bill.*

***20 සහ 21 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*20ஆம், 21ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 20 and 21 ordered to stand part of the Bill.*

## අලුත් වගන්ති
## புதிய வாசகங்கள்
## NEW CLAUSES

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් අලුත් වගන්ති ඉදිරිපත් කරනවා:

(1) "24 වන පිටුවේ, 16 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

| | |
|---|---|
| 'ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම | 17. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තියේ " උත්පාදනයේ සහ බෙදා හැරීමේ නිරත වන අවස්ථාවක දී සහ එසේ උත්පාදනය කළ විදුලි ධාරිතාවය හෝ ප්‍රමාණය" යන වචන වෙනුවට, "උත්පාදනයේ, බෙදා හැරීමේ හෝ සැපයීමේ නිරත වන අවස්ථාවක දී සහ එසේ උත්පාදනය කළ, බෙදා හරින ලද හෝ සපයන ලද විදුලි ධාරිතාවය හෝ ප්‍රමාණය" යන වචන ආදේශ කිරීමෙන්. ' " |

(2) "27 වන පිටුවේ, 9 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

| | |
|---|---|
| 'ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම | 19. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, එහි "මේ පනතේ විධිවිධාන සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය." යන වචන වෙනුවට, "මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට හෝ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.' " |

***ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.***
*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*
*Brought up, and read the First time.*

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අලුත් වගන්ති දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අලුත් වගන්ති පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***අලුත් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*புதிய வாசகங்கள் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென்ற வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*புதிய வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Question, that the New Clauses be added to the Bill, put and agreed to.*
*New Clauses ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## දුම්කොළ බදු පනත: නියමය
## புகையிலை வரிச் சட்டம்: கட்டளை
## TOBACCO TAX ACT: ORDER

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සංශෝධිත, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 2 වගන්තිය යටතේ බීඩි සඳහා දුම්කොළ බද්දක් පැනවීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## තේ (අපනයන බදු සහ පාලන) පනත: නියෝග
## தேயிலை (வரி மற்றும் ஏற்றுமதிக்கான கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
## TEA (TAX AND CONTROL OF EXPORT) ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1959 අංක 16 දරන තේ (අපනයන බදු සහ පාලන) පනතේ 7(1) සහ 8(2) වගන්ති සමඟ කියවිය යුතු 15 වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 05 දිනැති අංක 2343/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න.

පළමුවන ප්‍රශ්නය, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාටයි මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ.

01. ග්‍රාම සේවා වසමක් තුළ මහජන ආරක්ෂක කමිටු සහ සිවිල් ආරක්ෂක කමිටු යනුවෙන් කමිටු දෙකක් පවතීද?
02. සිවිල් ආරක්ෂක කමිටු අහෝසි කර තිබේ නම් අහෝසි කළ දිනය කවදාද?
03. ලංකාව පුරා පැවැත්වීමට අපේක්ෂිත මහජන ආරක්ෂක කමිටු සංඛ්‍යාව කොපමණද?
04. මේ වනවිට පිහිටුවා ඇති කමිටු සංඛ්‍යාව කොපමණද?
05. එකී කමිටුවේ කාර්යභාරය කුමක්ද?
06. කමිටුවේ ප්‍රධානියා කවුරුන්ද?
07. කමිටුවේ නිලධාරින් පත් කරන්නේ කවුරුන් විසින්ද?
08. කමිටුව කැඳවන්නා (කැඳවුම්කරු) කවුරුන්ද?
09. කමිටු රැස්වීම් සඳහා සහභාගී වන්නේ කවුරුන්ද?
10. කමිටු සාමාජිකයින් ලෙස පත්වීමට ඇති සුදුසුකම් මොනවාද?
11. නොඑසේ නම් ඒ මන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාගේ පිළිතුරෙන් පසුව මම මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්නම්.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. නැත.
02. 2025.04.04වන දින.
03. මහජන ආරක්ෂක කමිටු - 14,126කි.
04. 2025.08.04වන දිනට මහජන ආරක්ෂක කමිටු 12,710ක් පිහිටුවා අවසන් කර ඇත.
05. (i) අරමුණු
    - මහජන ආරක්ෂාව සුරක්ෂිත කිරීම තුළින් ජාතික ආරක්ෂාව සහතික කිරීම සඳහා දායකත්වය ලබා දීම.
    - සාමූහික තීරණ ගැනීම තුළින් ගැටුම් නිරාකරණය හා අපරාධ වැළැක්වීම.
    - තරුණ ප්‍රජාවේ ආත්මාභිමානය සුරක්ෂිත කිරීම මඟින් ප්‍රජා සවිබලගැන්වීම සඳහා දායකත්වය ලබා ගැනීම.

- ජාතික වගකීම හා වගවීම ප්‍රවර්ධනය කිරීම හා ආගමික සමගිය තහවුරු කිරීම.
- පරිසර ආරක්ෂණය තුළින් ස්වභාවික සම්පත් තිරසර ලෙස පරිහරණය කිරීම.
- අවදානම හඳුනා ගනිමින් උපද්‍රව සහ ව්‍යසන කළමනාකරණය.
- පොදු කටයුතු තුළින් ප්‍රජා සංවර්ධනයට දායක වීම.
- මහජන කේන්ද්‍රීය පොලිස් සේවාවක් නිර්මාණය කිරීම.
- විනයගරුක, නීතිගරුක පුරවැසියෙකු නිර්මාණය කිරීමට දායක වීම.
- පුරවැසියා අධ්‍යාත්මික හා ආකල්පමය වශයෙන් සංවර්ධනය කරමින් සමාජයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- කාලීන සමාජ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම.
- සමාජ ව්‍යසනයක් බවට පත්ව ඇති මත් ද්‍රව්‍ය සමාජයෙන් තුරන් කිරීමට දායක වීම.

(ii) ඉහත 5 (i)හි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහජන ආරක්ෂක කමිටු වෙත පහත කාර්යභාරය පවරා ඇත.

- ඉහත 5 (i)හි මූලික අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස සැලසුම් සකස් කිරීමත්, ඒ සඳහා සාමාජිකයන් වෙත වගකීම පැවරීමත් කමිටුවේ වගකීම වේ.
- අපරාධ හා මත් ද්‍රව්‍යවලට ගොදුරු වීමේ ප්‍රවණතාවක් ඇති සමාජ කණ්ඩායම් හඳුනා ගැනීම හා ගැටලු නිරාකරණය කිරීම.
- මහජන ආරක්ෂාව පිළිබඳව ජනතාවගේ දැනුවත්භාවය වැඩි කිරීම උදෙසා නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රමෝපාය ආශ්‍රිත වැඩසටහන් (ඩිජිටල්, ජනසන්නිවේදන සහ සාහිත්‍ය කලා) ක්‍රියාත්මක කිරීම.
- අපරාධ වැළැක්වීම උදෙසා තත් කාලයේ බලපවත්නා නෛතික තත්ත්ව යටතේ ජනතාව දැනුවත් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජාවේ පවතින විවිධ ගැටලු හඳුනා ගනිමින් එම ගැටලුවලට පිළියම් සපයන ආයතන සමඟ එක්ව සම්බන්ධීකරණය කිරීම.
- කමිටු බල ප්‍රදේශවල පාසල් හැර යන තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් පුහුණු සහ වෙනත් අවශ්‍යතා සඳහා යොමු කිරීම.
- ආපදා අවස්ථාවන්හි හා වසංගත තත්ත්වයන්හි ශ්‍රී ලංකා පොලීසිය, ත්‍රිවිධ හමුදා සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධ වූ මෙහෙයුම් කමිටුවක් ලෙස ක්‍රියාත්මක වීම.
- අදාළ කමිටු බල ප්‍රදේශවල තරුණ ප්‍රජාවගේ සහයෝගීතාව වර්ධනය කිරීමට අවශ්‍ය සාමූහික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනයට කටයුතු කිරීම. (ක්‍රීඩා, යෞවන සමාජ, සංස්කෘතික හා වෙනත් සමිති සමාගම්)
- අදාළ කමිටු බල ප්‍රදේශ තුළ පරිසරයට එරෙහිව සිදු වන වැරදි මෙන්ම වෙනත් විෂමාචාර ක්‍රියාවන් ඇති විය හැකි ස්ථාන හඳුනාගෙන හවුල්කාරි ප්‍රවේශයකින් විසඳුම් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.
- කමිටු බල ප්‍රදේශවල පිහිටි සංරක්ෂිත වනාන්තර, ප්‍රේරණ තලයේ පරිවාර වනාන්තර, සංරක්ෂිත සංවේදී තෙත් බිම්, ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීමට ජනතාව දැනුවත් කිරීම.
- පරිසර පවිත්‍රතාව, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හා නොදිරන අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළු කසළ කළමනාකරණය සඳහා මහජනතාව දැනුවත් කර දිරිගැන්වීම සිදු කළ යුතුය.
- සමාජයේ යහපැවැත්ම වෙනුවෙන් තම වසමේ පදිංචි ළමුන් පාසල් හා දහම් පාසල් අධ්‍යාපනයට යොමු කිරීම.

06. කමිටු සාමාජිකයන් විසින් පත් කරනු ලබන සභාපති.

07. කමිටු සාමාජිකයන් පත්කර ගැනීම මූලස්ථාන පොලිස් පරීක්ෂක/ස්ථානාධිපති විසින් සිදු කරනු ලබන අතර, එම සාමාජිකයන් විසින් ලේකම් හැර අනෙකුත් නිලධාරින් පත්කර ගැනීමට කටයුතු කරනු ලබයි.

කමිටුව අයත් ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරිවරයා ලේකම් ධුරය සඳහා නිතරගයෙන් පත් කරගනු ලබයි.

08. මූලස්ථාන පොලිස් පරීක්ෂක/ස්ථානාධිපති විසින් පත් කරන ලද පොලිස් නිලධාරියා.

09. සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, කැඳවුම්කරු ඇතුළු සියලුම කමිටු සාමාජිකයන්.

10. සාමාජිකයන් පත් කිරීමේදී ග්‍රාම නිලධාරි වසමේ ස්ථිරව පදිංචි වී සිටින පිළිගත් සමාජ සම්භාවනාවට පත් වූ නියෝජිතයන් තෝරා ගැනීමට කටයුතු කරනු ලබයි.

ක්ලීන් ශ්‍රී ලංකා ග්‍රාමීය සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු අනිවාර්යයෙන්ම කමිටු සාමාජිකත්වයට ඇතුළත් කළ යුතු අතර, ඊට අමතරව වෙනත් රාජ්‍ය ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන කමිටු නියෝජිතයන්ට මහජන ආරක්ෂක කමිටුවේ සාමාජිකත්වය සඳහා අවස්ථාව සලසා දිය යුතුය.

කමිටුවේ සමස්ත සාමාජික සංඛ්‍යාවෙන් අවම වශයෙන් සියයට 50ක් තරුණ ප්‍රජාව -වයස අවුරුදු 18ත්, 45ත් අතර- නියෝජනය වන පරිදි පත් කළ යුතු අතර, එම සාමාජිකයන් අතරින් අවමය සියයට 25ක් කාන්තා නියෝජනයක් සහිතව පවත්වාගෙන යෑමට කටයුතු කරනු ලබයි.

11. අදාළ නොවේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, මීට පෙරාතුව තිබුණා, ප්‍රජා පොලිස් කමිටුව. ඒ ප්‍රජා පොලිස් කමිටුව පිළිබඳව තිබෙන කාරණා එකින් එක අරගෙන බැලුවාම ඒකේ බොහොම පැහැදිලිව තිබුණේ ඒ නම මොකක්ද කියන කාරණය පමණයි. හැබැයි, දැන් "මහජන ආරක්ෂක කමිටුව" කියලා අලුත් වැඩබලන පොලිස්පතිතුමා ඉදිරිපත් කරපු කමිටුව තිබෙනවා. මීට අදාළව නිකුත් කර ඇති

[ගරු දයාසිරි ජයසේකර මහතා]

චක්‍රලේඛයේ තිබෙනවා, "දිවයින පුරා පිහිටි සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි මහජන ආරක්ෂක කමිටු පිහිටුවිය යුතු අතර, එම කමිටු 'මහජන ආරක්ෂක කමිටු' යන සිංහල නාමයෙන් හැඳින්විය යුතුය." කියලා. ඒකත් ඇත්තටම දමිළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ආවා නම් හොඳයි. මොකද, දමිළ සහ ඉංග්‍රීසි කියන භාෂා දෙකෙන්ම අනෙක් එක දාලා තිබුණා. නැත්නම් ඒ ප්‍රදේශවල දමිළ සහ මුස්ලිම් ජනතාවට යම් ප්‍රශ්නයක් වෙනවා. නමුත්, ඒක මෙතැන ඇතුළත් වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා ඒකත් මෙතැනට ඇතුළත් කරන්න කියලා. හැබැයි, මේකෙදි අපි එකක් දකිනවා. "ප්‍රාදේශීය ලේකම් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිගේ මඟ පෙන්වීම සහ දායකත්වය ලබා ගත යුතුය. සුදුසු පරිදි ආගමික නායකයින්ගේ අනුශාසකත්වය ලබා ගත යුතුය" කියලා මේකේ දාලා තිබෙනවා. හැබැයි, මීට පෙරාතුව තිබුණු කමිටුවල කිසි වෙලාවක, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හෝ මන්ත්‍රීවරු හෝ කිසිම කෙනෙක් මෙවැනි කාරණයකට අත ගැහුවේ නැහැ. මේක බොහොම පැහැදිලිව, ස්වාධීනව සිද්ධ වුණු ක්‍රියාවලියක් විධියට තමයි තිබුණේ.

ඊට අමතරව මම කියන්න කැමැතියි, මේ එවලා තිබෙන චක්‍රලේඛයේ, "2. 2 මහජන ආරක්ෂක කමිටුවේ සාමාජිකයින් තෝරා ගැනීමේ ක්‍රමවේදය" කියන එක යටතේ -ප්‍රජා පොලිස් කමිටුවේ සාමාජිකයන් තෝරා ගැනීම පිළිබඳව තිබෙන තත්ත්වයන් හා ඒ කරුණු සියල්ලම ගැන කථා කරලා ඉවර වෙලා- "සැ.යු. ඉදිරිපත් වන අයදුම්පත් සම්බන්ධයෙන් කොට්ඨාස භාර නිලධාරියා විසින් සිදු කරනු ලබන පසුබිම් පරීක්ෂණයකට යටත්ව එම පත් කිරීම් සිදු කළ යුතු ය" කියලා සඳහන් කර තිබෙනවා. සමහර තැන්වල මේ ප්‍රශ්නය ඇතිවෙලා තිබෙන නිසා තමයි මේ තත්ත්වය මතුවෙලා තිබෙන්නේ. මේක ඉතිහාසයේ මොන නමින් පැවැත්වූවත් සාමාන්‍යයෙන් අපි කරපු ක්‍රියාදාමය තමයි, කලින් හිටපු ප්‍රජා පොලිස් කමිටුව කැඳවලා, ඒ අයට ඉල්ලා අස්වෙන්න කියලා, ග්‍රාම නිලධාරි කොට්ඨාසය භාර පොලිස් නිලධාරිවරයාට තිබෙන බලය අනුව මෙයට උනන්දු තවත් පිරිසක් ඉන්නවා නම් ඒ අයවත් එකතු කරලා, ඒ අය සියලුදෙනාම කැඳවලා, ඉන්න අයට ඉල්ලා අස් වෙන්න කියලා අලුත් කණ්ඩායමක් පත් කර ගැනීම සඳහා වන ක්‍රියාදාමයට යාම. හැබැයි, දැන් සිද්ධවෙලා තිබෙන දේ ගැන ස්ථාන අනුව අපේ දිස්ත්‍රික්කයේ ඕනෑ තරම් කරුණු මට ඔබතුමාට කියන්න පුළුවන්. ඇත්තවශයෙන්ම ඒ ප්‍රදේශවල සිදුවෙලා තිබෙන්නේ මේකයි. කොට්ඨාස භාර නිලධාරියා විධියට පත් කරලා තිබෙන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්. කටුපොත පොලිස් වසම ගැන කිව්වොත්, ඒ පොලිස් වසමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා තමයි මේ ලැයිස්තුව හදලා පොලිසියට ගෙනැල්ලා භාර දීලා තිබෙන්නේ. ඕනෑ නම් මම ඔබතුමාට නම් ටිකත් කියවන්නම්. ඒ ලැයිස්තුව ලබා දෙනතුරු තවමත් සමහර කොට්ඨාසවල මේවා පිහිටුවා නැහැ. ඔබතුමා දැන් කිව්වා, දොළොස්දහස් ගණනක් හදලා තිබෙනවා කියලා. 14,036කට මේවා හදාගන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා තිබෙන්නේ මෙන්න මේ කාරණය නිසායි. ඒක විශාල ගැටලුවක්. එක පැත්තකින් ඔවුන් හිටපු කමිටුවට කැඳවලා නැහැ. කැඳවන්නේ නැතුව අලුත් මිනිස්සු ටිකක් ගිහිල්ලා කමිටුව හදනවා. එතකොට, ඒකේ හිටපු සභාපති අහනවා, "ඇයි, මට කිව්වේ නැත්තේ?" කියලා. මේ වාගේ ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මම දන්නේ නැහැ, හැම තැනම මෙහෙමද කියලා. මට බොහොම පැහැදිලිව, නම් එක්ක කියන්න පුළුවන්, මෙන්න මේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මෙන්න මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා තමයි ලැයිස්තුව හදලා ගෙනැල්ලා දෙන්නේ කියලා. මොකද, "පසුබිම් පරීක්ෂණකට යටත්ව" කියලා මේකේ සඳහන් කරලා තිබෙනවා. එතකොට, ඔහු තමයි අයදුම් පත් සම්බන්ධයෙන් තීන්දු ගන්න එකම පුද්ගලයා. අයදුම් පත්‍ර ඉදිරිපත් කරන තැනක් පිළිබඳවත් මේකේ සඳහන් කරලා නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා වාගේ ග්‍රාම නිලධාරිතුමා නම් අයදුම් පත්‍ර සම්බන්ධයෙන් තීරණ ගැනීමට නිල බලයෙන් එතැනට පත් වෙන්නේ, එහෙම නම් එතුමාට හෝ යම් කිසි විධියකට බලය ලබා දීමේ තත්ත්වයක් තිබෙන්නට ඕනෑ. නමුත්, එහෙම එකක් නැහැ. ඒ නිසා මම අහන්න කැමැතියි, කොට්ඨාස භාර නිලධාරියා කියන්නේ කවුද කියලා.

සමහර තැන්වල සිද්ධවෙලා තිබෙන දේ මම අවංකව ඔබතුමාට කියන්නම්. මම බොහොම නිවැරදිව තමයි මේ කාරණය මතු කරන්නේ. හැම තැනකම නොවෙයි, සමහර තැන්වලදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු,- ඊයේ මට කිව්වා, "අරගෙන එන්න, මම කියලා දෙන්නම්" කියලා. මමත් කියලා දෙන්නම්. මමත් මේක දන්න නිසා තමයි මේ කියන්නේ. සමහර ප්‍රදේශවල ඔහු පත් කරපු ලැයිස්තුව පොලිස් ස්ථානාධිපතිවරයාට දීලා තිබෙනවා, "මේ අයත් එක්ක කථා කරලා මේක කරන්න" කියලා. ඔහු තමයි කොට්ඨාස භාර නිලධාරියාව පත් කරලා තිබෙන්නේ. එම නිසා මේක ඇත්තවශයෙන්ම දේශපාලනීකරණයට ලක්වෙලා තිබෙනවාය කියන කාරණය තමයි මගේ තර්කය. එම නිසා මම ඔබතුමාට කියනවා, මේ කොට්ඨාස භාර නිලධාරියාව පත් කරන්නේ කවුද කියලා කරුණාකරලා කියන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු මන්ත්‍රීතුමනි, ඔබ ප්‍රකාශ කරපු අදහස වැරැදියි. විශේෂයෙන් කොට්ඨාස භාර නිලධාරියා කියන්නේ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා. නැත්නම් Division කියලා අපි කියන්නේ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා. එහෙම නැතුව දේශපාලන චරිතයක් නොවෙයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

එතකොට, කොට්ඨාස භාර නිලධාරිවරයා කියන්නේ කවුද?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

කොට්ඨාස භාර නිලධාරි කියන්නේ, පොලිස් දෙපාර්තමේන්තුවේ SSP, නැත්නම් පොලිස් කොට්ඨාසයේ,- *[බාධා කිරීම්]* මේක පොලිස් චක්‍රලේඛයක්. ඒ කට්ටිය දන්නවා, කොට්ඨාස භාර නිලධාරියා කියන්නේ කවුද කියලා. අනිවාර්යයෙන් ඒක ඒ අය දන්නවා. *[බාධා කිරීම්]* එතකොට, ඔබතුමා කියපු පරිදි කිසිදු දේශපාලන මන්ත්‍රීවරයෙකුට මේ සඳහා ලැයිස්තු දෙන්න බැහැ. මේ සම්බන්ධයෙන් යම් ගැටලුවක් තිබෙනවා නම්, පැමිණිලි ආවාම ඒක අහෝසි කරන ක්‍රමයකුත් තිබෙනවා. පොලිස් චක්‍රලේඛ නිකුත් කරනවා. පොලිස් චක්‍රලේඛයට අනුව කොට්ඨාස භාර නිලධාරියා කියන්නේ SSP. ඔබතුමා ජීවත් වන කුලියාපිටියේ නම්, පොලිස් අධිකාරිවරයා නැත්නම් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා. එතකොට එය කිසිම ආකාරයක දේශපාලනීකරණයක් වෙන්න ඉඩකඩ නැහැ. මොකද මෙහි නිල තනතුරු ගත්තොත්, ග්‍රාම නිලධාරි ඉන්නවා, කැඳවුම්කරු පොලිසියේ ස්ථානාධිපති විසින් පත් කරන පොලිස් නිලධාරියා. සභාපති පත් කර ගන්නේ කමිටුවේ සියලු දෙනාගේ එකඟත්වය සහිතව. එතකොට එහි කිසිම ආකාරයක -දශමයක හෝ- දේශපාලනීකරණයක් වෙන්න ඉඩක් නැහැ. ඔබතුමා එක කාරණයක් සඳහන් කළා. පෙර ප්‍රජා පොලිස් කමිටුවල නිලධාරින්ටත් ඒ සඳහා අයදුම් කරන්න පුළුවන්. පොලිස් ස්ථානාධිපතිට හෝ මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාට අයදුම් පත්‍රයක් දුන්නාම ඒ පිළිබඳව පරීක්ෂා කර බලලා ඒ අය තෝරා පත් කර ගැනීම් කරනවා, අපි කියපු ව්‍යුහය තුළ.

සියයට 25ක් කාන්තා නියෝජනය සහිතව ප්‍රදේශයේ කවුරුත් පිළිගත්, චෝදනාවට ලක් නොවෙච්ච පුද්ගලයෙකු සභාපති හැටියට අර කමිටුව විසින් පත් කර ගන්නවා. ඒ කමිටුවේ ඉන්න ප්‍රමාණය -පිරිස- විසින් යෝජනා සම්මතයක් අරගෙන සභාපති පත් කරගන්නවා. පොදු එකඟතාව සහිතව තමයි ඒ පත් කර ගන්නේ. අපි ඉඩකඩ දීලා තිබෙනවා, ඊට අමතරව රාජ්‍ය ආයතනවලින් සිදු කරන ක්‍රියාකාරකම් මේකට සම්බන්ධීකරණය කර ගැනීම සඳහා යම් රාජ්‍ය ආයතනයක් හරහා ග්‍රාමීය මට්ටමේ කමිටුවක් නිර්මාණය වෙනවා නම් ඒ කමිටුවේ සාමාජිකයෙක් එතැනට දා ගන්න කියලා, අපේ වැඩ පහසුව සඳහා. "ක්ලීන් ශ්‍රී ලංකා" වාගේ වැඩසටහනක් දමා ගත්තාම පරිසර සංරක්ෂණය වාගේ බොහෝ වැඩසටහන් ඒ යටතේ ක්‍රියාත්මක වෙනවා. එතකොට මේ කමිටුවට ප්‍රයෝජනවත් වෙයි, ඒ අය හරහා ගන්නා ආධාර උපකාර වාගේම උපදෙස්ද සලකා බලමින් ඒකාබද්ධ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අනෙකුත් කටයුතු කරගන්න. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ පුළුල් සංකල්පයක් තමයි මේක ඇතුළේ අන්තර්ගත කරලා තිබෙන්නේ. ඒ නිසා කිසිසේත්ම ඉඩකඩක් නැහැ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට ලැයිස්තු ගෙනෙන්න. ඔබතුමා දන්නවා, මේ චක්‍රලේඛය යන කොට ස්ථානාධිපතිවරුන්, මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් සියයට 90ක් හිටියේ පෙර රජයෙන් පත් කරපු අයයි කියන එක. ඒ නිසා කිසිම ඉඩකඩක් නැහැ, මෙහිදී දේශපාලනීකරණය වෙන්න. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා මේක අධීක්ෂණය කරනවා. ඔහු තමයි කොට්ඨාස භාර නිලධාරියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, එම ප්‍රශ්නය සඳහා වෙන්කොට ඇති කාලය අවසානයි.

දෙවන ප්‍රශ්නය, ගරු උපුල් කිත්සිරි මහතා.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට රට පුරා ජනතාව බොහෝ දෙනෙක් ඉඩම් ගැටලුවලින් විශාල පීඩාවට පත් වෙලා සිටිනවා. විශේෂයෙන් මා ජීවත්වන රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ආසනය, ඇඹිලිපිටිය වැනි ප්‍රදේශ තුළත් මේ පිළිබඳව සොයා බලද්දී දැන ගන්න ලැබුණා, ගැටලු රාශියක් මතු වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන් ඉඩම් අයිතිය පිළිබඳව ඔවුන් කාලයක් තිස්සේ යම් ගැටලු ප්‍රමාණයකින් පීඩා විඳින බව පෙනෙනවා. එයට හේතුව හැටියට අපට හඳුනා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ, මේ ඉඩම් ප්‍රශ්නයට ඒ ඒ කාලවලදී නිසි පිළිතුරු ලබා නොදීම, රජයන් විසින් ඒ කාලවලදී උත්තර ලබා දෙන්න ගත් ප්‍රමාදයන් වාගේ ඒවා. විශේෂයෙන් ඒවා බලපා තිබෙනවා. ඒ වාගේම තමයි මේ කාරණාවලදී නිලධාරීන්ගෙන් වෙච්ච අපහසුතා, ඒ වාගේම නිලධාරීන්ගෙන් වෙච්ච අක්‍රමිකතා ඒ ඉඩම් ගැටලුවලට හේතු වෙලා තිබෙනවා. ප්‍රධාන වශයෙන් ජනතාවට ඔප්පු, බලපත්‍ර ලබා දීම වාගේ කාරණාවලදී විශේෂයෙන්ම ජනතාව දුක්විඳින තැනට, පීඩා විඳින තැනට පත් වෙන්න ඒ කාරණා බලපා තිබෙනවා.

ඒ වාගේම ඉඩම් සහ බලපත්‍ර, ඔප්පු ආදිය කාලයක් තිස්සේ ලබා නොදීම, විශේෂයෙන් ව්‍යාපාරික ප්‍රජාවට තමන්ගේ ව්‍යාපාරික ස්ථාන කරගෙන යන්න ඒ ඉඩම් සහ බලපත්‍ර, ඔප්පු ලබා නොදීම කියන කාරණා නිසා මේ වනකොට පවුල්වල උග්‍ර ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එය දරුවන්, දෙමව්පියන්, සහෝදර සහෝදරියන්, ඥාතීන් අතර උග්‍ර ගැටුමක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා ඒ ජනතාවට බලපත්‍ර සහ ඔප්පු කඩිනමින් ලබා දීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වෙලා කඩිනම් උත්තර සොයන්න ඕනෑ කියන තැනට ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මහජන කාර්යාලවලට එන ප්‍රශ්නවලින් සියයට 95ක් තිබෙන්නේ ඉඩම් පිළිබඳ ගැටලු. ඒ නිසා අපි මේ සභාවෙනුත්, ගරු ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටින්නේ, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා ඒ සඳහා කඩිනමින් කටයුතු කරන්න කියලා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් කඩිනමින් උත්තර බලාපොරොත්තුවෙන් පහත සඳහන් ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

1. මේ වන විට ඉඩම් බලපත්‍ර ලබා දීම සඳහා සූදානම පහත සඳහන් ආයතන ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද?
   i. රජයේ ඉඩම් (ප්‍රාදේශීය ලේකම් සතු)
   ii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
   iii. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
2. මේ වන විට දීමනාපත්‍ර හා ප්‍රදානපත්‍ර (ඔප්පු) ලබා දීම සඳහා සූදානම පහත සඳහන් ආයතන ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද?
   i. රජයේ ඉඩම් (ප්‍රාදේශීය ලේකම් සතු)
   ii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
   iii. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
3. පසුගිය රජය විසින් "උරුමය" සින්නක්කර ඔප්පු ලබා දීමේ වැඩසටහන තුළ යම් දුර්වලතා අමාත්‍යාංශ මට්ටමින් හඳුනාගෙන තිබෙනවාද? ඒ පිළිබඳව කරුණු දැනගන්න කැමැතියි.
   i. ඒ මොනවාද?
   ii. එම දුර්වලතා ඉවත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?
4. "උරුමය" ඔප්පු වැඩසටහන සක්‍රිය කර නැවත ආරම්භ කර එම ජනතාවට ඔප්පු කඩිනමින් ලබා දීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙනවාද?
   i. ඒ සඳහා කාල රාමුවක් සකසා තිබෙනවාද?
   ii. කාල රාමුවක් සකසා නැත්නම්, ඒ මන්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. i. අඛණ්ඩව සාමාන්‍ය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිකුත් කෙරේ.
   ii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් බලපත්‍ර ලබා දීමක් සිදු නොකරයි.
   iii. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ඉඩම් සහ බලපත්‍ර ලබා දෙන්නේ කෙසේද යන්න පහත සඳහන් කර ඇත.

   ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2025 වර්ෂයට අදාළව කලාප මට්ටමින් බලපත්‍ර 25,000ක් ලබා දීමට සැලසුම් කර ඇත.

[ගරු සුසිල් රණසිංහ මහතා]

| කලාපය | බලපත්‍ර |
|---|---|
| බී | 4,500 |
| සී | 4,500 |
| ඩී | 1,000 |
| එච් | 4,000 |
| එල් | 2,000 |
| වික්ටෝරියා | 500 |
| හුරුළුවැව | 500 |
| මොරගහකන්ද | 2,000 |
| වලව | 4,500 |
| රඹකැන්ඔය | 1,500 |
| **එකතුව** | **25,000** |

2. i. 4,000කට ආසන්න ප්‍රමාණයක් ලබා දීමට කටයුතු සූදානම් කර ඇත.

ii. මේ වන විට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඔප්පු 1,400ක් පමණ ලබා දීමට සූදානම් කර ඇත.

iii. 2025 වර්ෂයට අදාළව දීමනා පත්‍ර හා ප්‍රදාන පත්‍ර ලබා දීම සඳහා මේ වන තෙක් සැලසුම් සකස් කර නොමැත.

3. i. සහ ii. "උරුමය" වැඩසටහන සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද වාර්තාව සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු කිරීමේ හැකියාව පවතී.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අදාළ නොවේ.

4. i. සහ ii. "උරුමය" වැඩසටහන සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද වාර්තාව සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමේ හැකියාව පවතී.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අදාළ නොවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, පසුගිය කාලයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ඔප්පු, ඉඩම් ලබා දීම සම්පූර්ණයෙන් නවත්වා තිබුණු බව. අපේ අමාත්‍යාංශයට කෘෂිකර්ම ක්ෂේත්‍රය විතරක් නොවෙයි අදාළ වන්නේ. එය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයයි. ඒ කියන්නේ, ඉඩම් විෂයය වෙනම අමාත්‍යාංශයක් හැටියට නොව, කෘෂිකර්ම අමාත්‍යාංශය තුළටම ගෙන තිබෙනවා. අපේ රටේ ජනතාවට ඉඩමට හිමිකමක් ලබා දීම සඳහා තිබෙන ආයතන වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව කියන මේ සියල්ල අද කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය වනවා. ඉඩම් සඳහා හිමිකමක් ලබා දීමට; ඉඩම් සඳහා ඔප්පුවක්, බල පත්‍රයක්, නිදහස් දීමනා පත්‍රයක් ලබා දීම සඳහා වන, අපේ ජාතික ජන බලවේගය රජයේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න අපි සූදානම් වෙනවා. එළඹෙන 13වන දා උදේ 9.00ට කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් අපි එය ආරම්භ කරනවා. ඉඩමට බලපත්‍ර, ඔප්පු ලබා දීමේ වැඩසටහන අපි නම් කර තිබෙන්නේ "හිමිකම වැඩසටහන" කියලායි. "හිමිකම වැඩසටහන" ආරම්භ කරනවා, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ලබන 13වන දා උදේ 9.00ට කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාවට ඔප්පු ලබා දීමෙන්.

අපි බලාපොරොත්තු වෙනවා, 2025 අවුරුද්දේ, බලපත්‍ර වෙන්න පුළුවන්, ඔප්පු වෙන්න පුළුවන්, නිදහස් දීමනා පත්‍ර වෙන්න පුළුවන් 50,000ක් ලබා දීමට. අපි මේ වනකොටත් ඒ සඳහා කටයුතු සූදානම් කර තිබෙනවා. මගේ පිළිතුරේ ඒ ගැන කරුණු සඳහන් කළා. ඒ ගරු මන්ත්‍රීතුමා අහන්නේ, දැනට සූදානම් කරලාද කියලායි. 'දැනට' කියන වචනය නිසා තමයි මා දුන් පිළිතුරෙහි 1,400 සහ 4,000 කියලා ඉලක්කමක් එන්නේ. අපි 2025 අවුරුද්දේ බලපත්‍ර, ඔප්පු, නිදහස් දීමනාපත්‍ර ආදිය 50,000ක් ලබා දෙන්න ලෑස්ති කර තිබෙනවා. ඒවායෙන් 25,000ක් තිබෙන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම්. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම්වල පදිංචි වෙලා ඉන්නවා. හැබැයි, පසුගිය අවුරුදු 4, 5 ඇතුළත කිසිදු ලියවිල්ලක් දීලා නැහැ. ඒ නිසා අපි ඒ සඳහා වැඩ කටයුතු සූදානම් කළා. අපි බලාපොරොත්තු වෙනවා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් මහවැලි කලාප 10හි ම ජීවත් වන ජනතාවගෙන් 25,000කට තමන්ගේ ඉඩමට හිමිකම විධියට බලපත්‍රයක් හෝ ඔප්පුවක් මේ අවුරුද්ද ඇතුළත ලබා දීමට.

ඒ වාගේම තමයි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - LRC එක - සතු, නේවාසික කටයුතු සඳහා පාවිච්චි කරන ඉඩම් සඳහා බලපත්‍ර හෝ ඔප්පු 7,000ක් මේ අවුරුද්ද ඇතුළතදී ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් ප්‍රදාන පත්‍ර, දීර්ඝ කාලීන බලපත්‍ර සහ ඔප්පු 18,000ක් ලබා දීමට බලාපොරොත්තු වෙනවා. එහෙම තමයි අප කියපු 50,000 හැදෙන්නේ. දැනට බොහෝ දෙනෙක් කෘෂිකාර්මික හෝ වෙනත් කටයුතු සඳහා -වාණිජ කටයුතු ආදිය සඳහා- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් භාවිත කරන බව අපි දන්නවා. නමුත්, ඔවුන්ට ලියවිල්ලක් නැහැ. ඒ නිසා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් එවැනි කර්මාන්ත සඳහා භාවිත කරන, වාණිජ වශයෙන් භාවිත කරන පිරිස් සඳහා දීර්ඝ කාලීන බදුකර 500ක් පමණ සකස් කරලා ඔවුන්ට ඔවුන්ගේ හිමිකම මේ අවුරුද්ද ඇතුළත ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ තිබෙන රජයේ ඉඩම් විවිධ ආයෝජන සඳහා ලබා දිය යුතුයි. ආයෝජකයෝ එනවා. ඔවුන්ට ආයෝජනය කරන්න ඉඩමක් අවශ්‍යයි. එවැනි ආයෝජන සඳහා ලබා දීමට අඩුම තරමින් ඉඩම් කට්ටි 500ක්වත් ලබා දීම අවශ්‍යයි. ඉඩම් කට්ටියක් කිව්වාම, ඒක පර්චස් 20ක් වෙන්නත් පුළුවන්; අක්කර 50ක් වෙන්නත් පුළුවන්. මේ වසර තුළ ඉඩම් කට්ටි 500ක් ආයෝජන සඳහා ලබා දීමට අපි සැලසුම් සකස් කර තිබෙනවා. අපි ආයෝජකයන්ට ආරාධනා කරනවා, "ඔබේ ආයෝජනය සඳහා ඉඩම් ලබා දෙන්න අපි සූදානම්, ඔබේ ආයෝජන අරගෙන එන්න" කියලා.

ගරු මන්ත්‍රීතුමාගේ මේ ප්‍රශ්නයට පිළිතුර, ජාතික ජන බලවේගය රජයේ, ඉඩමට හිමිකමක් ලබා දීමේ වැඩසටහන "හිමිකම" නමින් අපි ආරම්භ කරන්න ලැහැස්තියි, ලබන 13වන දා. එතැනින් පසුව 2025 අවුරුද්ද ඇතුළත අපි පුද්ගලයන් 50,000කට හිමිකම, හිමිකම් බලපත්‍රය හෝ ඔප්පු ලබා දීමේ වැඩසටහන සූදානම් කර තිබෙනවා කියන පණිවුඩය මා නැවතත් ලබා දෙන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ 4වන ප්‍රශ්නයේ i කොටසට පැහැදිලි කරගැනීමක් කරගන්න අවශ්‍යයි. 2025 අවුරුද්දේ ඔප්පු 50,000ක් ලබා දීමක් ගැන ඔබතුමා කථා කළා. නමුත්, මේ සඳහා ඒ ඒ ආයතනවලට නියමිත කාල රාමුවක් හදන්න ඕනෑ. ඒ කාල රාමුව මේ වනකොට සකසා ඒ කාර්යය අවසන් කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද, ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග ගන්නවාද කියන එක තමයි අපට වැදගත් වන්නේ. ඒ නිශ්චිත ඉලක්කයට යන්න ඒ ආයතනවලට පුළුවන්ද කියන එක සම්බන්ධයෙන් තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අදහස ඕනෑ.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඔව්. ඔප්පු ලබා දෙන්නේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන්. ඔප්පු 7,000ක් ලබා දීමට අපි සැලසුම් සකස් කර තිබෙනවා. දැනට ඔප්පු 1,400ක් සකස් කර තිබෙනවා. 13වන දා ඒ ඔප්පු ලබා දීම පටන් ගන්නවා. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් මේ අවුරුද්ද ඇතුළත බලපත්‍ර 25,000ක් ලබා දෙනවා. ඒ කලාප 10 මොනවාද කියලා අපි වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබෙනවා. දැනට ඒ ක්‍රියාවලිය ආරම්භ වෙලා තිබෙනවා. ඉදිරි මාසවලදී ඒ බලපත්‍ර 25,000 ලබා දීමේ කටයුත්ත සම්පූර්ණ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් 18,000ක් ලබා දෙනවා. ඒ 18,000න් දැනට 4,000ක් සූදානම් කරලා තිබෙනවා. ඒවා ඉදිරි කාලයේදී ලබා දෙනවා. ඒ දෙපාර්තමේන්තු සහ ආයතනවලින් ලබා දෙන ප්‍රමාණය සහ දැනට සූදානම් කළ ප්‍රමාණයක් තිබෙනවා. ඉදිරියේදී ලබා දිය යුතු ඒවාත් සූදානම් කෙරෙමින් පවතිනවා. අපි ඒවා දෙසැම්බර් මාසය වනකොට ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.01ට, 2025 අගෝස්තු 07වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.01க்கு, பாராளுமன்றம் 2025 ஓகஸ்ட் 07, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.01 p.m. until 9.30 a.m. on Thursday, 07th August, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.